සූචිය

ප්‍රත්‍යාවර්තනයෙහි ආයෝජනය

වාර්ෂික වාර්තාව 2019



ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank



මූල්‍යමය අභියෝගයන් හමුවේ ස්වකීය සාර්ථකත්වය උදෙසා දිරිමත්ව කටයුතු කරන්නා වූ සියළුම ආකාරයේ දේශීය ව්‍යවසායකයින් වෙත අවැසි මූල්‍යමය සවිබලය සැපයීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අපි ඇපකැප වී ක්‍රියා කරන්නෙමු. අප විසින් සේවා සලසනු ලබන ප්‍රජාවන් වෙත සවිමත් මූල්‍යමය කුළුණක් වශයෙන් පවතිමින්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් 34 වසරක ජාතික මෙහෙවරෙහි පරිණතාවය හා විශ්වසනීයත්වය මත පදනම් වෙමින්, පුද්ගල හා සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි දායක වීම උදෙසා ව්‍යවසායකයින් වෙත අවශ්‍ය සහයෝගය අපක්ෂපාතීව පිරිනමනු ලැබේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින්, අප රටෙහි ආර්ථික ජීවනාලිය සාමූහිකව ගොඩනංවන්නා වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මෙන්ම කාන්තා ව්‍යවසායිකවන්ගේ ජීවන තත්වය නගාසිටුවීමේ සිය කාර්යභාරය අඛණ්ඩවම ඉටු කරනු ලබයි. ප්‍රජාවගේ දිවිපෙවෙත වඩාත් යහපත් අයුරින් වෙනස් කිරීම සඳහා අයෝජනයන් සිදුකරමින්, ග්‍රාමීය ජනතාව නියෝජනය කරන්නා වූ අපගේ ගනුදෙනුකරුවන් හා ඔවුන්ගෙන් යැපෙන්නන්ගේ මූල්‍යමය වර්ධන හා සමාජ වපසරිය පුළුල් කෙරෙන ආකාරයේ දායකත්වයන් ලබාදෙමින්, ජාතියේ සමාජයීය හා ආර්ථික වර්ධනය කෙරෙහි දිගු කාලීන සාධනීය බලපෑමක් ඇති කිරීමට අපි නිරන්තරයෙන්ම කටයුතු කරමු.

පටුන

බැංකුව පිළිබඳව

3 දැක්ම, මෙහෙවර ප්‍රකාශය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිළිබඳව
4 අපගේ සන්ධිස්ථාන
6 මූල්‍යමය වැදගත් සිදුවීම්
8 සභාපතිවරයාගේ පණිවුඩය
10 සාමාන්‍යාධිකාරීවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

නියමුත්වය

14 අධ්‍යක්ෂ මණ්ඩලය
18 ආයතනික කළමනාකරණ කණ්ඩායම
20 ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්
22 සහකාර සාමාන්‍යාධිකාරීවරුන්/අංශ ප්‍රධානීන්

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

26 මූල්‍ය සමාලෝචනය
29 ගනුදෙනුකරු සහ සබඳතා සමාලෝචනය
32 අලෙවිකරණ සමාලෝචනය
37 සමාජ හා පාරිසරික සමාලෝචනය
39 සේවක සමාලෝචනය
42 විශේෂ සිදුවීම්
49 අවදානම් කළමනාකරණය

ආයතනික පාලනය

66 ආයතනික යහපාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව
67 ආයතනික පාලනය
88 අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල පැමිණීම
89 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
95 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
97 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව
99 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු වාර්තාව
100 ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
102 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය
103 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
104 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව
106 අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

මූල්‍ය වාර්තා

108 විගණකාධිපති වාර්තාව
113 ආදායම් ප්‍රකාශය
114 විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනය
115 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
116 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
117 ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය
118 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පරිපූරක තොරතුරු

196 තුන් අවුරුදු සාරාංශය
198 ආයෝජක තොරතුරු
200 ශාඛාවන්හි භූගෝලීය බෙදීයාම
203 සටහන්
පසුපස ඇතුළත කවරය - ආයතනික තොරතුරු

දැක්ම, මෙහෙවර ප්‍රකාශය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිළිබඳව

දැක්ම

දූයේ සමාජ ආර්ථික සෞභාග්‍ය වේගවත්ව ඉදිරියට ගෙන යන දිරිමත් ව්‍යවසායකයින් පෝෂණය කිරීම.

මෙහෙවර ප්‍රකාශය

ප්‍රාදේශීය සමාජ ආර්ථික සෞභාග්‍ය ඵලදායී ලෙස ඉහළ නැංවීම සඳහා ඊට කැපවූ උද්‍යෝගිමත් ව්‍යක්තිකයින් කණ්ඩායමක් මගින් මූල්‍ය හා උපදේශන සේවා ලබා දීම.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිළිබඳව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භය වසර 1895 දක්වා විහිදෙන අතර, එහිදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපනය කෙරිණි.

වසර 1997 දී, එවැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකුව වශයෙන් පළාත් මට්ටමේ බැංකු හයක් ලෙස ඒකාබද්ධ කෙරිණි.

මෙම පළාත්බද බැංකු හය 2010 මැයි මස තවදුරටත් ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන නමින් පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය සහිත ජාතික මට්ටමේ බැංකුවක් 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපනය කෙරිණි. මෙහි දිගු කාලීන අරමුණ වූයේ ග්‍රාමීය ප්‍රජාවන් වෙත පහසු හා දරාගත හැකි ආකාරයේ මූල්‍යමය සහාය ලබාදෙමින් ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීම හා ඒ ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමයි.

'නිර්ධන පංතියේ බැංකුකරණ සංකල්පය' මත ඇරඹී බැංකුව මගින් ආදායම් පිරමීඩයේ පතුලේ සහ මධ්‍යම මට්ටම් වල ප්‍රජාවන් හට සරල හා ඵලදායී වූ මූල්‍යමය සාධනපත්‍ර වෙනුවට මූල්‍ය උපකරණ (ප්‍රධාන වශයෙන් තැන්පතු රැස්කිරීම හා ණය ලබා දීම) සපයනු ලැබේ. බැංකුව මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සහ කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම මෙන්ම කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වෙනත් කුඩා කර්මාන්තයන්ද නගා සිටුවමින් දේශයේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සාධනීය දායකත්වයක් සපයනු ලැබේ. ඉතුරුම් හා ස්ථාවර තැන්පතු වෙත ඉහළ පොලී අනුපාතයන් පිරිනමමින් බැංකුව මගින් ග්‍රාමීය ජනතාව හා පාසැල් දරුවන් තුළ ඉතිරිකිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීම සඳහාද කටයුතු කරනු ලැබේ.

මේ වන විට, ශාඛාවන් 276 ක් ඔස්සේ හිතෛෂී ගනුදෙනුකරුවන් මිලියන හයකට අධික පිරිසක් වෙත සේවා සලසමින් 2,735 දෙනෙකුගෙන් සමන්විත ව්‍යක්තීයමය ස්ථීර කාර්ය මණ්ඩලයක් සමගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ව්‍යවසායකයින් නිර්මාණය කිරීමේ ස්වකීය දැක්ම ක්‍රියාවට නංවමින් අප දේශයේ සමාජ ආර්ථික සෞභාග්‍ය උදෙසා ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටු කරයි.

අපගේ සන්ධිස්ථාන

පළාත්බද සංවර්ධන බැංකු හය එක් ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් වශයෙන් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව සාර්ථකත්වයේ කතාව

''2010 දී ඒකාබද්ධකරණයෙන් අනතුරුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් වසර නවයකට වැඩි කාලයක් තුළ රුපියල් බිලියන 200 කට ආසන්න මුළු වත්කම් ප්‍රමාණයක් අත්පත් කරගන්නා ලදී''

රු.බිලියන 32 සිට රු. බිලියන 150 දක්වා 369% ක මුළු තැන්පතු වර්ධනයක්

රු.බිලියන 30 සිට රු. බිලියන 145 දක්වා 383% ක මුළු ණය හා අත්තිකාරම් වර්ධනයක්

රු.බිලියන 41 සිට රු. බිලියන 200 දක්වා 388% ක මුළු වත්කම් වර්ධනයක්

රු.මිලියන 371 සිට රු. මිලියන 2,960 දක්වා 698% ක මෙහෙයුම් ලාභ වර්ධනයක්

රු.බිලියන 3 සිට රු. බිලියන 15 දක්වා 400% ක මුළු ස්කන්ධ වර්ධනයක්



1985 සිට 2009 දක්වා වසර විසි හතරක කාල සීමාව තුළ පළාත්බද සංවර්ධන බැංකු (නම් වශයෙන්: රජරට, රුහුණ, කඳුරට, වයඹ, උඩව සහ සබරගමුව) මගින් අත්පත් කරගන්නා ලද ප්‍රතිඵල, 2010 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපනය කිරීමෙන් අනතුරුව ගතවූ වසර නවයක කාලසීමාව (2010-2019) තුළ කැපී පෙනෙන අයුරින් වර්ධනය වී ඇත.

2010 මැයි සිට 2019 දෙසැම්බර් දක්වා

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මුළු තැන්පතු රු.මිලියන 32,350 සිට රු.මිලියන 149,600 දක්වා රු.බිලියන 117 කින් ඉහළ නැංවුනි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මුළු ණය හා අත්තිකාරම් රු.මිලියන 30,311 සිට රු.මිලියන 144,694 දක්වා රු.බිලියන 114 කින් ඉහළ නැංවුනි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මුළු වත්කම් රු.මිලියන 41,018 සිට රු.මිලියන 199,979 දක්වා රු.බිලියන 159 කින් ඉහළ නැංවුනි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඉතිහාසය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භය වසර 1985 දක්වා විහිදෙන අතර, එහිදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපනය කෙරිණි. ඉන්පසු වසර 1997 දී, එවැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණ, වයඹ, උඩව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකුව වශයෙන් පළාත්බද බැංකු හයක් ලෙස ඒකාබද්ධ කෙරිණි. මෙම පළාත්බද බැංකු හය 2010 මැයි 01 දින තවදුරටත් ඒකාබද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන නමින් පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ජාතික මට්ටමේ බැංකුවක් 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපනය කෙරිණි. මෙහි අරමුණු වූයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සහ කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම මෙන්ම කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර හා වෙනත් කුඩා කර්මාන්තයන්ද නගා සිටුවමින් දේශයේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සාධනීය දායකත්වයක් සැපයීමයි.

මූල්‍යමය වැදගත් සිදුවීම්

- සංවර්ධන බැංකුකරණය සඳහාම විශේෂිත මූල්‍ය ආයතනයක් වශයෙන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දේශයේ සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් නගාසිටුවීමෙහිලා කැපී පෙනෙන දායකත්වයක් සපයයි. මූල්‍ය සම්පාදකයෙක් ලෙස සැළකිය යුතු කාර්යභාරයක් ඉටු කරමින් දිවයින තුළ සියළුම සංවර්ධන වැඩසටහන් වලදී බැංකුව ප්‍රමුඛස්ථානයේ සිට ඇත. අපගේ ප්‍රධාන වත්කම වන්නේ උතුර සහ නැගෙනහිර ඇතුළුව මුළු රට පුරා පැතිරුණු මිලියන හයකට වැඩි අපගේ ගනුදෙනුකාර පදනමයි. එමනිසා බැංකුව ශාඛා 276 ක පුළුල් ශාඛා ජාලය ඔස්සේ ජාතියේ ප්‍රගතිය උදෙසා නිරන්තරයෙන් කටයුතු කරයි.
- බැංකුවේ සමස්ත ආදායම පෙර වසරට සාපේක්ෂව 6%කින් ඉහළ ගිය අතර වසර 2019 දී මෙහෙයුම් ලාභය 2018 දී වාර්තා වූ රු.මිලියන 3,606 ට සාපේක්ෂව රු.මිලියන 2,960 දක්වා 18% කින් පහත වැටිනි. බදු පෙර වත්කම් මත ඉපැයීම (ROA) 2018 දී 2.1% ක් වූ අතර 2019 දී 1.6% ක් වශයෙන් වාර්තා විය.

ගනුදෙනුකරුවන් වෙත සහය සේවා

- NDB සමඟ වෙස්ටර්න් යුනියන් - වෙස්ටර්ව් යුනියන් ඔස්සේ ලොව ඕනෑම ස්ථානයක සිට මෙරටට සම්පූර්ණ ආරක්ෂාව සහිතව පහසුවෙන් මුදල් මාරු කල හැකි අතර ගනුදෙනුකරුවන් හට දීපව්‍යාප්ත ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය ඔස්සේ අදාළ මුදල් ලබාගත හැකි වේ.

- DFCC සමඟ ලංකා මුදල් හුවමාරුව (LMT) - ලංකා මුදල් හුවමාරුව ඔස්සේ සෘජුවම ගනුදෙනුකරුගේ ගිණුම් වලට ක්ෂණිකව මුදල් හුවමාරු කල හැකි වන අතර ශාඛා 276 ක දීපව්‍යාප්ත ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය ඔස්සේ අදාළ මුදල් ලබාගත හැකි වේ.
- බැංකුව මගින් ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා විදුලිබල මණ්ඩලය හා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල බිල්පත් ගෙවීමේ සේවාවන් සපයනු ලැබේ.
- **ප්‍රාදේශීය සංවර්ධන බැංකු සහ** LankaPay **ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සේවාව** - දැන් අපගේ ගනුදෙනුකරුවන් හට දිවයින පුරා පිහිටි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4000 කට අධික සංඛ්‍යාවකදී සිය මුදල් ආපසු ලබාගත හැකි වන අතර මේ වන විට ටෙලර් කාඩ්පත් 200,000 ක් පමණ නිකුත් කොට ඇත.
- **පොදු විද්‍යුත් අරමුදල් මාරු කිරීමේ** (CEFT) **ක්‍රමය** - අපගේ ගනුදෙනුකරුවන් හට අන්තර් බැංකු මුදල් හුවමාරු සේවාවන් සැපයේ.
- **මුදල් තැන්පතු යන්ත්‍ර** - තෝරාගත් ශාඛා වල පවතී.

මූල්‍යමය වැදගත් සිදුවීම්

	2019 රු.'000	2018 රු.'000	වෙනස %
වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵල			
දළ ආදායම	**27,507,821**	26,070,611	6
එකතු කල අගය මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය	**2,960,258**	3,606,330	-18
බදුකරණය	**2,461,663**	2,532,744	-3
බදු වලට පසු ලාභය	**498,595**	1,073,586	-54
කොටස් හිමිකරුවන් වෙත ආරෝපණය කල යුතු ලාභය	**418,126**	993,559	-58
වත්කම් සහ වගකීම්			
ගනුදෙනුකාර තැන්පතු	**149,599,829**	141,559,974	6
ණය සහ ලැබිය යුතු දෑ	**144,693,551**	137,769,683	5
මුළු වත්කම්	**199,978,929**	176,937,319	13
මුළු වගකීම්	**185,013,608**	162,227,205	14
කොටස් හිමිකරුවන්ගේ අරමුදල	**14,965,322**	14,710,115	2
ලාභදායීත්වය			
වත්කම් මත ඉපයීම (මෙහෙයුම් ලාභය)	**1.6%**	2.1%	
ස්කන්ධ මත ඉපයීම	**3.4%**	10.7%	
අක්‍රිය ණය අනුපාතය	**9.6%**	5.4%	

නියාමන අනුපාතයන්

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (බාසල් III අනුව)	2019 %	අවම අවශ්‍යතාවය %	2018 %	අවම අවශ්‍යතාවය %
පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය	**10.90**	**7.00**	11.58	7.00
මුළු ස්ථර 1 ප්‍රාග්ධන අනුපාතය	**10.90**	**8.50**	11.58	8.50
මුළු ප්‍රාග්ධන අනුපාතය	**16.27**	**12.50**	13.61	12.50
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය	**32.38**	**20.00**	24.27	20.00



දළ ආදායම (රු.මිලියන)



බදු පෙර මෙහෙයුම් ලාභය (රු.මිලියන)



බදු පසු ලාභය (රු.මිලියන)



ගනුදෙනුකාර තැන්පතු (රු.මිලියන)



ණය සහ ලැබිය යුතු දෑ (රු.මිලියන)



කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධය (රු.මිලියන)

සභාපතිවරයාගේ පණිවුඩය



"රජයේ 'සෞභාග්‍යයේ දැක්ම' යන දර්ශනය හා මෙහෙවර අනුව යමින්, අප බැංකුව විසින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ග්‍රාමීය කෘෂි ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීම සඳහා දායකත්වය සැපයෙනු ඇත."

2020 ජනවාරි 1 වැනි දින සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති ධුරයෙහි ගෞරවනීය වූ වගකීම දරමින්, මෙසේ වසර 2019 සඳහා වන බැංකුවේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. අපගේ ජයග්‍රහනයන් ඇගයීමේ අරමුණින් යුතුව පසුගිය වසරෙහි කාර්යසාධනය පිළිබඳව විමසා බලන අතරතුර, වසර 2020 දී අප හට සිදු කළ හැකි වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමුකිරීම සඳහා මෙය අවස්ථාවක් කොට ගැනීම කාලෝචිත බව මාගේ හැඟීමයි.

සෑමකල්හිම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන අරමුණ වූයේ අඩු ආදායම්ලාභී පාර්ශ්වයන් හට මූල්‍යමය පහසුකම් සළසමින් ඔවුන් සවිබලගැන්වීම සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් වෙත මෙන්ම ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය වෙතද අවැසි සෙසු සහයෝගය ලබාදෙමින් මෙරට ආර්ථික සංවර්ධනය කෙරෙහි කැපී පෙනෙන අයුරින් දායක වීමයි.

ගතවූ වසර පිළිබඳව ආපසු හැරී බැලීමේදී, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කරගැනීම හා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය පහසුකමක් හිමිවීම සැළකිය යුතු විශේෂතා වශයෙන් දැක්විය හැකි වේ. 2019 අප්‍රියෙල් මස සම්පූර්ණ කරන ලද, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කරගැනීම, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හට බාසල් 111 යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිර්දේශිත කඩඉම් සීමාව ඉක්මවා යමින්, ස්ථර 1 (Tier I) ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සවිමත් කරගැනීම කෙරෙහි ඉවහල් විය.

අනපේක්ෂිත පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව උද්ගත වූ අහිතකර දේශපාලනික වාතාවරණය හමුවේ සියළු බැංකු කටයුතු දැඩි ලෙස අඩාල වුනු පසුගිය වසර, මෙරට මෑත කාලීන ඉතිහාසයේ අඳුරුතම කාලසමයක් සනිටුහන් කලේය. මෙම අවාසනාවන්ත තත්ත්වයන්හි ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයේ හා සෙසු ආශ්‍රිත කර්මාන්තයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත සංවර්ධන මාර්ග විවර කරදීම සඳහා අප සතුව පැවති අවස්ථාව, අපේක්ෂිත මට්ටමින් සාක්ෂාත් කරගැනීමට නොහැකි විය.

සිදුවූ හානි සහ බැංකුකරණය තුළ තිරසාර සංවර්ධනයක් අත්පත් කරගැනීමෙහිලා අනාගතයේදී ගත හැකි පියවර පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් මේ වන විට සාකච්ඡාවට භාජනය කෙරෙමින් සැකසෙමින් පවතී. මෙහිදී තාක්ෂණය, යටිතල පහසුකම්, සේවක පුහුණු හා දිරිගැන්වීමේ වැඩසටහන් වැඩිදියුණු කිරීම සහ විනිවිදභාවය ඉහළ නැංවීම කෙරෙහි ප්‍රමුඛතාවය හිමි වනු ඇත.

රජයේ 'සෞභාග්‍යයේ දැක්ම' යන දර්ශනය හා මෙහෙවර අනුව යමින්, අප බැංකුව විසින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ග්‍රාමීය කෘෂි ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීම සඳහා දායකත්වය සැපයෙනු ඇත. නව රජයක් යටතේ උදා වූ නව යුගයක් තුළ අප හට අපගේ ව්‍යාපාරික කටයුතු ඵලදායී අයුරින් යළි අර්ථගන්වමින් බැංකුවේ අග්‍රගන්‍ය අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ස්වර්ණමය අවස්ථාවක් උදාවී ඇත. වසර 2020 සිට ඉදිරියට ඇදී එන මෙම ආයතනික චාරිකාවේදී, අපගේ සැලසුම වනුයේ නව ව්‍යාපාරික ආකෘතියක් සමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය වෙත සේවා සම්පාදනය සඳහා බැංකුව නිසි පරිදි ප්‍රතිස්ථානගත කිරීමයි. මෙකී ප්‍රතිසැකසුම්ගත ව්‍යාපාරික ක්‍රමෝපාය, දැනට පවතින හා අපේක්ෂිත ආර්ථික සහ සෙසු අභියෝග යන්ට සාර්ථකව මුහුණදීම සඳහා ප්‍රමාණවත් සවිබලයකින් යුක්ත වනු ඇත.

මා හට ඒත්තු ගැන්වුනු සහ මා විශ්වාස කරන පරිදි සියළුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගයෙන් යුතුව නව ව්‍යාපාරික සැලසුම් ක්‍රියාවට නැංවීමත් සමගම, බැංකුව මුහුණදෙන අභියෝග ජයගැනීම සඳහා අප හට නව ජවයක් හිමිවනු නොඅනුමානය. ස්ථාවර දේශපාලනික වාතාවරණයක් හමුවේ, මාගේ අභිලාෂය වනුයේ අපගේ බැංකුව බැංකුකරණ සේවාවන් අතර උසස්ම ස්ථානය කරා රැගෙන යාමයි.

අවසාන වශයෙන්, අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, ඔවුන් විසින් අප බැංකුව කෙරෙහි විදහා දක්වන ලද අචල විශ්වාසය උදෙසා මිලියන සංඛ්‍යාත අපගේ ගනුදෙනුකරුවන් හා සෙසු පාර්ශ්වකරුවන් වෙත මාගේ ප්‍රණාමය හිමි වේ. එමෙන්ම, පැවති අස්ථාවර වූ ආර්ථික වාතාවරණය හමුවේ බැංකුවේ සුරක්ෂිතභාවය උදෙසා කැපවීමෙන් යුතුව කටයුතු කල කළමනාකරණ කාර්ය මණ්ඩලය ඇතුළු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සමස්ත සේවක පිරිස වෙත මාගේ කෘතඥතාවය පළ කරනු කැමැත්තෙමි. අප නව යුගයක් තුළ නව වසරක් වෙත පියනගන මේ අවස්ථාවේදී, අපගේ එළඹෙන වසර වලදී සියළු අභියෝගයන් ජයගනිමින් විශිෂ්ටතවයෙන් යුතුව ඉදිරිය කරා ගමන් කරනු ඇති බව මාගේ ඒකායන විශ්වාසයයි.



මහින්ද සාලිය
සභාපති

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය



"අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවක් හමුවේ වුවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සිය වත්කම් පදනම 2018 දී පැවති රු. බිලියන 176.94 සිට 2019 දී රු.බිලියන 199.98 දක්වා ඉහළ නංවමින් 13% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කල අතර එහිදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් පවත්වා ගනිමින් ශක්තිමත් ශේෂ පත්‍ර කාර්යසාධනයක් පිළිබිඹු කලේය. වසර 2019 දී, අප විසින් රු.බිලියන 144.69 ක් දක්වා ණය කළඹෙහි 5.03% ක සහ රු. බිලියන 149.6 ක් දක්වා තැන්පතු කළඹෙහි 5.68% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කරන ලදී."

RDB යන නමින් පොදුවේ හඳුන්වනු ලබන, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, වසර 34 ක දීර්ඝ ඉතිහාසයක් සහිත ප්‍රාදේශීය මට්ටමේ බැංකුවක් වශයෙන් පැවති තැන් පටන්, ජාතික මට්ටමේ බැංකුවක් බවට පත්ව අති සාර්ථක වසර 9 ක් සම්පූර්ණ කලේය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් අඛණ්ඩව දෙවන වසරේදීත් මවිසින් බැංකුවේ 2019 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය නිකුත් කරනු ලබන්නේ ඉමහත් වූ අභිමානයෙනි.

2019 වසරේදී, පසුගිය වසර කිහිපය පුරා දිගින් දිගටම පැවති, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ගැටළුව සම්බන්ධ ක්‍රමෝපායික අවධානය හා ක්‍රියාකාරී සැලසුම සකසා ගනිමින්, බැංකුවේ අනාගත වර්ධනය සම්බන්ධ විශ්වාසයේ පදනම ස්ථාපනය කරගත හැකි වීම සතුටට කරුණකි. කෙසේවුවද, වසර 2019 දී, අක්‍රිය අත්තිකාරම් වල ඉහළයාමක් අත්විඳීමට සිදුවිය. මාගේ දැක්ම වනුයේ, සාර්ථකත්වය මනිනු ලබන්නා වූ අපගේ මිනුම්දණ්ඩ මගින් මූල්‍යකරණය සිදුකරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව, ණය පරිමාව සහ අක්‍රීය වත්කම් කළඹ ආදිය කෙරෙහි පමණක් අවධානය යොමු නොකොට, රාජ්‍ය හිමිකාරීත්වය සහිත සංවර්ධන බැංකුවක් වශයෙන්, මෙරට අප විසින් සහකාරත්වය දක්වනු ලබන ව්‍යාපෘතීන් සහයෝගය පිරිනමන ආර්ථික ක්ෂේත්‍රයන් පිළිබඳව මෙන්ම රජය විසින් එය ස්ථාපනය කරන ලද අරමුණු සපුරාගැනීම සඳහා බැංකුව විසින් දක්වන ලද දායකත්වය වැනි කරුණු ද සැළකිල්ලට ගැනීම වැදගත් බවයි.

ප්‍රකාශිත සංඛ්‍යාලේඛණ අනුව, වසර 2019 දී ගෝලීය ආර්ථික වර්ධනය, 2018 දී පැවති 3.6% සිට 2.9% දක්වා පහත වැටිණි. එය 2019 දී ශ්‍රී ලංකා ආර්ථිකයේ මන්දගාමී වර්ධනය කෙරෙහි හේතු වූ බවට සැළකේ. තවද, මෙරට ආර්ථික වර්ධනය ප්‍රබල වශයෙන් අඩාල කරමින් සංචාරක කර්මාන්තය කෙරෙහි අහිතකර අයුරින් බලපෑ පාස්කු ඉරිදා ප්‍රහාරයද මේ සඳහා හේතු පාදක විය. මේ අයුරින් සංචාරක කර්මාන්තය අඩාල වීමත් සමග එහි විසිරුනු බලපෑම ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගනුදෙනුකරුවන්ගෙන් සැළකිය යුතු පිරිසක් නිරතව සිටින්නා වූ එම ක්ෂේත්‍රය ආශ්‍රිත සැපයුම් දාමයන් කෙරෙහි ඇති විය.

වසර 2019 දී බැංකුකරණ ක්ෂේත්‍රයද තැන්පතු අනුපාතික සීමාවක් හඳුන්වාදෙන ලද වටපිටාවක් තුළ මෙහෙයුම් සිදුකරන ලද අතර පසුව එය ණය ලබාදීමේ අනුපාතික සීමාවක් මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි. බැංකුවේ ප්‍රධාන ආදායම් මාර්ගය පොලී ආදායම බැවින් එයද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි මන්දගාමී වර්ධනය කෙරෙහි හේතු වූ තවත් සාධකයක් වශයෙන් සැළකිය හැකි වේ.

2019 අප්‍රියෙල් මස, අදාළ ක්‍රියාකාරකම් අනුකූලනය කරමින් නියාමන අධිකාරිය වන ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිර්දේශිත පූර්ණ අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සපුරාලමින්, අත්පත් කරගන්නා ලද ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ මෙහෙයුම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යටතට පත් කෙරිණි.

2019 ජූනි මාසයේදී ආසියානු සංවර්ධන බැංකුව වෙතින් සාකච්ඡා කරන ලද ඇ.ඩො. මිලියන 50.0 ක ණය සම්බන්ධ ණය ගිවිසුම ද අත්සන් තබන ලදී. තවද, 2019 වසර අවසානය වන විට, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ඇ.ඩො. ණය පහසුකම වෙතින් ඇ.ඩො. මිලියන 25.0 ක වටිනාකමකින් යුතු අරමුදල් ලබාගෙන තිබිණි. ආසියානු සංවර්ධන බැංකුව මගින්, ඇ.ඩො. මිලියන 1.0 ක තාක්ෂණික සහාය ආධාර යටතේ, දේශීය හා විදේශීය උපදේශකවරුන්ගේ සහභාගීත්වයෙන් යුතුව බැංකුව වෙත තාක්ෂණික සහයෝගය පිරිනැමීමද අරඹන ලදී.

වසර 2019 සඳහා වන තවත් සැළකිය යුතු වර්ධනයක් වශයෙන්, බැංකුව මගින් සිය බැංකුකරණ පද්ධතිය අධිශ්‍රේණිගත කිරීම උදෙසා වන යටිතල පහසුකම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමද දැක්විය හැක.

බැංකුව මගින් 2019 දී තරඟකාරී අවම පොලී අනුපාතිකයක් යටතේ වෙළඳපොල වෙත RDB කල්බදු හඳුන්වාදෙන ලදී. මෙය සිදුකල හැකි වූයේ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කරගැනීමත් සමගය. වසර 2019 දී කාන්තා ව්‍යවසායිකාවන්ගේ ඉතුරුම් පුරුදු ප්‍රවර්ධනය කරවීම උදෙසා 'RDB ලිය සවිය ප්ලස්' නමින් විශේෂයෙන් නිර්මාණය කරන ලද ආයෝජන ඉතුරුම් ගිණුමක් එළිදක්වන ලදී.

ජනාධිපතිවරණයෙන් අනතුරුව නව රජය මගින් 2019 දෙසැම්බර් මාසයේදී, කෙටි හා මධ්‍ය කාලීන ආර්ථික වර්ධනය ඉලක්ක කරගනිමින්, එකතු කළ අගය මත බදු 15% සිට 8% දක්වා පහත හෙළීම, වාර්ෂික එකතු කළ අගය මත බදු ලියාපදිංචි වීමේ කඩඉම් මට්ටම ඉහළ නැංවීම, සිවිල් සේවකයින් අළුතින් සේවයේ යෙදවීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ණය සහන ඇතුළු බදු කප්පාදු රැසක් සිදුකරමින් වර්ධන උත්තේජන පැකේජයක් ඉදිරිපත් කරන ලදී. කෙසේවුවද, කෝවිඩ් 19 වසංගතය පැතිරීමත් සමග උද්ගත වූ ජාත්‍යන්තර හා දේශීය ආර්ථික අවගමනකාරී තත්ත්වය හමුවේ අපේක්ෂිත මධ්‍ය කාලීන වර්ධනය ඒ අයුරින්ම සපුරාගැනීමට නොහැකි විය.

අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවක් හමුවේ වුවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සිය වත්කම් පදනම 2018 දී පැවති රු. බිලියන 176.94 සිට 2019 දී රු.බිලියන 199.98 දක්වා ඉහළ නංවමින් 13% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කල අතර එහිදී ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් පවත්වා ගනිමින් ශක්තිමත් ශේෂ පත්‍ර කාර්යසාධනයක් පිළිබිඹු කලේය. වසර 2019 දී, අප විසින් රු.බිලියන 144.69 ක් දක්වා ණය කළඹෙහි 5.03% ක සහ රු. බිලියන 149.6 ක් දක්වා තැන්පතු කළඹෙහි 5.68% ක වසරින් වසර වර්ධනයක් වාර්තා කරන ලදී.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

2019 දී බැංකුවේ පොලී අනුපාත ආදායම රු. බිලියන 12.45 ක් දක්වා 4.6.% කින් වර්ධනය වූ අතර මෙහෙයුම් ලාභය (රු.බිලියන 2.96) සහ බදු වලට පසු ලාභය (රු.මිලියන 498.59) පිළිවෙලින් 17.91% ක සහ 53.56% ක පහළ යාමක් වාර්තා කලේය. මේ සඳහා ප්‍රධාන හේතු සාධකයන් වූයේ පිළිවෙලින් රු.බිලියන 7.96 ක් හා රු.බිලියන 2.41 ක් වූ ඉහළ යමින් පැවති මෙහෙයුම් වියදම් සහ හානිකරණ ගාස්තු වේ. අක්‍රීය වත්කම් කළඹෙහි (රු.බිලියන 13.71) කැපී පෙනෙන ඉහළයාම (89%) හේතුවෙන් 2019 දී හානිකරණ ගාස්තු 2018 ට සාපේක්ෂව 71% කින් ඉහළ නැංවිනි. අක්‍රීය වත්කම් කළඹෙහි ඉහළයාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දිවයිනේ පහළ ආර්ථික වර්ධනය, පාස්කු ඉරිදා ප්‍රහාරය මෙන්ම 2017 දී බැංකුවේ ඉහළ ණය වර්ධන අනුපාතය කෙරෙහි හේතු වූ සාපේක්ෂව පහළ ණය ගුණාත්මකභාවය ඉවහල් විය. වසර 2018 හිදී වාර්තා වූ 5.4% ට සාපේක්ෂව 2019 දී බැංකුවේ අක්‍රීය වත්කම් අනුපාතය 9.63% ක් වශයෙන් දක්විනි.

කෝවිඩ් 19 වසංගතය ගෝලීය වශයෙන් මැඩපැවත්වීමට අපොහොසත් වුවහොත්, විශේෂයන්ම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සේවා සැලසෙන්නා වූ ක්ෂේත්‍රයන්හි සැබෑ ආර්ථික ප්‍රතිසාධනය සිදුවීම 2021 මැදභාගයේදී පමණ සිදුවෙතැයි අපේක්ෂා කළ හැක. කෙසේවුවද, කෝවිඩ් 19 වසංගතය පැතිරයාමත් සමග, රාජ්‍ය අනුග්‍රහය සහිතව විශේෂයෙන්ම අගය එකතු කල කෘෂිකර්මය මත පදනම් වූ නිෂ්පාදන හා සේවාවන්හි වර්ධනයත් සමගින් පෙර පැවති ප්‍රමුඛ ග්‍රාමීය කේන්ද්‍රීය ආර්ථික තත්ත්වයන් කෙරෙහි යළි පරිවර්තනය වීමේ ලකුණු දක්නට ලැබේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අපගේ විශ්වාසය අනුව, අප විසින් අක්‍රීය වත්කම් කළඹ වර්ධනය පාලනය කරගනිමින් මෙම තත්ත්වය තුළ ප්‍රතිස්ථානගත වුවහොත්, ඉදිරි වසර කිහිපය තුළ එය බැංකුව කෙරෙහි හිතකර අයුරින් බලපානු ඇත.

අභියෝගාත්මක වූ 2019 වසරේදී ප්‍රකාශිත බැංකුවේ මිශ්‍රිත ප්‍රතිඵල අත්පත් කරගනු ලැබුවේ කළමනාකාරීත්වය විසින් සකසා ක්‍රියාවට නංවන ලද කාලෝචිත වූ සැලසුම් හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ අප්‍රතිහත ධෛර්ය්‍ය නිසාවෙනි.

අප හට වසර 2020 විශේෂයෙන්ම කෝවිඩ් 19 වසංගතය පැතිරයාම හමුවේ, වත්කම් තත්ත්වය දුර්වල වෙමින් පවතින සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් හානිකරණ ගාස්තු ඉහළ නැංවෙන වසරක් වශයෙන් පුරෝකථනය කළ හැකි වේ. මෙහිදී අපගේ ගනුදෙනුකරුවන් වෙත ඇති වූ අහිතකර බලපෑම අති විශාල වන අතර විලම්බන කාලසීමාවේදී ගනුදෙනුකරුවන්ගේ 62% ක් පමණ සහන ඉල්ලා සිටීමෙන් මේ බව තහවුරු වේ. කෙසේවුවද, රාජ්‍ය හිමිකාරීත්වය සහිත සංවර්ධන බැංකුවක සේවා කණ්ඩායමක් වශයෙන්, අප ඉදිරියේ ඇති අභියෝග සුබවාදී ආකාරයෙන් ජයගනිමින්, බැංකුවේ ඉලක්ක සාක්ෂාත් කරගනු ලබන අතරතුර අපගේ ගනුදෙනුකාර පදනම වෙත ඵලදායී වූද කාර්යක්ෂම වූද සේවාවක් සැලසීම අපගේ අපේක්ෂාව වේ.

අවසාන වශයෙන්, අප හා අබණ්ඩව රැඳීසිටීම උදෙසා හිතෛෂී ගනුදෙනුකරුවන් වෙතද, සිය උපදේශනය හා දිරිමත් කිරීම් වෙනුවෙන් හිටපු හා වර්තමාන සභාපතිවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද මාගේ ප්‍රණාමය පුද කෙරේ. වසර 2019 දී බැංකුවේ කාර්යසාධනය යතාර්ථයක් බවට පත්කරගැනීමෙහිලා දායක වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මාගේ කෘතඥතාවය පළ කෙරේ. වසර 2019 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත දක්වන ලද නොමසුරු සහයෝගය වෙනුවෙන් බැංකුවේ කොටස්හිමිකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්, මුදල් අමාත්‍යාංශය සහ සෙසු රාජ්‍ය ආයතනයන් වෙත මාගේ ගෞරවනීය ස්තුතිය මෙයින් පුද කෙරේ.

ටී. කුහන්
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

නියමුන්වය

14 අධ්‍යක්ෂ මණ්ඩලය
18 ආයතනික කළමනාකරණ කණ්ඩායම
20 ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්/
ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්
22 සහකාර සාමාන්‍යාධිකාරීවරුන්/අංශ ප්‍රධානීන්

අධ්‍යක්ෂ මණ්ඩලය



මහින්ද සාලිය මහතා
සභාපති

එම්.ඒ.බී. සිල්වා මහතා
අධ්‍යක්ෂ

කේ.බී. විජයරත්න මහතා
අධ්‍යක්ෂ

ඒ.කේ. සෙනෙවිරත්න මහතා
අධ්‍යක්ෂ

ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ



එම්.එස්.ඩී. රණසිරි මහතා
අධ්‍යක්ෂ

මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආර්යරත්න හේරත්
අධ්‍යක්ෂ

ආචාර්ය නිර්මාල් ද සිල්වා
අධ්‍යක්ෂ

ලලිත් අබේසිරිවර්ධන මහතා
අධ්‍යක්ෂ

කේ.ඊ.ඩී. සුමනසිරි මහතා
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය

මහින්ද සාලිය මහතා

සභාපති

මහින්ද සාලිය මහතා කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධරයෙකි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යාලේඛණ සම්බන්ධ මනා පළපුරුද්දක් සහිත හෙතෙම වාර්ෂික රාජ්‍ය අයවැය ලේඛණය සකස් කිරීම සඳහාද දායක වේ.

රාජ්‍ය සේවයේ වසර 34 ක සේවා කාලයක් සපුරාලන්නා වූ ඒ මහතා එම කාලසීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ සහ ප්‍රාදේශීය කළමනාකාර යන ධූරයන් හෙබවීය. හෙතෙම මහා භාණ්ඩාගාර රාජ්‍ය ගිණුම් අංශයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ, අයවැය අධ්‍යක්ෂ සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද කටයුතු කලේය. රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරන ලද ඒ මහතා මහ භාණ්ඩාගාර නියෝජිතයකු වශයෙන් ද කටයුතු කොට ඇත.

රජරට සංවර්ධන බැංකුව, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ආරක්ෂක සේවා අණදෙන සහ මාණ්ඩලික විද්‍යාලය, රක්නා ලංකා ආරක්ෂක සමාගම, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව, ටවර් හෝල් රගහල පදනම සහ සෙලසිනෙ රූපවාහිනී ආයතනය සාලිය මහතා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය උසුලන ලද රාජ්‍ය ආයතනයන්ගෙන් සමහරකි.

එම්. ඒ. බී. සිල්වා මහතා

අධ්‍යක්ෂ (2020 මාර්තු 4 දක්වා)

සිල්වා මහතා මහජන බැංකුවේ බැංකු මෙහෙයුම් සම්බන්ධ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වේ.

වසර 1987 දී බැංකුවේ සේවයට බැඳුනු ඒ මහතා සතුව 31 වසරක හසළ අත්දැකීම් සමගින් බැංකු මෙහෙයුම් කටයුතු පිළිබඳ හසල දැනුමක් පවතී.

බැංකුකරණ මෙහෙයුම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් සිල්වා මහතා විසින්, වෙන් වෙන්වූ ප්‍රධානීන් විසින් වගකීම් දරනු ලබන්නා වූ ශාඛා ජාලයෙහි නියාමන ඒකකය වන චැනල කළමනාකරණ කොට්ඨාශයෙහි ක්‍රියාකාරකම් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර හා කියොස්ක්ස්, අලෙවි, තොරතුරු තාක්ෂණ සහ මහජන බැංකුවේ සහායක සේවා ඒකකයෙන් සමන්විත වන අනුශාංගික සේවා ජාලයෙහි කටයුතු ද අධීක්ෂණය කරනු ලබයි.

පේරාදෙණිය සරසවියේ ශාස්ත්‍රවේදී උපාධිධරයකු වන සිල්වා මහතා AIB ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ සුදුසුකම් ලද්දෙකි. පුළුල් පරාසයක පැතිරුනු දෙස් විදෙස් පුහුණු සැසි රැසකට සහභාගී වුනු හෙතෙම ස්වකීය විෂය පථය පිළිබඳ ප්‍රාමාණික වෘත්තීයවේදියෙකි. ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි සහයෝගීතා සාමාජිකයකු ද වේ.

කේ. බී. විජේරත්න මහතා

අධ්‍යක්ෂ

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් කිත්සිරි බී විජේරත්න මහතා විසින් මූල්‍ය හා සැලසුම්කරණ, පර්යේෂණ හා සංවර්ධන, විශ්‍රාම පාරිතෝෂික හා භාණ්ඩාගාර පශ්චාත් කාර්යාල යන ක්ෂේත්‍රයන් අධීක්ෂණය කරනු ලබයි. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විගණන හා මූල්‍ය සේවා සම්බන්ධ වසර 35කට අධික පළපුරුද්දක් සහිත ඒ මහතා, රක්ෂණ හා බැංකුකරණ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ පෙලේ මූල්‍ය ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු රැසක් හොබවනු ලැබ ඇත.

හෙතෙම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි හා ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකාර ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි අධිසාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ තාක්ෂණඥයින්ගේ සංගමයෙහි ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු, ශ්‍රී ලංකා බැංකුකරණ ආයතනයෙහි අධිසාමාන්‍ය සාමාජිකයකු සහ වෘත්තික සංගම් සංවිධානයෙහි සාමාජිකයකු ද වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී දෙවන පංතියේ ගෞරව උපාධිධරයකු වන විජේරත්න මහතා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි රාජ්‍ය මූල්‍ය හා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාලාභියෙකි.

ඒ. කේ. සෙනෙවිරත්න මහතා

අධ්‍යක්ෂ

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණි නිලධාරියෙකි. හෙතෙම කැළණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධරයෙකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියකු වන ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

සෙනෙවිරත්න මහතා වසර 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් විය. සේවාස්ථ පුහුණුව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හෙතෙම 1996 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ප්‍රතිපත්ති අංශයෙහි සහකාර අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කෙරිණි. වසර 2006 දී ඒ මහතා එම අමාත්‍යාංශයෙහිම ජාතික අයවැය අංශය වෙත අනුයුක්ත කෙරිණි. 2015 දී හෙතෙම ෆිස්කල් ප්‍රතිපත්ති අංශයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කෙරිණි. 2018 පෙබරවාරි මස මහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ධූරයට පත් කරනු ලබන තෙක් ඒ මහතා 2018 ජනවාරි මස සිට ජාතික අයවැය අංශයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් කටයුතු කලේය. සෙනෙවිරත්න මහතා රාජ්‍ය ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ධූරය හොබවා ඇත.

ඩබ්. එම්. කරුණාරත්න මහතා

අධ්‍යක්ෂ

ඩබ්. එම්. කරුණාරත්න මහතා 2020.01.03. දින ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයකු වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයකු වන කරුණාරත්න මහතා බැංකුකරණ ක්ෂේත්‍රයේ වසර 30 කට අධික හසළ අත්දැකීම් සහිත වෘත්තිකයෙකි. හෙතෙම ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ''ගබඩා ලැබීම් මූල්‍යකරණ ව්‍යාපෘතියෙහි'' මුදල් අමාත්‍යාංශ උපදේශකවරයකු වශයෙන් කටයුතු කලේය. ඒ මහතා අනුරාධපුර - ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ සභාපති/ප්‍ර.විධි.නි. වශයෙන් සහ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් කටයුතු කලේය.

හෙතෙම දිළිඳු ජන කොටස් සමග බැංකුකරණය (සමූහ ණය ලබාදීම) අළලා ග්‍රන්ථ දෙකක් සහ දරිද්‍රතා ණය ලබාදීම, සුළු හා මධ්‍ය පරිමාණ මූල්‍යකරණය, වාරිකර්මාන්ත සංවර්ධනය, ගෘහ උද්‍යාන පාලනය, පශු සම්පත් සංවර්ධනය, මූල්‍යමය සාක්ෂරතාවය සහ ගබඩා ලැබීම් මූල්‍යකරණය සම්බන්ධ ග්‍රන්ථ හයක් සම්පාදනය කොට ඇත.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව සම්බන්ධ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිධරයකු වන කරුණාරත්න මහතා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීති (ගෞරව) උපාධිධරයෙකි. තවද, හෙතෙම වසර 2002 සිට නීතිඥයකු වශයෙන් ද කටයුතු කරයි.

එම්. එස්. ඩී. රණසිරි මහතා

අධ්‍යක්ෂ

2020 01 03 දින රණසිරි මහතා ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයකු වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරිණි. ඒ මහතා මුදල් අමාත්‍යාංශයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් අංශයෙහි හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

කොළඹ විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධරයකු වන ඒ මහතා සතුව රාජ්‍ය අංශයේ වසර 30 කට අධික අත්දැකීම් සම්භාරයක් පවතී. හෙතෙම රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මහා භාණ්ඩාගාර නියෝජිතයකු වශයෙන්ද කටයුතු කොට ඇත.

මහාචාර්ය එච් එම් ඩබ්ලිව් ආරියරත්න හේරත්

අධ්‍යක්ෂ

මහාචාර්ය ආරියරත්න හේරත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිධරයකු හා ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිධරයෙකි. හෙතෙම ජීවන විද්‍යාවන් පිළිබඳ තෝරිවිජයානු සරසවියේ සංවර්ධන හා සම්පත් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියකින් සහ පේරාදෙණිය සරසවියේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් ආචාර්ය උපාධියෙන් පිදුම් ලබා ඇත. මහාචාර්ය හේරත් සංවර්ධන ආර්ථික විද්‍යාව, මුදල් හා බැංකුකරණ, ව්‍යාපෘති සමාලෝචනය, ක්ෂුද්‍ර මූල්‍ය හා දිළිඳුබව විමර්ශනය පිළිබඳ ප්‍රකට විද්වතෙකු සහ පර්යේෂකයකු වේ.

හෙතෙම වසර 26 ක පමණ කාලයක් කථිකාචාර්යවරයකු, ජ්‍යෙෂ්ට කථිකාචාර්යවරයකු සහ මහාචාර්යවරයකු වශයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සේවය කලේය. මෙම කාලසීමාව අතරතුර ඒ මහතා පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයෙහි අධ්‍යක්ෂවරයකු (අධ්‍යයන හා සංවර්ධන) වශයෙන් ද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු වශයෙන් ද කටයුතු කලේය.

මහාචාර්ය ආරියරත්න හේරත් විසින් කොළඹ පාත්ෆයින්ඩර් පදනම, ප්ලෑන් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා, අයිඑෆ්ඒඩ්, තැපැල් විදුලි සංදේශ හා උඩරට සංවර්ධන අමාත්‍යාංශය, උතුරු මැද පළාත් සභාව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා යූඑන්ඩීපී සහ මධ්‍යම පළාත් සභාව ඇතුළු දේශීය හා ජාත්‍යන්තර ආයතන රැසක් වෙත උපදේශන සේවාවන් ලබාදෙමින් වාර්තාවන් බොහොමයක් සකසනු ලැබ ඇත.

ඒ මහතා විසින් විවිධ ක්ෂේත්‍රයන් අළලා ලියැවුනු අධ්‍යයනශීලී ග්‍රන්ථ කිහිපයක්ම ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. ප්‍රතිපත්ති හා ව්‍යාපෘති සැලසුම්කරණය සහ ඇගයීම, න්‍යාය හා භාවිතය, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ ප්‍රතිචාරාත්මක අයවැය ක්‍රියාවලිය ඉන් සමහරකි. මහාචාර්ය හේරත් විසින් විවිධ වූ ජාතික හා ජාත්‍යන්තර ලේඛණයන් වෙත පර්යේෂණ ලිපි රැසක් සපයනු ලැබ ඇත.

ආචාර්ය නිර්මාල් ද සිල්වා

අධ්‍යක්ෂ

ආචාර්ය නිර්මාල් ද සිල්වා බොහෝ බහුජාතික සමාගම් සහ ෆෝචූන් 500 සමාගම් වෙත මගපෙන්වීම සිදුකරන ලද, දශක දෙකකට ආසන්න කලක් ලොව පුරා 'සී මට්ටමේ' අත්දැකීම් බහුල සම්මානනීය ව්‍යාපාරික වෘත්තිකයකු සහ ව්‍යවසායකයකු වේ. පසුගිය වසර කිහිපයක කාලය තුළ බෙහෙවින්ම ඔහුගේ අවධානය යොමු වූයේ දේපළ වෙළඳාම්, ක්‍රමෝපායික උපදේශනය හා නව ව්‍යාපාර ඇරඹුම කෙරෙහිය.

ආචාර්ය නිර්මාල් ද සිල්වා මේ වන විට පැරමවුන්ට් රියැලිටි සමාගමෙහි සම නිර්මාතෘ/ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් කටයුතු කරයි. හෙතෙම ක්‍රමෝපාය, නායකත්වය, සාධනීය ආයෝජනය, ක්‍රමෝපායික බලතුලනය හා පරිවර්තනීය මැදිහත්වීම් (විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා) සහ සමාජ ව්‍යවසායයන් කෙරෙහි අවධානය යොමු කෙරෙන්නාවූ උපදේශන ආයතනයක් වන ටයිනා කන්සල්ටන්සි හිද නිර්මාතෘවරයා වේ. එයට අමතරව ආචාර්ය ද සිල්වා කෘෂිකර්මය, ආහාර පාන, තාක්ෂණය, අත්කම්, අධ්‍යාපනය, අධ්‍යයනය හා සංවර්ධනය, පහසුකම් කළමනාකරණය, කළඹ ආයෝජන, වෘත්තීයමය සේවා, ඩිජිටල් රසවින්දන මාධ්‍ය, පාරිභෝගික භාණ්ඩ සහ ජීවන රටාව ආශ්‍රිත සේවාවන් වැනි විවිධ වූ පරාසයක පැතිරුනු සමාගම් රැසක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි.

හෙතෙම ගෞරවනීය වූ චින්තන නියමුවකු පමණක් නොව ව්‍යාපාර ඇරඹුම් උපදේශකයකු සාධනීය ආයෝජකයකු සහ මහජන දේශකයකු වශයෙන් ද කීර්තියට පත්ව සිටී.

අධ්‍යයන වටපිටාව තුළ ආචාර්ය ද සිල්වා දේශීය හා ජාත්‍යන්තර විශ්ව විද්‍යාල රැසක ආශ්‍රිත මහාචාර්යවරයකු, බාහිර කථිකාචාර්යවරයකු සහ ආචාර්ය උපාධි මට්ටමේ වැඩසටහන් සඳහා නිබන්ධන සමීක්ෂකයකු වශයෙන් කටයුතු කරයි.

පහත දැක්වෙන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ආචාර්ය ද සිල්වා සතු වේ.

- ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධිය (මානව සම්පත් කළමනාකරණ විශේෂිත)
- ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය (ඕස්ට්‍රේලියාව)
- ව්‍යාපාර කළමනාකරණ උපාධිය (ඕස්ට්‍රේලියාව)
- සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී (ඕස්ට්‍රේලියාව)
- අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (එක්සත් රාජධානිය)
- ව්‍යාපෘති කළමනාකාර (ඇඑජ)
- ව්‍යාපාරික විධායකයින්ගේ සංගමයෙහි අධිසාමාජික (එක්සත් රාජධානිය)
- ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඇමරිකානු සංගමයෙහි අධිසාමාජික (ඇඑජ)
- වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමයෙහි අධිසාමාජික (ශ්‍රී ලංකාව)
- ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙහි යාවජීව සාමාජික

ලලිත් අබේසිරිවර්ධන මහතා

අධ්‍යක්ෂ

ලලිත් අබේසිරිවර්ධන මහතා 2020 01 03 වැනි දින ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයකු වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී. අබේසිරිවර්ධන මහතා වසර 1996 සිට වෘත්තියෙන් නීතිඥවරයකු වශයෙන් කටයුතු කරයි. කොළඹ විශ්ව විද්‍යායෙන් නීති උපාධිය හිමිකරගත් ඒ මහතා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සුදුසුකම් ලත් නීතිඥවරයෙකි.

මේ වන විට හෙතෙම ලීඩ් බිස්නස් ඩිවෙලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් සමාගමෙහි, ලීඩ් ෆුඩ්ස් සමාගමෙහි සහ ලීඩ් හාඩ්වෙයාර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගමෙහි අධ්‍යක්ෂ ධූරයන් හොබවයි.

කේ ඊ ඩී සුමනසිරි මහතා

අධ්‍යක්ෂ

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය හිමිකර ගැනීමෙන් අනතුරුව සුමනසිරි මහතා වසර 1990 දී ලංකා බැංකුවේ සේවයට එක් විය. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයකු වන ඒ මහතා ඇමරිකා එක්සත් ජනපදයේ හාවර්ඩ් සරසවියේ හාවර්ඩ් ව්‍යාපාර පාසල හිදී නායකත්ව පාඨමාලාවක් ද නිම කොට ඇත. 2013 අප්‍රියෙල් මස සිට හෙතම ලංකා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් පත් කෙරිණි.

සාමාන්‍ය බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍ය, ආයතනික මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයන්හි ඔහු සතු පුළුල් අත්දැකීම් සම්භාරය ඔස්සේ ඒ මහතා ලංකා බැංකු ශාඛා ජාලය තුළ කළමනාකාරීත්ව හා නායකත්ව වෘත්තික භූමිකාවන් රැසක් නිරූපනය කලේය. හෙතෙම ලංකා බැංකුවේ කළමනාකාර, ක්ෂේත්‍ර කළමනාකාර, මෙහෙයුම් කළමනාකාර සහ සහකාර සාමාන්‍යාධිකාරී යන ධූරයන් හෙබවිය.

කළමනාකාර (පුහුණු) වශයෙන් ලංකා බැංකු පුහුණු ආයතනයෙහි පීඨ සාමාජිකයකු වශයෙන් කටයුතු කරන ලබන අතරතුර හෙතෙම බැංකු කාර්ය මණ්ඩලයේ දැනුම ඉහළ නැංවීම සඳහා ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටු කලේය.

ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ පැවති දශක තුනක අර්බුධකාරී සමය නිමවීමත් සමග ලංකා බැංකුවේ උතුරු පළාතේ සහකාර සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් වැඩභාරගත් සුමනසිරි මහතා, එහි නැවත පදිංචි කරවන ලද ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් පළාතේ ආර්ථිකය යළි ගොඩනැංවීම සඳහා කැපී පෙනෙන අයුරින් දායක විය. උතුරු ප්‍රදේශයේ බෙදාහැරීමේ චැනල ව්‍යාප්ත කිරීම සඳහාද ඔහුගෙන් ඉටු වූ මෙහෙවර පැසසුම් කටයුතු වේ.

සාමාන්‍ය බැංකුකරණය හා ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධ ඔහුගේ විශේෂඥ දැනුම උතුරු පළාත තුළ ලංකා බැංකුව කැපී පෙනෙන තලයකට ඔසවා තැබීම සඳහා බෙහෙවින් ඉවහල් විය.

මේ වන විට ලංකා බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් කටයුතු කරන සුමනසිරි මහතා සීබැන්ක් හොලිඩේ හෝම්ස්, කොලදෙණිය ජල විදුලි සමාගම සහ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ - හොටෙල්ස් කළම්බු හි අධ්‍යක්ෂ ධූර කිහිපයක් හොබවයි.

ආයතනික කළමනාකරණ කණ්ඩායම



ටී. කුහන් මහතා
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

ව්‍යක්තීයමය බැංකුකරුවකු වන ටී. කුහන් මහතා 2011 වසරේ සැප්තැම්බර් මස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා සම්බන්ධ වූයේ හැටන් නැෂනැල් බැංකුව සහ කොළඹ යුනියන් බැංකුව යන පිළිගත් පෞද්ගලික බැංකු දෙකක සේවය කිරීමෙන් අනතුරුවය. ඒ මහතා සංවර්ධන බැංකුකරණය, ආයතනික ණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ වෙළඳ මූල්‍යකරණය යන අංශයන්හි විවිධ කළමනාකාරීත්ව තනතුරු වල කටයුතු කරමින් බැංකු ක්ෂේත්‍රයට ම පමණක් ආවේණික වූ සේවාවල වසර 29 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍යකරණ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය මෙන්ම ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ගෙන ඇත. ඔහුගේ සෙසු සුදුසුකම් වනුයේ බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමාව (IBSL) සහ මොරටුව විශ්වවිද්‍යාලයෙන් පිරිනමනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාවේ ජාතික තාක්ෂණවේදී ඩිප්ලෝමාව (NDT) වේ. ඔහු IBSL හි ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන අතර IBSL හි මෙන්ම ආරාධිත කථිකාචාර්යවරයෙක් ද වේ.



වජිර ජයසිංහ මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී

විසි වසරකට අධික පළපුරුද්දක් ඇති ව්‍යක්තීයමය තොරතුරු තාක්ෂණවේදියකු වන ජයසිංහ මහතා 2011 ජූනි මාසයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා කටයුතු කිරීමට එක් විය. ඔහු මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරියෙකි. තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යාපති උපාධිධරයෙකු වන ඒ මහතා ඇමරිකා එක්සත් ජනපදයේ හවායි විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිකරගෙන ඇත. උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ඔහු IBM තොරතුරු තාක්ෂණ ආයතනයේ පද්ධති ඉංජිනේරුවරයකු ලෙස සිය ව්‍යක්තිය දිවිය ආරම්භ කරන ලදී. මූල්‍ය සේවා සහ බැංකුකරණ ක්ෂේත්‍රයේ කළමනාකාරීත්ව තනතුරුවල වසර 16කට අධික සේවා පළපුරුද්දක් ඔහු සතුය. බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සහතිකලත් තොරතුරු තාක්ෂණමය ව්‍යක්තියවේදියකු (CITP) සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ හි සහතිකලත් ව්‍යාපෘති කළමනාකරණ ව්‍යක්තියවේදියකු (PMP) වන ජයසිංහ මහතා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වරලත් ඉංජිනේරුවරයෙකි.



කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මයා
අංශ ප්‍රධානී මානව සම්පත් සංවර්ධන
සහ පරිපාලන ප්‍රධානී (2020 ජූනි මස දක්වා)

වසර 32 කට අධික පළපුරුද්දක් ඇති මානව සම්පත් විශේෂඥයකු වන කේ. එම්. ජේ.එස්. කරුණාතිලක මහතා 2014 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකු සේවයට එක් වූයේ ය. ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි (SMIB) සහකාර සාමාන්‍යාධිකාරී / ප්‍රධානී (මානව සම්පත් හා සැපයුම්) වශයෙන් සේවය කර ඇත. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ ගැමිදිරිය ව්‍යාපෘතියෙහි අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වශයෙන් ද ඔහු කටයුතු කළේ ය. ඔහු ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන වශයෙන්) ද ශ්‍රී ලංකා සමූපකාර කළමනාකරණ ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාර උපදේශක හා කළමනාකරු (පරිපාලන සහ මූල්‍ය) ද වශයෙන් ද සේවය කරන ලදී.

කරුණාතිලක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය (1986) ලබා සිටින අතර කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍රය ද (1996) ව්‍යාපාර පරිපාලනපති (2003) උපාධියද ලබා සිටියි. ඔහු ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයෙ හි (IPM) ආශ්‍රිත සාමාජිකයකු ද වන්නේ ය. එම ආයතනයෙන් පිරිනැමෙන ජාතික මානව සම්පත් විශිෂ්ටතා සම්මානය 2010 වසරේ දී හිමි කර ගන්නා ලද්දේ ඔහු විසිනි. කරුණාතිලක මහතා සහතිකලත් මානව සම්පත් විගණක ලෙස 2017 වර්ෂයේ දී මානව සම්පත් සංවර්ධන විගණනය සඳහා සහතික පත්‍රය IPM වෙතින් ලබා ගෙන ඇත.



පී සුමේධ එදිරිසූරිය මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

එදිරිසූරිය මහතා 1992 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා ගෙන ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයකු වන ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබා ගෙන ඇත. හෙතෙම කොළඹ අර්න්ස්ට් ඇන්ඩ් යංග්, ජාතික සංවර්ධන බැංකුව සහ සෙලාන් බැංකුව යන ප්‍රමුඛ පෙළේ ආයතනවල වසර 29 කට අධික කාලයක් සේවය කොට විගණනය, ගණකාධිකරණය, බදුකරණය, කළමනාකරණ උපදේශනය සහ බැංකුකරණය හා මූල්‍යකරණ ක්ෂේත්‍රවලට අදාළව පළපුරුද්ද හිමි කර ගත් අයෙකි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඔහු 2017 වසරේ ජනවාරි මාසයේ දී එක් විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත් කිරීමට පෙර ඒ මහතා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරී, අනුකූලතා නිලධාරී සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දරා ඇත.



ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ණය සහ අයකිරීම්

ජයසිංහ මහතා 1986 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ උපාධිය ලබා ගෙන ඇත. තව ද ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව ද වයඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) ශ්‍රී ලංකා වෙතින් ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ගෙන ඇත. උපාධිය ලබා ගැනීමෙන් පසු ඔහු 1987 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග එක් වූ අතර ශාඛා කළමනාකරු, කලාපීය කළමනාකරු, දිස්ත්‍රික් කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන තනතුරුවල සේවය කර ඇත. ජයසිංහ මහතා බැංකු ක්ෂේත්‍රය තුළ වසර 31කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.



සී. එල්. පිහිල්ලන්ද මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
මෙහෙයුම් සහ බැංකු සහාය සේවා

පිහිල්ලන්ද මහතා කැළණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධිය සාර්ථකව නිම කර ඇත. ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකි. එසේම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර්මධ්‍ය විභාගය ද සමත් වී ඇත. ඔහු කළමනාකරුවකු ලෙස (මෙයට පෙර මහනුවර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව/RRDB) බැංකුව සමග එක් විය. බැංකුකරුවකු ලෙස සිය සේවා කාලය තුළ ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී මෙන් ම සබරගමුව සහ දකුණු පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුරෙහි ද සේවය කරමින් කළමනාකරණ මට්ටමේ පුළුල් පරාසයක අත්දැකීම් සම්භාරයක් අත් කර ගෙන ඇත. බැංකු ක්ෂේත්‍රයෙහි 31 වසරකට අධික කාලයක පළපුරුද්දක් ඒ මහතා සතුව ඇත.

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරු/ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරු



ඩී.එම්.එස්. බණ්ඩාර මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
මධ්‍යම පළාත
වාණිජවේදී (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



ඩී.එම්.ටී.එස්. කුමාර මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
වයඹ පළාත
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රපති ආර්ථික විද්‍යාව - කැලණිය විශ්ව විද්‍යාලය



ඩබ්.එම්.එන්. ද සිල්වා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
දකුණු පළාත (2020 ජූලි මස දක්වා)
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



ඒ.එච්.එම්.ජී. අබේරත්න මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
උතුරු මැද පළාත
වාණිජවේදී (විශේෂ) උපාධිය
කැලණිය විශ්ව විද්‍යාලය
ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය



ජී.එස්.ඩී. ද සිල්වා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
බස්නාහිර පළාත
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



බී.එච්.එම්.එස්. බස්නායක මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
ඌව පළාත (2020 අප්‍රියෙල් මස දක්වා)
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
ඌව විශ්ව විද්‍යාලය



සී.එස්. වේරගොඩ මිය
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
සබරගමුව පළාත
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



ආර්.එම්.ආර්. රන්දෙණිය මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
නැගෙනහිර පළාත
ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය
බැංකුකරණය හා මූල්‍යකරණය පිළිබඳ සහතිකය
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ඩබ්.එම්.ඩී.එස්. වික්‍රමසිංහ මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
ඌව පළාත (2020 අප්‍රියෙල් මස සිට)
වාණිජවේදී (විශේෂ) උපාධිය රුහුණු විශ්ව විද්‍යාලය
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි
ඩිප්ලෝමාව කොළඹ විශ්ව විද්‍යාලය
බැංකුකරණ අවදානම් කළමනාකරණය
පිළිබඳ සහතිකය - ස්විඩනය



කේ. ආරියතිලක මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - (වැඩබලන)
දකුණු පළාත (2020 ජූලි මස සිට)
මානව සම්පත් සංවර්ධනය පිළිබඳ
උසස් ජාතික ඩිප්ලෝමාව
ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනය



කේ.පී. දහනායක මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී
මානව සම්පත් සංවර්ධන හා පරිපාලන
වාණිජවේදී (විශේෂ) උපාධිය රුහුණු විශ්ව විද්‍යාලය
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
රජරට විශ්ව විද්‍යාලය

සහකාර සාමාන්‍යාධිකාරීවරු/අංශ ප්‍රධානීන්



බී.එම්.යූ.එස්. බස්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
මෙහෙයුම් (2020 අගෝස්තු මස දක්වා)
කෘෂිකර්ම ඩිප්ලෝමාව
කෘෂිකර්ම විද්‍යාලය - පැල්වෙහෙර්



ඩී.එස්.පී.සී. හඳුන්හේවා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
අලෙවිකරණ, පර්යේෂණ හා නිමැවුම් සංවර්ධන
ක්ෂුද්‍ර මූල්‍ය ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ඩබ්.වී.ඊ.ජී. වරකාගොඩ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
භාණ්ඩාගාර
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍ය විභාගය -
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය



එල්.බී. උපාලි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
ණය
වාණිජවේදී (විශේෂ) උපාධිය
කැලණිය විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍ය විභාගය -
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය



බී.ආර්.ඩී. පුෂ්පකුමාරි මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී
වයඹ පළාත
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
කැලණිය විශ්ව විද්‍යාලය



ඩී.පී. ධර්මදාස මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
මධ්‍යම පළාත (2020 අගෝස්තු මස දක්වා)
ශාස්ත්‍රවේදී උපාධිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය



පී.එස්.ටී. රණතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
මධ්‍යම පළාත
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
කොළඹ විශ්ව විද්‍යාලය



කේ.ඩී.ඩී. ධර්මප්‍රිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
උතුරු මැද පළාත
ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජික
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



පී.එම්.එස්. වික්‍රමරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
අයකිරීම්
වාණිජවේදී (විශේෂ) උපාධි
කොළඹ විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍ය විභාගය -
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය -
CBF ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
MAAT



එම්.එම්.එස්. ආනන්ද මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
බස්නාහිර පළාත
ආශ්‍රිත සාමාජිකත්වය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



බී.ජී.ඩබ්.ඒ. කුමාර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
නැගෙනහිර පළාත
විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



එම්.ඒ. ගුණරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
සබරගමුව පළාත
විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



කේ.බී. විජේරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
මූල්‍ය
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
රජරට විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍ය විභාගය -
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ජී.එම්.බී.සී. ද සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
අවදානම් කළමනාකරණ
වාණිජවේදී උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ආශ්‍රිත සාමාජික ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
වයඹ විශ්ව විද්‍යාලය
ක්ෂුද්‍ර මූල්‍ය සහතිකත්ව පාඨමාලාව
MBA - වයඹ විශ්වවිද්‍යාලය



ඩබ්.එම්.එස්. විජේතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
තොරතුරු තාක්ෂණ
විද්‍යාවේදී ව්‍යවහාරික විද්‍යා උපාධි
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධි
කොළඹ විශ්ව විද්‍යාලය
MBA - තොරතුරු තාක්ෂණ විශේෂිත
සික්කිනි මනිපාල් විශ්ව විද්‍යාලය
බැංකු කළමනාකරණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ඩබ්.පී.එම්.කේ. දසන්ත මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
ගොඩනැගිලි සහ නඩත්තු
විද්‍යාවේදී (ඉංජිනේරු) ගෞරව උපාධිය
මොරටුව විශ්ව විද්‍යාලය
තාක්ෂණය පිලිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
වරලත් ඉංජිනේරු - MIE (SL)



ආර්.එම්.ටී. රාජපක්ෂ මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
නීතිඥ
නීති උපාධි - කොළඹ විශ්ව විද්‍යාලය



ඩබ්.වී.ඩී.පී. කුමුදිනී මිය
සහකාර සාමාන්‍යාධිකාරී
මානව සම්පත් සේවා සහ සංවර්ධන
විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

සහකාර සාමාන්‍යාධිකාරීවරු/අංශ ප්‍රධානීන්



සී.එල්.සී. මුතුබණ්ඩා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
අභ්‍යන්තර විගණන
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
DBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ඩබ්.එම්.අයි.කේ. අබේරත්න මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී
පරිපාලන
විද්‍යාවේදී (භෞතික විද්‍යා) උපාධිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය



පී.එච්. විජේතිලක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
දකුණු පළාත
විද්‍යාවේදී (දේපල විශ්ලේෂණය සහ තක්සේරු) උපාධිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
DBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



ඩී.එම්. ගුණසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
ඌව පළාත
වාණිජවේදී උපාධිය
රුහුණු විශ්ව විද්‍යාලය



ජී.බී.එම්.ටී.කේ. විජේරත්න මිය
ප්‍රධාන කළමනාකාරිනී
අනුකූලතා
ශාස්ත්‍රවේදී (ආර්ථික විද්‍යාව) විශේෂ උපාධිය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



පී.එන්. ඒකනායක මිය
ප්‍රධාන නීති නිලධාරිනී
නීතිඥ



මේජර් ජෙනරාල් ජේ ඕ පී පක්ෂවීර
ප්‍රධාන ආරක්ෂණ නිලධාරී
RSP, VSV, USP (විශ්‍රාමික)

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

26 මූල්‍ය සමාලෝචනය
29 ගනුදෙනුකරු සහ සබඳතා සමාලෝචනය
32 අලෙවිකරණ සමාලෝචනය
37 සමාජ හා පාරිසරික සමාලෝචනය
39 සේවක සමාලෝචනය
42 විශේෂ සිදුවීම්
49 අවදානම් කළමනාකරණය

මූල්‍ය සමාලෝචනය

සංවර්ධන මූල්‍ය කටයුතු සඳහා විශේෂිත මූල්‍ය ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙරට සමාජයීය හා සංවර්ධන ක්‍රියාකාරකම් නගාසිටුවීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. බැංකුව දිවයිනේ බොහෝ සංවර්ධන වැඩසටහන් වලදී පෙරමුණ ගනිමින් මූල්‍ය සම්පාදකයකු වශයෙන් කැපී පෙනෙන දායකත්වයක් ලබාදෙයි. මෙම සංවේදී හා සංකීර්ණ පරාසය තුළ බොහෝ මූල්‍ය ආයතනයන් සක්‍රීයව සහභාගී වීමට අකැමැත්තක් දක්වන්නා වූ ආර්ථික ක්ෂේත්‍රයන් වෙත පහසුකම් සලසමින්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මේ වන විට ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වන සුවිශේෂී මූල්‍ය ආයතනයක් බවට පත්ව ඇත. අපගේ වටිනාම වත්කම වනුයේ උතුරු නැගෙනහිර ද ඇතුළුව දිවයින පුරා විසිරී සිටින මිලියන හයකට අධික අපගේ ගනුදෙනුකාර පදනමයි. රටේ සහ එහි පුරවැසියන්ගේ ප්‍රගතිය කෙරෙහි බැංකුවේ ප්‍රමුඛ අවධානය යොමු වේ. ඒ අනුව දිවයින පුරා විසිරුනු ශාඛා 276 ක පුළුල් සේවා ජාලය ඔස්සේ බැංකුව ඔවුන් සවිබල ගන්වමින් ජාතියේ අභිවෘද්ධිය පිණිස කටයුතු කරයි.

ලාභදායීත්වය

පෙර වසරට සාපේක්ෂව බැංකුවේ සමස්ත ආදායම 6% කින් වර්ධනය විය. වසර 2019 දී මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 2,960 දක්වා පහත වැටුනු අතර එය 2018 දී වාර්තා වුනු මෙහෙයුම් ලාභය වන රුපියල් මිලියන 3,606 ට සපේක්ෂව 18% ක අඩු වීමකි. 2019 දී බදු වලට පෙර වත්කම් මත ආදායම 1.6% ක් වශයෙන් වාර්තා වූ අතර 2018 දී එය 2.1% ක් විය. එමෙන්ම බැංකුව 2019/12/31 දිනට රුපියල් බිලියන 200 කට ආසන්න සමස්ත වත්කම් වටිනාකමක් කරා ළඟා වූ අතර එයට පෙර වසරට සාපේක්ෂව 13% ක වර්ධනයකි.

ඉලක්කගත සැලසුමට ඉහළින් අත්පත් කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණ

	සැබෑ රු. 000	ඉලක්කගත රු. 000	අත් කරගැනීම %
දළ ආදායම	27,507,821	26,247,150	105
මෙහෙයුම් ලාභය	2,960,258	3,147,868	94
බදු පසු ලාභය	498,595	417,098	120

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය

වසර 2019 තුළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය සුළු වශයෙන් වර්ධනය විය.

	2019				
	31-දෙසැ රු. 000	30-සැප් රු. 000	30-ජූනි රු. 000	31-මාර්තු රු. 000	31-දෙසැ-18 රු. 000
ශුද්ධ මෙහෙයුම් ආදායම	10,916,887	7,662,298	4,983,868	2,240,309	11,442,195
බදු පෙර ලාභය රු.	2,960,258	1,836,691	1,206,261	413,445	3,606,330
ලාභය/(අලාභය) බදු වලට පසු	498,595	133,576	78,982	(25,750)	1,073,586
ණය සහ ලැබිය යුතු දෑ	144,693,551	140,805,499	139,606,532	136,388,470	137,769,683
ගනුදෙනුකාර තැන්පතු	149,599,829	146,461,414	143,840,189	139,220,160	141,559,974
මුළු වත්කම්	199,978,929	190,329,661	187,881,565	175,763,050	176,937,319
කොටස් හිමිකරුවන්ගේ අරමුදල	14,965,322	14,634,015	14,805,590	14,763,500	14,710,115

ආදායම

බැංකුවේ සමස්ත ආදායම රු. බිලියන 26 සිට රු. බිලියන 27.5 ක් දක්වා 6% ක වසරින් වසර වර්ධකයක් වාර්තා කළේය. මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ පොලී ආදායමයි.

සමස්ත ආදායමෙහි සංයුතිය

	රු. 000
පොලී ආදායම	26,357,071
ගාස්තු හා කොමිස් ආදායම	1,134,422
වෙනත් මෙහෙයුම් ආදායම	16,328
සමස්ත ආදායම	27,507,821

ශුද්ධ පොලී ආදායම (NII)

2019 මූල්‍ය වර්ෂය තුළදී ශුද්ධ පොලී ආදායම රුපියල් මිලියන 11,906 සිට රුපියල මිලියන 12,453 දක්වා 5% කින් වර්ධනය විය.



ශුද්ධ පොලී ආදායම (රු. මිලියන)

ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

2019 දී 8% ක පහත වැටීමක් වාර්තා විය වසර 2018 දී වාර්තා වූ රුපියල් මිලියන 928 ට සාපේක්ෂව 2019 දී රුපියල් මිලියන 856 දක්වා පහත වැටීමක් වාර්තා විය.



ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම (රු.මිලියන)

බදුකරණය

	2019 රු. 000	2018 රු. 000	වෙනස %
මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු	1,012,949	1,158,678	-13
ජාතිය ගොඩනැංවීමේ බද්ද	123,626	154,490	-20
ආදායම් බදු	723,566	1,029,496	-30
ණය ආපසු ගෙවීමේ ගාස්තුව	601,523	190,080	216
මුළු බදු වියදම	2,461,663	2,532,744	-3

වසර 2019 දී බැංකුව විසින් මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැංවීමේ බද්ද සහ ණය ආපසු ගෙවීමේ ගාස්තුව වශයෙන් රුපියල් මිලියන 1,738 ක්ද ආදායම් බදු වශයෙන් රුපියල් මිලියන 724 ක්ද වැය කරන ලදී. වසර තුළ බදු වශයෙන් රුපියල් මිලියන 2,462 ක මුදලක් වැය කොට ඇත.

වත්කම් මත ආදායම (ROA)

බැංකුව මගින් 2018 දී වාර්තා වූ 2.1% ට සාපේක්ෂව වසර 2019 දී 1.6% ක වත්කම් මත ආදායමක් (මෙහෙයුම් ලාභය) වාර්තා කළේය.



වත්කම් මත ආදායම (ROA) (%)

ස්කන්ධය මත ආදායම (ROE)

බදු පසු ලාභයෙහි කැපී පෙනෙන අඩුවීම සහ 2018.12.31 දින සිදු කරන ලද කොටස් නිකුතුව හේතුවෙන් ස්කන්ධ මත ආදායම පෙර වසරට සාපේක්ෂව 3.4% ක පහළ යාමක් වාර්තා කළේය.



ස්කන්ධ මත ආදායම (%)

මූල්‍ය සමාලෝචනය

මුළු වත්කම්

බැංකුව වසර 2019 අවසානය වන විට පෙර වසරට සාපේක්ෂව මුළු වත්කම් වල 13% ක වර්ධනයක් වාර්තා කලේය. ඒ අනුව මුළු වත්කම් පදනම රුපියල් බිලියන 199 කඩඉම පසු කර යමින් රුපියල් බිලියන 200 ආසන්නයට ළඟා විය. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමග එළැඹී හවුල්කාරිත්වය මගින් රුපියල් බිලියන 9.3ක වත්කම් බැංකුව තුළට ගලාඒමක් සිදු වූ අතර මුළු වත්කම් වටිනාකම රුපියල් බිලියන 200 කරා ළඟවීම කෙරෙහි එය බෙහෙවින් දායක විය.

මුළු කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධය

2018 දී වාර්තා වූ රුපියල් මිලියන 14,710 ට සාපේක්ෂව 2019 දී බැංකුවේ මුළු කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 14,965 කරා ළඟා විය.



කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධය (රු. මිලියන)

වත්කම් ගුණාත්මකභාවය

පෙර වසර අවසානයේදී 5.4% ක් වශයෙන් පැවැති බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2019 දෙසැම්බර් 31 දිනට 9.63% දක්වා වර්ධනය විය. වසර තුළදී අක්‍රීය ණය අනුපාතය ඉහළ යාම කෙරෙහි බාහිර අහිතකර සාධක ඉවහල් විය.



අක්‍රීය ණය අනුපාතය (%)

පහත දැක්වෙනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම් වූ බැංකුවේ අක්‍රීය ණය පිළිබඳ විශ්ලේෂණයකි.



ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම්ව, අක්‍රීය ණය (රු. මිලියන)

ද්‍රවශීලතාවය

	2019	2018
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR)	32.38%	24.27%

බැංකුව විසින් නිරන්තරයෙන්ම සිය ද්‍රවශීලතා මට්ටම් නියාමන අවශ්‍යතාවයන්ට ඉහළින් පවත්වා ගෙන යනු ලැබීය. වසර 2019 දී සමහර ආයතනික තැන්පතුවල කැපීපෙනෙන ගලා ඒම සහ පෙර පැවති ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ආයෝජන කළඹක් හාරගැනීම පෙර වසරට වඩා ඉහළ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයක් කෙරෙහි හේතු විය.

ගනුදෙනුකරු සහ සබඳතා සමාලෝචනය

ණය සහ මෙහෙයුම්

ජාතික මට්ටමේ නියෝජනයක් සහිත සංවර්ධන බැංකුවක් වශයෙන් ජාතිය නගාසිටුවීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් බැංකුව වෙතින් අපේක්ෂිතය. මෙහිදී ණය ලබාදීම වඩාත්ම වැදගත් ක්‍රියාදාමය වන අතර ඉහත අරමුණ සාක්ෂාත් කරගැනීමේදී බැංකුව විසින් මෙම උපකරණය යොදාගනිමින් පවතී. ණය ලබාදීම ඔස්සේ කෘෂිකර්මය, කුඩා කර්මාන්ත, ධීවර, පශු සම්පත්, නිවාස සහ සේවා වැනි ආර්ථිකයේ විවිධ වූ ක්ෂේත්‍රයන් වෙත උත්තේජනයක් සපයමින් එහි ප්‍රතිඵලයක් වශයෙන් අදාළ ක්ෂේත්‍රයන් මගින් ජාතික ආර්ථිකය වෙත දක්වනු ලබන දායකත්වය ඉහළ නැංවිය හැකි වේ. බැංකුව සම්බන්ධයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම්, වසර 1986 දී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වශයෙන් ඇරඹුනු දා පටන් අඛණ්ඩව පවත්වා ගෙන එනු ලැබූ ග්‍රාමීය ප්‍රදේශයන්හි එහි සවිමත් වූ නියෝජනයයි.

එමනිසා, බැංකුව මගින් එහි අරමුණු සපුරාගැනීම උදෙසා ණය ලබාදීමේ මෙහෙයුම් ඇතුළු ක්‍රමෝපායන් රැසක් ක්‍රියාවට නංවන ලදී. මෙහිදී අවශ්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ වන පරිදි ණය ලබාදීමේ කොන්දේසි සකසන ලද්දේ සහනදායී පොලී අනුපාත, ලිහිල් ඇප අවශ්‍යතා මත පහසු නැවත ගෙවීමේ කාලසීමාවන් සහිතව නිර්මාණය කරන ලද ආපසු ගෙවීමේ සැලසුම් ආදිය ගනුදෙනුකරුවන් වෙත පිරිනමමිනි. එයට අමතරව බැංකුව මගින් ව්‍යවසායකත්ව සංවර්ධනය, පුහුණුව, කළමනාකරණ හා අලෙවි ක්‍රියාකාරකම් ආශ්‍රිත උපදේශනය වැනි ණය ලබාදීමෙන් ඔබ්බට ගිය පහසුකම් ද සලසන ලදී. මෙවැනි සේවාවන් ඔස්සේ ණය ලබාදීමේ අවදානම පහත වැටෙන අතර එහිදී ණය ලබාදීමේදී ඇපකර මත රඳාපැවතීම් මට්ටමද අවම කෙරේ.

වර්තමානය වන විට බැංකුව මගින් සියළුම ගනුදෙනුකාර කාණ්ඩයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සකසන ලද එකිනෙකට වෙනස් ණය යෝජනා ක්‍රම පෙළක් සම්බන්ධයෙන් මෙහෙයුම් සිදුකරනු ලබයි. මෙකී බොහොමයක් සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම සඳහා අවශ්‍ය අරමුදල් ලැබෙනුයේ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපීය ආයෝජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි බහුපාර්ශ්වීය ආයතනයන් මගින් ක්‍රියාවට නැංවෙන ප්‍රතිමූල්‍ය සැලසුම් ක්‍රම හරහාය. ඒ අනුව විමර්ශනයට ලක් වන වසරේදී එවැනි ප්‍රතිමූල්‍ය වැඩසටහන් 26 ක් සඳහා බැංකුව සහභාගීත්ව ණය ලබාදීමේ ආයතනයක් (PCI) වශයෙන් කටයුතු කල අතර ඉන් 16 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් මෙහෙයවන ලද වැඩසටහන් විය. බැංකුව විසින් ස්වයං ලෙසින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මෙහෙයවනු ලබන ප්‍රතිමූල්‍ය වැඩසහෙන් සියල්ලටම පාහේ සවිමත් නියෝජනයක් සිදු කරන ලදී.

තවද වසර 2019 දී බැංකුව විසින් එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහනෙහි විෂයපථය යටතේ පැවති නව ණය යෝජනා ක්‍රම 16 ක් සඳහා සක්‍රීය දායකත්වයක් දක්වන ලදී .

විමර්ශනයට ලක් වන වසර තුළදී බැංකුව සිය ණය සැලසුම් කළඹ තවදුරටත් පුළුල් කරමින් ''ගබඩා ලැබීමේ මූල්‍යකරණය'' ("Warehouse Receipt Financing") නමැති නව ණය ලබාදීමේ උපකරණයක් හඳුන්වාදීමට සමත් විය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්‍රියාත්මක වන මෙමගින් ගොවි ප්‍රජාවන් වෙත සෙත සැලසේ. මෙම උපකරණය ඔස්සේ ගොවීන් හට සිය නිෂ්පාදන අඩු මුදලට අලෙවි නොකොට එම අස්වැන්න ඇපයට තබා තාවකාලික අරමුදල් ලබාගත හැකි වේ. බැංකුව දැනටමත් රජය වෙනුවෙන් ලෝක බැංකු සහාය සහිතව නිර්මාණය කරන ලද ටොන් 5,000 බැගින් වූ ධාරිතා සාමාන්‍යයක් සහිත එවැනි ගබඩා ව්‍යාපෘතීන් 6 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ උපුල්දෙණිය, මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, මන්නාරම දිස්ත්‍රික්කයේ මුරුන්කන් සහ 2018 වසරේ අළුතින් ඉදිකරණ ලද පොලොන්නරුව, ඇඹිලිපිටිය සහ කිලිනොච්චි දිස්ත්‍රික් මධ්‍යස්ථාන ආශ්‍රිතව කළමනාකරණය කරයි. මෙහිදී ගොවීන් හට මිළ මට්ටම් ස්ථාවර වන තුරු සිය අස්වැන්න මෙකී ගබඩා සංකීර්ණයන්හි ගබඩා කොට තැබිය හැකි වේ.

මේ අතරම මෙහිදී මිල ගණන් සාධාරණ මට්ටමට පැමිණ අස්වැන්න අලෙවි කරනු ලබන තෙක් හදිසි මුදල් අවශ්‍යතා සඳහා අදාළ ගබඩා ලදුපත් භාවිත කරමින් කෙටි කාලීන ණය ලබාගැනීමේ අවස්ථාවද ගොවීන් වෙත උදා වේ. තවද බැංකුව මගින් වසර 2019 දී මුදල් අමාත්‍යාංශයේ සුදුසුකම් ලත් උපදේශකයින් යොදාගනිමින් ගොවීන් හා ආශ්‍රිත පාර්ශ්වයන් වෙත දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

බැංකුව මගින් 2019 ඔක්තෝබර් මාසයේදී මූල්‍ය කල්බදු සේවාවන් අරඹන ලද අතර 2019 අවසානය වන විට රුපියල් මිලියන 97 ක් වූ පහසුකම් 43 ක් ලබාදීමට සමත් විය.

බැංකුව විසින් ලබාදුන් ණය හා සම්බන්ධ රක්ෂණ ක්‍රියාකාරකම් ඔස්සේ අණ්ඩවම ගාස්තු ආදායම් උපදවා ගැනීමට බැංකුවට හැකි විය.

මෙම කාර්යය උදෙසා බැංකුව විසින් කෘෂිකර්ම රක්ෂණ, රථවාහන ණය රක්ෂණ, නිවාස ණය රක්ෂණ ආදී රක්ෂණවරයන් ලබාගැනීම සඳහා රක්ෂණ සමාගම් පහලොවක සේවාවන් ලබාගත් අතර 2019 දී අරඹන ලද මූල්‍ය කල්බදු මෙහෙයුම් සඳහාද මෙම සේවාව තවදුරටත් ව්‍යාප්ත කෙරිණි. ඒ අයුරින් 2019 තුළ උපයන ලද ගාස්තු ආදායම රුපියල් මිලියන 18 කි. මෙම අත්දැකීම සමගින් බැංකුව රක්ෂණ ක්‍රියාකාරකම් විධිමත් හා ව්‍යාප්ත කරනු පිණිස සිය බැන්ක්ඇෂුවරන්ස් ඒකකය සවිබල ගැන්වීය.

තවද බැංකුව විසින් වසර 2017 දී සිය ශාඛා ජාලය ඔස්සේ පාරිභෝගික බිල්පත් ගෙවීමේ සේවාවන් ලබාදෙමින් ගනුදෙනුකරුවන් හට ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් හි බිල්පත් ගෙවීමේ පහසුකම් සලසන ලදී. නුදුරු අනාගතයේදී මෙම සේවාව සෙසු සේවා සැපයුම්කරුවන් වෙනුවෙන්ද පුළුල් කිරීමට බැංකුව අපේක්ෂා කරයි.

පැවති අස්ථාවර සාර්ව ආර්ථික වටපිටාව හමුවේ බැංකුව වසර 2019 දී ප්‍රබල ආකාරයෙන් ණය ලබාදීමේ නිරත නොවිය. කෙසේවුවද වසර තුළදී රජයේ දර්ශනය හා සමගාමීව අවශ්‍ය ක්ෂේත්‍රයන් වෙත සහන පොලී අනුපාත යටතේ ණය ලබාදෙමින් බැංකුව කැපීපෙනෙන කාර්යභාරයක් ඉටු කලේය.

ගනුදෙනුකරු සහ සබඳතා සමාලෝචනය

ණය සහ අත්තිකාරම් වර්ධනය



ණය සහ අත්තිකාරම් වර්ධනය (රු. මිලියන)

ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදිතය අනුව

කාණ්ඩය	රු. මිලි 2019	රු. මිලි 2018
උකස්	13,747	11,455
කාර්ය මණ්ඩල ණය	3,561	3,479
කෙටි කාලීන	10,201	9,181
දිගු කාලීන	117,185	113,655
එකතුව	144,694	137,770



ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදිතය අනුව (රු. මිලියන)

ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව

කාණ්ඩය	රු. මිලි 2019	රු. මිලි 2018
කෘෂිකර්ම හා ධීවර	29,289	36,880
නිෂ්පාදන	22,724	22,907
ප්‍රවාහන	165	244
ඉදිකිරීම්/නිවාස	23,618	20,086
වෙළඳුන්	24,261	22,819
පරිභෝජන/තැන්පතු වෙනුවෙන්/ කාර්ය මණ්ඩල/සංචාරක	44,637	26,852
එකතුව	144,694	137,770



ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව (රු. මිලියන)

අයකර ගැනීම්

2019 වසර තුළදී බැංකුවේ විශේෂ අවධානය යොමු වූයේ 2018 අවසානයේදී බැංකුවේ සමස්ත ණය කළඹෙන් 5.4% ක් වශයෙන් වාර්තා වූ සිය අක්‍රීය ණය කළඹ කළමනාකරණය කෙරෙහිය. දරන ලද විශේෂ ප්‍රයත්නයන් හා බාහිර වටපිටාවෙහි පැවති ඇතැම් අවාසනාවන්ත සිදුවීම් හේතුවෙන් අපගේ බොහොමයක් ගනුදෙනුකරුවන් හට මුහුණපෑමට සිදුවූ ආතතිය නිසි පරිදි කළමනාකරණය කරගැනීම හේතුවෙන්, වසර තුළදී සුළු ණය වර්ධනයක් අත්පත් කරගනිමින් 2019 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය අනුපාතය 9.63% ක් වශයෙන් පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

අක්‍රීය ණය කාණ්ඩය	රු. මිලි 2019	රු. මිලි 2018
විශේෂයෙන් සඳහන්	2,051	1,323
උප ප්‍රාමාණික	3,185	2,080
අඩමාන	2,228	1,431
අලාභ	6,247	2,429
මුළු අක්‍රීය ණය	13,711	7,263
අක්‍රීය ණය අනුපාතය (%)	9.63%	5.40%

තැන්පතු වර්ධනය

බැංකුවේ තැන්පතු පදනම පෙර වසරට වඩා 6% ක වර්ධනයක් සමගින් රුපියල් බිලියන 150 දක්වා ඉහළ නැංවුනි. මේ සඳහා ප්‍රධාන වශයෙන් 9% ක වර්ධනයක් වාර්තා කළ ඉතුරුම් තැන්පතු සහ 4%ක වර්ධනයක් වාර්තා කල ස්ථාවර තැන්පතු දායක විය.



තැන්පතු වර්ධනය (රු. මිලියන)

තැන්පතු මිශ්‍රය (රුපියල් මිලියන)

තැන්පතු වර්ගය	රු. මිලි 2019	රු. මිලි 2018
ඉතුරුම් තැන්පතු	55,951	51,519
ස්ථාවර තැන්පතු	93,649	90,040
එකතුව	149,600	141,559



තැන්පතු මිශ්‍රය (රු. මිලියන)

වසර 2019 දී ලද තොරතුරු තාක්ෂණ ජයග්‍රහන

2019 බැංකුවට තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ ගනුදෙනුකාර සේවාව උසස් කිරීම සඳහා පද්ධති වැඩිදියුණු කිරීම් සිදු කල තවත් වසරක් විය.

2019 අවසානය වන විට බැංකුව මගින් ස්වකීය ගනුදෙනුකාර භවතුන් වෙත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් 200,000 ට වැඩි ප්‍රමාණයක් නිකුත් කරන ලද අතර බැංකුවට අයත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 50 දක්වා ඉහළ නැංවුනි. මෙම වසරේදී බැංකුව විසින් පැය 24 පුරා බැංකු සේවාවන් ලබාදීම සඳහා තෝරාගත් පරිශ්‍රයන්හි මුදල් තැන්පතු යන්ත්‍ර 5 ක් ස්ථාපනය කෙරිණි.

තොරතුරු තාක්ෂණ අංශය මගින් LankaClear සමග එක්ව EMV මත පදනම් වූ JCB චිප් කාඩ්පත් සාර්ථකව අත්හදා බලන ලද අතර නුදුරු අනාගතයේදී EMV මත පදනම් වූ JCB චිප් කාඩ්පත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් හා ඩෙබිට් කාඩ්පත් සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය.

බැංකුව වෙත නෛතික කටයුතු කළමනාකරණ පද්ධතියක් බැංකුව වෙත හඳුන්වාදීමට සමත් විය. මෙම පද්ධතිය මගින් බැංකුව මගින් පවරන ලද හා බැංකුවට එරෙහිව පවරන ලද නඩු කටයුතු අධීක්ෂණය කිරීමේ අවස්ථාව අධිකාරීලත් කාර්ය මණ්ඩලය වෙත හිමි වේ.

වසර 2019 දී කල්බදු ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා මධ්‍යගත පරිගණක පද්ධතිය (CBS) වෙත කල්බදු සැලසුම් මොඩියුලයක් සාර්ථකව හඳුන්වාදෙන ලදී. මෙම කල්බදු මොඩියුලය කල්බදු ව්‍යාපාරය සඳහා පූර්ණ අවශ්‍ය රක්ෂණ හා අයකර ගැනීමේ විශේෂාංගයන්ගෙන් සමන්විත වේ.

කාර්ය මණ්ඩලය මුහුණදුන් එකිනෙකට වෙනස් පද්ධති රහස්‍ය අංක මතක තබා ගැනීමේ අපහසුතාව මගහරවමින් තොරතුරු තාක්ෂණ අංශය මගින් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 'පොදු පද්ධති පෝටලයක්' (CSP) හඳුන්වාදෙන ලදී .

2019 දී තොරතුරු තාක්ෂණ අංශය මගින් දොරින් දොර බැංකු සේවාව සඳහා ''පාරිභෝගික සේවා බිල්පත් එක්රැස් කිරීමේ මොඩියුලයක්'' සාර්ථකව ක්‍රියාවට නංවන ලදී.

'බැන්ක්ඇෂුවරන්ස් පද්ධතියක්' හඳුන්වාදීමද 2019 දී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදුකරන ලද තවත් අත්පත් කරගැනීමකි. මෙම මොඩියුලය මගින් ණය රක්ෂණ ක්‍රියාවලියෙහි සියළුම පියවර විමසුමට ලක් කෙරේ.

වසර 2019 දී තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධති පරීශීලකයන් විසින් ඉස්මතු කරනු ලබන ගැටළු වඩාත් කාර්යක්ෂමව හා පහසුවෙන් විසඳාලිය හැකි ආකාරයෙන් 'ගැටළු කළමනාකරණ පද්ධතිය' ප්‍රතිසැකසීමට සමත් විය.

අලෙවිකරණ සමාලෝචනය

නිෂ්පාදිත සහ සේවා

RDB කැකුළු - ළමා ඉතුරුම් ගිණුම

ගිණුම විශේෂයෙන් සකසනු ලැබ ඇත්තේ වයස අවුරුදු 14 න් පහළ දරුවන් උදෙසාය. මෙමගින් අප දේශයෙහි සෑම දරුවකු හටම දීප්තිමත් අනාගතයක් උදෙසා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඉතිරිකිරීමේ අවස්ථාව උදාවේ. බැංකුව මගින් සෑම නව ගිණුමක් සඳහාම ඉතුරුම් කැටයක් පිරිනමනු ලැබේ. තවද, විශේෂයෙන් නිර්මාණය කරන ලද කුඩ, පාසැල් බෑග්, ශබ්දකෝෂ, තෑගි වවුචර හා ළමා බයිසිකල් වැනි තිළිණ රැසක් ගිණුම් ශේෂය අනුව දරුවන් වෙත පිරිනැමේ. බැංකුව විසින් ඉතුරුම් සඳහා ඉහළ පොලී අනුපාතිකයන් පිරිනමමින් කුඩා දරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කෙරේ. ඒ අනුව, රාජ්‍ය බැංකුවක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින්, ශ්‍රී ලාංකේය දූ පුතුන්ගේ අනාගත ආර්ථික ස්ථාවරත්වය තහවුරු කරමින් ''RDB කැකුළු'' නමින් විශේෂිත ළමා ඉතුරුම් ගිණුමක් ඉදිරිපත් කරන ලද අතර එහිදී සකසුරුවම හා ඉතුරුම් කෙරෙහි ඔවුන් දිරිගන්වමින්, ත්‍යාග හා ශිෂ්‍යත්ව පිරිනැමීමද සිදු කෙරේ. දරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීම සඳහා බැංකුව මගින් පාසැල් ඉතුරුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමත් සමග ඒ සඳහා සිසුනගේ කැපීපෙනෙන සහභාගිත්වයක් දක්නට ලැබිණි. මෙයට අමතරව, මෙම ගිණුම නිර්මාණය කරනු ලැබ ඇත්තේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙත සහාය දක්වමින් ඔවුන් යහපත් පුරවැසියන් බවට පත් කිරීමේ අරමුණ පෙරදැරි කර ගනිමිනි. මෙහිදී, පහ වසර ශිෂ්‍යත්ව විභාගයේදී සහ සාමාන්‍ය පෙළ විභාගයේදී විශිෂ්ඨ ප්‍රතිඵල අත්පත් කරගනු ලබන සිසු සිසුවියන් වෙත තිළිණ ප්‍රදානය කෙරේ. තවද, ඉහත විභාගයන් සඳහා පෙනී සිටින ගිණුම් හිමි දරුවන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණද සංවිධානය කෙරේ.

RDB 4TEEN PLUS

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මැතකදී RDB 14+ ගිණුම හඳුන්වාදෙන ලද්දේ නව යොවුන් ප්‍රජාව තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීමේ අරමුණිනි. මෙම ගිණුම විශේෂයෙන් සකසනු ලැබ ඇත්තේ වයස අවුරුදු 14 ට ඉහළ යොවුන් දරුවන් වෙනුවෙනි. ඒ අනුව, RDB 14+ ගිණුම මෙහෙයවනු ලබන්නේ නව යොවුන් තරුණ/තරුණියන් ආකර්ශනය කරගත හැකි ආකාරයේ අගය එකතු කිරීම් සමගිනි. RDB 14+ ගිණුම සඳහා ගිණුමෙහි ශේෂයට සාපේක්ෂව අමතර බෝනස් පොලියක් සමගින් වඩාත් ඉහළ පොලී අනුපාතයක් පිරිනැමේ. මෙහිදී ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පතක් නිකුත් කෙරෙන බැවින් වයස අවුරුදු 14 ට වැඩි දරුවන් හට ඔවුන්ගේ මූල්‍යමය අවශ්‍යතාවයන් සඳහා මුදල් ආපසු ගැනීමේ අවස්ථාව උදාවේ. පාසැල් දරුවන් හට සිය හදිසි මුදල් අවශ්‍යතාවයන් සඳහා මෙම ගිණුම භාවිත කල හැකි වන අතර, කාඩ්පතෙන් මුදල් ලබාගැනීමේදී එක් එක් වාරයක් පාසා දරුවාගේ භාරකරු වෙත අදාළ මුදල් ආපසුගැනීමේ විස්තර ඇතුළත් කෙටි පණිවුඩයක් යවනු ලැබේ. ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ දත්ත අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකායෙන් 10% කට ආසන්න පිරිසක් වයස අවුරුදු 15 - 25 අතර පසුවේ. ශ්‍රම බලකායෙහි මෙම කාණ්ඩය වෙත මෙම ගිණුම් මගින් ඉමහත් ප්‍රතිලාභ අත්පත් කරගත හැකි වේ. මෙහිදී යොවුන් ප්‍රජාව හට නිවසක්, මෝටර් රථයක්, ගෘහභාණ්ඩ, ව්‍යාපාර හිමිකරගැනීම හා අධ්‍යාපන අවශ්‍යතා සඳහා ඉලෙක්ට්‍රොනික උපාංග මිළදී ගැනීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි වන අතර විදේශ සංචාරයන් සඳහා මෙමගින් මුදල් සම්පාදනය කොට ගත හැකි වේ. සියළුම ගනුදෙනු කටයුතු ඔබේ ජංගම දුරකථනය වෙත කෙටි පණිවුඩ මාර්ගයෙන් දන්වනු ලැබේ.

RDB ලිය සවිය - කාන්තා ඉතුරුම් ගිණුම

මෙම ගිණුම හඳුන්වාදෙන ලද්දේ ශ්‍රී ලංකාවේ දිරිය කාන්තාවන් ඉලක්ක කරගනිමිනි. මෙහිදී මූල්‍යමය පහසුකම් වලට අමතරව බැංකුව මගින්, ස්වයං රැකියා ඔස්සේ මෙරට ආර්ථිකය වෙත දායකත්වය සපයනු ලබන කාන්තාවන් හට උපදේශන සේවාවන් ද සපයනු ලැබේ. ගිණුමෙහි විශේෂතා වනුයේ ඉහළ පොලී අනුපාතය, බොනස් පොලිය සහ තරඟකාරී අනුපාතයන් යටතේ අත්තිකාරම් ලබාදීම යනාදිය වේ. තවද මෙහිදී ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තා ව්‍යවසායිකාවන් සඳහා විශේෂ සම්මන්ත්‍රණ, නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු වැඩසටහන් ඇතුළු ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ වැඩමුළු රැසක් සංවිධානය කෙරේ. තවද, බැංකුව මගින් දීප ව්‍යාප්තව සංවිධානය කරනු ලබන 'විශිෂ්ටතම කාන්තා ව්‍යවසායිකාව' තරඟාවලියට සහභාගීවීම සඳහා මෙම ගිණුම් හිමිකාරියන් සුදුසුකම් ලබයි.

RDB ලිය සවිය ප්ලස් - කාන්තා ආයෝජන ඉතුරුම් ගිණුම

RDB ලිය සවිය ප්ලස් ආයෝජන ගිණුම කාන්තාවන් උදෙසාම විශේෂයෙන් සකසන ලද ඉතුරුම් සැලසුමක් වන අතර, එහි අරමුණ වනුයේ සුරක්ෂිත මධ්‍ය කාලීන ආයෝජන අවස්ථාවක් සහ විශේෂ ණය සැලසුම් යටතේ ඔවුන්ව සවිබල ගැන්වීමයි.

RDB ලිය සවිය ප්ලස් ආයෝජන ගිණුමෙහි විශේෂාංග

- වයස අවුරුදු 18 ට වැඩි කාන්තාවන් ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබයි.
- 5 අවුරුදු ආයෝජන සැලසුම
- ඉතුරුම් දිරිගැන්වීම සඳහා විශේෂ ත්‍යාග සැලසුම

RDB නිව් ලයිෆ් විශ්‍රාම සැලසුම

RDB නිව් ලයිෆ් විශ්‍රාම සැලසුම ඉහළ පොලියක් හිමිකර ගත හැකි විශේෂ ඉතුරුම් ගිණුමක් වශයෙන් වසර 2018 දී හඳුන්වාදෙන ලදී. එය විශේෂිත විශ්‍රාම සැලසුමකි. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන සාමාන්‍යය බර තබන ලද තැන්පතු අනුපාත 6 මාසික සාමාන්‍ය අනුව පොලී අනුපාතිකය ද්වි-වාර්ෂිකව සංශෝධනය කෙරේ. ගිණුම්හිමියා වයස අවුරුදු 55 හෝ 60 වෙත ළඟාවීමෙන් පසු ගිණුම මගින් ආකර්ශනීය විශ්‍රාම ප්‍රතිලාභයක් ගෙවනු ලැබේ. එය අදාළ ගිණුම්හිමියා ජීවත්ව සිටින තාක් කල් ගෙවනු ලැබේ. එමනිසා, මෙම ගිණුම ස්වයං රැකියා නියුක්තිකයින්, වෙළඳුන්, ගොවීන්, කර්මාන්තකරුවන් හා විශ්‍රාම වැටුප් රහිත පුද්ගලයින් හට අතිශය යෝග්‍ය වේ. වයස අවුරුදු 16 සිට 60 දක්වා පුද්ගලයින් හට මෙම ගිණුම විවෘත කල හැකි වන අතර ගිණුම්හිමියාගේ මුදල් ප්‍රවාහ අනුව තැන්පතු සිදුකල හැකි වේ. නිශ්චිත වාරික හෝ එකවර මුදලක් වශයෙන් සිදුකරනු ලබන ආයෝජනයන් ඔස්සේ ගිණුම්හිමියාගේ සේවා දිවිය තුළදී මුදල් වර්ධනය වීම සිදුවේ. ගිණුමෙහි ශේෂය මාසික විශ්‍රාම ප්‍රතිලාභයක් වශයෙන් යොදාගැනේ.

RDB VICTORY

බැංකුව මගින් හඳුන්වාදෙනු ලැබ ඇති මෙම ගිණුම මුදල් ආපසු ගැනීම් සිදු කරන අතරතුර ඉහළ පොලියක් හිමිකරගත හැකි විශේෂ ඉතුරුම් ගිණුමකි. විශේෂ ප්‍රතිලාභයක් වශයෙන්, මෙම ගිණුම ඔස්සේ බෝනස් පොලියක් පිරිනැමේ. තවද, ගිණුම් හිමියන් හට විශේෂ ණය පහසුකම් ලබාගැනීමටද මෙහිදී හැකි වේ. ඔවුන් හට පවත්වා ගෙන යනු ලබන ශේෂය මෙන් දස ගුණයක් දක්වා වූ ණය මුදලක් ලබාගත හැක. මෙම ගිණුම මගින්, තැන්පතුව පවත්වා ගෙන යන ලද දින ගණන අනුව බෝනස් පොලිය ගෙවනු ලැබේ. තවද, සියළුම ගනුදෙනු පිළිබඳ විස්තර කෙටි පණිවුඩ ඔස්සේ දැනුම්දෙනු ලැබේ. කිසියම් රටක ප්‍රගතිය උදෙසා එරට ජනතාවගේ ඉතුරුම් පුරුද්ද අතිශය වැදගත් වන අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වික්ටරි ඉතුරුම් ගිණුම මගින් එම අරමුණ සාක්ෂාත් කරගැනීමට කටයුතු කෙරේ. වට්ටිමගත අනුපාතයන් යටතේ මුදල් හුවමාරු සේවාවන් සැපයීමද ගිණුම මගින් පිරිනැමෙන විශේෂ ප්‍රතිලාභයකි.

RDB උත්තම ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම

බැංකුව මගින් මෙකී ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාව වෙත වෙළඳපොලේ පවතින තරඟකාරී පොලී අනුපාතිකයන් පිරිනමනු ලැබේ. රු. 500/- ක මූලික තැන්පතුවක් සමගින් වයස අවුරුදු 55 න් ඉහළ ඕනෑම පුරවැසියකු හට වැඩිහිටි ඉතුරුම් ගිණුමක් ඇරඹිය හැකි වේ. මෙහිදී සේවා ගාස්තු වලින් තොරව සිය භාවිත සේවා බිල්පත් ගෙවීමේ අවස්ථාවද ඔවුන් වෙත හිමිවේ. ඔවුන් හට නොමිලේ වෛද්‍ය පරීක්ෂාවන් සිදුකරවා ගත හැකි වන අතර විශ්‍රාමිකයින් RDB දෙටුසවි ණය පහසුකම් ලබාගැනීමේ ද සුදුසුකම් ලබයි.

අලෙවිකරණ සමාලෝචනය

නිෂ්පාදිත සහ සේවා

RDB ආයෝජන ගිණුම

ජ්‍යෙෂ්ඨ ණය ගිණුම පහසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා බැංකුව මගින් හඳුන්වාදෙන ලද සාමාන්‍ය ආයෝජන ගිණුමකි. මෙම සැලසුමෙහි විශේෂාංගයන් අතරට තැන්පතු සඳහා ආකර්ශනීය පොලියක් සහ ඉලක්කගත කාණ්ඩය වෙත විශේෂයෙන් සකසන ලද ණය යෝජනා ක්‍රමයක් ඇතුළත් වේ.

RDB ස්ථාවර තැන්පතු

RDB ස්ථාවර තැන්පතු, බැංකුවේ පුද්ගල හා ආයතනික ගනුදෙනුකරුවන් අතර ජනප්‍රිය ආයෝජන මාදිලියක් වේ. බැංකුවේ ස්ථාවර තැන්පතු මාස 1,2,3 හා 6 මෙන්ම වසර 1-5 දක්වා ඉදිරිපත් කෙරේ. අරම්භයේ සිට, බැංකුව මගින් සෙසු බැංකු හා සැසඳීමේදී අතිශය ආකර්ශනීය පොලී අනුපාතිකයන් පිරිනැමුනි. වසර 1 සහ ඉහළ කල්පිරීමේ කාලසීමාවක් සහිත ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාතිකයන් පිරිනැමේ.

RDB ජය නිධාන ඉතුරුම් සහතිකය

මෙය සියළුම ආර්ථික මට්ටම් නියෝජනය කරන ගනුදෙනුකරුවන් ආකර්ශනය කරගැනීම සඳහා බැංකුව මගින් හඳුන්වාදෙනු ලබන සැලසුමකි. මෙම සහතිකය රු. 5,000/-, රු. 10,000/-, රු. 25,000/-, රු. 100,000/-, රු. 500,000/- සහ රු. 1000,000/- දක්වා වටිනකම් වලින් යුතු මුහුණත අගයකින් සමන්විත වේ. මෙම සැලසුම මගින් ප්‍රධාන වශයෙන් බැංකුවේ ස්ථාවර තැන්පතු කළඹ වර්ධනය කරමින් ඒ ඔස්සේ කුඩා පරිමාණ ව්‍යවසායකයින් වෙත සහයෝගය පිරිනැමීම අපේක්ෂා කෙරේ. මෙම සැලසුමෙහි විශේෂත්වයක් වනුයේ බැංකුව මගින් කල්පිරීමේදී අදාළ පොලිය පිරිනැමීමයි.

RDB දොරින් දොර - පහසු සමීප බැංකු සේවාව

මෙය ශ්‍රී ලංකාවේ නිවස වෙතම ගොස් බැංකු සේවා සැපයීමේ පුරෝගාමියා වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රමුඛතම සේවාව වේ. මෙහිදී අදාළ ශාඛාවන්හි ප්‍රදේශයන් තුළ පවතින ව්‍යාපාරික පරිශ්‍රයන් සහ නිවාස වෙත දෛනිකව ගමන් කරන, විශේෂිත සේවා සම්පාදකයින් සමූහයක් යොදාගැනේ. මෙම නිරන්තර චාරිකාවන් මගින් ඉලක්ක කණ්ඩායම් වෙත පහසුව සලසමින් බැංකු ගනුදෙනු සඳහා වැය විය හැකි ඔවුන්ගේ කාලය සහ මුදල් ඉතිරිකර දෙනු ලැබේ. 'දොරින් දොර සේවාව' තැන්පතු එක්රැස් කිරීමට පමණක් සීමා නොවී, ඉලක්කගත ගනුදෙනුකරුවන්ගේ සංවර්ධන කටයුතු සඳහා ණය ලබාගැනීම, ණය ගිණුම සේවා කරමින් සිය වාරික හා පොලිය නිසි කලට ගෙවීම සඳහාද අවස්ථාව සැලසේ. එයට අමතරව, භාවිත සේවා බිල්පත් ද මෙම සේවා ඔස්සේ ගෙවිය හැකි වේ. මෙම විශේෂිත සේවාව මගින් කුඩා පරිමාණ ව්‍යවසායකයින් හා පුද්ගලයින් රැසක් හට විශාල ප්‍රයත්නයකින් තොරව කාලයක් තිස්සේ මනා ගිණුම් ශේෂයන් පවත්වාගෙන යාමේ අවස්ථාව උදා විය. එයට අමතරව, මෙකී ගනුදෙනු අතේ ගෙන යා හැකි ඉලෙක්ට්‍රොනික මෙවලමක් ඔස්සේ සිදු කෙරෙන අතර බැංකුවේ පද්ධතිය වෙත ස්වයංක්‍රීයව යාවත්කාලීන කෙරේ. එමනිසා, මෙමගින් බැංකුවේ දැක්ම වන 'ව්‍යවසායකයන් නිර්මාණය කිරීම' යන්න යතාර්ථයක් බවට පත් කරගැනීමට හැකි විය.

RDB ලීසිං

"RDB ලීසිං" යනු ක්ෂුද්‍ර ව්‍යවසාය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, වෘත්තිකයින්, ඉහළ ධනස්කන්ධයක් සහිත වූවන්, රජයේ සහ පෞද්ගලික අංශයෙන් සේවකයින් හට ස්වකීය ව්‍යාපාරයන් හා වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා අත්‍යාවශ්‍ය ලියංපදිංචි කල හා නොකල රථවාහන මිලදී ගැනීම සඳහා භාවිත කල හැකි සේවාවකි. රාජ්‍ය හිමිකාරීත්වය සහිත හා දිවයිනේ විශාලතම සංවර්ධන බැංකුව වශයෙන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ලොරි රථ, ශීතකාරක ලොරි රථ, ට්‍රක් රථ, කැබ් රථ, බස් රථ හා වෑන් රථ වැනි වාණිජමය රථවාහන මෙන්ම ඉඩම් වාහන සඳහා කල්බදු පහසුකම් සලසමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා අතහිත දෙනු ලැබේ.

ලංකා මනි ට්‍රාන්ස්ෆර් (LMT)

ලංකා මනි ට්‍රාන්ස්ෆර් ඔස්සේ මුදල් හුවමාරුව අතිශය වේගවත් වන අතර මෙහිදී ලොව විවිධ රටවලින් එවනු ලබන මුදල් පුළුල් ව්‍යාප්තියක් සහිත ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය හරහා ලබාගත හැකි වේ. සියළුම ප්‍රේෂණයන් ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් ගිණුම් වෙත එසැණින් බැර කෙරේ.

වෙස්ටර්න් යුනියන්

වෙස්ටර්න් යුනියන් ඔස්සේ මුදල් හුවමාරුව වේගවත් වන අතර මෙහිදී ලොව විවිධ රටවලින් එවනු ලබන මුදල් පුළුල් ව්‍යාප්තියක් සහිත ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය හරහා ලබාගත හැකි වේ.

ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර

ජංගම ගිණුම් හැරුනුවිට බැංකුව මගින් ගනුදෙනුකරුවන් වෙත ඉතුරුම් ගිණුම්, ළමා ඉතුරුම් ගිණුම්, කාන්තා ගිණුම්, ජ්‍යෙෂ්ට පුරවැසි ගිණුම්, උකස් සේවාවන් හා විවිධ වූ දිගුකාලීන ණය පහසුකම් ඇතුළු සැලසුම් හා සේවාවන් රැසක් සපයනු ලැබේ. කෙසේවුවද, ලංකා ක්ලියර් වෙතින් සපයනු ලබන ලංකාපේ පොදු ස්වයංක්‍රිය ටෙලර් ජාලය සමගින් බැංකුව සිය ගනුදෙනුකරුවන් වෙත ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සේවාවන් සැපයීමට කටයුතු යෙදීය. එමනිසා, වසර 2015 සිට බැංකුව මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකු ටෙලර් යන්ත්‍ර කාඩ්පත භාවිත කරමින් ලංකාපේ ලාංඡනය සහිත ඕනෑම ටෙලර් යන්ත්‍රයකින් මුදල් ලබාගැනීමේ අවස්ථාව සිය ගනුදෙනුකරුවන් වෙත උදාකෙරිණි. බැංකුවේ ගනුදෙනුකරුවන්ගෙන් බහුතරය ග්‍රාමීය හා අර්ධ නාගරික ව්‍යවසායකයින් වන බැවින්ද, ඔවුන් කෘෂිකර්ම, ධීවර හා පශුසම්පත් වැනි ක්ෂේත්‍රයන්හි නිරත වන බැවින්ද මෙම ටෙලර් යන්ත්‍ර කාඩ්පත ඔවුන් වෙත පහසුව හා සුරක්ෂිතභාවය ළඟා කරනු ඇත. මේ වන විට බැංකුව මගින් දිවයින පුරා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 50 කට අධික සංඛ්‍යාවක් ස්ථාපනය කොට ඇති අතර වසර 2018 දී මුදල් තැන්පතු යන්ත්‍ර ද හඳුන්වාදෙන ලදී. මේවා ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා කාර්යබහුල නගර රැසක ස්ථාපනය කොට ඇත. තවද, නිසි බැංකුකරණ සේවාවන් නොමැති පදවි ශ්‍රීපුර හා වැලිඔය ප්‍රදේශයන්හි ස්වයංක්‍රිය බැංකුකරණ මධ්‍යස්ථාන දෙකක් පිහිටුවා ඇත.

අලෙවිකරණ සමාලෝචනය

ජංගම බැංකුකරණ ඒකකය



ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ගනුදෙනුකරුවන් හට සේවා කවුළු ඔස්සේ මූලික සේවාවන් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් ලබාදීම සඳහා ජංගම බැංකුකරණ ඒකකය හඳුන්වාදෙන ලදී. එහි ඇතුළත මුදල් තැන්පතු, මුදල් ආපසුගැනීම්, බැංකු ගිණුම් විවෘත කිරීම, භාවිත සේවා බිල්පත් ගෙවීම ආදිය සඳහා බැංකු සේවා කවුළුවක් පවතී. මෙම ඒකකය ආපදා සහන ජංගම ඒකකයක් වශයෙන්ද ක්‍රියාකරයි.

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීමේ පද්ධතිය (SLIPS)

RDB SLIPS යනු ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත ආකාරයකින් දේශීය නිශ්කාශන පද්ධතිය ඔස්සේ මුදල් මාරුකිරීමේ අවස්ථාව සලසන්නා වූ අන්තර්බැංකු ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු ක්‍රමවේදයකි. SLIPS භාවිත කරමින් ශ්‍රී ලංකාවේ ඕනෑම සහභාගීත්ව බැංකුවක් වෙත මුදල් මාරු කල හැකි වේ.

පොදු ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු ස්විචය (CEFTS)

පොදු ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු ස්විචය (CEFTS) යනු ගනුදෙනුකරුවන් හට සිය දේශීය අන්තර්බැංකු මුදල් හුවමාරු කටයුතු එසැණින් පහසුවෙන් සිදුකරගැනීමේ අවස්ථාව සලසන තත්කාලීන මුදල් හුවමාරු පද්ධතියකි.

භාවිත සේවා බිල්පත් ගෙවීම



ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් එකම වහළක් යටදී විදුලි බිල්පත්, ජල බිල්පත්, දුරකථන බිල්පත්, රක්ෂණ වාරික ගෙවීම් සිය ශාඛාවන් සහ දොරින් දොර/ග්‍රාමීය නායිකා (ජංගම සේවා) ඔස්සේ සිදුකිරීමේ අවස්ථාව ගනුදෙනුකරුවන් වෙත පිරිනැමේ.

ගබඩා පහසුකම්



ගොවි ජනතාව හට බැංකු ණය ලබාගැනීම සඳහා සහායවීම හා සිය කෘෂි අස්වැන්න අලෙවි කරගැනීමේ දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුවේ සහයෝගය සහිතව ගබඩා ලදුපත් ක්‍රමවේදයක් හඳුන්වාදෙනු ලැබ ඇත. සාකච්ඡා කොට ගත හැකි ගබඩා ලදුපත් මගින් සැබෑ කෘෂි නිෂ්පාදන භාරදීමකින් තොරව ගබඩාවක පවතින කවර හෝ නිෂ්පාදන හිමිකාරීත්වය මාරු කිරීමේ අවස්ථාව උදා කෙරේ.

මෙම ලදුපත් බැංකු ණය සඳහා ඇපකර වශයෙන් භාවිත කල හැකි වේ. ගබඩා ලදුපත් මූල්‍යකරණය මගින් ගොවීන් වෙත ගබඩාකරණය ඔස්සේ වටිනාකම් දාමගත සේවාවක් සහ ගබඩා කරන ලද නිෂ්පාදන ඇපයට තබා ණය ලබාගැනීමේ අවස්ථාවද පිරිනැමේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මේ වන විට ගලෙන්බිඳුනුවැව, මුරුන්කන්, කිලිනොච්චි, මැදවච්චිය සහ ඇඹිලිපිටිය ප්‍රදේශයන්හි ගබඩා හයක් කළමනාකරණය කෙරේ. එහිදී ගොවීන් හට ධාන්‍ය වර්ගය අනුව අවම ගාස්තුවක් යටතේ සිය අස්වැන්න ගබඩා කල හැකි වේ.

BANCASSURANCE

අප සමග බැංකු කටයුතු සිදුකරනු ලබන අතරතුර පුළුල් පරාසයක පැතිරුනු රක්ෂණ සමාගම් රැසක් වෙතින් රක්ෂණාවරණයන් සහ ප්‍රතිලාභ ලබාගැනීමට RDB බෑන්ක්ඇෂුවරන්ස් ඒකකය ඔස්සේ අවස්ථාව උදා කෙරේ.

සමාජ හා පාරිසරික සමාලෝචනය

ආයතනික සමාජ වගකීම

සමාජයේ මිනිසුන් අත්විඳින ගැටළු පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, බැංකුවේ පාර්ශ්වකරුවන් හා කොටස් හිමිකරුවන් කෙරෙහි වන වගකීම පිළිබඳ අවධාරණය කිරීම සහ ප්‍රජාව හා පරිසරය නගාසිටුවීම සඳහා වන බැංකුවේ වගකීම අවධාරණය කිරීම සමාජය කෙරෙහි වන වගකීම් වශයෙන් දැක්විය හැක.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ආයතනයක් වශයෙන් ප්‍රතිලාභී තත්ත්වයක පසුවන අතර සිය සමාජ වගකීම ඉටුකිරීමෙහිලා කැප වී ක්‍රියාකරයි. ඒ අනුව, ආරම්භයේ සිට මේ දක්වා බැංකුව හුදෙක් ලාභ ඉපැයීමේ අරමුණින් යුතුවම කටයුතු කොට නොමැති අතර ස්වකීය ශක්ති ප්‍රමාණයෙන් සමාජ සුබසාධන කටයුතු කෙරෙහි දායකත්වය දක්වා ඇත.

සිය මෙහෙවර ප්‍රකාශය අනුව යමින්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් විශේෂිත වෘත්තික කණ්ඩායමක් ඔස්සේ මූල්‍ය හා උපදේශන සේවාවන් සපයනු ලබන අතර අදාළ ප්‍රදේශයන්හි සමාජ ආර්ථික සෞභාග්‍යය උදාකරලීම එහි අරමුණ වේ.

බැංකුවේ සමාජ සුභසාධන වැඩසටහන් වල විශේෂ ලක්ෂණයක් වනුයේ එමගින් අව වරප්‍රසාදිත ප්‍රජාවන් වෙත බැංකු සේවාවන් ලබාදෙමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ කාන්තා ව්‍යවසායිකාවන් වෙත සහනදායී පොලී අනුපාතික යටතේ මූල්‍ය සේවාවන් ලබාදීමයි.

සමස්තයක් වශයෙන්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ස්වකීය සමස්ත කාර්ය මණ්ඩලයේ සහයෝගය හා කැපවීම මත, මෙරට ප්‍රධාන පෙලේ සමාජ සේවා ව්‍යාපෘතීන් කෙරෙහි කැපීපෙනෙන දායකත්වයක් ලබාදී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය වෙතද ආදර්ශවත් ආයතනයක් වශයෙන් පෙනී සිටීමේ විශිෂ්ඨ හැකියාව බැංකුව සතු වේ.

රිකිල්ලගස්කඩ ලූල්කඳුර දෙමළ විද්‍යාලය වෙත නව සනීපාරක්ෂක පහසුකම් ලබාදීම



ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් විවිධ අයුරින් ප්‍රජාවන් වෙත මූල්‍ය හා උපදේශන සේවාවන් සපයනු ලබන අතර, එහිදී 2019 ජනවාරි 24 වැනි දින රිකිල්ලගස්කඩ ලූල්කඳුර දෙමළ විද්‍යාලය වෙත නව සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සිදු කෙරිණි.

සිංහල හා හින්දු නව වසර සමරමින් පැළ බෙදාදීම්

2019 සිංහල හා හින්දු අළුත් අවුරුදු සැමරුමෙහි කොටසක් වශයෙන්, දිවයින පුරා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛාවන්හි, 2019 අප්‍රියෙල් 15 වැනි දින අවුරුදු ගනුදෙනු චාරිත්‍ර සඳහා පැමිණි ගනුදෙනුකරුවන් වෙත පැළ බෙදාදීම සිදුකෙරිණි.



ආයතනික සමාජ වගකීම

ධාන්‍ය ගබඩා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මෙහෙයවනු ලබන ගබඩා ආශ්‍රිතව ලබාගත හැකි පහසුකම් හා ප්‍රතිලාභ පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මුරුත්කන් සහ ඇඹිලිපිටිය ප්‍රදේශයන් හිදී පවත්වන ලදී. එහිදී ගබඩා ලවුපත් මූල්‍යකරණ පහසුකම් යටතේ අදාළ ගබඩාවන්හි ධාන්‍ය එක්රැස් කරනු ලබන ආකාරය, තරඟකාරී මිළ ගණන් යටතේ අස්වැන්න අලෙවි කරගන්නා ආකාරය පිළිබඳ උපදෙස් සහ අවශ්‍ය මූල්‍යමය සහාය පිරිනමන ලදී.





ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් නිරන්තරයෙන් පවත්වනු ලබන දේශන හා පුහුණු වැඩසටහන් ඔස්සේ ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රජාවන් වගකීම් සහගත පුරවැසියන් බවට පත්කරලීම උදෙසා ආයෝජනයන් සිදුකෙරේ. එවැනි ප්‍රයත්නයන් ඔස්සේ අදාළ ප්‍රජාවන් හට සිය එදිනෙදා ජීවිතය වඩාත් යහපත් ආකාරයෙන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ ක්‍රියාවට නැංවීම සඳහා ඉඩ සළසමින්, ඉතුරුම් කෙරෙහිම පමණක් අවධානය යොමු නොකොට අමුද්‍රව්‍ය හා කාල කළමනාකාරණය ඔස්සේ සිට ජීවන රටාවන් ඉහළ නංවා ගත හැකි මාර්ගයන් කෙරෙහි ඔවුන් යොමු කරවීමද සිදු කෙරේ.



සේවක සමාලෝචනය

සාරාංශය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සිය සේවකයින් හට හැකියාවන් උපරිම වර්ධනය කරගනිමින් රැකියා තත්ත්වය උසස් කර ගැනීමට අවස්ථාවන් සැලසීම සහ ප්‍රශංසනීය කණ්ඩායම් පරිසරයක් තුළ හිතකර හා ඵලදායී වූ වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කැප වී කටයුතු කරයි. මෙහිදී සේවකයා හට දැනුම් හුවමාරු පරිසරයක්, රැකියා සුරක්ෂිතභාවය සහ රැකියා සංවර්ධනය සඳහා ප්‍රතිලාභ සලස්වනු ලබයි.

මීට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් කිහිපයක් ඔස්සේ, සිය සේවකයින් වෙත කාර්යක්ෂම සේවාවන් ලබාදීම උදෙසා ඩිජිටල් පරිවර්තන ක්‍රියාකාරකම්ද ඇතුළුව නිසි ප්‍රතිපත්ති, භාවිතයන් හා ක්‍රියාවලීන් හඳුන්වාදෙමින් හැකියාව මත පදනම් වූ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් නිර්මාණය කරන ලදී. සේවක සහභාගීත්වය විධිමත් කිරීම සඳහා මානව සම්පත් ක්‍රියාවලීන් ස්වයංක්‍රියකරණය දායක විය. මානව ප්‍රාග්ධන මූල්‍යමය ප්‍රකාශය ඔස්සේ, සේවක ශක්තීන් හා ව්‍යාපාරික කාර්සාධනය කෙරෙහි ඔවුන්ගේ දායකත්වය ඇගයීම සඳහා මානව සම්පත් ආශ්‍රිත දත්ත හා විශ්ලේෂණයන් අඛණ්ඩවම යොදාගැනේ.

මානව සම්පත් ආශ්‍රිත ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක

මානව ප්‍රාග්ධන ආයෝජන මත ප්‍රතිලාභ ආශ්‍රිත ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක වසර 2019 දී දිගින් දිගටම වර්ධනය වෙමින් පැවති අතර ඒ සඳහා ශ්‍රම බලකායෙහි සමස්ත පිරිවැය අවම මට්ටමක පවත්වා ගනිමින් පෙර වසර වලට සාපේක්ෂව ව්‍යාපාරික කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා බැංකු සේවකයින් විශිෂ්ට අයුරින් දායක වී ඇත.

2016 සිට 2019 දක්වා සඳහා ශ්‍රම බලකා ඵලදායීතා බලපෑම සම්බන්ධ ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක

	2016	2017	2018	2019
මුළු මෙහෙයුම් ලාභය (රු.මිලියන)	2,130	3,307	3,606	**2,960**
මුළු අදායම (රු.මිලියන)	15,744	22,016	26,071	**27,508**
ණය කළඹ (රු.මිලියන)	106,806	130,325	137,770	**144,694**
තැන්පතු කළඹ (රු.මිලියන)	107,032	139,827	141,560	**149,600**
මුළු සේවක සංඛ්‍යාව (පූර්ණ කාලීන)	2,342	2,395	2,345	**2,735**
මුළු සේවක පිරිවැය (රු.මිලියන)	4,699	5,346	6,225	**6,261**
මානව ප්‍රාග්ධන ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය (රු.මිලියන)	1.47	1.62	1.33	**1.08**
පූර්ණ කාලීන සේවකයකුට ඵලදායීතාවය (රු)	950,514	1,380,791	900,357	**1,082,267**
මානව ප්‍රාග්ධන ආයෝජනය මත ප්‍රතිලාභ	45.3%	61.9%	52%	**47.3%**

මිනිස්බල ශක්තිය

බැංකුවේ ශ්‍රම බලකාය ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවන ලද සේවකයින්ගෙන් සමන්විත වේ. එයට අමතරව, දොරින් දොර ක්ෂේත්‍ර සහායකයින් (ස්ථාවර කොන්දේසි කොන්ත්‍රාත් ගිවිසුම මත) සහ ග්‍රාමීය නායකයින් (ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ) බැංකුව වෙත මිනිස් බල සේවාවන් සපයයි. එමෙන්ම බැංකුව මගින් විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, පිලිගත් වෘත්තීය ආයතන හා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන පාසැල් හැරයන්නන්ගේ ඉල්ලීම පරිදි පුහුණුව (මාස 6-12) අවශ්‍ය කරන අභ්‍යාසලාභීන් සඳහා බැංකුව අවස්ථාවන් ලබාදේ. බැංකුවේ කාර්යසාධනය සඳහා මෙම කාණ්ඩයන් වෙතින් ද වටිනා යෙදවුම් ලබාදේ.

මිනිස් බල ශක්තිය පිළිබඳ සාරාංශය පෙර වසරට සාපේක්ෂව පහත පරිදි වේ.

	පුද්ගලයින් ගණන	
මිනිස්බල කාණ්ඩය	2018	2019
ස්ථිර/කොන්ත්‍රාත් සේවකයින්	2345	**2735**
දොරින් දොර ක්ෂේත්‍ර සහායකයින්	399	**449**
ග්‍රාමීය නායකයින්	340	**200**
එකතුව	3084	**3384**

සේවක සමාලෝචනය

බැංකුවේ ප්‍රවේශ මට්ටමේ තනතුරු සඳහා පුහුණු සංවර්ධන සහායකයින් 328 දෙනෙකු බඳවා ගන්නා ලදී. ඊට අමතරව, අත්පත් කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 152 දෙනෙකු අන්තර්ග්‍රහනය කෙරිනි. වසර තුළදී සේවක සංඛ්‍යාවේ 17% ක පමණ සැලකිය යුතු ඉහළයාමක් වාර්තා විය. කළමනාකාරීත්ව මට්ටමේ ශ්‍රම සේවක පිරිස් බෙදීයාම පහත දැක්වේ.

	සේවක පිරිස් බෙදීයාම		
කළමනාකාරීත්ව මට්ටම	2018	2019	%
ආයතනික කළමනාකාරීත්වය	8	**6**	-25
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය	29	**34**	17
විධායක කළමනාකාරීත්වය	153	**133**	-13
විධායක නිලධාරීන්	1030	**1040**	1
ලිපිකරු හා ආශ්‍රිත	981	**1366**	28
වෙනත් ශ්‍රේණි	144	**156**	8
එකතුව	2345	**2735**	17

බැංකුව විසින් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය වෙතම සම රැකියා අවස්ථා පිරිනමනු ලැබේ. නව බඳවාගැනීම/අත්පත් කරගැනීමෙන් අනතුරුව පවා වසර 2019 දී ස්ත්‍රී පුරුෂ තුලනාත්මක ස්වභාවය අඛණ්ඩවම පවත්වා ගෙන යන ලදී.

	2018		2019	
ස්ත්‍රී/ පුරුෂභාවය	සේවක සංඛ්‍යාව	%	සේවක සංඛ්‍යාව	%
පුරුෂ	1314	56.03	**1546**	**56.53**
ස්ත්‍රී	1031	43.97	**1189**	**43.47**
එකතුව	2345	100.00	**2735**	**100.00**

සේවක ප්‍රජාව අතිශය අත්දැකීම් සපිරි වෘත්තික පිරිසක් වන අතර ඔවුන්ගේ අතීත සේවා සාමාන්‍යය වසර 15.8 ක් සහ වයස සාමාන්‍යය වසර 41.2 ක් වේ. බැංකුවේ වයස් හා අත්දැකීම් ස්වභාවයන් පහත දැක්වේ.

වයස ස්වභාවය

වයස් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	%
අවුරුදු 31 ට පහළ	608	22.23
අවුරුදු 31 - 40	830	30.35
අවුරුදු 41 - 50	562	20.54
අවුරුදු 51 - 55	487	17.81
අවුරුදු 55 ට ඉහළ	248	9.07
එකතුව	2735	100.00

අත්දැකීම් ස්වභාවය

අත්දැකීම් කාණ්ඩය	සේවක සංඛ්‍යාව	%
අවුරුදු 30 ට ඉහළ	308	11.26
අවුරුදු 20-29	836	30.57
අවුරුදු 10-19	576	21.06
අවුරුදු 5 -9	554	20.26
අවුරුදු 5 ට පහළ	461	16.85
එකතුව	2735	100.00

වෘත්තීය අභිවෘද්ධිය

බැංකුව මගින්, සේවක ආකල්ප සංවර්ධනය මෙන්ම බැංකුකරණ මෙහෙයුම් සහ වඩා යහපත් ගනුදෙනුකාර සේවාව පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් සහ දැනුම ලබාදීම උදෙසා අඛණ්ඩ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. වසර තුළදී සේවකයින් 2,382 දෙනෙකු සහභාගී කරවාගනිමින් එවැනි වැඩසටහන් 87 ක් පවත්වන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධ සියළුම පැතිකඩ ආවරණය වන පරිදි අත්දැකීම් ලබාදීමේ අරමුණින් යුතුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති මූල්‍යකරණය සම්බන්ධව කටයුතු කරන කාර්ය මණ්ඩලය නියෝජනය වන පරිදි සාමාජිකයින් 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් 02 ක් සඳහා, ඉන්දියාවේ ජවහර්ලාල් නේරු බැංකුකරණ හා මූල්‍ය ආයතනයේ සම්පත් දායකත්වය සහිතව ඉන්දියාවේදී දස දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

ස්වකීය ක්ෂේත්‍රයන්හි අදාළ දැනුම ලබාගැනීම සඳහා නිලධාරීන් නව දෙනෙකු වෙත විදේශ පුහුණු අවස්ථා පිරිනමන ලදී. 2017 විශිෂ්ටතම ශාඛාව සම්මානයෙන් පිදුම් ලද ශාඛාවෙහි කාර්ය මණ්ඩලය වෙත විදේශ සංචාරයක්ද එහි ශාඛා කළමනාකරු වෙත විදේශ පුහුණුවක් ද පිරිනමන ලදී. වසර තුළ දේශීය හා විදේශීය පුහුණු කටයුතු සඳහා ආයෝජනය කරන ලද මුදල රු. මිලියන 24.2 කි.

දුක්ගැනවිලි නිරාකරණය

බැංකුව මගින් සන්නිවේදනය දියුණු කිරීම ඔස්සේ අනාගතයෙහි ඇති විය හැකි යැයි අපේක්ෂිත ගැටළු මගහරවා ගැනීමේ අරමුණින් යුතුව සේවක ගැටළු හා දුක්ගැනවිලි සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදෙනු ලැබ ඇත. මෙහිදී ප්‍රධාන කාර්යාලයීය හා පළාත් මට්ටමින් සේවක දිනයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, එමගින් මානව සම්පත් ආශ්‍රිත ගැටළු සාකච්ඡා කිරීම සඳහා කාර්තුමය වශයෙන් දින යොදා ගනිමින් කාර්ය මණ්ඩලය වෙත දැනුවත් කර ඇත.

සේවක ප්‍රතිලාභ

සෙසු රාජ්‍ය බැංකු වල වටුප් පරිමාණයන් සමග සමාන වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සේවක වැටප් තවුදුරටත් ඉහළ නංවන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සක්‍රීය සේවකයින් හට සහභාගී විය හැකි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමග නැවතත් සාකච්ඡා අරඹන ලද අතර, එහිදී මූල්‍යමය වශයෙන් දැරිය හැකි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් හඳුනගැනීම සඳහා ආයුගණන තක්සේරුකරණයන් කිහිපයක් ඇගයුමට ලක් කරන ලදී.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහනය, අත්පත් කරගැනීමේ ප්‍රතිඵලය

බැංකුව, වරලත් පිරිස් කළමනාකරණ ආයතනය මගින් ඉදිරිපත් කරන ලද (HR due Deligence Report) වාර්තාවෙහි නිර්දේශ අනුව, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සේවකයින් 152 දෙනෙකු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තනතුර වෙත අන්තර්ග්‍රහනය කෙරිණි. ඉන්පසු ඔවුන් බැංකුව විසින් පවත්වන ලද අනුස්ථාපන සහ ඒකාබද්ධකරණ වැඩසටහනක් වෙත යොමු කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා සම්බන්ධ වීම අපේක්ෂා නොකල සේවකයින් 10 දෙනෙකු වෙත ස්වේච්ඡා විශ්‍රාම සැලසුම් පිරිනමන ලදී.

මානව සම්පත් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

ආයතනික යහපාලන පරිචයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශයන්ට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා කමිටුව යනුවෙන් වෙන් වෙන් වූ අනු කමිටු දෙකක් ස්ථාපනය කෙරිණි. මෙකී කමිටු දෙකෙහි ප්‍රධානත්වය දරනු ලබන්නේ බැංකුවේ සභාපතිවරයා විසිනි. වසර 2019 දී නාමයෝජනා කමිටු රැස්වීම් හතරක් (4) සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් දහයක් (10) පවත්වන ලදී.

මීට අමතරව, බැංකුවේ ආයතනික යහපාලන පරිචයන් සවිමත් කිරීම සඳහා මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවක් ස්ථාපනය කිරීමට කටයුතු යොදන ලදී. මෙම කමිටුවෙහි කාර්යභාරය වනුයේ, නාමයෝජනා කමිටුව සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් හා ස්වභාවයෙන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමවේ. මෙහි ප්‍රධානත්වය සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. විසින් හොබවන අතර එය විධායක කමිටුවක් වශයෙන් ක්‍රියාත්මක වේ. වසර තුළදී, කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර අදාළ පරිදි රැස්වීම් වාර්තා නාමයෝජනා කමිටුව සහ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

විශේෂ සිදුවීම්

ශාඛා ප්‍රතිස්ථානගත කිරීම

මොණරාගල ශාඛාව



මොණරාගල ශාඛාව වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 ජනවාරි 21 දින සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. ආරියපාල මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

කළුවැල්ල ශාඛාව



කළුවැල්ල ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 මැයි 27 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් විවෘත කරන ලදී.

කුරුවිට ශාඛාව



කුරුවිට ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 පෙබරවාරි 18 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් අභිනවයෙන් විවෘත කරන ලදී.

දන්තුරේ ශාඛාව



දන්තුරේ ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 ජූනි 10 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් විවෘත කරන ලදී.

හෑදෙනිය ශාඛාව



හෑදෙනිය ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 ජූනි 10 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් විවෘත කරන ලදී.

කල්මුණේ ශාඛාව



කල්මුණේ ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 අගෝස්තු 19 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් විවෘත කරන ලදී.

මඩකළපුව ශාඛාව



මඩකළපුව 2 වැනි ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 අගෝස්තු 19 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

පොතුපිටිය ශාඛාව



පොතුපිටිය ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 සැප්තැම්බර් 16 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

විශේෂ සිදුවීම්

කැකණදුර ශාඛාව



කැකණදුර ශාඛාව ගනුදෙනුකරුවන් වෙත වඩාත් පහසු ස්ථානයක් වෙත රැගෙන යන ලද අතර එය 2019 ඔක්තෝබර් 14 දින දකුණු පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී නිමල් ද සිල්වා මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

නැගෙනහිර පළාත් කාර්යාලය සහ මඩකළපුව දිස්ත්‍රික් කාර්යාලය



නව ස්ථානයක් වෙත රැගෙන යන ලද නැගෙනහිර පළාත් කාර්යාලය සහ මඩකළපුව දිස්ත්‍රික් කාර්යාලය 2019 අගෝස්තු 19 දින වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී. කුහන් මහතාගේ සහභාගීත්වයෙන් සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

ජය ශ්‍රී මහ බෝ සමිඳුන් අභියස දානමය පුණ්‍යකර්මය

කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් සංවිධානය කරන ලද දානමය පිංකම 2019 ජූනි මස අනුරාධපුයේදී පැවැත්විනි.



පාසැල් ඉතුරුම් මධ්‍යස්ථාන

පාසැල් දරුවන් අතර ඉතුරුම් පුරුදු ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව, 2019 ජනවාරි 31 දින මහනුවර, Springfield ජාත්‍යන්තර පාසැල් ඉතුරුම් මධ්‍යස්ථානය යළි එළිදක්වන ලදී.



''ඉතුරු මිතුරු'' ව්‍යාපෘතිය යටතේ කොළඹ විශ්ව විද්‍යාලයීය ලියෝ සමාජයෙහි සහයෝගීතාවයෙන් යුතුව, වත්තේගම ශාඛාව මගින් වත්තේගම සිද්ධාර්ථ විද්‍යාලයීය පාසැල් ඉතුරුම් මධ්‍යස්ථානය යළි එළිදක්වන ලදී.



තෙපොංගල් සැමරුම

2019 ජනවාරි 16 වැනි දින විශේෂ තෙපොංගල් උත්සව සැමරුමක් ප්‍රාදේශීය සංවර්ධන බැංකු ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විනි.



ජාත්‍යන්තර කාන්තා දින සැමරුම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සෑම ශාඛාවක් මගින්ම දිවයින පුරා කාන්තාවන් අතර ඉතුරුම් පුරුදු ප්‍රචලිත කිරීමේ අරමුණින් යුතුව විශේෂ ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් සංවිධානය කෙරිණි.



මහනුවර නගරයේ අවුරුදු වාසි විශේෂ වීදි ප්‍රවර්ධන ව්‍යාපෘතිය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මහනුවර ශාඛාව මගින් අනාගත ගනුදෙනුකරුවන් හා ශාඛාවේ තැන්පතු පදනම වර්ධනය කරගැනීමේ අරමුණින් යුතුව, 2019 අප්‍රියෙල් 3 වැනි දින විශේෂ අවුරුදු වාසි වීදි ප්‍රවර්ධන ව්‍යාපෘතියක් සංවිධානය කෙරිණි.



විශේෂ සිදුවීම්



සිංහල හා දෙමළ අළුත් අවුරුදු සැමරුම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සෑම ශාඛාවක් මගින්ම 2019 අප්‍රේල් 16 වැනි දින සිංහල හා දෙමළ අළුත් අවුරුදු සැමරුම වෙනුවෙන් විශේෂ වැඩසටහන් සංවිධානය කෙරිණි.



ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් ස්ථාපනය කිරීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් වසර 2019 දී ස්වකීය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය පුළුල් කරමින් දිවයින පුරා ටෙලර් යන්ත්‍ර 25 ක් ස්ථාපනය කෙරිණි.



නව බඳවාගැනීම්

ඵලදායීතාවය වර්ධනය කරගැනීමේ සහ නව අදහස් තුළින් අනාගතය වෙත පියනැගීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් සිය ශ්‍රමබලකාය වෙත නව සේවක සේවිකාවන් 328 දෙනෙකු එක් කර ගැනුනි.



ජංගම බැංකුකරණ සේවාව

උඩුදුම්බර ශාඛාව මගින් හුන්නස්ගිරිය ස්මාර්ට් ෂර්ට්ස් හි සේවකයින්ගේ මුදල් ගනුදෙනු කිරීමේ පහසුව උදෙසා 2019 සැප්තැම්බර් 4 දින සිට මාසිකව ජංගම බැංකුකරණ සේවාවක් පවත්වනු ලැබේ.



සේවක සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින්, සමස්ත සේවක ප්‍රජාවගේ කාර්යසාධන වර්ධනය හා දැනුම් මට්ටම ඉහළ නැංවීම සඳහා පුහුණු සැසි කිහිපයක් පවත්වන ලදී.



ප්‍රාදේශීය සංවර්ධන බැංකු සංවත්සරය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියළුම ශාඛාවන් මගින් සිය ගනුදෙනුකරුවන් සමග විශේෂ වැඩසටහන් පවත්වමින් ස්වකීය 34 වැනි සංවත්සරය සමරන ලදී.



ලෝක ළමා දින සැමරුම

බැංකුවේ සෑම ශාඛාවක් මගින්ම ඔක්තෝබර් 1 වැනි දින ලෝක ළමා දිනය සමරමින් දරුවන් හා ඔවුන්ගේ දෙමව්පියන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීම උදෙසා කටයුතු කෙරිණි.





විශේෂ සිදුවීම්

2019 වසරේ නව නිෂ්පාදන සංවර්ධනය

"RDB ලීසිං" හඳුන්වාදීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය කළඹ වෙත තරඟකාරී පහල පොලී අනුපාතියක් සහිත "RDB ලීසිං" එක් කරන ලද්දේ, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, වෘත්තිකයින් සහ වියදම දරාගත හැකි ආදායම් මට්ටමක් සහිත පුද්ගලයින් මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් සේවා නියුක්තිකයන් වෙනුවෙනි.



RDB ලිය සවිය ප්ලස් එළිදැක්වීම

කාන්තා ආයෝජන ඉතුරුම් ගිණුම

RDB ලිය සවිය ප්ලස් ආයෝජන ගිණුම විශේෂයෙන් සකසනු ලැබ ඇත්තේ බැංකුවේ කාන්තා ව්‍යවසායිකාවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කරවීමේ අරමුණිනි. මෙහිදී පිරිනමනු ලබන තරඟකාරී පොලී අනුපාතිකයට අමතරව, මෙම මධ්‍ය කාලීන ආයෝජන ගිණුම මගින් විශේෂ තිළිණයන්ද ලබාදෙනු ලැබේ. ලෝක කාන්තා දිනය සමරමින් මෙම සැලසුම් 2019 මාර්තු 1 වැනි දින එළිදක්වන ලදී.



අවදානම් කළමනාකරණය

විධායක සාරාංශය

ස්වකීය මෙහෙයුම් ක්‍රියාවලිය තුළදී උද්ගත වන අවදානම් කළමනාකරණය හා වළකා ගැනීම උදෙසා බැංකුව මගින් සම්පූර්ණ බැංකුකරණ ක්‍රියාවලිය ආවරනය වන පරිදි පරිපූර්ණ අවදානම් කළමනාකරණ ආකෘතියක් ක්‍රියාවේ යොදවනු ලැබ ඇත.

අවදානම් කළමනාකරණ ආකෘති සහ පාලනයන්

- සම්පූර්ණ බැංකු අවදානම පාලනය සහ කළමනාකරණය සඳහා රේඛා ත්‍රිත්වයකින් යුත් ආරක්ෂණයක් යෙදවීම
- කුසලතා පූර්ණ කාර්ය මණ්ඩලයක් සමගින් අවදානම් කළමනාකරණ ඒකකය ස්ථාපනය හා ව්‍යාප්ත කිරීම
- යෝග්‍ය වූ තොරතුරු කළමනාකරණය සහ තාක්ෂණික යටිතල පහසුකම්
- මනා සේ ස්ථාපනය කරන ලද අවදානම් කළමනාකරණ කමිටු
- තොරතුරු සුරක්ෂිතකරණ ඒකකය පිහිටුවීම
- දැනුවත් කිරීම් හා පුහුණුව තුළින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වටපිටාවක් නිර්මාණය කිරීම

ණය අවදානම් ස්වභාවයෙහි වර්ධනය ඒකාබද්ධකරණය



භූගෝලීය ප්‍රදේශය අනුව ණය අවදානම (%)

කර්මාන්තය අනුව ණය අවදානම (%)



අක්‍රිය වත්කම් අනුපාතය (%)



වෙන්කිරීම් ආවරන අනුපාතය (%)



විවාත ණය නිරාවරනය (%)

- සමස්ත කළඹෙන් 37% ක් කර්මාන්ත ක්ෂේත්‍රය මගින් නියෝජනය වන අතර ඉන් පසු කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රයන් මගින් 20% ක් ආවරනය වේ. තවද සමස්ත කළඹ සඳහා HHI දර්ශකය පිළිවෙලින් 0.111 සහ 0.041 වශයෙන් දැකවෙන අතර ක්ෂේත්‍රයන් සම්බන්ධ අඩු සංකේන්ද්‍රණය හේතුවෙන් ණය කළඹ සඳහා මුළු HHI 0.205 ක් ලෙස දැක්වුනි.
- පසුගිය වසර (2018) හා සැසඳීමේදී බැංකුවේ සමස්ත ණය කළඹ 5% කින් වර්ධනය විය.
- අක්‍රිය ණය අනුපාතය 2018 වසර අවසානයේ දී වාර්තා වූ 5.36% ට සාපේක්ෂව 9.63% දක්වා ඉහළ යාමක් වාර්තා කළේය.
- බැංකුව හට අනපේක්ෂිත තත්ත්වයක් තුළ කොටස් හිමිකරුවන්ගේ අරමුදල් යොදා ගනිමින් 40.39% ක් වූ සිය අක්‍රිය ණය සමනය කිරීමට සිදුවන බැවින් වෙන්කිරීම් ආවරන අනුපාතය දළ වශයෙන් 55.92% ක් ලෙස පැවතිණි.
- දෙසැම්බර් මාසය තුල වෙන්කිරීම් රුපියල් මිලියන 4.2 කින් ඉහළ ගිය අතර එයා පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 119% ක වර්ධනයකි.

අවදානම් කළමනාකරණය

බැංකුවේ ද්‍රවශීලතා අවදානම



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (%)



මුළු ප්‍රාග්ධනය (%)

- බැංකුව බාසල් 111 අවශ්‍යතාවයට අනුකූල වේ.

ද්‍රවශීලතා ආවරණ අනුපාතය

කාලසීමාව	2019-ජන.	2019-පෙබ.	2019-මාර්තු	2019-අප්‍රේල්	2019-මැයි	2019-ජූනි	2019-ජූලි	2019-අගෝ.	2019-සැප්.	2019-ඔක්.	2019-නොවැ.	2019-දෙසැ.
සැබෑ වටිනාකම (%)	172.22	225.94	114.32	145.20	158.41	144.98	183.63	144.70	170.09	205.99	187.26	205.99

- මේ සම්බන්ධ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය 20% කි. බැංකුව මගින් නියාමන අවශ්‍යතාවය සපුරාලමින් 32.38% ක අනුපාතයක් පවත්වා ගැනිනි.
- 2019 ජනවාරි 1 දිනට ද්‍රවශීල ආවරණ අනුපාතය (LCR) සම්බන්ධ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය 100 කි. බැංකුව මගින් නියාමන අවාශ්‍යතාවය සපුරාලමින් 205.99 ක අනුපාතයක් පවත්වා ගැනිනි.

ප්‍රාග්ධන අවදානම



ස්ථරය 1 ප්‍රාග්ධනය (%)

මූල්‍යමය නොවන අවදානම්

මෙහෙයුම් අවදානම

- 2019 වසරේ දී මෙහෙයුම් කමිටු රැස්වීම් 12 පැවැත්වූ අතර එහි රැස්වීම් වාර්තා විමර්ශනය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත භාරදෙන ලදී.
- වසර 2019 සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය විමර්ශනයට ලක් කෙරුනු අතර එය බැංකුවේ නිසි ක්‍රියාකාරීත්වය හේතුවෙන් අවදානම් කළමනාකරණ කමිටුව මගින් නිර්දේශ කරනු ලැබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

අනුකූලතා අවදානම

බැංකුවේ අනුකූලතා ක්‍රියාදාමය අවදානම් සම්බන්ධ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අවදානම් කළමනාකරණ කමිටුවේ විෂයපථයට අයත් වේ. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා ඔහු විසින් අනුකූලතා අවශ්‍යතා අධීක්ෂණය හා ඇගයුමට ලක් කරමින් විමර්ශනය සඳහා කාර්තුමය වාර්තා අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි. වාර්ෂිකව විමර්ශනයට ලක් කරනු ලබන පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලත් අනුකූලතා ප්‍රතිපත්තියක් පවතී. අනුකූලතා නිලධාරීවරයා විසින් ද නියාමනයන් වෙත බැංකුවේ අවශ්‍ය ව්‍යවස්ථාපිත වාර්තා නිසි කලට ලබාදීම පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ.

සෑම ව්‍යාපාරයක්ම සිය ව්‍යාපාරික වටපිටාව තුළ අවිනිශ්චිතතාවන්ට හෝ අවදානමට මුහුණ දෙයි. මූල්‍ය ආයතනයක් වශයෙන්, බැංකුවට සිය මෙහෙයුම් ක්‍රියාවලිය තුළ අවදානම් ආවේණික වේ. එමනිසා බැංකුව සෑමවිටම අවදානම හා ආදායම අතර සමතුලිතයක් පවත්වා ගනී. අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සළකන කල, බැංකුව මගින් සිය අවදානම් සාධක කළමනාකරණය හා වළකාගැනීම සිදු කල යුතු වන අතර, එසේ නැතිනම් එය දූවැන්ත මෙහෙයුම් හා මූල්‍යමය අලාභයන් කෙරෙහි හේතු විය හැක. බලාත්මක අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඔස්සේ සිය අනපේක්ෂිත අවදානම් වළකාගැනීම සඳහා ඵලදායී තීරණ ගනිමින් ස්වකීය ක්‍රමෝපායික හා මෙහෙයුම් අරමුණු වැඩිදියුණු කරගැනීම තුළින් තිරසාර වර්ධනයක් අත්පත් කරගැනීමට බැංකුව සමත් වේ.

අවදානම් කළමනාකරණ විශ්ලේෂනය

බැංකුව විසින් මුහුණදෙනු ලබන අවදානම් බැංකුවේ පාලනය තුළ පවතින අභ්‍යන්තර අවදානම් සහ බැංකුවේ පාලනයෙන් බැහැර වූ බාහිර අවදානම් වශයෙන් වර්ග කළ හැකි අතර මේ ද්විත්වයම ප්‍රබල අවදානම් කළමනාකරණ අකෘතියක් ඔස්සේ කළමනාකරණය කෙරේ.

අභ්‍යන්තර හා බාහිර සාධක හේතුවෙන් බැංකුවේ සමස්ත අවදානම් ස්වභාවයෙහි වෙනස්වීම් සිදුවිය හැක. බැංකුව ක්‍රමෝපායික ප්‍රතිචාරයන් යොදාගනිමින් මෙසේ උද්ගත වන අවදානම් හා අවිනිශ්චිතතාවන්ට මුහුණදෙයි.

අභ්‍යන්තර සාධක අතරට අවදානම් කළමනාකාරණ ආකෘතිය ක්‍රියාවේ යෙදවීමේ දුර්වලතා, සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ උපකල්පන වෙනස්වීම, අභ්‍යන්තර ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා ආදිය ඇතුළත් වන අතර, බාහිර සාධකයන් සමස්ත ආර්ථික හෝ වෙළඳපොල සම්බන්ධ අහිතකර සංචලනයන්, දේශපාලන අස්ථාවරත්වය සහ රජයේ මුදල් ප්‍රතිපත්තියේ වෙනස්කම් ආදියෙන් සමන්විත වේ. මෙම සාධකයන් මගින් මෙහෙයුම් වටපිටාව සංකීර්ණ තත්ත්වයට පත් කෙරෙන අතර, එමනිසා අවදානම් කළමනාකරණය අභියෝගාත්මක කාර්යයක් බවට පත්ව ඇත.

උද්ගත වන අවදානම් සහ අවිනිශ්චිතතා

ඉහත දක්වන ලද අවදානම් වලට අමතරව, වර්තමානයේදී බැංකු තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවකාශයේ පුළුල් ව්‍යාප්තිය, ඩිජිටල්කරණය හා ජනවිකාශය කරණ කොට ගෙන උද්ගත වන ඇතැම් අවදානම් හා අවිනිශ්චිතතාවන්ටද මුහුණපායි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මෙකී උද්ගත වන්නා වූ අවදානම් හා අවිනිශ්චිතතා හඳුනාගනිමින්, ඒවායේ අනාගත විනාශකාරීත්වය පිළිබඳ දැනුවත්භාවයෙන් යුතුව දැඩි අවධානයකින් යුතුව ඒවා පිළිබඳ පසු විපරම් කරනු ලැබේ.

මෙමගින් ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් මැනවින් හඳුනාගනිමින් අභ්‍යන්තර ක්‍රියාවලීන් සම්බන්ධ විශිෂ්ටත්වය අත්පත් කරගන්නා අතරතුර මෙහෙයුම් පිරිවැයද අවම කරගැනීමට බැංකුවට හැකි වේ. මෙකී ක්‍රමෝපායන් සිය සේවාවන් විවිධාංගීකරණය සඳහා සහ ඒවා අවස්ථාවන් බවට පත්කරගැනීම උදෙසා දායක වනු ඇති බව බැංකුවේ විශ්වාසය වේ.

අවදානම් කළමනාකරණ ආකෘතිය

බැංකුව මගින් ත්‍රිත්ව රේඛීය ආරක්ෂණ මොඩලය මත පදනම්ව බලාත්මක අවදානම් කළමනාකරණ අකෘතියක් සකසනු ලැබ ඇත. අවදානම් කළමනාකරණ අකෘතිය මගින් බැංකුව නිරාවරනය විය හැකි අවදානම් හා අවිනිශ්චිතතාවන් කෙරෙහි පාදක වන සාංගමික ව්‍යුහයන්, ක්‍රමවේද, ක්‍රියාවලීන්, ක්‍රියාපටිපාටීන් සහ ක්‍රියාකාරකම් සැළකිල්ලට ගනු ලැබීය. ජාත්‍යන්තර තත්ත්ව සම්මතයක් වන, ත්‍රිත්ව රේඛීය ආරක්ෂණ මොඩලය, අවදානම් කළමනාකරණය සඳහා වන විශේෂිත දර්ශනයන්ගෙන් හා නිපුණතා වලින් සමන්විත වේ. අවදානම් කළමනාකරණ අකෘතිය මගින් බැංකුව වෙත සිය එදිනෙදා මෙහෙයුම් වලදී මාර්ගෝපදේශනය සැපයේ.

අවදානම නිසි කලට හඳුනාගනිමින්, විමර්ශනය කරමින්, මිනුම්ගත කරමින්, කළමනාකරණය කොට ව්‍යාපාරික ක්‍රියාවලිය ආශ්‍රිත අවදානම් වාර්තා කිරීම කෙරෙහි බැංකුවේ අවධානය යොමු වේ. අවදානම් කළමනාකරණ අකෘතිය මගින් බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රමුඛ කාර්යසාධනය හා ප්‍රමුඛ අවදානම් සාධක පිළිබඳ බලාත්මක හා ප්‍රමාණාත්මක තහවුරුවක් ද සපයනු ලැබේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් අවදානම දරා ගැනීමේ සූදානම සම්බන්ධ ප්‍රකාශයෙහිදී මනා සේ ස්ථාපිත අවදානම් කළමනාකරණ ක්‍රමොපායක් සම්බන්ධයෙන් පූර්ව නිර්වචන කරන ලද අතර බැංකුවේ සමස්ත අවදානම ආවරනය කෙරෙන අයුරින් ස්ථාපනය කරන ලද පරිපූර්ණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ආකෘතීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මගින් අභ්‍යන්තර පාලනයන් අධීක්ෂණය, අවදානම් ක්ෂේත්‍රයන් සම්බන්ධ ආතති පරීක්ෂාවන් සහ ත්‍රිත්ව රේඛීය ආරක්ෂණ මොඩලය ක්‍රියාවේ යෙදවීම සිදු කෙරේ.

බැංකු මෙහෙයුම් වල නිරත සියළුම පුද්ගලයින් බැංකුවේ අවදානම් කළමනාකරණය සම්බන්ධ වගකීමෙන් බැඳේ.

අවදානම් කළමනාකරණය



අවදානම් පාලනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් පාලන ආකෘතිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඇරඹී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, කමිටු සහ විමධ්‍යගත අධිකාරීත්ව මට්ටම් ඔස්සේ පහළ ස්ථරයන් වෙත ව්‍යාප්ත වේ. සමස්තයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණයේ අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව, ණය කමිටුව, තොරතුරු තාක්ෂණ කමිටුව සහ විගණන කමිටුව බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වන අතර කළමනාකරණ කමිටුව සහ බැංකුවේ ව්‍යාපාරික රේඛාවන්ගෙන් ස්වාධීන පුද්ගලයකු වන ප්‍රධාන අවදානම් නිලධාරීවරයා විසින් සියළුම ව්‍යාපාරික මට්ටම් වල එදිනෙදා මෙහෙයුම් පිළිබඳ වාර්තාවන් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව යනු බැංකුවේ අවදානම් කළමනාකරණ ආකෘතිය පිළිබඳ තීරණ ගැනීම සඳහා විධායක අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් සැදුම්ලත් කමිටුවකි. කමිටුව මගින් බැංකුවේ සමස්ත කළමනාකරණ ස්වභාවය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ඇගයුම් ක්‍රියාවලිය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරිණි. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ඇගයුම් ප්‍රධාන අවදානම් නිලධාරීවරවයා සහ ඔහුගේ අංශය මගින් සකසනු ලැබ, විමර්ශනය කරනු ලැබීමෙන් අනතුරුව අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ නියාමන අනුකූලතාවය පිළිබඳ පරීක්ෂාවන් සිදුකෙරේ. කමිටුව මගින් බැංකුවේ අභ්‍යන්තර විගණන අංශයෙහි කාර්යසාධනය, නිරවද්‍යතාවය සහ ස්වාධීනත්වයද ඇගයුමට ලක් කෙරේ.

කළමනාකරණ කමිටුව බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු වන අතර බැංකුවේ සියළුම සියළුම විධායක මට්ටමේ කාර්ය මණ්ඩලය එය නියෝජනය කරයි. අවදානම සහ අවිනිශ්චිතතාවය වළකා ගනු පිණිස කමිටුව මගින් බැංකුවේ සියළුම මෙහෙයුම් මට්ටමේ වාර්තාවන් ආවර්තිතව විමර්ශනයට ලක් කෙරේ.

ප්‍රධාන අවදානම් නිලධාරී යනු බැංකුවේ සමස්ත අවදානම කළමනාකරණය හා අදාළ ශිල්පක්‍රම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වන පුද්ගලයා වේ.

අවදානම් කළමනාකරණ අංශයෙහි ප්‍රධානත්වය ප්‍රධාන අවදානම් නිලධාරීවරයා විසින් උසුලනු ලබන අතර එය ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළඳපොල හා පොලී අවදානම යන එකිනෙකට වෙනස් ක්‍රියාකාරකම් තුනකින් සමන්විත වේ.

අවදානම් පාලන ව්‍යුහය



අවදානම් කළමනාකරණය

ප්‍රතිපත්ති ආකෘතිය

අවදානම් කළමනාකරණයේ බලාත්මකභාවය මූලිකවම කළමනාකණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා ආකෘතිය මත රඳා පවතී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ බලාත්මක අවදානම් කළමනාකරණය සඳහා වන ක්‍රමෝපායික උපදෙස් මෙහි දැක්වේ. අවදානම් කළමනාකරණ අංශය මගින් අවදානම් කළමනාකරණ කමිටුව විසින් නිර්දේශිත හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිපූර්ණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි හා ආකෘතීන් ස්ථාපනය කෙරිණි. මේ සියළුම ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා ආකෘතීන් අවදානම් කළමනාකරණ අංශය මගින් වාර්ෂිකව විමර්ශනය කෙරේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි

ප්‍රතිපත්තිය	ස්ථාපිත වසර	ආවරණය
ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	2012	අවදානම් කළමනාකරණයේ ක්ෂේත්‍ර ආශ්‍රිත සීමා සහ ක්‍රමවේද හා ණය සම්බන්ධ අවම කිරීමේ ශිල්පක්‍රම
මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	2012	මෙහෙයුම් අවදානම් අවම කිරීමේ හා කළමනාකරණ ශිල්පක්‍රම සහ මෙහෙයුම් අනුකම්ටුව පිළිබඳ විස්තර
ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	2012	ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීල වගකීම් කළමනාකරණ ශිල්පක්‍රම
පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	2012	පොලී අනුපාත අවදානම හඳුනාගැනීමේ, අවම කිරීමේ සහ කළමනාකාරණ ශිල්පක්‍රම
ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය	2012	ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සහ ද්‍රවශීලීත්වය සඳහා ආතති පරීක්ෂා ආකෘතිය
සමෝධානික අවදානම් කළමනාකරණ ආකෘතිය	2013	ප්‍රදේශිය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ ආකෘතිය
වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය	2015	වෙළඳපොල අවදානම හඳුනාගැනීමේ, අවම කිරීමේ සහ කළමනාකාරණ ශිල්පක්‍රම
ණය විමර්ශන ප්‍රතිපත්තිය	2016	ණය විමර්ශන යාන්ත්‍රණය
ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම	2016	ආපදාවන්හිදී ව්‍යාපාරික අඛණ්ඩත්වය සඳහා උපදෙස්
පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය	2015	තොරතුරු භාවිතය සඳහා උපදෙස්
තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්තිය	2015	තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතාවය සඳහා උපදෙස්
අවදානම දරාගැනීමේ සූදානම ප්‍රකාශය	2019	දරාගැනීමේ සීමාව සඳහා උපදෙස්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණය

ණය අවදානම කෙරෙහි නිරාවරනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සමස්ත ණය අවදානම කෙරෙහි නිරාවරනය එහි මුළු වත්කම් වලින් 72.35% කි. ණය ලබාදීම බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික ධාරාව වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ණය අවදානම යනු කළමනාකරණය කරනු ලබන වඩාත්ම කැපී පෙනෙන අවදානම් කාණ්ඩය වේ.

වසර තුළදී අපගේ ණය ලබාදීමේ නිරාවරනය රුපියල් බිලියන 6.92 කින් ඉහළ ගිය අතර එය පසුගිය වසරට සාපේක්ෂව 5.03% ක වර්ධනයකි. වසර 2019 අවසානය වන විට, බැංකුවේ ණය කළඹ මිලියන 5 ට වැඩි කාණ්ඩයේ ණය පහසුකම් 626 කින් සමන්විත වූ අතර ප්‍රමුඛ ණයගැතියන් 10 දෙනා මුළු අත්තිකාරම් කළඹෙන් 0.43% කට දායක විය. තවදුරටත් විමර්ශනය කිරීමේදී හෙළි වූයේ ප්‍රමුඛ ගනුදෙනුකරුවන් තිදෙන විසින් පිළිවෙලින් 0.13%, 0.11% සහ 0.03% ක් වශයෙන් සමස්ත කළඹ වෙත දායක වී ඇති බවයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය කළඹ කෘෂිකාර්මික ණය, පශු පාලන ණය, කර්මාන්ත ණය, වෙළඳ හා සේවා ණය, නිවාස ණය, උකස්, පාරිභෝගික ණය හා තැන්පතු ඇපයට ණය වලින් සමන්විත වේ.

වෙනත් ඕනෑම බැංකුවක මෙන් සංවර්ධන බැකුවක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේද ප්‍රධාන ව්‍යාපාරික ධාරාව ණය ලබාදීම වන අතර එහිදී බැංකුවේ ණය අවදානම් නිරාවරනය ඉහළ යයි. එමනිසා බැංකුව ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වෙත සැළකිය යුතු බර තැබීමක් සිදු කොට ඇත.

ණය අවදානම පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට වසරකට වරක් විමර්ශනයට ලක් කෙරෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ණය අවදානම කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන මාර්ගෝපදේශනය වේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය අවදානම පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු මෙන්ම කළමනාකාරිත්ව මට්ටමේ කමිටුද දායක වේ. අවදානම් කළමනාකරණ අංශයට අනුයුක්ත ණය අවදානම් පරිපාලන ඒකකය සුරක්ෂිතතා අවදානම, අක්‍රීය ණය අවදානම හඳුනාගැනීම සහ අධීක්ෂණය මෙන්ම ණය අධීක්ෂණය සඳහා ද වගකිව යුතු වේ.



ණය අවදානම අවම කිරීම, අධීක්ෂණය සහ වාර්තාකරණය

දෛනික ගනුදෙනුකාර විශ්ලේෂණයන් හා පියැවීම් ක්‍රියාවලීන් ඔස්සේ ශාඛා කළමනාකරු/ණය නිලධාරීන් සහ ශාඛා මට්ටමේ ණය සේවාවන් මගින් ණය කළඹ ප්‍රබල ලෙස අධීක්ෂණය කෙරේ. කෙසේවුවද, ප්‍රධාන ශාඛා මට්ටමේදී, අවදානම් කළමනාකරණ අංශය මගින් බැංකුවේ ණය කළඹ විමර්ශනය කොට මාසිකව ප්‍රමුඛ අවදානම් දර්ශක ප්‍රකාශය යටතේ මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. ප්‍රමුඛ අවදානම් දර්ශක ප්‍රකාශය වෙත සමස්ත ණය කළඹ විශ්ලේෂණය, අක්‍රීය ණය විශ්ලේෂණය සහ ණය සඳහා වෙන්කිරීම් ආදිය ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ අංශය මගින් බැංකුවේ ප්‍රමුඛ ණයගැතියන් 20 පිළිබඳ දැඩි අධීක්ෂණයක් සිදු කොට මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් උසස් තත්ත්වයේ ණය කළඹ කළමනාකාරණය සඳහා පහත දැක්වෙන අවම කිරීමේ ශිල්පක්‍රම හා එළඹුම් යොදාගැනේ.

විමධ්‍යගත අනුමැති අධිකාරිත්වය

බැංකුව මගින් ණය පහසුකම් අනුමත කිරීම සඳහා අධිකාරීත්ව මට්ටම් විමධ්‍යගත කොට ඇත. සාමාන්‍යයෙන්, ණය යෝජනා පත්‍ර පළපුරුදු ණය නිලධාරීන් විසින් විමර්ශනය කොට අදාළ අනුමැති අධිකාරිත්ව මටටම වෙත භාරදෙනු ලැබේ. කෙසේවුවද, ඉහළ වටිනාකමකින් යුතු ණය යෝජනා පත්‍ර ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරේ. වර්තමානයේදී, ණය සම්බන්ධ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැති අධිකාරීත්ව මට්ටම ඉක්මවා යන ණය යෝජනා පත්‍ර සම්බන්ධයෙන් ණය අවදානම් නිලධාරී විසින් තක්සේරුවක් සිදුකෙරේ. බැංකුව මගින් 2014 දී හඳුන්වාදෙන ලද ව්‍යුහගත තක්සේරුකරණ හා අනුමැති ක්‍රියාවලි අබණ්ඩවම අනුගමනය කරන ලද අතර එය බැංකුවේ ණය කළඹ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කෙරෙහි බෙහෙවින් දායක විය.

අවදානම් කළමනාකරණය

ණය පරිපාලන ඒකකය

ණය කළඹ ආශ්‍රිත පරිපාලන ක්‍රියාවලිය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව බැංකුව මගින් 2016 දී අවදානම් කළමනාකරණ අංශය යටතේ ස්වාධීන ඒකකයක් වශයෙන් සහකාර සාමාන්‍යාධිකාරීවරයකු විසින් ප්‍රධානත්වය දරනු ලබන ණය පරිපාලන ඒකකය ස්ථාපනය කෙරිණි. 2019 දී ණය පරිපාලන ඒකකය අමතර පළපුරුදු සේවකයින් යොදා ගනිමින් සවිමත් කරන ලද අතර එහි ක්‍රියාකාරකම් පුළුල් කෙරිණි.

මෙම ඒකකය මගින් මූලිකව ගම්පහ දිස්ත්‍රික්කයේ රුපියල් මිලියන 2.5 සහ එයට වැඩි සියළුම ණය මුදල් විමර්ශනය හා ණය සුරැකුම් ලියකියවිලි අධීක්ෂණ වගකීම දරන ලදී. පසුව, මෙය 2019 දී දිවයින පුරා සියළුම ශාඛාවන් වෙත ව්‍යාප්ත කෙරුනු අතර බස්නාහිර පළාතේ රුපියල් මිලියන 2.5 සහ එයට වැඩි සියළුම ණය මුදල් විමර්ශනය හා වෙනත් පළාත් වල රුපියල් මිලියන 5 සහ එයට වැඩි සියළුම ණය මුදල් විමර්ශනය කිරීමේ වගකීම එය වෙත පැවරිනි.

වසර 2019 දී ණය පරිපාලන ඒකකය මගින්, ණය පහසුකම් 208 ක සුරැකුම් ලියකියවිලි විමර්ශනයට ලක් කෙරිණි.



2019 දී විමර්ශනයට ලක් කෙරුනු ණය පහසුකම් සංඛ්‍යාව

ණය විමර්ශන යාන්ත්‍රණය (LRM)

2017 සිට, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ණය කළඹ පවත්වාගෙන යාම සඳහා අංග සම්පූර්ණ ණය විමර්ශන යාන්ත්‍රණයක් ස්ථාපනය කෙරිණි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය විමර්ශන ප්‍රතිපත්තිය මගින් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ණය පරිපාලනයක් වර්ධනය කරනු පිණිස ණය විමර්ශන යාන්ත්‍රණය වෙත පොදු ආකෘතික රාමුවක් ස්ථාපනය කෙරේ. විමර්ශනය මගින් බැංකුවේ ණය කළඹෙන් 40% ක් ඉක්මවිය යුතු කඩඉම් සීමාවෙන් ඉහළ සියළුම සක්‍රීය ණය ආවරනය විය යුතු වේ. මෙම කඩඉම් සීමාව අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය/අනුමත කළ යුතු වේ.

බැංකුවේ ණය විමර්ශන යාන්ත්‍රණය වෙත අනුගත වෙමින්, ණය පරිපාලන ඒකකය මගින් වසර 2020 සඳහා 40% කඩඉම් සීමාව ආවරනය කරමින් වාර්ෂික සැලසුමක් සකසනු ලැබ ඇත. මේ යටතේ, බැංකුවේ ණය අවදානම අවම කිරීම සඳහා සුරැකුම් ලියකියවිලි නිශ්චය කිරීම හා අනුමැති අධිකාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසි සම්පූර්ණ කිරීම පිළිබඳව පළපුරුදු ජ්‍යෙෂ්ට නිලධාරියකු විසින් පරීක්ෂා කෙරේ.

නිශ්චය කිරීමෙන් අනතුරුව ශාඛාව වෙත පැමිණි නිලධාරියා විසින් වර්තාවක් සකසා ඇත්නම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා ශාඛා කළමනාකරු වෙත ලබාදෙනු ලැබේ.

මේ වන විට. ශාඛා 9 ක දෙන ලද සීමාවන්ට ඉහළ ණය සීමාවන් ණය පරිපාලන ඒකකය මගින් භෞතිකව විමර්ශනය කරනු ලැබ ඇති අතර ඉන් ශාඛා 5 ක් වෙත වාර්තාවන් භාරදී ඇත.

ඉහත දැක්වෙන කරුණු වලට අමතරව ඒකකය මගින් බැංකුවේ ණය අවදානම සහ මෙහෙයුම් අවදානම අවම කිරීම සඳහා ඒකකය මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් ආවරනය කෙරේ.

- දිනපතා පිරිනමනු ලබන පහසුකම් වල පොලී අනුපාත අධීක්ෂණය
- යාවත්කාලීන කළ යුතු රක්ෂණවරයන් අධීක්ෂණය කොට අදාළ අධිකාරීන්ට දැන්වීම
- යාවත්කාලීන කල යුතු දේපළ තක්සේරුකරණයන් අධීක්ෂණය කොට අදාළ අධිකාරීන්ට දැන්වීම
- ප්‍රධාන බැංකුකරණ පද්ධතිය තුළ අසාමාන්‍ය ඇතුළත් කිරීම් සම්බන්ධ අවධානයෙන් පසුවීම
- රු. 500,000 න් ඉහළ උකස් පහසුකම් අධීක්ෂණය

අවදානම් ශ්‍රේණිගත කිරීම

2016 අගෝස්තු මස සිට බැංකුව මගින් විශේෂික ආකෘතියක් යටතේ ගනුදෙනුකාර ශ්‍රේණිගත කිරීමක් හඳුන්වාදෙන ලදී. මෙහිදී ගනුදෙනුකරුවන් AAA, AA, A, BBB වශයෙන් ශ්‍රේණිගත කෙරිණි. ඒ අනුව BBB ශ්‍රේණිය සහිත ගනුදෙනුකරුවන් බැංකුව වෙතින් ණය පහසුකම් සඳහා සුදුසුකම් නොලබයි.

අවදානම මත පදනම් වූ මිළකරණය

අවදානම් කළමනාකරණ අංශය මගින් වසර 2016 දී බැංකුවේ ණය පහසුකම් සඳහා අවදානම මත පදනම් වූ මිලකරණයක් හඳුන්වාදෙන ලදී. මෙම මිළකරණ ක්‍රමවේදය බැංකුවේ අරමුදල් යටතේ සැළකිල්ලට ගැනෙන ණය පහසුකම් සඳහා පමණක් යොදා ගනු ලැබූ අතර ප්‍රතිමූල්‍ය සැලසුම් යටතේ සළකාබැලෙන සෙසු ණය පහසුකම් මෙයින් බැහැර කෙරිණි.

ණය අලාභ වෙන්කිරීම (හානිකරණ වෙන්කිරීම සහ ශ්‍රී ලං ම බැ වෙන්කිරීම)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල වීම උදෙසා බැංකුව මගින් ක්‍රමවේදයන් දෙකක් ඔස්සේ ණය අලාභ සඳහා හානිකරණය ගණනය කරන ලදී.

- කේවල හානිකරණය
- සාමූහික හානිකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව, බැංකුව මගින් වර්ග දෙකක වෙන්කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබයි.

- සාමාන්‍ය වෙන්කිරීම (ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව)
- විශේෂිත වෙන්කිරීම (ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව)

බැංකුවේ වෙන්කිරීම් ආවරන අනුපාතය හා විවෘත ණය නිරාවරන අනුපාතය අවදානම් කළමනාකරණ අංශය මගින් ආවර්තිතව ගණනය කොට විශ්ලේෂණය කෙරේ. අවදානම් කළමනාකරණ අංශය මගින් මෙම අනුපාතයන් එහි නිරීක්ෂණ ද සමග මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.

SLFRS 9 ක්‍රියාවට නැංවීම

බැංකුව මගින් 2018 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි SLFRS 9 ක්‍රියාවට නංවන ලදී. මෙම වෙන්කිරීමේ ක්‍රමවේදය පැහැර හැරීමට ලක්වූ නිරාවරණය (EAD), පැහැර හැරීමේ සම්භාවිතාව (PD), අලාභ ගෙන දෙන ලද පැහැර හැරීම සහ 1 වැනි හා 2 වැනි වාරික හිඟවීම් භාවිත කරමින් දරන ලද ණය අලාභය මත ඉදිරි දැක්ම මත පදනම් වේ.

ක්ෂේත්‍ර ආශ්‍රිත ණය සීමාවන් සහ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය

බැංකුව මගින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ඔස්සේ ණය පහසුකම් සඳහා අනුමත ක්ෂේත්‍ර ආශ්‍රිත සීමාවන් ස්ථාපනය කරනු ලැබ ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ අංශය මගින් ආර්ථික හා ක්ෂේත්‍ර තත්ත්වයන් අනුව මෙම සීමාවන් ආවර්තිතව අනුමත කරන ලදී. ව්‍යාපාරික ඒකක මගින් මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සීමාවන් අනුව ඔවුන්ගේ කේවල ණය කළඹ කළමනාකරණය කරනු ලැබේ.

අනුමත සහ සැබෑ ක්ෂේත්‍ර ආශ්‍රිත සීමාවන්

	2019-දෙසැ.		
ක්ෂේත්‍රය	සැබෑ අනුපාතය	අනුමත සීමාව	වෙනස
කෘෂිකර්ම	20.86%	21.00%	(0.14%)
පශු පාලනය	2.21%	3.00%	(0.79%)
කර්මාන්ත (සුළු හා මධ්‍ය පරිමාණ)	33.37%	35.00%	(1.63%)
වෙළඳ හා සේවා	0.11%	1.00%	(0.89%)
නිවාස	16.44%	19.00%	(2.56%)
උකස්	6.30%	6.00%	0.30%
වෙනත් ප්‍රමුඛතා*	18.12%	12.00%	6.12%
කාර්ය මණ්ඩල	2.58%	3.00%	(0.42%)

*වෙනත් ප්‍රමුඛතා-පරිභෝජනය+තැන්පතු ඇප මත ණය+කල්බදු+ප්‍රතිසැකසුම්ගත ණය+LDB අක්‍රීය ණය

සංකේන්ද්‍රණ අවදානම

බැංකුව මගින් ආවර්තිතව විමර්ශනය කරන ලද ක්ෂේත්‍ර ආශ්‍රිත සීමාවන් පදනම් කරගනිමින් එක් එක් ක්ෂේත්‍රය, සැලසුම් හා භූගෝලීය වශයෙන් සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කෙරිණි.

	2018	2019
ක්ෂේත්‍රය	HHI	HHI
කෘෂිකර්ම	0.038	0.044
පශු පාලනය	0.001	0.000
කර්මාන්ත (සුළු හා මධ්‍ය පරිමාණ)	0.112	0.111
වෙළඳ හා සේවා	0.000	0.000
නිවාස	0.042	0.027
උකස්	0.003	0.004
වෙනත් ප්‍රමුඛතා*	0.025	0.033
කාර්ය මණ්ඩල	0.001	0.001
එකතුව	0.221	0.220

මුළු සැලසුම් වශයෙන් ව HHI වටිනාකම්වල් 00 වැඩි සහ 0.5 ට අඩු විය. ඉහළම සංකේන්ද්‍රණය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයන් ආශ්‍රිතව දැක්වුනු අතර සෙසු ක්ෂේත්‍රයන්හි HHI 00 වෙත ඉතා ආසන්නව පහළ සංකේන්ද්‍රණ අවදානමක් දරන ලදී.

අවදානම් කළමනාකරණය

විවාත ණය නිරාවරණය සහ වෙන්කිරීම් ආවරණ අනුපාතය



2019 ආරම්භයේ සිට අනුපාතය ඉහළ ගොස් ඇති අතර එය හිතකර ලක්ෂණයක් නොවන්නේ එම අනුපාතය මගින් බැංකුව හට අනපේක්ෂිත තත්ත්වයකදී සමනය කිරීමට සිදුවන අක්‍රිය ණය ප්‍රතිශතය පිළිබිඹු කෙරෙන බැවිනි. එමනිසා රටේ ආර්ථික තත්ත්වය හේතුවෙන් අනුපාතය පහළ යන තරමට බැංකුවට හිතකර වේ. කෙසේවුවද, විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ අක්‍රිය වත්කම් වල ඉහළයාමේ ප්‍රවණතාවය හේතුවෙන් අදාළ අනුපාතයෙහි සුළු පහළයාමක් දැකගත හැකි විය. වෙන්කිරීම් ඉහළ නංවමින් සහ යථා තත්ත්වයට පත් කිරීමේ පියවර ඔස්සේ බැංකුව අදාළ තත්ත්වය පාලනය කිරීමට කඩිනමින් කටයුතු කලේය.



ද්‍රවශීලතා අවදානම

මෙය මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් වලින් පියවනු ලබන මූල්‍යමය වගකීම් ඉටුකිරීමේදී බැංකුව මගින් මුහුණදෙනු ලබන අසීරුතාවය ආශ්‍රිත අවදානම වේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

බැංකුව සැමවිටම සිය ද්‍රවශීලතාව ආකෘතිය සහ බැංකු ද්‍රවශීලතාවය සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකු නියෝගයන්ට අනුකූලව කටයුතු කොට ඇත. නියාමන අවශ්‍යතාවයන් වන ද්‍රවශීල වත්කම් අනුපාතය මත 20% ක් සහ ද්‍රවශීල ආවරන අනුපාතය මත 80% ක් වශයෙන් වන නියාමන අවශ්‍යතාවන්ට ඉහළින් සවිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ.

ද්‍රවශීලතා අවදානම් පාලනය

බැංකුවේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම වත්කම් හා වගකීම් කමිටුව වෙත පැවරේ. වත්කම් හා වගකීම් කමිටුව බැංකුවේ ආයතනික හා විධායක මට්ටමේ වෘත්තිකයින්ගෙන් සමන්විත වේ.

ද්‍රවශීලතා අවදානම් අවම කිරීම, අධීක්ෂණය සහ වාර්තාකරණය

ද්‍රවශීලතා අවදානම මැනීම සඳහා ප්‍රධාන එළඹුම් දෙකක් බැංකුව සතු වේ,

- තොග එළඹුම
- ප්‍රවාහ එළඹුම

නියාමන අවශ්‍යතාවන්ට අනුව තොග එළඹුම යටතේ බැංකුවේ ද්‍රවශීලතා අවදානම මැනීම සඳහා බැංකුව මගින් ප්‍රධාන වශයෙන් අනුපාතයන් දෙකක් භාවිත කෙරිණි.

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR)

බැංකුව මගින් සිය ද්‍රවශීල වත්කම් අනුපාතය නියාමන අවශ්‍යතාවය වන 20% ට ඉහළින් පවත්වා ගැනුනි.

ද්‍රවශීලතා ආවරන අනුපාතය (LCR)

බැංකුව 2016 වසරේදී ද්‍රවශීලතා ආවරන අනුපාතය සම්බන්ධ ශ්‍රී ලං ම බැ නියෝගය වෙත අනුගත වෙමින් 2019 දෙසැම්බර් අවසානය වන විට 205.99% ක අනුපාතයක් පවත්වා ගෙන යන ලද අතර එහි අවම නියාමන අවශ්‍යතාවය 100%කි.

වසර 2019 විශේෂතා



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (%)

ද්‍රවශීලතා අවදානම මැනීම සඳහා පහත දැක්වෙන සෙසු අනුපාතයන්ද ගණනය කරන ලදී.



වෙනත් අනුපාතයන්හි කාර්යසාධනය (%)

ද්‍රවශීලතාවය පිළිබඳ පීඩන පරීක්ෂණය

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විවිධ දැඩි කොන්දේසි වලට අදාළ ක්‍රමවේදයන් තුනක් යටතේ බැංකුවේ ද්‍රවශීලතාව පිළිබඳ පීඩන පරීක්ෂණයක් කලින් කලට පවත්වනු ලැබේ. සෑම මාසයකදීම, මෙම දෙපාර්තමේන්තුව මගින් පීඩන පරීක්ෂණයේ ප්‍රතිඵල ඇගයුමට ලක් කෙරෙන අතර බැංකුවේ ද්‍රවශීලතාව කෙරෙහි අනපේක්ෂිත අවස්ථා වලින් සිදුවිය හැකි බලපෑම අගය කරනු ලබයි. පීඩන පරීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුකූලව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වත්කම් හා වගකීම් කමිටුව තුළින් එවැනි අවස්ථා සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ අරමුදල් වැඩපිළිවෙල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දෙනු ලැබේ.

සියළුම සංඛ්‍යා රු. 000' වලිනි

විස්තර	2019/12/31 දිනට ශේෂය	කම්පන		
		සුළු	මධ්‍යම	ප්‍රධාන
කම්පනයේ විශාලත්වය		2%	4%	6%
ද්‍රවශීල වත්කම්	46,699,453	46,699,453	46,699,453	46,699,453
මුළු වගකීම්	144,233,376	144,233,376	144,233,376	144,233,376
මුළු වගකීම් මත වටිනාකම් පහත වැටීම		2,884,668	5,769,335	8,654,003
කම්පනයෙන් පසු ප්‍රතිශෝධිත මුළු වගකීම්		141,348,709	138,464,041	135,579,374
කම්පනයෙන් පසු ප්‍රතිශෝධිත ද්‍රවශීල වත්කම්		43,814,786	40,930,118	38,045,451
ද්‍රවශීල වත්කම් අනුපාතය	32.38%	31.00%	29.56%	28.06%

අවදානම් කළමනාකරණය

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසමත් වූ අභ්‍යන්තර ක්‍රියාවලීන්, සේවකයින් සහ ක්‍රමවේදයන් සහ බාහිර සිදුවීම්, ණය හෝ වෙළඳපොලෙහි ප්‍රතිඵලයක් වශයෙන් අනපේක්ෂිත සෘජු හෝ වක්‍ර අලාභයන්හි භයානක බව ප්‍රකාශයට පත්වීමකි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය

උතුරු නැගෙනහිරද ඇතුළුව බැංකුව මගින් මුළු දිවයිනම ආවරනය වන පරිදි මේ වන පවත්වා ගෙන යනු ලබන ශාඛා සංඛ්‍යාව 276 කි. ශාඛා සංඛ්‍යාව අනුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙරට තෙවන විශාලතම බැංකුව වන අතර එහි වත්මන් සේවක සංඛ්‍යාව 3000 ඉක්මවයි.

2014 අවසානය දක්වා බැංකුව එකිනෙකට වෙනස් තොරතුරු තාක්ෂණ පදනම් හතරක් සම්බන්ධයෙන් කටයුතු කලේය. මේ වන විට බැංකුව නව මධ්‍යගත තොරතුරු තාක්ෂණ විසඳුමක් භාවිත කරයි. නව තොරතුරු තාක්ෂණ පදනම ක්‍රියාවේ යෙදවීමත් සමග බැංකුව නිසගයෙන්ම තොරතුරු තාක්ෂණ අවදානම වෙත නිරාවරනය විය. 2015 සිට බැංකුව මගින් සිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ ලංකා පේ ජාලය යොදාගනිමින් ගනුදෙනුකරුවන් වෙත පහසුකම් සලසනු ලැබ ඇත.

මෙහෙයුම් අවදානම් පාලනය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් අංග සම්පූර්ණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපනය කරනු ලැබ ඇති අතර එය 2013 දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරිණි.

මෙහෙයුම් අවදානම් පාලනය සහ අධීක්ෂණය

- 2019 දී මෙහෙයුම් අනුකමිටු රැස්වීම් 12 ක් පැවති අතර ඒවායේ වාර්තා අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කෙරිණි.
- 2019 සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය විමර්ශනය කරන ලද අතර එය අවදානම් කළමනාකරණ කමිටුව මගින් නිර්දේශ කරනු ලැබ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කෙරිණි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය

අවදානම් කළමනාකරණ අංශය යටතේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකය මගින් මාසික ප්‍රමුඛ අවදානම් දර්ශකයන් මත මෙහෙයුම් අලාභ සම්බන්ධ ආවර්තිත වාර්තාවක් භාරදෙනු ලැබ ඇත.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ අනුකමිටුව

2012 සිට අවදානම් කළමනාකරණ අංශය මගින් බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අධීක්ෂණය යටතේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ අනුකමිටුව ස්ථාපනය කෙරිණි. වසර 2017 දී මෙහෙයුම් අංශය පිහිටුවීමත් සමග එය ප්‍රතිස්ථාපනය කෙරුනු අතර මේ වන විට එය අවම වශයෙන් මසකට වරක් රැස්ව කාර්තුමය වශයෙන් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තාවක් භාරදෙනු ලබයි.

තොරතුරු තාක්ෂණ නියමු කමිටුව

බැංකුව මගින් 2013 දී ප්‍රධාන තොරතුරු නිලධාරිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව තොරතුරු තාක්ෂණ නියමු කමිටුව පිහිටුවන ලදී. ප්‍රධාන අවදානම් නිලධාරිවරයා සහ සියළුම තාක්ෂණ සේවකයින් එය නියෝජනය කරන අතර එමගින් බැංකුවේ තොරතුරු තාක්ෂණ ගැටළු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ හා විසඳුම් ඉදිරිපත් කෙරේ.

ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම

බැංකුව මගින් වසර 2015 දී සිය ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම පිළිබඳ අවසන් තීරණයකට එළඹෙන ලද අතර 2017 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ සියළුම ශාඛාවන් ආවරනය කරමින් එය විමර්ශනයට ලක් කරන ලදී. ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම මෙහෙයවීමේ ප්‍රධාන වගකීම මෙහෙයුම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා සතු වේ. බැංකුව මගින් 2017 ප්‍රධාන කාර්යාලය ආශ්‍රිතව ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම් ආදේශනයක් ද පවත්වන ලදී.

තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (ISMS)

බැංකුව මගින් වසර 2015 සිට එහි ප්‍රධාන තොරතුරු නිලධාරියාගේ අධීක්ෂණය යටතේ තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහිදී අනුමත තොරතුරු සුරක්ෂිතතා සහ පිළිගත් භාවිත ප්‍රතිපත්ති බලාත්මක කොට කලින් කලට විමර්ශනයට භාජනය කෙරේ.

මෙහෙයුම් අවදානම් අවම කිරීම, අධීක්ෂණය හා වාර්තාකරණය

බැංකුව මගින් එහි මෙහෙයුම් අවදානම සම්බන්ධයෙන් පහත දැක්වෙන අවම කිරීම්, අධීක්ෂණ හා වාර්තාකරණ ශිල්පක්‍රම භාවිත කොට ඇත.

අලාභ දත්ත වර්තාකරණය

වසර 2012 සිට, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අලාභ වූ දත්ත අත් කරගැනීම සහ වාර්තාකරණ ක්‍රියාවලීන් හා සම්බන්ධ වී ඇත. විමර්ශන ඒකකය වෙත වාර්තා කරනු ලබන ලද සියළුම අලාභ අවදානම් කළමනාකාරණ දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන අතර, සෑම කාර්තුවකදීම රු.500,000.00 නියමිත සීමාව ඉක්මවන දත්ත මහ බැංකුව වෙත වාර්තා කෙරේ. විවිධ වර්ගයේ දත්ත අහිමිවීම් සම්බන්ධයෙන් දත්ත පදනමක් බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබේ.

වසර 2019 දී විශේෂතා

අභිමි දත්ත වාර්තාකරණය



අභ්‍යන්තර වංචා සම්බන්ධ ප්‍රවණතාව



බාහිර වංචා සම්බන්ධ ප්‍රවණතාව

අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) මගින් බැංකුවේ ප්‍රාග්ධනය එහි අවදානම මත බර තබන ලද වත්කම් වලට සාපේක්ෂව මනිනු ලැබේ. අවදානම මත බර තබන ලද වත්කම් වෙත ප්‍රාග්ධන අනුපාතය බැංකුවේ මූල්‍යමය ස්ථාවරත්වය හා කාර්යක්ෂමතාවය වර්ධනය කරයි. එමනිසා මෙම අනුපාතය බැංකුවක ස්ථාවරත්වය සහ සවිමත්බව විදහා දක්වන ප්‍රමුඛ මූල්‍යමය දර්ශකයකි. මෙමගින් බැංකුව විසින් සිදුකරනු ලබන විවිධ වූ ආර්ථික ක්‍රියාකාරකම් තුළදී ඇති විය හැකි අනපේක්ෂිත අලාභ තත්ත්වයකදී පැවැත්ම සඳහා බැංකුව සතු හැකියාව මනිනු ලැබේ. බාසල් කමිටුව මගින් බැංකුවේ ප්‍රාග්ධනය සම්බන්ධ පියවර කිහිපයක් ක්‍රියාවට නංවනු ලැබ ඇත. ඒ අනුව බාසල් 111, සම්මුතිය 2010 දී නිකුත් කරන ලද අතර එය බාසල් 11 සම්මුතිය මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් 111 යටතේ ප්‍රාග්ධන අවයශතාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකු නියෝග 2006 හි 01 මත පදනම්ව 2017 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාව තුළ බලාත්මක විය. 2017 දෙවන කාර්තුව වන තෙක් බැංකුව බාසල් 11 සම්මුතිය වෙත අනුගත වෙමින් අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අවශ්‍යතාවය 10% වශයෙන් පවත්වාගෙන ගිය අතර, කෙසේවුවද 2017 ජූනි මස සිට බාසල් 111 හඳුන්වාදෙනු ලැබීමත් සමගම අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය වූ 12.5% සපුරාලීම සඳහා ප්‍රාග්ධනය ඉහළ නැංවීමට බැංකුවට සිදුවිය.

2017 ජූලි 1 දින සිට ඇරඹෙන පරිදි, රුපියල් බිලියන 500 කට අඩු මුළු වත්කම් සහිත බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වශයෙන් පහත දැක්වෙන පරිදි ස්ථර 2 කින් ප්‍රාග්ධනය පවත්වා ගෙන යාමට බැංකුවට සිදු විය.

	අවම අවශ්‍යතාවය
1 ස්ථරය	7.00%
2 ස්ථරය	8.50%
මුළු ප්‍රාග්ධනය	12.50%

පසුගිය වසර 2 තුළ බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය පහත දැක්වේ.

අවශ්‍ය ප්‍රමාණයට එරෙහිව සැබෑ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය



අවශ්‍ය ප්‍රමාණයට එරෙහිව සැබෑ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (%)

අවස්ථා කිහිපයකදීම අවම අවශ්‍යතාවය සපුරාලීමට අපොහොසත්ව ඇති බැවින් බාසල් 111 සම්මුතීන් අනුව බැංකුව අවම නියාමන අවශ්‍යතාවය වෙත ළඟා විය යුතු වන අතර, බැංකුවේ ප්‍රාග්ධන පදනම සවිමත් කිරීම උදෙසා අධ්‍යක්ෂවරුන් විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුමත කරන ලදී.

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව දැනට සිටින කොටස් හිමිකරුවන්ගෙන් ප්‍රාග්ධනය අන්තර්ග්‍රහනය කරගැනීම. මෙමගින් නව ආයෝජකයකු හට කොටස් හිමිකරුවකු වශයෙන් පැමිණීමේ අනුමැතිය ලබා නොදෙයි.
2. ණයකර නිකුත් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර 2017 දී, රු.බිලියන 2 දක්වා වූ ණයකර නිකුතුවක් ඔස්සේ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඉහත ක්‍රමෝපායන් දෙක ක්‍රියාවට නැංවීම තුළින් නියාමනය විසින් පනවනු ලැබ ඇති අවම අවශ්‍යතාවය ඉක්මවා යමින් සිය ප්‍රාග්ධන පදනම සවිමත් කරගැනීමට බැංකුවට හැකි වේ.

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය කෙරෙහි බලපාන්නා වූ ණය කළඹෙහි අක්‍රීය වත්කම් සම්බන්ධයෙන්ද කළමනාකාරිත්වය අවධානය යොමු කලේය. එමනිසා, අවදානම් කළමනාකරණ අංශය මගින් ආවර්තිත ආතති පරීක්ෂාවන් සිදුකරමින් එහි ප්‍රතිඵල කාර්තුමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා අවදානම් කළමනාකරණ කමිටුව වෙත දන්වනු ලබයි.

වසර 2019 සඳහා ආතති පරීක්ෂාවන්ගේ ප්‍රතිඵල පහත දැක්වේ.

අක්‍රීය ණය කළඹ	ආරම්භක ප්‍රාප්‍රඥ	ආකෘතිය 01	ආකෘතිය 02	ආකෘතිය 03
කම්පනයේ විශාලත්වය	-	2%	3%	4%
සෘජුවම අලාභ වර්ගීකරණයට	11.27%	11.24%	11.22%	11.20%
සියළුම වර්ගීකරණ තුළ කම්පනයේ විතැන්වීම	11.27%	11.25%	11.25%	11.24%

පසුගිය වසර 2 තුළ ප්‍රාග්ධන වර්ධනයෙහි සාරාංශය සහ මීළඟ වසර සඳහා සැලසුම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මෙරට සෙසු බැංකු මෙන්ම වර්ධනය, ලාභය, කාර්යක්ෂමතාවය වැනි කාර්යසාධන ක්ෂේත්‍රයන් අත්පත් කොට ගෙන ඇත. ඒ අයුරින්ම බැංකුව බාසල් 111 ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා නව ප්‍රාග්ධනය ආකර්ශනය කරගැනීමේදී ප්‍රබල අභියෝගයකට මුහුණ පා ඇත.

මෙයට ප්‍රධාන හේතුව වනුයේ එහි කොටස් හිමිකාරිත්වය රාජ්‍ය බැංකු 3 ට සහ මහා භාණ්ඩාගාරය වෙත සීමාකරමින් බිහිකිරීමේ පනත ඔස්සේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත පනවා ඇති වත්මන් ප්‍රාග්ධන සීමාවන්ය.

මූලික බාසල් 111 ප්‍රාග්ධන අවශ්‍යතාවය වන 12.5% සපුරාගැනීම උදෙසා මහා භාණ්ඩාගාරය සිය කොටස් හිමිකාරිත්වය රුපියල් බිලියන 2.5 කින් ඉහළ නංවමින් සිය කොටස 64% සිට 87.3 දක්වා වර්ධනය කලේය. තවද බැංකුව 2018 දෙසැම්බර් මස ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමග හවුල්කාරිත්වයකට පිවිසෙමින් එහි ප්‍රාග්ධනය රු. 4,176,292,999 කින් ඉහළ නැංවීය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් අනාගතයේදී බාසල් 111 අවශ්‍යතා වෙත අනුගත වීම සඳහා පහත දැක්වෙන පියවර ගන්නා ලදී.

- ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය වෙත ඍණාත්මක බලපෑම පාලනය කිරීම සඳහා බැංකුව අක්‍රීය ණය වර්ධනය වැළැක්වීමට/ පහත හෙළීමට කටයුතු කරනු ඇත.
- බැංකුව ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් ණය මුදලෙහි දෙවන මුදාහැරීම ලබාගැනීමට කටයුතු කරයි.
- සිය වර්තමාන කොටස් හිමිකාරිත්වය පුළුල් කිරීම උදෙසා කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද බැංකු පනත වෙත සංශෝධනය සම්බන්ධයෙන් පසු විපරම් සිදුකෙරෙමින් පවතී.
- 2017 අයවැය යෝජනා වලදී සිදු කලාක් මෙන් තවදුරටත් ප්‍රාග්ධනය අන්තර්ග්‍රහනය කරමින් කොටස් හිමිකාරිත්වය ඉහළ නංවන මෙන් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් සිදුකෙරේ.
- තවදුරටත් අනාගත ණය වර්ධනය සහ ප්‍රාග්ධන ආයෝජන යම් පමණකට සීමා කෙරේ.

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ඇගයුම් ක්‍රියාවලිය (ICAAP)

අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ඇගයුම් ක්‍රියාවලියෙහි අරමුණ නම් බැංකුවේ අබණ්ඩ පැවැත්ම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන මට්ටම නිර්ධන කිරීම සහ ආශ්‍රිත අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් පවතින බවට තහවුරු කිරීමයි. මෙම වාර්තාව බාසල් 111 සම්මුතියට අනුගත වීම සඳහා මහ බැංකුව මගින් දෙන ලද හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය සපුරාලීමකි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ඇගයුම් ක්‍රියාවලිය (ICAAP) ලේඛණය සකසනු ලැබ ඇත්තේ, ප්‍රාග්ධන අවශ්‍යතාවය සම්බන්ධ ඇගයුම, සමස්ත බැංකුව ආශ්‍රිත අවදානම සම්බන්ධ ඇගයුම, අවදානම් අවම කිරීමේ ශිල්පක්‍රම, ප්‍රාග්ධන කළමනාකරණය හා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය යන කරුණු ඇතුළත් කරමිනි. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයුම් ක්‍රියාවලිය (ICAAP) වාර්තාවේ ප්‍රතිඵල එක් එක් වසරෙහි විගණිත සංඛ්‍යාවන් මත පදනම් වන අතර මැයි මස අවසානයේදී බැංකු අධීක්ෂණ අංශය වෙත භාරදෙන ලදී.

අවදානම් කළමනාකරණය

අනුකූලතා අවදානම් කළමනාකරණය

බැංකුවේ කළමනාකාරිත්වය එහි නීතිකරණ සහ මූල්‍ය අධිකාරිය විසින් සහ අනෙකුත් නෛතික/රාජ්‍ය ආයතන විසින් පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බව තහවුරු කිරීමට සහ ඒවා කඩකිරීම සහ පිළිපැදීමට අපොහොසත් වීම වැළැක්වීම සඳහා ඉහළ අවධානයක් යොමු කරනු ලැබ ඇත.

මෙහිදී අනුකූලතා නිලධාරියාගේ ප්‍රධාන පරමාර්ථය වනුයේ අභ්‍යන්තර පාලනයන් සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික කිරීමයි. බැංකුවේ අනුකූලතා ක්‍රියාවලිය සහකාර සාමාන්‍යාධිකාරී-අනුකූලතා විසින් මෙහෙයවනු ලබන අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි අධීක්ෂණය යටතේ පවතී. මෙම පරමාර්ථය අත්පත් කරගනු පිණිස ඔහු විසින් අනුකූලතා අවශ්‍යතා නියාමනය කොට තක්සේරු කරනු ලබන අතර, සමාලෝචනය සඳහා බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳ කාර්තුමය වාර්තා අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

අනුකූලතා නිලධාරියා විසින් බැංකුවේ අවශ්‍ය ව්‍යවස්ථාපිත වාර්තා නියාමකයා වෙත නිසි කලට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්ද සොයාබැලීම සිදු කෙරේ.

පොලී අනුපාත අවදානම

පොලී අනුපාතයන්හි අහිතකර සංචලනයන් වෙත බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි නිරාවරනය වීම පොලී අනුපාත අවදානම වශයෙන් හැඳින්වේ. පොලී අනුපාතයන්හි වෙනස්වීම් බැංකුවේ ඉපැයුම් කෙරෙහි මෙන්ම බැංකුවේ වත්කම්, වගකීම් සහ ශේෂ පත්‍රයෙන් පිටත අයිතමයන් පාදක වන ආර්ථික වටිනාකම් කෙරෙහි කැපීපෙනෙන බලපෑමක් ඇති කළ හැක.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව, බැංකුවේ පරතරය හා කාලසීමා විශ්ලේෂණයන් මත පදනම්ව පොලී අනුපාත නිර්ණය කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව වෙත පැවරේ. මෙම විශ්ලේෂණය මත පදනම්ව, අවදානම් කළමනාකරණ අංශය මගින් පොලී අනුපාත උච්ඡාවචනයන් පිළිබඳ අවදානම් ඇගයුම් සිදුකරනු ලැබේ. කෙසේවුවද, මේ වන විට පද්ධතිමය සීමාවන් හේතුවෙන් වත්කම් හා වගකීම් කමිටුව මගින් ණය ලබාදීම් හා තැන්පතු යන දෙකම සම්බන්ධයෙන් වෙළඳපොල තත්ත්වයන් හා ණය තැන්පතු අනුපාතය ආශ්‍රයෙන් පොලී අනුපාත තීරණය කරනු ලැබේ. ප්‍රධාන බැංකුකරණ විසඳුම ක්‍රියාවට නැංවීම සම්පූර්ණ වීමත් සමග අනාගතයේදී අවදානම් ඇගයුමෙහි මෙම පරාසය තවදුරටත් වැඩිදියුණු වනු ඇත.

තොරතුරු අවදානම සහ සයිබර් අවදානම

එදිනෙදා බැංකුවේ මෙහෙයුම් සිදුකිරීමේදී පරිගනක පද්ධති භාවිතයේදී, ගිණුම් පොත් සැසඳීමේදී, තොරතුරු හා වාර්තා ගබඩා කිරීමේදී හා නැවත ලබාගැනීමේදී තාක්ෂණික අවදානම පැන නගී. සයිබර් පහරදීම් හෝ පද්ධති, ජාල හෝ දත්ත පදනම් අවභාවිත කිරීම් මගින් ගනුදෙනුකාර දත්ත අහිමිවීම්, මෙහෙයුම් වෙත බාධාවන් හෝ කීර්තිනාමය ආශ්‍රිත හානි තුළින් සයිබර් අවදානම් උද්ගත වේ.

තොරතුරු අවදානම සහ සයිබර් අවදානම පාලනය

තොරතුරු තාක්ෂණ නියමු කමිටුව

බැංකුව මගින් 2013 දී ප්‍රධාන තොරතුරු නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව සියළුම තාක්ෂණික ව්‍යාත්තිකයින් නියෝජනය කරන්නා වූ තොරතුරු තාක්ෂණ නියමු කමිටුවක් ස්ථාපනය කරන ලදී. එමගින් බැංකුවේ සියළුම තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගැටළු සාකච්ඡා කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

තොරතුරු අවදානම සහ සයිබර් අවදානම අවම කිරීම, අධීක්ෂණය සහ වාර්තාකරණය

- ප්‍රබල තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතා ප්‍රතිපත්තියක් සහ පැහැදිලිව දක්වන ලද වගකීම සමගින් සවිමත් තොරතුරු තාක්ෂණ පාලනයක්
- නිතිපතා තොරතුරු තාක්ෂණ අනතුරු සහගත තත්ත්වයන් ඇගයීම
- දෘඩාංග හා මෘදුකාංග අධිශ්‍රේණිගත කිරීමේ අඛණ්ඩව ක්‍රියාත්මක වන අයෝජන
- ස්වාධීන පාර්ශ්වයන් විසින් තොරතුරු තාක්ෂණ විගණනයන්

ඉදිරි දැක්ම

තරඟකාරී මූල්‍ය ක්ෂේත්‍රයක් තුළ අවදානම් කළමනාකරණයෙහි වැදගත්කම් කළමනාකාරිත්වය විසින් මැනවින් හඳුනාගනු ලැබ ඇත. අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය වර්ධනය කිරීමෙහිලා ආයෝජන සිදුකිරීම මීළඟ වසර දෙකක් කාලයේදී අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. බැංකුවේ කළමනාකාරිත්වය විසින් අවදානම් කළමනාකරණ ආකෘතිය සවිමත් කිරීමෙහිලා දැනටමත් පහත දැක්වෙන අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

- ණය ලකුණු සටහන් සහ ණය ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය මිලට ගැනීම
- ස්වයංක්‍රීය SLFRS 9 ගිණුම්කරණ පද්ධතිය මිළට ගැනීම
- ණය ඇරඹුම් පද්ධතිය මිළට ගැනීම
- බැංකුව පුරා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ක්‍රියාවට නැංවීම
- බාසල් රෙගුලාසි වෙත පූර්ණ අනුකූලතාවය
- සයිබර් අවදානම ආරක්ෂණ අවම කිරීමේ තාක්ෂණයන් ස්ථාපනය
- තොරතුරු තාක්ෂණ සුරක්ෂිතතාවය සඳහා ISO 27000 ස්ථාපනය කිරීම

ආයතනික පාලනය

66 ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව
67 ආයතනික පාලනය
88 අධ්‍යක්ෂ මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල පැමිණීම
89 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
95 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව
97 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව,
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව
99 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු වාර්තාව
100 ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
102 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය
103 මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම
104 අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව
106 අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/F/RDB/CG/2019 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 26 June 2020

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා කෙරෙහි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සිද්ධිවාචක සොයාගැනීම් පිළිබඳ විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට පිළියෙල කොට ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුම තුළ ගණනය කල ක්‍රියාපටිපාටි මා විසින් ඉටුකර ඇත. මෙම සහභාගිත්වය ඉටු කරනු ලැබුවේ එකඟ වූ ක්‍රියාපටිපාටි සහභාගිත්වයට අදාළ සම්බන්ධිත සේවා 4400 (SLSRS 4400) පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතියේ දක්වා ඇති මූලධර්මවලට අනුකූලවය. ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට ඔබට සහයවීම සඳහා පමණක් ක්‍රියාපටිපාටි ඉටු කරන ලදි.

මෙම වාර්තාවට අමුණා ඇති ඇමුණුම 1 තුළ මාගේ සොයාගැනීම් පිළිබඳව මා විසින් වාර්තා කරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් ඉහත ක්‍රියාපටිපාටිවලින් අදහස් නොකරන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝග සමඟ අනුකූලතාව පිළිබඳ සහතිකයක් මම ප්‍රකාශ නොකරමි.

අතිරේක ක්‍රියාපටිපාටි මවිසින් ඉටුකරන ලද බැවින් සහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් මම ඉටුකර ඇති බැවින්, අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්වියහැකි අතර ඒවා ඔබ වෙත වාර්තා කර ඇත.

මගේ වාර්තාව හුදෙක් මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදයේ දක්වා ඇති අරමුණ සහ ඔබගේ දැනගැනීම සඳහා පමණක්ම වන අතර, වෙනත් යම් අරමුණක් සඳහා හෝ යම් වෙනත් පාර්ශ්වයන්ට බෙදාහැරීමට භාවිතා නොකළ යුතුය.

මෙම වාර්තාව ඉහත විශේෂයෙන් දක්වා ඇති අයිතමවලට පමණක් අදාළවන අතර, සමස්තයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වෙනත් මූල්‍ය ප්‍රකාශන සඳහා පුළුල් කළ නොහැක.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඇමුණුම - 1

තථ්‍ය සොයාගැනීම් පිළිබඳ ඇමුණුම

		අනුකූලතා මට්ටම
3(1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**	
3(1)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බැංකුවේ සුරක්ෂිතතාවය හා ස්ථාවරත්වය සවිමත් කරනු ලැබ ඇති බවට තහවුරු කිරීම උදෙසා ක්‍රියාවට නංවන ලද එකඟත්වයට පත් ක්‍රියාපටිපාටීන්.	
	අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, බැංකුවේ ක්‍රමෝපායික අරමුණු හා සාංගමික වටිනාකම්. බැංකුව මගින් එහි ක්‍රමෝපායික අරමුණු බැංකුව පුරා සන්නිවේදනය කලේද යන වග	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල අනුමත 2016 - 2020 දක්වා සකසන ලද සාංගමික සැලසුම සහ වාර්ෂික අයවැය ඉදිරිපත් කොට ඇත. ඒවා තුළ බැංකුවේ ක්‍රමෝපායික අරමුණු සහ සාංගමික වටිනාකම් අන්තර්ගත වේ. කෙසේවුවද, දැනට පවතින සාංග මික සැලසුම මගින් වසර 2020 දක්වා පමණක් පුරෝකථනයන් සිදු කරනු ලබයි. බැංකුවේ ක්‍රමෝපායික අරමුණු සහ සාංගමික වටිනාකම් ප්‍රධාන කාර්යාල මට්ටමේ රැස්වීම් වලදී ප්‍රාදේශීය කළමනාකාරවරුන්ටද පළාත් මට්ටමේ රැස්වීම් වලදී ශාඛා කළමනාකාරවරුන්ටද දන්වනු ලැබිණි.
	ආ) බැංකුවේ සමස්ත ක්‍රමෝපාය සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය. යාන්ත්‍රණයන්ගෙන් සමන්විත වන අතර ඒවා ලේඛණගත කෙරේ. සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය, සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටීන් හා යාන්ත්‍රණයන්ගෙන් සමන්විත වන අතර ඒවා ලේඛණගත කෙරේ. සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය තුළ අවම වශයෙන් මීළඟ වසර තුන සඳහා මැනිය හැකි ඉලක්ක අඩංගු වේ.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල අනුමත (2016-2020) සාංගමික සැලසුම තුළ බැංකුවේ සමස්ත ව්‍යාපාරික ක්‍රමෝපාය ඇතුළත් වේ. සමස්ත අවදානම් ප්‍රතිපත්තිය හා ක්‍රියාපටිපාටීන් සමෝධානික අවදානම් කමිටුවෙහි නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ආවර්තිතව සමාලෝචනය කෙරේ. කෙසේවුවද, සාංගමික සැලසුමෙහි මැනිය හැකි ඉලක්ක වසර 2020 දක්වා පමණක් පුරෝකථනය කෙරේ.
	ඇ) අවදානම කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලැබූ යෝග්‍ය වූ ක්‍රමවේදයන් විචක්ෂණශීලී වූ අතර නිසි පරිදි ක්‍රියාවට නංවන ලදී.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල අනුමත සමෝධානික අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි තුළ විචක්ෂණශීලී ඇගයුම් ක්‍රියාවලියක් ඇතුළත් වේ. තවද, එය සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවෙහි සමාලෝචනයට ලක් වේ.
	ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස් හිමිකරුවන් හා ණය ගැතියන් ඇතුළු සියළුම පාර්ශ්වකරුවන් සමග සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කොට ක්‍රියාවට නංවන ලදී:	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල අනුමත සන්නිවේදන ප්‍රතිපත්තියක් පවතින අතර එය තැන්පත්කරුවන්, ණය හිමියන්, කොටස් හිමිකරුවන් හා ණය ගැතියන් ඇතුළු සියළුම පාර්ශවකරුවන් සමග වන සන්නිවේදනයන්ගෙන් සමන්විත වේ.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	අනුකූලතා මට්ටම
ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ සුපිළිපත් බව සම්බන්ධ සමාලෝචනයක් සිදු කෙරිණි.	අනුගත විය : විශේෂයෙන් මෙහෙයුම් නියෝජ්‍ය සමාන්‍යාධිකාරීවරයා ඇතුළු සියළුම ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීමේ හා යාවත්කාලීන කිරීමේ වගකීමෙන් බැඳේ. අභ්‍යන්තර විගණන අංශය මගින් ද බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ සුපිළිපත් බව සම්බන්ධ සමාලෝචනයක් සිදු කෙරේ. භාරදෙන ලද වාර්තා ද විගණන කමිටුව මගින් සමාලෝචනය කෙරේ.
ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අර්ථදක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (i) ප්‍රතිපත්තිය වෙත සැළකිය යුතු ආකාරයෙක් බලපෑම් ඇති කළ හැකි (ii) ක්‍රියාකාරකම් නියම කළ හැකි (iii) ව්‍යාපාරික කටයුතු, මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය සම්බන්ධ පාලනයන් ක්‍රියාවේ යෙදවිය හැකි කළමනාකරණ වෘත්තිකයින් හඳුනාගෙන පත්කරනු ලැබ ඇත.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් හඳුනාගෙන පත්කරනු ලැබ ඇත.
උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් හටම සහ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ට අදාළ අධිකාරීත්වය සහ වගකීම් නිර්වචනය කරනු ලැබ ඇත.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් හටම සහ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ට අදාළ අධිකාරීත්වය සහ වගකීම් නිර්වචනය කරනු ලැබේ. ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ට අදාළ අධිකාරීත්වය සහ වගකීම් නිර්වචනය ආශ්‍රිත රැකියා විස්තරයන්හි ලේඛණගත කොට ඇත.
ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් විසින් සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදුකරන ලද්දේ, ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තියට අනුකූලව සිදුකෙරේද යන්න විමසීම උදෙසාය.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ඔස්සේ බැංකුවේ කාර්යයන් පිළිබඳව නිසි අධීක්ෂණයක් සිදුකරන ලදී. තවද. අවශ්‍ය විටකදී පැහැදිලි කිරීම් සඳහා ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත කැඳවන ලදී.
එ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දක්වෙන කරුණුද ඇතුළත්ව අධ්‍යක්ෂවරුන්ගේම පාලන ක්‍රියාකාරකම් ආවර්ජිතව ඇගයුමට ලක් කෙරිණි: (i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් තෝරාගැනීම, නම් කිරීම: (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය : සහ (iii) දූර්වලතා නිර්ණය කරමින් අවශ්‍ය අවස්ථාවන්හිදී වෙනස්කම් ක්‍රියාවට නැංවීම.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ස්වයං ඇගයුම් පෝරමයන් පවතී.

	ඒ) ප්‍රමුඛ කළමනාකරණ ව්‍යෘත්තිකයින් සඳහා අනුප්‍රාප්තික සැලසුමක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමුඛ කළමනාකරණ ව්‍යෘත්තිකයින් සඳහා අනුප්‍රාප්තික සැලසුමක පවතී. කෙසේවුවද යාවත්කාලීන කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් නොපවතී.
	ඔ) ප්‍රතිපත්ති විමර්ශනය, සන්නිවේදන ධාරාවන් ස්ථාපනය හා සාංගමික අරමුණු කෙරෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා ප්‍රමුඛ කළමනාකරණ ව්‍යෘත්තිකයින් සමග රැස්වීම් පවත්වන ලදී.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් හටම සහ ප්‍රමුඛ කළමනාකරණ ව්‍යෘත්තිකයින්ට අදාළ අධිකාරීත්වය සහ වගකීම් නිර්වචනය කරනු ලැබ ඇත.
	ඕ) නියාමන වටපිටාව සහ බැංකුව නියාමනයන් සමග සබඳතා පවත්වාගෙන යන්නේද යන වග අවබෝධ කරගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය පියවර හා ක්‍රියාවලීන් දියත් කරන ලදී.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන වටපිටාව අවබෝධ කරගැනීම සඳහා සහ නියාමනයන් සමග සබඳතා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර හා ක්‍රියාවලීන් දියත් කරන ලදී.
	ක) බාහිර විගණකවරුන්ගේ සේවය ලබාගැනීම හා අධීක්ෂණය සඳහා ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබයි.	අදාළ නොවේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.
3(I)(ii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති හා විධායක නිලධාරීවරයා පත් කරන ලදී. සභාපති හා විධායක නිලධාරීවරයාගේ ක්‍රියාකාරකම් හා වගකීම් මෙම නියෝගයන්හි නියෝග 3(5) ට සමගාමීව වේ.	අනුගත විය : මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරීවරයා පත් කෙරේ. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර, බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාර කළමනාකරණය භාර විධායකයා වශයෙන් ප්‍රධාන විධායක නිලධාරීවරයා කටයුතු කරයි. කෙසේවුවද, 2018 නොවැම්බර් 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැය කමිටුවෙහි රැස්වීමෙහි තීරණය අනුව, සභාපතිවරයා ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු ආදිය අත්සන් තැබීම් වලදී බැංකුව වෙනුවෙන් සම්බන්ධ වේ.
3(I)(iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දළ වශයෙන් මාසික කාල අන්තරයන්හිදී නිතිපතා හමුවී අවම වශයෙන් දොළොස් වතාවක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබ ඇත.	අනුගත විය : සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වේ. එමෙන්ම අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂ රැස්වීම් කැඳවනු ලැබේ. වසර 2019 දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 16 ක් පවත්වන ලද අතර, භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් පරිදි දෙසැම්බර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නොපැවැත්විනි.
3(I)(iv)	සියළුම අධ්‍යක්ෂවරුන් හට, බැංකුවේ ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණ අරමුණු ප්‍රවර්ධනය කෙරෙන ආකාරයේ කරුණු හා යෝජනා නිල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල න්‍යායපත්‍රයට ඇතුළත් කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩල විසින් පවත්වා ගෙන යනු ලබයි.	අනුගත විය : නිල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව කැඳවනු ලැබේ. කරුණු හා යෝජනා ඇතුළත් කිරීමේ ඉඩකඩ සලසමින් මීලඟ රැස්වීම පිළිබඳව අධ්‍යක්ෂවරුන් හට කල්තබා දැනුම්දෙනු ලැබේ.
3(I)(v)	සියළුම අධ්‍යක්ෂවරුන් හට සහභාගී වීමේ අවස්ථාව ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් අවම වශයෙන් දින 7 කට පෙර දැනුම්දීම් සිදු කෙරේ. එමෙන්ම සෙසු සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දැනුම්දීම් සිදු කරනු ලැබ ඇත.	අනුගත විය : නිල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පිළිබඳ දැනුම්දීම දින 7 කට පෙර සිදුකෙරේ. සෙසු විශේෂ රැස්වීම් සාධාරණ දැනුම්දීමක් සහිතව සිදු කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(I)(vi)	අධ්‍යක්ෂ මණ්ඩලය මගින්, ආසන්නතම පෙර මාස 12 තුළ අවම වශයෙන් රැස්වීම් වලින් තුනෙන් දෙකකට සහභාගී නොවූ හෝ අඛණ්ඩව ආසන්නතම පෙර රැස්වීම් තුනට සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් නිසි පියවර ගනු ලැබිය. කෙසේවුවද, විකල්ප අධ්‍යක්ෂවරයකුගේ මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වීම, පැමිණීම වශයෙන් පිළිගනු ලැබේ.	අනුගත විය : රැස්වීම් වලින් තුනෙන් දෙකකට සහභාගී නොවූ හෝ අඛණ්ඩව ආසන්නතම පෙර රැස්වීම් තුනට සහභාගී නොවීමේ සිදුවීමක් සම්බන්ධයෙන් කිසිදු නිරීක්ෂණයක් නොමැත.
3(I)(vii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1988 අංක 30 දරණ බැංකු පනතේ වගන්ති 43 හි විධිවිධාන සපුරලන්නා වූ, අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාර රැස්වීම් සඳහා ලේකම් කාර්යාල සේවාවන් සැපයීම සහ ව්‍යවස්ථාව හා වෙනත් රෙගුලාසි මගින් විශේෂිත සෙසු ක්‍රියාකාරකම් සිදුකිරීම මූලික වගකීම කොට ගත්, සමාගම් ලේකම්වරයකු පත් කරනු ලැබ ඇත.	අනුගත විය : 1988 අංක 30 දරණ බැංකු පනතේ වගන්ති 43 සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතෙහි වගන්ති 19 හා අර්ථදක්වනු ලැබ ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා පත් කරනු ලබන අතර අදාළ ලේකම්වරයා පූර්ණ කාලීන නිලධාරියකු වේ.
3(I)(viii)	සියළුම අධ්‍යක්ෂවරුන් හට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් ලබාගැනීමට හැකි වන ක්‍රියාවලිය.	අනුගත විය : සියළුම අධ්‍යක්ෂවරුන් හට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ උපදෙස් හා සේවාවන් ලබාගත හැක.
3(I)(ix)	සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වා ගෙන යනු ලබන අතර ඒවා පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂවරුන් හට ක්‍රමවේදයක් පවතී.	අනුගත විය : සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වා ගෙන යනු ලැබේ. තවද ඒවා පරීක්ෂා කිරීමට ඕනෑම අධ්‍යක්ෂවරයකු හට ලබාගත හැකි වේ.
3(I)(x)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වල පහත දැක්වෙන දෑ ඇතුළත් හෝ සම්බන්ධ වේ: අ) ස්වකීය තීරණ ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගන්නා දත්ත හා තොරතුරු වල සාරාංශයක් ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සළකා බලනු ලබන කරුණු ඇ) සාධක සොයාගැනීමේ සාකච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය වගකීම් නිසි අවධානයකින් හා විචක්ෂණශීලීභාවයකින් යුතුව සිදුකරන්නේද යන්න දැක්වෙන ආකාරයේ විසම්මුතික ගැටළු ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රමෝපායන් හා ප්‍රතිපත්තීන් වෙත අනුකූලතාවය සහ අදාළ නීතිරීති හා රෙගුලාසි වෙත අනුගතවීම දැක්වෙන කරුණු ඉ) බැංකුව නිරාවරනය වන අවදානම් අවබෝධ කරගැනීම සහ ආදේශ කරගනු ලැබූ අවදානම් කළමනාකරණ පියවර සම්බන්ධ විමර්ශනයක් : සහ ඊ) තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මගින් පහත දැක්වෙන අවශ්‍යතා ආවරණය කෙරේ, I. නිශ්චිත විෂයයන් ආශ්‍රිතව ගනු ලබන ව්‍යාපාරික තීරණ II. විශේෂ විෂයන් ආශ්‍රිතව සම්මත කරගනු ලබන යෝජනා III. කළමනාකාරීත්ව වෙත නියම කෙරෙන උපදෙස් හා කරුණු IV. කරුණු සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ හා කාර්යසාධන විමර්ශනයන් V. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා සම්බන්ධ නිර්දේශයන් VI. අවදානම් කළමනාකරණ පියවර සම්බන්ධ විමර්ශනය VII. අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රමෝපායන් හා ප්‍රතිපත්තීන් කෙරෙහි අනුකූලතාවය
3(I)(xi)	අවශ්‍ය අවස්ථාවන්හිදී බැංකුවේ වියදමෙන්, ස්වාධීන වෘත්තික උපදෙස් පැතීම සඳහා, සාධාරණ ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරුන් හට කටයුතු කළ හැකි අයුරින් අධ්‍යක්ෂ මණ්ඩලය එකඟත්වයට පත් වන ක්‍රියාපටිපාටීන් පවතී.	අනුගත විය : ස්වාධීන වෘත්තික උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලත් ක්‍රියාපටිපාටියක් පවතී.

3(I)(xii)	අධ්‍යක්ෂවරුන් සම්බන්ධව බැදියා පිළිගැටුම්, හෝ බැදියා පිළිගැටුමක් පිළිබිඹුවීම වළකාගැනීම සම්බන්ධ යෝග්‍ය වූ ක්‍රියාමාර්ග නිර්ණය කිරීම, වාර්තා කිරීම, විසඳීම සහ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධ ක්‍රියාපටිපාටියක් පවතී. අධ්‍යක්ෂවරයකු ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියකු හෝ කාරණයක් සම්බන්ධ අදාළ අධ්‍යක්ෂවරයාගේ සැළකිය යුතු අභිමතයක් සහිත කවර හෝ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්දය භාවිත කිරීමෙන් වැළකී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ නඩුවපත්‍ර අයිතමය සඳහා වන ගනපූර්ණයේදී ඔහු/ඇය ගණන් ගෙන ඇතිද යන වග	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික අභිමතය සහිත යෝජනාවක් සම්මත කරගැනීමේදී, අදාළ අධ්‍යක්ෂවරයා එම යෝජනාව සඳහා ඡන්දය භාවිත කිරීමෙන් වැළකී සිටී. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ නඩුවපත්‍ර අයිතමය සඳහා වන ගනපූර්ණයේදී අභිමතය සහිත අධ්‍යක්ෂවරයා ගණන් නොගැනේ.
3(I)(xiii)	බැංකුවේ නිර්දේශය හා පාලනය නිසි පරිදි ස්වකීය පාලනය යටතේ පවතිද යන්න හඳුනාගැනීම සඳහා වන තීරණයකදී අධ්‍යක්ෂ මණ්ඩලය සඳහාම විශේෂිතව වෙන් කෙරුනු නිල කාර්ය සටහනක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව පවතී.	අනුගත විය : අවසන් තීරණ වලට එළඹීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය තහවුරු කිරීම පිණිස, නඩුවපත්‍රය තුළ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා වෙන්කරන ලද කරුණු ආශ්‍රිත කාර්ය සටහනක් ඇතුළත් කරනු ලැබ ඇත.
3(I)(xiv)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුව සිය බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වන්නේද නැතහොත් බුන්වත් භාවයට පත්වීමට නියමිතද නැතහොත් තැන්පත්කරුවන් හා වෙනත් ණයහිමියන් වෙත ගෙවිය යුතු ගෙවීමේ අත්හිටුවීමට සිදුවේද යන්න පිළිබඳව හඳුනාගැනීම සඳහා අනුගමනය කෙරන ක්‍රියාපටිපාටීන් ආශ්‍රයෙන්, කවර හෝ තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර, බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත එකෙණෙහිම දන්වනු ලැබ ඇත.	අදාළ නොවේ: එවැනි සිදුවීමක් උද්ගතව නොමැති නමුත්, බැංකුව බුන්වත් භාවයට පත්වීමට නියමිතද නැතහොත් තැන්පත්කරුවන් හා වෙනත් ණයහිමියන් වෙත ගෙවිය යුතු ගෙවීමේ අත්හිටුවීමට සිදුවේද යන්න පිළිබඳව, කවර හෝ තීරණයක් හෝ ක්‍රියාමාර්ග යක් ගැනීමට පෙර, බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දන්වනු ලැබීමේ අවශ්‍යතාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්භාවයකින් පසුවේ.
3(I)(xv)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, මුදල් මණ්ඩලය මගින් ඉල්ලා සිටිනු ලැබූ මට්ටම් අනුව බැංකුවේ ප්‍රාග්ධනිතය සිදු කරන ලදී.	අර්ධ වශයෙන් අනුගත විය : බැංකුව මගින් 2019.12.31. දිනට මුදල් මණ්ඩලය මගින් නිර්ණය කරන ලද පරිදි ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පවත්වා ගැනුනි. කෙසේවුවද, ඇතැම් අවස්ථාවලදී අවශ්‍ය මට්ටම පහළ සිදුවීම් වාර්තා විය.
3(I)(xvi)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ වාර්ෂික වාර්තාවේ, මෙකී නියෝගයන්හි නියෝග අංක 3 වෙත අනුකූල වන පරිදි වාර්ෂික සාංගමික පාලන වාර්තාවක් ප්‍රකාශයට පත් කෙරේ.	අනුගත විය : ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද සාංග මික පාලන නියෝගය සම්බන්ධ අනුකූලතා අවශ්‍යතාවය සපුරාලමින් වාර්ෂික වාර්තාවේ සාංගමික පාලන වාර්තාව ඇතුළත් කෙරේ.
3(I)(xvii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සිදුකරනු ලබන ස්වයං ඇගයුමක් යොදාගැනෙන අතර, එවැනි ස්වයං ඇගයුම් සම්බන්ධ වාර්තා පවත්වාගෙන යනු ලැබේ.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ස්වයං ඇගයුම් පෝරම පවතී.
3(2)	**අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සංයුතිය**	
3(2)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 කට නොඅඩු සහ 11 කට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ.	අනුගත විය : 2019.11.26. දිනට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 8 දෙනෙකුගෙන් සමන්විත විය.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(2)(ii)	අ) ප්‍ර.වි.නි. ධූරය දරන අධ්‍යක්ෂවරයා හැරුනු විට අධ්‍යක්ෂවරයකුගේ මුළු සේවා කාලසීමාව වසර නවය නොඉක්මවයි.	අනුගත විය : කිසිදු අධ්‍යක්ෂවරයකු නියෝගයෙහි දක්වා ඇති පරිදි වසර නවය ඉක්මවා නොමැත.
	ආ) කිසියම් අවස්ථාවකදී කවර හෝ අධ්‍යක්ෂවරයකු වසර 9 කට වැඩි කලක් සේවයේ යෙදෙන්නේ නම්, පරිවර්තනීය ප්‍රතිපාදන අදාළ කොට ගෙන ඇති දැයි පරීක්ෂා කරන්න.	අදාළ නොවේ : එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැත.
3(2)(iii)	ප්‍ර.වි.නි. ද ඇතුළුව විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එක ඉක්මවා නොමැත.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් විධායක අධ්‍යක්ෂවරයකු වූ අතර, ප්‍ර.වි.නි. ද ඇතුළුව සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එක ඉක්මවා නොමැත.
3(2)(iv)	අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් වන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් යන දෙකෙන් ඉහළ අගයෙන් සමන්විත වේ.	අර්ධ වශයෙන් අනුගත විය : 2019.11.26. වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිව් දෙනෙකු වූහ. 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව, එක් එක් කොටස් හිමිකාර බැංකුව විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරය මගින් එක් විධායක නොවන අධ්‍යක්ෂවරයකු පත් කෙරේ.
	ඔහු/ඇය පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් විධායක නොවන අධ්‍යක්ෂවරයකු විධායක අධ්‍යක්ෂවරයකු බවට සැළකිය හැකි දැයි පරීක්ෂා කරන්න:	
	අ) බැංකුවේ සියයට 1 ට වැඩි සෘජු හෝ වක්‍ර කොටස් හිමිකාරිත්වයක් පැවතීම:	අදාළ නොවේ
	ආ) වර්තමානයේදී හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් ඔහුගේ/ඇයගේ පත්වීමට ආසන්නතම පෙර වසර දෙක ඇතුළත, මෙහි එන 3(7) නියෝගයෙහි දක්වෙන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවූ කවර හෝ ව්‍යාපාරික ගනුදෙනුවක් බැංකුව සමග සිදු කිරීම:	අදාළ නොවේ
	ඇ) අධ්‍යක්ෂවරයකු වශයෙන් පත්වීමට ආසන්නතම පෙර වසර දෙක ඇතුළත බැංකුව මගින් සේවා නියුක්තියෙහි යොදවනු ලැබීම:	අදාළ නොවේ
	ඈ) අධ්‍යක්ෂවරයකු, ප්‍ර.වි.නි., ප්‍රමුඛ කළමනාකරණ ව්‍යක්තික සාමාජිකයෙකු, බැංකුවේ හෝ වෙනත් බැංකුවක මූර්ත කොටස් හිමිකරුවකු වන සමීප ඥාතියකු සිටීම : (මෙහිදී, ''සමීප ඥාතියකු'' යන්නෙන් කලත්‍රයා හෝ මූල්‍යමය යැපීමක් සහිත දරුවකු අදහස් වේ)	අදාළ නොවේ
	ඉ) බැංකුවේ නිශ්චිත කොටස් හිමිකරුවකු නියෝජනය කිරීම:	අදාළ නොවේ

	ඊ) පහත දැක්වෙන ලක්ෂණ සහිත ව්‍යාපාරික සමාගමක සේවකයකු හෝ අධ්‍යක්ෂවරයකු හෝ සාධනීය කොටස් හිමියකු වීම : I. මෙහි එන 3(7) නියෝගයෙහි දැක්වෙන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවූ කවර හෝ ව්‍යාපාරික ගනුදෙනුවක් වර්තමානයේදී බැංකුව සමග පැවතීම, හෝ II. එහිදී බැංකුවේ වෙනත් අධ්‍යක්වරුන්ගෙන් කවරකු හෝ සේවය කරන හෝ ඔවුන් අධ්‍යක්ෂවරුන් හෝ සාධනීය කොටස් හිමිකරුවන් වන : හෝ III. එහිදී බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයකු හට මෙහි එන 3(7) නියෝගයෙහි දැක්වෙන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවූ කවර හෝ ව්‍යාපාරික ගනුදෙනුවක් පැවතීම.	අදාළ නොවේ
3(2)(v)	ස්වාධීන අධ්‍යක්ෂවරයකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයකු පත් කරන ලද අවස්ථාවකදී, එසේ පත්කිරීමට නියමිත පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයකුට අදාළ ක්‍රියාපටිපාටිය සපුරාලන්නේද යන්න පරීක්ෂා කරන්න.	අදාළ නොවේ 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත අනුව විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා ප්‍රතිපාදන නොමැත.
3(2)(vi)	විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා බැංකුව සතුව ක්‍රියාවලියක් පවතී.	අදාළ නොවේ භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කෙරේ.
3(2)(vii)	බැංකුවේ ව්‍යවස්ථාපිත ගණපූර්ණය අධ්‍යක්ෂවරුන්ගෙන් 50% කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන අතර මෙම ගණපූර්ණයෙන් 50% කට වැඩි සංඛ්‍යාවක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු වේ.	අනුගත විය : ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ නම් ගණපූර්ණය 5 ක් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 කට වැඩි දෙනෙකුගෙන් සමන්විත වේ නම් ගණපූර්ණය 6 ක් වේ.
3(2)(viii)	බැංකුව මගින් වාර්ෂික සාංගමික පාලන වාර්තාවේ, සභාපතිවරයාගේ, විධායක අධ්‍යක්ෂවරුන්ගේ, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව, අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අනාවරනය කරනු ලැබේ.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ඔවුන්ගේ තොරතුරු වාර්ෂික වාර්තාවේ අනාවරනය කරනු ලැබේ.
3(2)(ix)	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියාපටිපාටිය.	අදාළ නොවේ: භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කෙරේ.
3(2) (x)	තාවකාලික පුරප්පාඩුවක් පුරවා ගැනීම සඳහා පත් කරනු ලබන සියළුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් පසුව එළඹෙන පළමු මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් තෝරා පත් කර ගනු ලැබීමට යටත් වේ.	අදාළ නොවේ: භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ ඉවත් කිරීම සිදු වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(2)(xi)	කිසියම් අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ධූරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්: (අ) අදාළ අධ්‍යක්ෂවරයාගේ බැංකුව සමග විසම්මුතියක් පවතී නම් ඒ ආශ්‍රිත තොරතුරුද ඇතුළත්ව නමුත් ඒවාට සීමා නොවී, අදාළ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ එවැනි ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීමක් සඳහා පාදක වූ හේතු ප්‍රකාශයට පත් කෙරේ: එමෙන්ම (ආ) කොටස් හිමිකරුවන්ගේ අවධානයට යොමු කළ යුතු කවර හෝ කරුණක් පවතීද නැතිද යන වග සම්බන්ධයෙන් තහවුරු කරමින් ප්‍රකාශයක් නිකුත් කෙරේ.	අනුගත විය : භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ ඉවත් කිරීම සිදු වේ. බැංකුව වෙත ලිපියක් ඔස්සේ ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයා ඔහුගේ/ඇයගේ ඉල්ලා අස්වීම පිළිගන්නා අතර, අදාළ ලිපිය පදනම් කරගනිමින් බැංකුව විසින් එකී අධ්‍යක්ෂවරයා ඉල්ලා අස්වූ බව අමාත්‍යාංශය වෙත දන්වනු ලබයි.
3(2)(xii)	කිසියම් බැංකුවක අධ්‍යක්ෂවරයකු හෝ සේවකයකු, තවත් බැංකුවක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත්කිරීම, තෝරාගැනීම හෝ නම්කිරීම හඳුනාගැනීමේ ක්‍රියාවලියක් පවතීද යන්න පරීක්ෂා කිරීම.	අනුගත විය : අමාත්‍යවරයා විසින් පත්කිරීම් සිදු කෙරෙන බැවින් එබඳු අවස්ථාවක් උද්ගත නොවේ. එමෙන්ම, අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ප්‍රමුඛ කළමනාකරණ ව්‍යක්තිකයින්ගෙන් ලබාගත් ප්‍රකාශයන් මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් යෝග්‍යතාවය සහ සුදුසුකම ඇගයුමට ලක් කෙරේ.
3(3)	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ සුදුසුකම ඇගයුමට ලක් කිරීමේ ක්‍රියාපටිපාටිය**	
3(3)(i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන්නකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු වේ.	අනුගත විය : වයස අවුරුදු 70 ඉක්මවූ කිසිදු අධ්‍යක්ෂවරයකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සැදුම්ලත් නොවීය.
	(අ) පරිවර්තනීය ප්‍රතිපාදන වලට අනුකූල විය.	අදාළ නොවේ:
3(3)(ii)	කිසියම් පුද්ගලයකු විසින් බැංකුවේ පරිපාලිතයන් හා හවුල්කාර සමාගම් ද ඇතුළුව සමාගම්/සංවිධාන/ආයතන 20 කට අධික සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධූරයන් දරන්නේ නම්:	අනුගත විය : ඔවුන්ගේ ප්‍රකාශයන්හි දක්වෙන පරිදි කිසිදු අධ්‍යක්ෂවරයකු විසින් සමාගම් 20 අධ්‍යක්ෂ ධූරයන් දරනු නොලබයි.
3(4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමධ්‍යගත කරනු ලැබ ඇති කළමනාකරණ ක්‍රියාකාරකම්**	
3(4)(i)	විමධ්‍යගත කිරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවට අදාළ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු මෙන්ම ප්‍ර.වි.නි. සහ සෙසු ප්‍රමුඛ කළමනාකරණ ව්‍යක්තිකයින් වෙතද විමධ්‍යගත කරනු ලැබ ඇත.
3(4)(ii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ක්‍රියාකාරකම් විමධ්‍යගත කොට තිබුණද 3 (1) (i) හි කරුණු සම්බන්ධ වගකීම භාර ගනු ලැබීය.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ක්‍රියාකාරකම් විමධ්‍යගත කොට තිබුණද 3 (1) (i) හි කරුණු සම්බන්ධ වගකීම භාර ගනු ලැබීය.
3(4)(iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ පවතින බවට තහවුරු කිරීම පිණිස පවතින විමධ්‍යගත ක්‍රියාවලීන් ආවර්තිත පදනමක් මත විමර්ශනයට ලක් කෙරේ.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමධ්‍යගත ක්‍රියාවලීන් ආවර්තිත පදනමක් මත විමර්ශනය සහ අනුමැතිය සිදු කෙරේ. අධිකාරීත්ව මට්ටම අනුව අනුමැති සීමාවන් නිර්ණය කෙරේ.

3(5)	**සභාපතිවරයා සහ ප්‍ර.වි.නි.**	
3(5)(i)	සභාපතිවරයා සහ ප්‍ර.වි.නි. ගේ කාර්යභාරයන් වෙන් වෙන් ඒවා වන අතර එකම පුද්ගලයකු විසින් ඉටු නොකෙරේ.	අනුගත විය : සභාපතිවරයා සහ ප්‍ර.වි.නි. ගේ කාර්යභාරයන් වෙන් කොට ඇති අතර ඒවා පුද්ගලයින් දෙදෙනෙකු විසින් ඉටු කෙරේ. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර ප්‍රධාන විධායක නිලධාරීවරයා බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාර සම්බන්ධ දෛනික කටයුතු භාර විධායක නිලධාරියා වශයෙන් ක්‍රියා කරයි. කෙසේවුවද, 2018 නොවැම්බර් 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවෙහි රැස්වීමෙහි තීරණය අනුව, සභාපතිවරයා ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු ආදිය අත්සන් තැබීම් වලදී බැංකුව වෙනුවෙන් සම්බන්ධ වේ.
3(5)(ii)	සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයකු නොවන අවස්ථාවකදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සුදුසු ලේඛණගත විමසුම් කොන්දේසි සමගින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයකු වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කරන්නේදැයි පරීක්ෂා කිරීම. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයකු පත් කිරීම සම්බන්ධයෙන් මෙම වාර්ෂික වාර්තාවේ අනාවරනය කරනු ලැබ ඇත.	අනුගත විය : සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. බැංකුව කිසිදු අධ්‍යක්ෂවරයකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කොට නොමැත.
3(5)(iii)	සභාපතිවරයා සහ ප්‍ර.වි.නි. හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර කවර හෝ සබඳතාවයක් (මූල්‍යමය, ව්‍යාපාරික, පවුලේ හෝ වෙනත් ප්‍රමාණාත්මක/අදාළ සබඳතාවයක්/යන් ඇතුළුව) ඇත්නම්, ඒවා සහ ඒවායේ ස්වභාවය, ඒවා හඳුනාගනිමින් සිය සාංගමික පාලන වාර්තාවේ අනාවරනය කිරීම සඳහා ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.	අනුගත විය : එබඳු සබඳතා හඳුනාගැනීම සඳහා වාර්ෂික ප්‍රකාශයන් උපකාරී වේ.
3(5)(iv)	අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ස්වයං ඇගයුම් ක්‍රියාවලියක් පවතින අතර එහිදී සභාපතිවරයා (අ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය සපයයි: (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් බලාත්මක ආකාරයෙන් ඉටු කරන්නේද යන්න : සහ (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම ප්‍රධාන හා සුදුසු ගැටළු කාලානුරූපී අයුරින් සාකච්ඡාවට භාජනය කරන්නේද යන්න තහවුරු කරයි.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයුම් පෝරම පවතී.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(5)(v)	සභාපතිවරයා විසින් අනුමත නිල න්‍යායපත්‍රය සමාගම් ලේකම්වරයා විසින් සංසරණය කෙරේ.	අනුගත විය : සභාපතිවරයා හා ප්‍ර.වි.නි. සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අදාළ න්‍යායපත්‍රය සකසා සංසරණය කෙරේ.
3(5)(vi)	කාලානුරූපී භාරදීම ඔස්සේ, සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී උද්ගත වන ගැටළු සම්බන්ධයෙන් දැනුවත් වන බවට සභාපතිවරයා විසින් තහවුරු කෙරේ.	අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡාවට භාජනය වීමට නියමිත හදිසි කරුණු හැරුනු විට රැස්වීමට අවම වශයෙන් දින 7 කට පෙර රැස්වීම පිළිබඳ' දැන්වීම මගින් දැනුම් දෙනු ලැබේ.
3(5)(vii)	අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සම්බන්ධයෙන් පූර්ණ දායකත්වය ලබාදීම සඳහා අධ්‍යක්ෂවරුන් දිරිගන්වන සහ බැංකුවේ පරම අභිමතය පරිදි සභාපතිවරයා පෙරමුණ ගෙන ක්‍රියාකරන ආකාරයේ ස්වයං ඇගයුම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයුම් පෝරම පවතී.
3(5)(viii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය අගයනු ලබන ස්වයං ඇගයුම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.	අර්ධ වශයෙන් අනුගත විය : අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයුම් පෝරම පවතී.
3(5)(ix)	ප්‍රධාන කළමනාකාරීත්ව ව්‍යත්තිකයින්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින හෝ වෙනත් කවර හෝ විධායක කාර්යභාරයන් වෙත සභාපතිවරයා සහභාගී වේ.	අනුගත විය : සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන අතර ඔහු ප්‍රමුඛ කළමනාකරණ ව්‍යත්තිකයින් සම්බන්ධයෙන් සෘජු අධීක්ෂණ ක්‍රියාකාරකම් වල නොයෙදේ. කෙසේවුවද, 2018 නොවැම්බර් 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවෙහි රැස්වීමෙහි තීරණය අනුව, සභාපතිවරයා ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු ආදිය අත්සන් තැබීම් වලදී බැංකුව වෙනුවෙන් සම්බන්ධ වේ.
3(5)(x)	කොටස් හිමිකරුවන් සමග බලාත්මක සන්නිවේදනයක් පවත්වා ගැනීම සඳහා සහ ඔවුන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැන්වීම සඳහා ක්‍රියාවලියක් පවතී.	අනුගත විය : 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත ප්‍රකාරව, සාමාජිකයින් සිව් දෙනෙකු පත් කරනු ලබන්නේ කොටස් හිමිකාර බැංකු තුන සහ මහා භාණ්ඩාගාරය නියෝජනය කරමිනි. එමනිසා, ඔවුහු අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමිකරුවන් අතර සබැඳියක් වශයෙන් ක්‍රියා කරති.
3(5)(xi)	ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ මෙහෙයුම් හා ව්‍යාපාර සම්බන්ධ දෛනික කළමනාකරණය භාර අග්‍ර විධායකය වශයෙන් කටයුතු කරයි.	අනුගත විය : ප්‍ර.වි.නි. යනු බැංකුවේ මෙහෙයුම් සම්බන්ධ දෛනික කළමනාකරණය භාර විධායක නිලධාරියෙකි.

3(6) අධ්‍යක්ෂ මණ්ඩලය පත් කල කමිටු

3(6)(i)	බැංකුව මගින් මෙකී නියෝගයන්හි 3(6)(ii), 3(6)(iii), 3(6)(iv), 3(6)(v) හි දක්වා ඇති පරිදි අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් ස්ථාපනය කරනු ලැබ ඇත. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව සෘජුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කොට ඇති දැයි පරීක්ෂා කිරීම. එක් එක් කමිටුවෙහි කාර්යභාරයන්, භූමිකාවන් හා කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කෙරේ.	අනුගත විය : බැංකුව මගින් මෙකී නියෝගයන්හි 3(6)(ii), 3(6)(iii), 3(6)(iv), 3(6)(v) හි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කරනු ලබන පහත දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපනය කරනු ලැබ ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමානාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව එක් එක් කමිටුවෙහි කාර්යභාරයන්, භූමිකාවන් හා කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කෙරේ.
3(6)(ii)	විගණන කමිටුව	
	අ) විගණන කමිටුවෙහි සභාපතිවරයා සුදුසුකම් හා පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.	අනුගත නොවිය : විගණන කමිටුවෙහි සභාපතිවරයා පත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙනි. කොටස් ප්‍රාග්ධනයෙන් බහුතරය මහා භාණ්ඩාගාර හිමිකාරිත්වය යටතේ පවතින බැවින් ඉහත අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවේ.
	ආ) විගණන කමිටුවෙහි සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.	අනුගත විය : විගණන කමිටුවෙහි සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
	ඇ) කමිටුව මගින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී: (i) අදාළ ව්‍යවස්ථාවන්ට අනුකූලව සේවාවන් සැපයීම සඳහා බාහිර විගණකවරයා පත් කිරීම : (ii) කලින් කලට විගණකවරුන් වෙත මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් ක්‍රියාත්මක කිරීම: (iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් යොදාගැනීම : සහ (iv) අදාළ විගණන සහකරු පෙර කාලසීමාව සම්පූර්ණ කෙරෙන දින සිට වසර තුනක් කල්ඉකුත් වීමට පෙර විගණනය සඳහා නැවත සහභාගී නොවන්නේ නම්, විගණන සහකරු වසර පහ නොඉක්මවන්නේ නම්, අදාළ විගණකවරයාගේ සේවා කාලසීමාව, විගණන ගාස්තුව, ඉල්ලා අස්වීම හෝ සේවයෙන් පහ කිරීම.	අදාළ නොවේ: 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතෙහි 33 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. රජයේ විගණකවරයා ආරාධනා මත විගණන කමිටුව නියෝජනය කරයි. එමෙන්ම වරින් වර විගණකවරුන් වෙත නිකුත් කෙරෙන අදළ රජයේ/මහබැංකු මාර්ගෝපදේශ හා අදළ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරේ.
	ඈ) කමිටුව මගින් විගණන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදුකෙරෙන බවට, ඔවුන්ගේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් බාහිර විගණක වෙතින් ආදර්ශයන් ලබාගෙන ඇත.	අදාළ නොවේ: 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතෙහි 33 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

	අනුකූලතා මට්ටම
ඉ) කමිටුව මගින් අදාළ රෙගුලාසි වලට අනුකූලව විගණනමය නොවන සේවාවන් සැපයීම සඳහා බාහිර විගණවරයකුගේ සහභාගීත්වය සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවනු ලැබ ඇත.	අදාළ නොවේ: විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වීම හේතුවෙන් එවැනි තත්ත්වයක් උද්ගත නොවීය.
ඊ) කමිටුව විසින්, විගණනය ඇරඹීමට පෙරාතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමග, විගණනයේ ස්වභාවය හා විෂයපථය පිළිබඳව සාකච්ඡා කොට අවසන් තීරණයකට එළැඹෙන ලදී.	අදාළ නොවේ: 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි, 13 වැනි වගන්තියෙහි (3) සහ (4) උප වගන්ති මගින් විගණනයේ විෂයපථය හා ප්‍රමාණය නිර්ණය කිරීමේ අභිමතානුසාරී බලය විගණකාධිපතිවරයා වෙත පවරනු ලැබ ඇත.
උ) බැංකුවේ, ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කෙරෙන්නා වූ මූල්‍ය ප්‍රකාශයන්හි, එහි වාර්ෂික වාර්තාවෙහි, ගිණුම් හා කාර්තුමය වාර්තාවන්හි සුපිළිපන් බව නිරීක්ෂණය කිරීම උදෙසා, බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් සහ පහත දැක්වෙන දෑ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙතින් ලබාගැනීමේ ක්‍රියාවලියක් කමිටුව සතුව පවතී : (i) ප්‍රධාන විනිශ්චයට අදාළ ක්ෂේත්‍රයන්: (ii) ගිණුම්කරණ ප්‍රමිතීන් හා ක්‍රියාකාරක්ම සම්බන්ධ කවර හෝ වෙනස්වීම් : (iii) අඛණ්ඩ පැවැත්ම උපකල්පනය : සහ (iv) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා වෙනත් නෛතික අවශ්‍යතා සමග අනුකූලතාවය, සහ (v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් විගණනය තුළින් ඉස්මතු වන සැළකිය යුතු ගැළපුම්.	අනුගත විය: විගණන කමිටුව මගින් ප්‍රමුඛ විනිසුම් ක්ෂේත්‍රයන්, ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්, සහ සෙසු නෛතික අවශ්‍යතාවයන් සැළකිල්ලට ගනිමින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ කාර්තුමය හා වාර්ෂික වශයෙන් විමර්ශනය කරනු ලැබේ.
ඌ) විගණනය සම්බන්ධයෙන් විධායක කළමනාකාරිත්වය සහභාගී නොවූ කවර හෝ ගැටළුවක් ආශ්‍රිතව කමිටුව බාහිර විගණකවරුන් හමු විය.	අනුගත විය: කමිටුව විධායක කළමනාකාරිත්වයෙහි සහභාගිත්වය රහිතව බාහිර විගණකවරුන් සමග සාකච්ඡා පැවැත්වීය.
එ) කමිටුව මගින් බාහිර විගණකවරයාගේ කළමනාකාරිත්වය ලිපිය සහ ඒ සම්බන්ධ කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය විමර්ශනයට ලක් කෙරිණි.	අනුගත විය: කමිටුව මගින් වසර 2017, 2018 සඳහා වන කළමනාකාරිත්වය ලිපිය සහ ඒ සම්බන්ධ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර විමර්ශනයට ලක් කෙරිණි.
ඒ) කමිටුව මගින් බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සම්බන්ධ පහත දැක්වෙන පියවර ගනු ලැබේ:	
I. අභ්‍යන්තර විගණන අංශයෙහි විෂයපථය, ක්‍රියාකාරකම් සහ සම්පත් වල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කොට, සිය කාර්යයන් සිදුකරගෙන යාම සඳහා එම අංශය සතුව අවශ්‍ය අධිකාරීත්වය පවතින බවට තහවුරු කරගැනීම.	අනුගත විය:
II. අභ්‍යන්තර විගණන වැඩසටහන සහ එම ක්‍රියාවලියෙහි ප්‍රතිඵල සමාලෝචනය කොට, අවශ්‍ය අවස්ථාවන්හිදී විගණන කමිටු නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බවට තහවුරු කිරීම.	අනුගත විය:
III. අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සම්බන්ධ කවර හෝ ඇගයුමක් සමාලෝචනය කිරීම.	අනුගත විය: විගණන කමිටුව මගින් වසර 2018 සඳහා අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධානියාගේ වාර්ෂික කාර්යසාධන ඇගයුම් වාර්තාව සමාලෝචනය කරන ලදී.

IV. අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධානියා සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය හා එහි පිටස්තර සේවා සම්පාදකයින් සම්බන්ධ කවර හෝ පත් කිරීමක් හෝ සේවය අවසන් කිරීමක් නිර්දේශ කිරීම.	අනුගත විය: විගණන කමිටු නිර්දේශ මත සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්වීම අනුමත කරන ලදී.
V. කමිටුව මගින් ප්‍රධාන විගණකවරයා එහි පිටස්තර සේවා සම්පාදකයින් ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයෙහි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයෙහි ඉල්ලා අස්වීම් ඇගයුමට ලක් කරමින්, ඔවුන් හට සිය ඉල්ලා අස්වීම් සඳහා වන හේතු දැක්වීමේ අවස්ථාව ද සළසන ලදී.	අනුගත විය: කමිටුව මගින් අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධාන විගණකවරයාගේ කාර්යසාධනය ඇගයුමට ලක් කෙරිණි.
VI. අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සිය විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වේ.	අනුගත විය: අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සිය විගණන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වන අතර විගණන කමිටුව වෙත සෘජුව වාර්තා කරයි.
ඒ) රැස්වීම් වාර්තා මගින් අභ්‍යන්තර පරීක්ෂණයන්හි ප්‍රධාන සොයාගැනීම් කමිටුව මගින් සැළකිල්ලට ගනු ලැබීද යන්න සහ ඒ සඳහා වන කළමනාකාරීත්වයේ ප්‍රතිචාර නිර්ණය කෙරේ.	අනුගත විය: අභ්‍යන්තර පරීක්ෂණයන්හි ප්‍රධාන සොයාගැනීම් විගණන කමිටුව මගින් සාකච්ඡාවට ගනු ලැබූ අතර අදාළ නිර්දේශ සිදුකෙරිණි.
ඔ) කමිටුව මගින් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් සමග අවම වශයෙන් රැස්වීම් දෙකක් පවත්වා ඇතිද යන්න.	අනුගත විය: කමිටුව මගින් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව අවම වශයෙන් රැස්වීම් දෙකක් පවත්වා ඇත
ඕ) පහත දැක්වෙන දෑ තහවුරු කරනු පිණිස කමිටුවේ යොමු නිර්දේශ පවත්වා ගෙන යන ලදී : (i) විමසුම් කොන්දේසි තුළ කවර හෝ කරුණක් පරීක්ෂා කිරීම් පැහැදිලි අධිකාරීත්වය (ii) එසේ කිරීමට අවශ්‍ය සම්පත් : (iii) තොරතුරු වෙත පූර්ණ පිවිසුම : සහ (iv) අවශ්‍ය නම්, බාහිර ව්‍යක්තීය සේවා හෝ අදාළ පළපුරුද්ද සහත පිටස්තරයින් වෙත ආරාධනා කිරීමේ අධිකාරීත්වය.	අනුගත විය: ''යොමු නිර්දේශ'' මගින් මෙකී සියළුම ක්ෂේත්‍රයන් ආවරනය කෙරේ.
ඖ) කමිටුව අවම වශයෙන් සිව් වරක් රැස්වී අදාළ වාර්තා පවත්වාගෙන ගොස් ඇත.	අනුගත විය: වසර 2019 දී කමිටු රැස්වීම් හතක් පවත්වා වාර්තා පවත්වාගෙන ගොස් ඇත.
ක) අධ්‍යක්ෂ මණ්ඩලය මගින් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන දෑ හෙළිදරවි කොට ඇත, (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර: (ii) වසර තුළ පවත්වන ලද කමිටු රැස්වීම් සංඛ්‍යාව : සහ (iii) එවැනි රැස්වීම් සඳහා එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වය පිළිබඳ විස්තර.	අනුගත විය: ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර, පවත්වන ලද කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ පැමිණීමේ විස්තර වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
	ග) කමිටුවේ ලේකම්වරයා වනුයේ සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකමෙහි ප්‍රධානියා වේ.	අනුගත විය: සමාගම් ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම්වරයා වේ.
	ච) ''තොරතුරු දැන ගැනීමේ'' ප්‍රතිපත්තිය මගින් පහත දැක්වෙන දෑ සම්බන්ධ ක්‍රියාවලීන් ආවරනය කෙරේ ; (i) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කරුණු සම්බන්ධ අක්‍රමිකතා (ii) (i) සම්බන්ධයෙන් කමිටුව මගින් අදාළ කරුණු සාධාරණව හා ස්වාධීනව පරීක්ෂා කිරීම සඳහා නිසි විධිවිධාන යොදවා ඇති බවට සහ (iii) අදාළ පසුවිපරම් ක්‍රියාමාර්ග තහවුරු කෙරේ.	අනුගත විය: අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ''විස්ල් බ්ලෝවර්'' ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ.
3(6)(iii)	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන නීතිරීති අදාළ වේද?	
	අ) කමිටුව මගින් ''යොමු නිර්දේශ'' සහ රැස්වීම් වාර්තා සමාලෝචනය මගින් බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. සහ ප්‍රමුඛ කළමනාකාරණ වෘත්තිකයින්ට අදාළ පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ සෙසු මූල්‍යමය ගෙවීම්) නිර්ණය කිරීම සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවනු ලැබ ඇත.	අනුගත විය: අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගින් පාලනය වේ. කමිටුව මගින් ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයන්ට අදාළ පාරිශ්‍රමික, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම් නිර්ණය කිරීම සඳහා පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් අනුමත කරනු ලැබ ඇත.
	ආ) අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. සහ ප්‍රමුඛ කළමනාකාරණ වෘත්තිකයින්ට අදාළ අරමුණු සහ ඉලක්ක ලේඛණගත කෙරේ.	අර්ධ වශයෙන් අනුගත විය: එක් එක් ප්‍රමුඛ කළමණාකරණ වෘත්තිකයා විසින් ලබාදෙන වාර්ෂික ක්‍රියාකාරී සැලසුමක් ඔස්සේ ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ට අදාළ අරමුණු සහ ඉලක්ක ලේඛණගත කෙරේ. කෙසේවුවද, අධ්‍යක්ෂවරුන් සහ ප්‍ර.වි.නි. ට සහ අදාළ අරමුණු සහ ඉලක්ක ලේඛණගත නොකෙරේ.
	ඇ) කමිටුව මගින් පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් වූ දීමනා සම්බන්ධ සෙසු ගෙවීම් සංශෝධනය කිරීම සඳහා සකසන ලද ඉලක්ක හා අරමුණු වලට සාපේක්ෂව ප්‍ර.වි.නි. හා ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ගේ කාර්යසාධනය සම්බන්ධ ඇගයීම් ආවර්තිතව සැළකිල්ලට ගැනේ.	අර්ධ වශයෙන් අනුගත විය : මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මගින් ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ගේ කාර්යසාධනය ඇගයුමට ලක් කෙරේ. කෙසේවුවද, ඇතැම් ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ගේ කාර්යසාධනය ඇගයුමට ලක් නොකෙරිණි. ස්වාධීන ක්‍රියාකාරකම් වල නිරතව සිටින ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ ප්‍රධාන තොරතුරු නිලධාරීවරයාගේ කාර්යසාධන ඇගයුම අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු මගින් සිදු කෙරේ.
	ඈ) රැස්වීම් වාර්තා සමාලෝචනය මගින් ප්‍ර.වි.නි. හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හිදී, කමිටු රැස්වීම් සඳහා ප්‍ර.වි.නි. සහභාගී නොවිය යුතු බවට ''යොමු නිර්දේශ'' මගින් දැක්වේ.	අනුගත විය : මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි ''යොමු නිර්දේශ'' මගින් ප්‍ර.වි.නි. හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හිදී, කමිටු රැස්වීම් සඳහා ප්‍ර.වි.නි. සහභාගී නොවිය යුතු බවට දැක්වේ.

3(6)(iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන නීතිරීති අදාළ වේද?	
	අ) කමිටුව මගින් නව අධ්‍යක්ෂවරුවන්, ප්‍ර.වි.නි. හා ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් තෝරාගැනීම/පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාවට නැංවේ.	අනුගත විය: භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍ර.වි.නි. පත් කෙරේ. කමිටුව මගින් ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් තෝරාගැනීම/පත්කිරීම සඳහා වන ක්‍රියාපටිපාටිය සකසනු ලැබේ.
	ආ) කමිටුව මගින් වර්තමාන අධ්‍යක්ෂවරුන් නැවත පත්කිරීම පිළිබඳ සැළකිල්ලට ගෙන නිර්දේශ කොට (හෝ නිර්දේශ නොකොට) ඇත.	අදාළ නොවේ: භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සිදුකෙරේ.
	ඇ) කමිටුව මගින් සේවා කාර්යභාර විස්තර සමලෝචනය කරමින්, ප්‍ර.වි.නි. සහ ප්‍රමුඛ කාර්යසාධන වෘත්තිකයින් වශයෙන් පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සුදුසුකම්ථ පළපුරුද්ද සහ ප්‍රධාන විශේෂාංග ආදී ක්‍රියාපටිපාටියක් සකසනු ලැබ ඇත.	අනුගත විය: ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන ධූරයන් සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මගින් නිර්ණය කෙරේ. ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ගේ සුදුසුකම් ලැබීමේ/තෝරාගැනීමේ ක්‍රියාපටිපාටිය නාමයෝජනා කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිර්ණය කෙරේ.
	ඈ) කමිටුව මගින් අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. හා ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් වෙතින් ව්‍යවස්ථාවේ දක්වා ඇති නියෝග 3(3) හි ක්‍රියාපටිපාටියෙහි විශේෂිතව සඳහන් කොට ඇති පරිදි අදාළ ධූරයන් දැරීම සඳහා යෝගය හා නිසි අයවළුන් වන බවට ප්‍රකාශයන් ලබා ගෙන ඇත.	අනුගත විය: අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි. හා ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින්ගේ යෝග්‍යතාවය සහ අදාළත්වය පිළිබඳ ප්‍රකාශයන් බැංකු අධීක්ෂණ අංශය මගින් ලබාගෙන අනුමත කරන ලද අතර එය බැංකුව මගින් ධූරයන්/සුදුසුකම් වෙනස්වීම වශයෙන් යාවත්කාලීන කෙරේ.
	ඉ) කමිටුව මගින්, විශ්‍රාම ලබන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රමුඛ කළමනාකාරීත්ව වෘත්තිකයින් සඳහා නිල අනුප්‍රාප්තික සැලසුමක් සැළකිල්ලට ගනු ලැබ ඇත.	අර්ධ වශයෙන් අනුගත විය: භාණ්ඩාගාර ලේකම්වරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන්ගේ අනුප්‍රාප්තික විධිවිධාන යොදනු ලැබේ. ප්‍රමුඛ කළමනාකාරීත්ව වෘත්තිකයින් සඳහා අනුප්‍රාප්තික ප්‍රතිපත්තියක් පවතී. කෙසේවුවද, අනුප්‍රාප්තික සැලසුම යාවත්කාලීන කොට නොමැත.
	ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් කමිටු සභාපතිත්වය දැරිය හැකි අතර කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකගෙන් සමන්විත වීම වඩාත් යෝග්‍ය වේ. ප්‍ර.වි.නි. ආරාධනා මත රැස්වීම් වලට සහභාගී වේ.	අනුගත විය: ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් කමිටු රැස්වීමේ සභාපතිත්වය දරන ලදී. විමසුම් කොන්දේසි අනුව ප්‍ර.වි.නි. හට ආරාධනා මත රැස්වීම් වලට සහභාගී විය හැක. කෙසේවුවද ප්‍ර.වි.නි. සියළුම රැස්වීම් වලට සහභාගී වී ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(6)(v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන නීතිරීති අදාළ වේද?	
	අ) කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍ර.වි.නි. සහ ණය, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික වැනි පුළුල් අවදානම් කාණ්ඩයන් අධීක්ෂණය කරනු ලබන ප්‍රමුඛ කළමනාකරණ ව්‍යුහිකයින්ගෙන් සමන්විත විය යුතු වන අතර, කමිටුව වෙත පවරන ලද අධිකාරීත්ව හා වගකීම් ආකෘතිය තුළ කටයුතු කළ යුතු වේ.	අනුගත විය: කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍ර.වි.නි. සහ ප්‍රධාන අවදානම් නිලධාරිවරයාගෙන් සමන්විත විය. වසර 2019 දී අනුකූලතා නිලධාරිවරයා ආරාධනා මත රැස්වීම් වලට සහභාගී විය.
	ආ) ණය, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික වැනි බැංකුවේ සියළුම අවදානම් කාණ්ඩයන් තක්සේරු කිරීම සඳහා ක්‍රියාවලියක් කමිටුව සතු වන අතර එහිදී යෝග්‍ය වූ අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු යොදා ගැනේ. පරිපාලිත සමාගම් හා හවුල්කාර සමාගම් සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණය, බැංකු පදනමින් හා සමූහ පදනමින් යන දෙයාකාරයෙන්ම සිදු කෙරේ.	අනුගත විය: කමිටුව මගින් අවදානම් තක්සේරු කොට ප්‍රධාන අවදානම් නිලධාරිවරයා විසින් බැංකුවේ ප්‍රමුඛ අවදානම් දර්ශක පිළිබඳ වාර්තාවක් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාර දෙනු ලැබේ. කමිටුවෙහි නිර්දේශයන්ද විමර්ශනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ. කෙසේවුවද, බැංකුවේ අවදානම් ස්වභාවය පිළිබිඹු වන අයුරින් ඇතැම් අවදානම් තක්සේරුකරණය වැඩිදියුණු කළ යුතු වේ.
	ඇ) කමිටුව මගින් ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටුව වැනි සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු සඳහා වන විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් විමර්ශනය කොට, ආවර්තිතව අවදානම් දර්ශකයන් වාර්තා කරනු ලැබේ.	අනුගත විය: අවදානම් කළමනාකරණ කමිටුවේ මෙහෙයුම් වල ඵලදායිතාවය සහ ප්‍රමාණවත්භාවය තහවුරු කිරීම පිණිස එමගින් කළමනාකරණ මට්ටමේ කමිටු රැස්වීම් වාර්තා සමාලෝචනය කෙරිණි.
	ඈ) කමිටුව මගින් විශේෂිතව දක්වන ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් ඉක්මවන ලද සියළුම අවදානම් දර්ශකයන් විමර්ශනය කොට සැළකිල්ලට භාජනය කරන ලදී.	අනුගත විය: ප්‍රධාන අවදානම් දර්ශකයන් කමිටුව මගින් විමර්ශනය කෙරිණි.
	ඉ) කමිටුව අවම වශයෙන් කොපමණ වරක් කාර්තුමය වශයෙන් රැස්වී ඇතිද?	අනුගත විය: වසර 2019 දී කමිටුව 04 වරක් රැස්ව ඇත.
	ඊ) විශේෂිත අවදානම් හඳුනාගැනීමට අපොහොසත් වූ නිලධාරීන් සම්බන්ධයෙන් කමිටුව නිල ලේඛණගත විනය ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.	අනුගත විය: නිල විනය සංග්‍රහය ක්‍රියාත්මකව පවතී. කමිටුව මගින් කමිටු පත්‍රිකා ඔස්සේ අවදානම ආශ්‍රිත කරුණු සම්බන්ධ තීරණ ගන්නා ලදී, කෙසේවුවද, වසර 2019 සඳහා කිසිදු සිදුවීමක් හඳුනාගනු ලැබ නැත.
	උ) කමිටුව මගින් එක් එක් රැස්වීමෙන් සතියක කාලයක් ඇතුළත අවදානම් .තක්සේරුකරණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙමින් අදහස්, එකඟත්වය සහ/හෝ විශේෂිත නියෝග අපේක්ෂා කෙරේ.	අනුගත විය: ප්‍රධාන අවදානම් නිලධාරිවරයා විසින් මාසිකව බැංකුවේ ප්‍රමුඛ අවදානම් දර්ශක පිළිබඳ වාර්තාවක් සකසා ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත භාර දෙනු ලැබේ. තවද, අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.
	ඌ) කමිටුව මගින්, නීතිරීති, කොන්දේසි, නියාමන උපදෙස්, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමග බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා අනුකූලතා ක්‍රියාමාර්ගයක් ස්ථාපනය කරනු ලැබ ඇති අතර, එය ක්‍රියාත්මක කොට ආවර්තිතව කමිටුව වෙත වාර්තා කිරීම සඳහා ප්‍රමුඛ කළමනාකරණ ව්‍යුහිකයින් අතුරින් අයෙකු විශේෂිත අනුකූලතා නිලධාරිවරයකු වශයෙන් කටයුතු කරයි.	අනුගත විය: බැංකුවේ අනුකූලතා ක්‍රියාවලිය අනුකූලතා නිලධාරිවරයාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරෙන අතර, ඔහු විසින් ආවර්තිතව කමිටුව වෙත අනුකූලතා අවදානම් තක්සේරුකරණ වාර්තාවක් භාරදෙනු ලැබේ.

3(7)	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු	
3(7)(i)	යම් පුද්ගලයින් සමග විශේෂයෙන් මෙම නියෝගයේ අරමුණු සඳහා ''සම්බන්ධිත පාර්ශව'' ලෙස සළකනු ලබන පහත සඳහන් පුද්ගල වර්ගීකරණ සමග බැංකුවේ යම් ගනුදෙනු වලින් ඇති විය හැකි යම් බැඳියා පිළිගැටුම් වලින් අධ්‍යක්ෂ මණ්ඩලය වැළැක්වීමට ස්ථාපිත ලේඛණගත ක්‍රියාවලියක් පවතී: (අ) බැංකුවේ පරිපාලිත සමාගමක (ආ) බැංකුවේ යම් ආශ්‍රිත සමාගමක (ඇ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක්, (ඈ) බැංකුවේ යම් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, (ඉ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප ඥාතියෙක් (ඊ) බැංකුවේ සැළකිය යුතු හිමිකමක් සහිත කොටස්හිමියෙක් (උ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක් හෝ යම් අධ්‍යක්ෂවරයකුගේ සමීප ඥාතියෙක් බැංකුවේ සැළකිය යුතු කොටස් හිමිකමක් සහිත කොටස්හිමියෙක් අදහස් වන පුද්ගලයෙක්	අර්ථ වශයෙන් අනුගත විය: සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් පවතී. කෙසේවෙතත්, එය නිවැරදිව සමාලෝචනය කර නොමැත. සම්බන්ධිත පාර්ශවයන්ට අයත් වන ගනුදෙනු ප්‍රකාශන මත පදනම්ව ජාතික හැඳුනුම්පත් අංකය භාවිතයෙන් ග්‍රහනය කරගත හැක.
3(7)(ii)	මෙම නියෝගයෙන් ආවරනය වන ''සම්බන්ධිත පාර්ශව'' සමග ගනුදෙනු ලෙස හඳුනාගත හැකි පහත සඳහන් ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමට ක්‍රියාවලියක් පවතී. (අ) පහසුකමෙහි උපරිම ප්‍රමාණය මත මුදල් මණ්ඩලයේ නියෝග යෙහි දක්වා ඇති පහසුකම් වර්ගයක් ප්‍රදානය කිරීම. (ආ) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන වලින් බැංකුවේ යම් වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ යම් සේවාවක් බැංකුව වෙත ලබාදීම හෝ බැංකුවෙන් ලබාගැනීම. (ඈ) සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි හිමිකාර, රහසිගත හෝ සංවේදී තොරතුරු හුවමාරු කරගැනීමට හේතු විය හැකි බැංකුව සහ යම් සම්බන්ධිත පාර්ශව අතර වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ නිර්මාණය සහ පවත්වාගෙන යාම.	අර්ථ වශයෙන් අනුගත විය: සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. කෙසේවුවද, ඉහත ප්‍රතිපත්තියෙන් ආවරනය කරනු ලබන්නේ (අ) පමණි. සම්බන්ධිත පාර්ශවයන්ට අයත් වන ගනුදෙනු ප්‍රකාශන මත පදනම්ව හඳුනාගත හැක.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනුකූලතා මට්ටම

3(7)(iii)	බැංකුව ඉහත 3 (7) (i) මෙ නියෝගය තුළ විස්තර කරන පරිදි සම්බන්ධිත පාර්ශවයන් සමග එම ව්‍යාපාරය කරගෙන යනු ලබන බැංකුවේ අනෙකුත් පුද්ගලයන්ට සළකන ආකාරයට වඩා ඔවුන්ට ''වඩාත් හිතකර සැළකීමක්'' ලබාදෙන ආකාරයෙන් ගනුදෙනු වල යෙදී නොමැති බව අධ්‍යක්ෂ මණ්ඩලයට තහවුරු කිරීමට ක්‍රියාවලියක් පැවතීම. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතය ඉක්මවන පරිදි සම්බන්ධිත පාර්ශවයන් වෙත ''මුළු ශුද්ධ පහසුකම්'' ප්‍රදානය කිරීම''. මෙම උප නියෝගයේ අරමුණ සඳහා: I. ''පහසුකම'' යන්නෙන් උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ 2007 අංක 07 දරණ බැංකු පනත් නියෝගයේ දක්වා ඇති පහසුකම අදහස් වේ. II. ''මුළු ශුද්ධ පහසුකම ගණනය කරනු ලබන්නේ මුළු පහසුකමෙන්, මුදල් ඇප සහ එවැනි සම්බන්ධිත පාර්ශවයන් විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ සිදුකරන ලද ආයෝජන සහ III. වසර පහ හෝ එයට වැඩි කල්පිරීමක් සහිත ණය උපකරණ අඩු කිරීමෙනි. (ආ) බැංකුවේ ප්‍රශස්ත ණයදීමේ අනුපායතයට වඩා අඩු පොළී අනුපාතයක් අයකිරීම හෝ අසම්බන්ධිත සැසඳිය හැකි ඇපයක් සහිත සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා ගෙවීම: (ඇ) හිතකර කොන්දේසි වැනි වරණීය සැළකිලි ලබාදීම, අසම්බන්ධිත පාර්ශවයන් සමග සිදුකරන සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ ලබාදෙන නියමයන්ට වඩා වෙළඳ අලාභ ආවරනය සහ/හෝ ගාස්තු/කොමිස් කපාදැමීම: (ඈ) ඇගයීම් ක්‍රියාපටිපාටියක් නොමැතිව සම්බන්ධිත පාර්ශවයක් වෙත සේවා ලබාදීම හෝ සේවයක් ලබාගැනීම: (ඉ) නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍යතාව හැර සම්බන්ධිත පාර්ශවයන් සමග හිමිකාර, රහසිගත සහ සංවේදී තොරතුරු හුවමාරු කරගැනීමට හේතු විය හැකි වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	අර්ධ වශයෙන් අනුගත විය: අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥාතීන්ට සහ හිතවතුනට ලබාදෙන ලද පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සකස් වී ඇති අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් දෙකට නොඅඩු ගණනක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ලැබේ. කෙසේවුවද, ප්‍රධාන කාර්ය මණ්ඩලය වෙත ලබාදෙන ලද වඩාත් හිතකර සැළකීමක් හඳුනාගැනීම සඳහා ක්‍රියාවලියක් නොමැත. (ඇත්නම්)
3(7)(iv)	බැංකුවට එහි අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත පහසුකම් ලබාදීම සඳහා ක්‍රියාවලියක් පවතින අතර එකී පහසුකම සඳහා පක්ෂව ඡන්දය දීම වළකමින් අදාළ අධ්‍යක්ෂවරයා හැර අධ්‍යක්ෂවරුන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ලබන බව සහ මෙම පහසුකම මුදල් මණ්ඩලය මගින් වරින් වර තීරණය කරනු ලබන ඇපයකින් ආරක්ෂා කරනු ලබන බව.	අර්ධ වශයෙන් අනුගත විය: අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් වසර තුළ එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත. කෙසේවුවද, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ පහසුකම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරනු නොලබන අතර සාමාන්‍ය ණය මුදල් අනුමත කිරීමේ ක්‍රියාවලිය ආදේශ කරගනු ලැබේ.

3(7)(v)	අ) බැංකුව විසින් යම් පුද්ගලයකුට, යම් පුද්ගලයකුගේ සමීප ඥාතියකුට හෝ යම් සැළකිය යුතු හිමිකමක් සහිත පුද්ගලයකුට යම් පහසුකමක් ලබා දී ඇති අවස්ථාවක සහ එම පුද්ගලයා පසුකාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත්වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයකු ලෙස එම පුද්ගලයාගේ පත්වීමේ දිනයේ සිට එක් වසරක් තුළ මුදල් මණ්ඩලය විසින් එම අරමුණ සඳහා අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය ඇප ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනීම සඳහා බැංකුව සතුව ක්‍රියාවලියක් පවතී.	අනුගත විය: සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ.
	ආ) ඉහත 3 (7) (v) (අ) නියෝගය තුළ දක්වා ඇති කාලසීමාව තුළ එකී ඇප ලබා දී නොමැති අවස්ථාවක, පහසුකම ලබාදෙන ලද අවස්ථාවේ නියම කල කාලසීමාව හෝ එකී අධ්‍යක්ෂවරයා පත්කිරීමේ දිනයේ සිට මාස දහ අටක කාලසීමාව යන දෙකෙන් කලින් එළඹෙන කාලසීමාව තුළ පොලිය සමග එම පහසුකම හේතුවෙන් ඇති වූ හිඟ මුදල අයකර ගැනීමට බැංකුව පියවර ගෙන ඇති බව.	එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත. කෙසේවුවද, ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය නොකෙරේ.
	ඇ) ඉහත උප නියෝග වලට අනුකූල වීමට අසමත් වන අධ්‍යක්ෂවරුන් හඳුනාගැනීමට සහ අධ්‍යක්ෂ තනතුරින් ඉවත්ව ඇති ලෙස සැළකීමට බැංකුව සතුව ක්‍රියාවලියක් පැවතීම සහ එවැනි කරුණු බැංකුව විසින් මහජනතාවට අනාවරනය කර තිබේද යන බව.	එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත. කෙසේවුවද, ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය නොකෙරේ.
	ඈ) පහසුකම ලබාදෙන අවස්ථාවේදී බැංකුවේ සේවකයකු වූ යම් අධ්‍යක්ෂවරයකුට ඉහත 3 (7) (v) (ඇ) ඡේදය යොදානොගන්නා බවට සහතික කිරීමට ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අතර එකී පහසුකම එම බැංකුවේ සියළුම සේවකයින්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ ලබාදෙන ලදී.	එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත. කෙසේවුවද, ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය නොකෙරේ.
3(7)(vi)	බැංකුව විසින් එම බැංකුවේ සේවකයින්ට අදාළ යෝජනා ක්‍රමයක් පදනම මත නොවන සැළකිය යුතු බැඳියාවක් සහිත යම් සේවකයකුට හෝ එම සේවකයාගේ සමීප ඥාතියකුට හෝ හිතවතකුට ගාස්තු සහ/හෝ කොමිස් පිළිබඳ අත්හැරීමකට අදාළව යම් පහසුකමක් හෝ 'වඩා හිතකර සැළකීමක්' ලබාදෙන අවස්ථා හෝ ඉහත 3 (7) (v) නියෝගය පරිදි ලබාදෙන පහසුකම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කල හැකි ඇපයකින් සුරක්ෂිත කරන අවස්ථාව හඳුනාගැනීමට ක්‍රියාවලියක ක්‍රියාත්මකව ඇත.	අනුගත විය: අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥාතීන්ට සහ හිතවතුනට ලබාදෙන ලද පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සකස් වී ඇති අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් දෙකට නොඅඩු ගණනක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ලැබේ.
3(7)(vii)	ඉහත 3 (7) (v) සහ 3 (7) (vi) නියෝග යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද යම් පහසුකමක් සඳහා මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමට ක්‍රියාවලියක පවතින අතර එවැනි පහසුකමක්, යම් කොටසක් හෝ ඒ සම්බන්ධ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිය ප්‍රේශනය කල නොහැකි වන අතර එකී අනුමැතිය නොමැතිව යම් අවලංගු කිරීමක් බලාත්මක නොවේ.	අනුගත විය: සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ. කාලසීමාව තුළ එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත.

ආයතනික පාලනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

		අනුකූලතා මට්ටම
3(8)	**අනාවරණය කිරීම්**	
3(8)(i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන කරුණු අනාවරණය කරන ලදී: (අ) වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශයන්, අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් පූර්ව නිර්දේශිත ආකෘතීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, එකී ප්‍රකාශයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල සංක්ෂිප්ත ආකාරයකින් ප්‍රකාශයට පත් කරන ලදී. (ආ) කාර්තුමය මූල්‍ය ප්‍රකාශයන්, පිළියෙල කොට, එකී ප්‍රකාශයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල සංක්ෂිප්ත ආකාරයකින් ප්‍රකාශයට පත් කරන ලදී.	අනුගත විය: වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශයන්, අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් පූර්ව නිර්දේශිත ආකෘතීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබ ඇත. එකී ප්‍රකාශයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල සංක්ෂිප්ත ආකාරයකින් ප්‍රකාශයට පත් කරන ලදී.
3(8)(ii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පහත දැක්වෙන අවම අනාවරණය කිරීම් සිදුකොට ඇති දැයි පරීක්ෂා කිරීම.	
	අ) විශේෂිත හෙළදරව් කිරීම්ද ඇතුළත්ව, වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශයන්, අධීක්ෂණ හා නියාමන අධිකාරීන් විසින් පූර්ව නිර්දේශිත ආකෘතීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබ ඇති බවට වන ප්‍රකාශය.	අනුගත විය: මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් මගින්, මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව සහ 1988 අංක 30 දරණ බැංකුකරණ පනතෙහි අවශ්‍යතාවයට අනුකූලව පිළියෙල කොට ඇති බවට හෙළදරව් කෙරේ.
	ආ) බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව මගින්, මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයභාවය පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාදිය හැකි අයුරින් සකසනු ලැබ ඇති බවට සහ බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශයන් සැකසීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව සිදු කොට ඇති බවට සහතික කෙරේ.	අනුගත විය: මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ වාර්තාව ''අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය'' යටතේ දක්වේ.
	ඇ) ඉහත නියෝග 3(8)(ii)(ආ) මගින් යටෝක්ත, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ බලාත්මකභාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ වාර්තාව ලබාගෙන ඇත.	අනුගත විය: බැංකුව මගින් මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ බලාත්මකභාවය පිළිබඳ සහතිකය විගණකාධිපතිවරයාගෙන් ලබාගෙන ඇත.
	ඈ) නම්, සුදුසුකම්, වයස, යෝග්‍යතාවය හා නිරවද්‍යභාවය සම්බන්ධ අවශ්‍යතා, සපුරාලනු ලබන පළපුරුද්ද, බැංකුව සමග ගනුදෙනු සහ බැංකුව මගින් ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර.	අනුගත විය: අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, සුදුසුකම්, වයස, පළපුරුද්ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ දක්වා ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙවන ලද මුළු ගාස්තු/පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් යටතේ හෙළිදරව් කොට ඇත

ඉ) 3(7)(iii) හි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි එක් එක් සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත මුළු ශුද්ධ අනුග්‍රහයක් පිරිනමනු ලැබ ඇත. එක් එක් සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද ශුද්ධ අනුග්‍රහය බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් වශයෙන්ද අනාවරනය කළ හැක.	අනුගත විය:
ඊ) බැංකුව මගින් සිය ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් වෙත ගෙවන ලද පාරිශ්‍රමික වල සමුච්චිත වටිනාකම් සහ සිය ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් සමග බැංකුවේ ගනුදෙනු වල සමුච්චිත වටිනාකම්, ගෙවන ලද පාරිශ්‍රමික, පිරිනමන ලද අනුග්‍රහය සහ බැංකුවේ සිදුකරන ලද තැන්පතු හෝ ආයෝජන වැනි පුළුල් කාණ්ඩයන් යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇත.	අනුගත විය: බැංකුව මගින් සිය ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් වෙත ගෙවන ලද පාරිශ්‍රමික වල සමුච්චිත වටිනාකම් සහ සිය ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් සමග බැංකුවේ ගනුදෙනු වල සමුච්චිත වටිනාකම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් යටතේ ඉදිරිපත් කරනු ලැබ ඇත.
උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාංගමික පාලන නියෝග කෙරෙහි අනුකූලතාවය සම්බන්ධ බාහිර විගණකවරයාගේ වාර්තාව ලබාගෙන ඇත.	අනුගත විය: සාංගමික පාලන නියෝග කෙරෙහි අනුකූලතාවය සම්බන්ධ බාහිර විගණකවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.
ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, නීති හා අභ්‍යන්තර පාලනයන් කෙරෙහි අනුකූලතාවය සහ කවර හෝ ප්‍රමාණාත්මක අනුකූලතාවයක් යථා තත්ත්වයට පත් කිරීම උදෙසා ගනු ලැබූ පියවර පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක්.	අනුගත විය: විචක්ෂණශීලී අවශ්‍යතා, නීති හා අභ්‍යන්තර පාලනයන් කෙරෙහි අනුකූලතාවය පිළිබඳ විස්තර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි ඇතුළත් වේ.
එ) බැංකුවේ අවදානම් කළමනාකරණයෙහි දුර්වලතා පිළිබඳ නියාමනය සහ අධීක්ෂණමය ගැටළු සහගත තත්ත්වයන් හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දෙන ලද මෙකී නියෝග කෙරෙහි අනනුකූලතාවයන්, එසේ වී නම් මහජනතාව වෙත හෙළිදරව් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් සිදුකරන ලද නියෝග, ඇතුළුව අදාළ ගැටළු මගහරවා ගැනීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ පියවර ආශ්‍රිත ප්‍රකාශයක්.	අදාළ නොවේ: මහජනතාව වෙත අනාවරණය කිරීම සඳහා එබඳු නියෝගයක් මුදල් මණ්ඩලය විසින් නිකුත් නොකරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සංයුතිය සහ 2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම්වලට අධ්‍යක්ෂවරු/කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ විධායක/ විධායක නොවන/ස්වාධීන තත්ත්වය	අධ්‍යක්ෂ මණ්ඩලය		අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්ති සම්මාදන කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව		
	* E	* A	* S	E	* A	* S	E	* A	* S	E	* A	* S	E	* A	* S	E	* A	* S	E	* A
1. ජේ ටී එස් පී කාරියවසම් මහතා (සභාපති)	16	16							C	10	10	C	07	07	C	04	04			
2. *ටී ඒ ආරියපාල මහතා (සාමාන්‍යාධිකාරී)	03	03								02	02									01	01
3. ** ටී කුහන් මහතා (සාමාන්‍යාධිකාරී)	13	13					04	04		08	08		07	07		04	04			02	02
4. *** ඒ ආර් දේශප්‍රිය මහතා (අධ්‍යක්ෂ)	03	02																			
5. **** ඒ කේ සෙනෙවිරත්න මහතා (අධ්‍යක්ෂ)	13	13	C	07	07																
6. කේ බී විජයරත්න මහතා (අධ්‍යක්ෂ)	16	15	M	07	07	C	04	04	M	03	03	M	07	06	M	02	02				
7. ***** කේ බී රාජපක්ෂ මහතා (අධ්‍යක්ෂ)	09	09				C	03	03				M	04	04				C	02	02	
8. ****** එම් ඒ බී සිල්වා මහතා (අධ්‍යක්ෂ)	04	04										M	01	01							
9. එම් ජේ පී සල්ගාදු මහතා (අධ්‍යක්ෂ)	16	12				M	04	04	M	04	04				M	03	03	M	03	03	
10. ******* නීල් ද අල්විස් මහතා (අධ්‍යක්ෂ)	06	06	M	01	01	M	01	01	M	06	06				M	01	01	M	01	01	
11. ******** කේ. අමරසිංහ මහතා (විධායක අධ්‍යක්ෂ)	06	06				M	01	01	M	06	06	M	03	02							
12. ********* ජේ ආර් ෆර්නැන්ඩස් මහතා (අධ්‍යක්ෂ)	09	09																C	02	02	
13. ********** වයි එම් ඩී වර්ණසූරිය මිය (අධ්‍යක්ෂිකා)	09	08	M	05	05				M	04	04				M	03	02				
14. ********** එස් ජේ සී පෙරේරා මහතා (අධ්‍යක්ෂ)	06	05	M	03	01	M	01	01				M	03	02				M	01	01	

*S – අදාළ කමිටු වල අධ්‍යක්ෂවරයාගේ තත්ත්වය
C – කමිටු සභාපති M – කමිටු සාමාජික
*E – සහභාගීවීමේ යෝග්‍යතාවය *A – පැමිණීම BI – ආරාධිත

* 30.01.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය.
** 01.02.2019 සිට බලපැවැත්වෙන පරිදි වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. සහ 01.11.2019 සිට බලපැවැත්වෙන පරිදි සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.
*** 31.01.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය.
**** 21.02.2019 දින පත් කරන ලදී.
***** 01.07.2019 සිට බලපැවැත්වෙන ධූර කාලය අවසන් විය.
****** 25.07.2019 දින පත් කරන ලද අතර 18.09.2019 දින නිල වශයෙන් යෝග්‍යතාවය හිමිවිය.
******* 01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය.
******** 01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය.
********* 21.02.2019 දින පත් කරන ලද අතර 15.05.2019 දින නිල වශයෙන් යෝග්‍යතාවය හිමිවිය.
********** 12.03.2019 දින පත් කරන ලද අතර 15.05.2019 දින නිල වශයෙන් යෝග්‍යතාවය හිමිවිය.
********** 04.06.2019 දින පත් කරන ලද අතර 24.07.2019 දින නිල වශයෙන් යෝග්‍යතාවය හිමිවිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පොදු කරුණු

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරුන් විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ බැංකුවේ දස වන වසර සඳහා වන බැංකුවේ කටයුතු වල තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ද සමගින් ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. මෙම වාර්තාව 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතෙහි - 1988 අංක 30 දරණ බැංකු පනතෙහි සහ සාංගමික පාලනයට අදාළ නිර්දේශයන්හි අවශ්‍යතාවයන්ට අනුකූල වේ. බැංකුව මුලින්ම ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතකින් යුතුව 1997 වර්ෂයේ දී ස්ථාපන කරන ලද අතර ඉන් අනතුරුව රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු වශයන් ශාඛා හයකට ඒකාබද්ධ කෙරිණි. මෙම පළාත් සංවර්ධන බැංකු හය 2010 මැයි මාසයේදී ජාතික සංවර්ධන බැංකුවක් වශයෙන් තවදුරටත් ඒකාබද්ධ කරන ලද අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වශයෙන් නම් කෙරිණි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපනය කෙරිණි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ග්‍රාමීය ජනතාව වෙත පහසු හා දරා ගත හැකි ආකාරයේ මූල්‍යමය පහසුකම් සළසමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන අතරතුර ඒ ඔස්සේ ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් යුතුව ස්ථාපනය කරන ලද පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ජාතික මට්ටමේ සංවර්ධන බැංකුවකි.

මූලික ක්‍රියාකාරකම්

බැංකුවේ මූලික ක්‍රියාකාරකම් වනුයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳ, වාණිජ, පශු සම්පත්, ධීවර කටයුතු ආශ්‍රිත සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික ප්‍රගමනය සඳහා පහසුකම් සැලසීම හා ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත මූල්‍යමය සහාය පිරිනමමින් ශ්‍රී ලාංකික ප්‍රජාව සවිබල ගන්වීමයි.

දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය

බැංකුවේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 3 හි දක්වනු ලැබ ඇත. බැංකුව මගින් එකී දැක්ම හා මෙහෙවර ප්‍රකාශයෙහි ඇතුළත් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කරන අතරම ස්වකීය ක්‍රියාකාරකම් වලදී ප්‍රශස්ත සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගෙන යනු ලබයි.

අඛණ්ඩ පැවැත්ම

පුරෝකථනය කළ හැකි අනාගත කාලයක් තුළ සිය මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ. එමනිසා අප විසින් මූල්‍යමය ප්‍රකාශයන් සැකසීමේදී තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කරගනු ලැබේ.

මූල්‍යමය ප්‍රකාශ

බැංකුවේ මූල්‍යමය ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් ඉදිරිපත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKASs) අනුකූලව සකසනු ලැබ ඇති අතර 1988 අංක 30 දරන බැංකුකරණ පනතට අනුකූල වේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බැංකුවේ මූල්‍යමය ප්‍රකාශයන් බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබනු ලැබ, පිටු 115 හි දක්වා ඉදිරිපත් කොට ඇති අතර එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ සාධනීය කොටසක් නිර්මාණය වේ.

මූල්‍යමය වාර්තාකරණයේදී අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ වූ දැක්මක් පිළිබිඹු කෙරෙන්නා වූ මූල්‍යමය ප්‍රකාශයන් සැකසීම කෙරෙහි අධ්‍යක්ෂවරුන් වගකීමෙන් බැඳේ. මෙම මූල්‍යමය ප්‍රකාශයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධනයන්ට අනුකූලව සකසනු ලැබ ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 103 හි දක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ප්‍රකාශය මගින් මූල්‍යමය ප්‍රකාශයන් ආශ්‍රිතව අධ්‍යක්ෂවරුනගේ වගකීම පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් දක්වෙන අතර එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ සාධනීය කොටසක් නිර්මාණය වේ.

විගණකවරයාගේ වාර්තාව

වසර 2019 දී විගණකාධිපතිවරයා විසින් බැංකුවේ විගණනය සිදු කරන ලද අතර අදාළ විගණනය වසර පුරාම සිදු කෙරිණි. ඔවුන්ගේ වාර්තාවේ හඳුනාගන්නා ලද ගැටළු කඩිනම් පියවර සඳහා කළමනාකාරීත්වය වෙත භාර දෙන ලදී. අවශ්‍ය දත්ත හා තොරතුරු ද සමග මූල්‍යමය වාර්තාකරණයේ මූල්‍යමය ප්‍රකාශයන්හි නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව ඒවා පරීක්ෂාව සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කෙරිණි. මූල්‍යමය ප්‍රකාශයන් සම්බන්ධව විගණකාධිපතිවරයාගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 108 හි දක්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගයන් කෙරෙහි වන අනුකූලතාවය තහවුරු කරගැනීම සඳහා, නියාමන අධීක්ෂණ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ කාලීන පරීක්ෂාවන්හි නිරත විය. එමගින් අදාළ මූල්‍යමය දර්ශකයන් අවශ්‍ය මට්ටමින් පවත්වා ගෙන යනු ලබන්නේද යන්න නිර්ණය කෙරෙන අර එහිදී පාර්ශ්වකරුවන්ගේ අභිමතයන් විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ අභිමතයන් සුරක්ෂිත කෙරන බවට තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේදී යොදාගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 122 සිට 134 දක්වා ඉදිරිපත් කොට ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

අදළ වසර තුළදී ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර මූල්‍යමය ප්‍රකාශයන්හි 12 සටහනෙහි දක්වේ.

අනාගත වර්ධනයන්

බැංකුවේ අනාගත වර්ධනයන් පිළිබඳ ඉදිරි දැක්මක් සභාපතිවරයාගේ පණිවුඩයෙහි (පිටු අංක 08 සිට 09), සාමාන්‍යාධිකාරීවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩයෙහි (පිටු අංක 10 සිට 12 දක්වා) සහ කළමනාකාර සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි (පිටු අංක 25 සිට 64 දක්වා) ඉදිරිපත් කොට ඇත.

ව්‍යාපාරික කාර්යසාධනය සමාලෝචනය

2019 මූල්‍ය වර්ෂයේදී බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සභාපතිවරයාගේ පණිවුඩයෙහි (පිටු අංක 08 සිට 09), සාමාන්‍යාධිකාරීවරයාගේ/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩයෙහි (පිටු අංක 10 සිට 12) සහ සහ කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණයෙහි (පිටු අංක 25 සිට 64 දක්වා) ඉදිරිපත් කොට ඇත. මෙම වාර්තාවන් වාර්ෂික වාර්තාවේ සාධනීය කොටසක් නිර්මාණය කරයි.

මූල්‍ය ප්‍රතිඵල

බැංකුවේ මූල්‍යමය සහ මෙහෙයුම් කාර්යසාධනය පිටු අංක 10 සිට 12 දක්වා සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනයෙන් සහ සහ පිටු අංක 5 සිට 7 දක්වා මූල්‍යමය විශේෂතා යටතේ දක්වා ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2019 12 31 දිනට සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල රු බිලියන 15 ක් විය වසර අවසන් වන විට කොටස් හිමිකරුවන් විසින් දායකත්වය දක්වන ලද ප්‍රකාශිත ප්‍රාග්ධනය බිලියන රු. 8.05 ක් වූ අතර ඔවුන්ගේ කොටස් හිමිකාරීත්ව ප්‍රතිශතයන් පහත දක්වේ.

		රු.	%
1.	මහා භාණ්ඩාගාරය	7,553,739,710	94
2.	ලංකා බැංකුව	164,484,480	2
3.	මහජන බැංකුව	164,484,480	2
4.	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	164,521,260	2
	එකතුව	8,047,229,930	100

ආදායම

වසර 2019 සඳහා බැංකුවේ දළ ආදායම රු. බිලියන 27.5 ක් විය. ආදායම පිළිබඳ විස්තර පිටු අංක 136 හි දක්වේ.

බදුකරණය

වසර 2019 දී බැංකුව රජය වෙත බදු හා ගාස්තු වශයෙන් ගෙවනු ලැබ ඇති මුදල රු. මිලියන 2,629 කි. මෙය රු. මිලියන 891 ක ආදායම් බදු රු. මිලියන 1,013 ක මූල්‍ය සේවා එකතු කළ අගය මත බදු රු. මිලියන 124 ක ජාතිය ගොඩනැගීමේ බදු සහ රු. මිලියන 601 ක ණය ආපසු ගෙවීමේ ගාස්තු වලින් සමන්විත විය. බැංකුවේ මෙහෙයුම් මත අදාළ වන ආදායම් බදු අනුපාතය 28% කි. බැරකම් ක්‍රමවේදය යටතේ හඳුනාගත් සියළුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත බදුකරණය සඳහා වෙන්කිරීම් සිදුකිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ.

දේපළ, පිරියත සහ උපකරණ

බැංකුව මගින් දේපළ, පිරියත සහ උපකරණ හා බදු දේපළ සහ අස්පෘශ වත්කම් අත්පත් කරගැනීම සඳහා වසර 2019 දී දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 232 ක් (2018 රු. මිලියන 414) වශයෙන් දක්වුනු අතර ඒ පිළිබඳ විස්තර පිටු අංක 150 සිට 158 දක්වා මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන් 24 සහ 25 හි දක්වා ඇත.

ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ගැලපීම් හෝ මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීම අවශ්‍ය වන අන්දමේ කිසිදු වැදගත් සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසුව සිදු වී නොමැත.

අසම්පූර්ණ නඩු කටයුතු

අධ්‍යක්ෂවරුන්ගේ සහ බැංකුවේ නීතිඥවරුන්ගේ මතය අනුව මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 38.2 හි අනාවරණය කොට ඇති බැංකුවට එරෙහිව පවතින අසම්පූර්ණ නඩු කටයුතු බැංකුවෙහි මූල්‍යමය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

ප්‍රාග්ධනය සහ සංචිත

රඳවාගත් ඉපැයුම් ද සමගින් බැංකුවේ ප්‍රාග්ධනය හා සංචිත පහත දැ වලින් සමන්විත වේ ;

	2019 (රු.)	2018 (රු.)
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**8,047,229,930**	8,047,229,930
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	**742,261,195**	717,331,468
විශේෂ සංචිත අරමුදල	**596,651,523**	571,721,796
පොදු සංචිත අරමුදල	**3,157,644,530**	3,057,925,624
රඳවාගත් ඉපැයුම්	**2,421,534,400**	2,315,905,812
එකතුව	**14,965,321,578**	14,710,114,630

ලාභාංශ

31.12.2018 දින මුදල් අමාත්‍යාංශය වෙත සිදුකරන ලද කොටස් නිකුතුව හැරුනු විට, 31.12.2018 දිනට නිකුත් කරන ලද කොටස් සඳහා 2019 සැප්තැම්බර් මස වසර 2018 ලාභය උපයෝගී කොට ගනිමින් කොටසකට රු. 0.50 බැගින් රු. 193,546,847 ක අවසන් ලාභාංශ ගෙවන ලදී. වසර 2019 සඳහා වන ආන්තික මෙහෙයුම් ප්‍රතිඵල හමුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ 13.05.2020 දිනැති 2020 අංක 3 දරණ නියෝගය අනුව අධ්‍යක්ෂවරුන් විසින් වසර 2019 සඳහා ලාභය උපයෝගී කර ගනිමින් ලාභාංශ බෙදාහැරීමක් අනුමත නොකරන ලදී.

පෙර පැවති ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමග හවුල්කාරිත්වය

2016 රජයේ අයවැය යෝජනාවට සමගාමීව 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙර පැවති ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඒකාබද්ධකරණයට එළැඹි අතර ඒ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 23 හි දක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිවරයාද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වේ. සභාපතිවරයා සහ සෙසු අධ්‍යක්ෂවරුන් භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව නියෝජනය කරන්නා වූ අධ්‍යක්ෂවරුන් සිව් දෙනෙකු කොටස් හිමිකරුවන් විසින් නම් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් පහත දක්වෙන අතර ඔවුන් පිළිබඳ සැකෙවින් හැඳින්වීමක් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 14 සිට 17 දක්වා ඉදිරිපත් කෙරේ.

මහින්ද සාලිය මහතා	- සභාපති
ඒ කේ සෙනෙවිරත්න මහතා	- ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ
කේ බී විජයරත්න මහතා	- ස්වාධීන නොවන/ විධායක නොවන අධ්‍යක්ෂ
එම් ජේ පී සල්ගාදු මහතා	- ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ (29.02.2020 දක්වා)
එම් ඒ බී සිල්වා මහතා	- ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ (04.03.2020 දක්වා)
එම් එස් ඩී රණසිරි මහතා	- ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
ඩබලිව් එම් කරුණාරත්න මහතා	- ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂ
මහාචාර්ය එච් එම් ඩබ්ලිව් ආරියරත්න හේරත්	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ
ආචාර්ය නිර්මාල් ද සිල්වා	- ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
ලලිත් අබේසිරිවර්ධන මහතා	- ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම්

ජේ ටී එස් පී කාරියවසම් මහතා	- සභාපති 31.12.2019 සිට ඉල්ලා අස්විය
ඒ ආර් දේශප්‍රිය මහතා	- ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ 31.01.2019 සිට ඉල්ලා අස්විය
කේ බී රාජපක්ෂ මහතා	- ස්වාධීන නොවන/විධායක නොවන අධ්‍යක්ෂ 01.07.2019 ධූර කාලය අවසන් විය
නීල් ද අල්විස් මහතා	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 01.04.2019 සිට ඉල්ලා අස්විය
කේ අමරසිංහ මහතා	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 01.04.2019 සිට ඉල්ලා අස්විය
ජේ ආර් ෆර්නැන්ඩස් මහතා	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 02.12.2019 සිට ඉල්ලා අස්විය
එස් ජේ සී පෙරේරා මහතා	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 15.12.2019 සිට ඉල්ලා අස්විය
වයි එම් ඩී වර්ණසූරිය මිය	- ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ 02.12.2019 සිට ඉල්ලා අස්විය

අධ්‍යක්ෂවරුන්ගේ නව පත් කිරීම්

අධ්‍යක්ෂ	පත් කරන ලද දිනය
මහින්ද සාලිය මහතා	27.12.2019 සහ 01.01.2020 වැඩ භාර ගන්නා ලදී
ඒ කේ සෙනෙවිරත්න මහතා	21.02.2019
එම් ඒ බී සිල්වා මහතා	25.07.2019
ජේ ආර් ෆර්නැන්ඩස් මහතා	21.02.2019
එස් ජේ සී පෙරේරා මහතා	04.06.2019
වයි එම් ඩී වර්ණසූරිය මිය	12.03.2019

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ත වගකීම සහ වගවීම උසුලනු ලබන අතර ආයතනික පාලන ප්‍රමිතීන්, ශ්‍රී ලංකා මහ බැංකු සම්මතයන් සහ සෙසු ව්‍යවස්ථාපිත අනුකූලතාවන් වෙත අනුගත වීම තහවුරු කරනු පිණිස පහත දක්වෙන අනු කමිටු ස්ථාපනය කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවල සංයුතීන් පහත පරිදි වේ.

විගණන කමිටුව

1. ඒ කේ සෙනෙවිරත්න මහතා (කමිටු සභාපති)
2. කේ බී විජයරත්න මහතා (01.08.2018 වෙනි දින පත් කරන ලදී)
3. නීල් ද අල්විස් මහතා
   (2019 අප්‍රියෙල් 01 වැනි දින ඉල්ලා අස්විය)
4. වයි එම් ඩී වර්ණසූරිය මිය
   (2019 මැයි 30 වැනි දින පත් කරන ලදී)
5. එස් ජේ සී පෙරේරා මහතා
   (2019 සැප්තැම්බර් 06 වැනි දින පත් කරන ලදී)
6. ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීවරයකු

විගණන කමිටු වාර්තාව පිටු අංක 95 හි දක්වා ඇති අතර එමගින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසක් නිර්මාණය වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

1. කේ බී රාජපක්ෂ මහතා
   (කමිටු සභාපති - 01.07.2019 ධූර කාලය අවසන් විය)
2. කේ බී විජයරත්න මහතා
   (කමිටු සභාපති - 08.07.2019 සිට බලපැවැත්වෙන පරිදි)
3. එම් ජේ පී සල්ගාදු මහතා
4. නීල් ද අල්විස් මහතා
   (01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
5. කේ අමරසිංහ මහතා
   (01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
6. එස් ජේ සී පෙරේරා මහතා (06.09.2019 පත් කරන ලදී)
7. එම් ඒ බී සිල්වා මහතා (02.10.2019 පත් කරන ලදී)
8. ටී ඒ ආරියපාල මහතා (සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. 31.01.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම යන ලදී)
9. ටී කුහන් මහතා (වැඩබලන සාමාන්‍යාධිකාරී/
   ප්‍ර.වි.නි. ලෙස 01.02.2019 සිට සහ සාමාන්‍යාධිකාරී/
   ප්‍ර.වි.නි. ලෙස 01.11.2019 සිට)
10. කේ සී ඩී ධර්මප්‍රිය මහතා - සහකාර සාමාන්‍යාධිකාරී -
    අවදානම් කළමනාකරණ
11. ඩබ්ලිව් එම් එස් වික්‍රමසිංහ මහතා - අනුකූලතා නිලධාරී

අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව පිටු අංක 100 හි දක්වා ඇති අතර එමගින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසක් නිර්මාණය වේ.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

1. ජේ ටී එස් පී කාරියවසම් මහතා (කමිටු සභාපති)
2. කේ බී විජයරත්න මහතා (12.07.2019 පත් කරන ලදී)
3. එම් ජේ පී සල්ගාදු මහතා (30.05.2019 පත් කරන ලදී)
4. නීල් ද අල්විස් මහතා
   (01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
5. කේ අමරසිංහ මහතා
   (01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
6. වයි එම් ඩී වර්ණසූරිය මිය (30.05.2019 පත් කරන ලදී)
7. ටී ඒ ආරියපාල මහතා
   (30.01.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
8. ටී කුහන් මහතා (වැඩබලන සාමාන්‍යාධිකාරී/
   ප්‍ර.වි.නි. ලෙස 01.02.2019 සිට සහ සාමාන්‍යාධිකාරී/
   ප්‍ර.වි.නි. ලෙස 01.11.2019 සිට)
9. කේ එම් ජේ එස් කරුණාතිලක මහතා -
   මානව සම්පත් සංවර්ධන හා පරිපාලන ප්‍රධානී

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව

1. කේ බී රාජපක්ෂ මහතා
   (කමිටු සභාපති - 01.07.2019 ධූර කාලය අවසන් විය)
2. ජේ ආර් ෆර්නැන්ඩස් මහතා
   (30.05.2019 පත් කරන ලදී, කමිටු සභාපති - 07.08.2019 සිට බලපැවැත්වෙන පරිදි)
3. එම් ජේ පී සල්ගාදු මහතා
4. එම් ඒ බී සිල්වා මහතා (02.10.2019 පත් කරන ලදී)
5. නීල් ද අල්විස් මහතා
   (01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
6. එස් ජේ සී පෙරේරා මහතා (07.08.2019 පත් කරන ලදී)
7. ටී ඒ ආරියපාල මහතා
   (2019.01.30 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය)
8. ටී කුහාන් මහතා (වැඩබලන සාමාන්‍යාධිකාරී/
   ප්‍රවි.නි. ලෙස 01.02.2019 සිට සහ සාමාන්‍යාධිකාරී/
   ප්‍ර.වි.නි. ලෙස 01.11.2019 සිට)
9. වී ජයසිංහ මහතා - ප්‍රධාන තොරතුරු නිලධාරී
10. කේ සී ඩී ධර්මප්‍රිය මහතා - සහකාර සාමාන්‍යාධිකාරී -
    අවදානම් කළමනාකරණ

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

1. ජේ ටී එස් පී කාරියවසම් මහතා (කමිටු සභාපති)
2. කේ බී රාජපක්ෂ මහතා (01.07.2019 දූර කාලය අවසන් විය)
3. කේ බී විජයරත්න මහතා
4. එම් ඒ බී සිල්වා මහතා (02.10.2019 පත් කරන ලදී)
5. කේ අරමසිංහ මහතා
(01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම ලැබීය)
6. එස් ජේ සී පෙරේරා මහතා (07.08.2019 පත් කරන ලදී)
7. ටී කුහාන් මහතා (වැඩබලන සාමාන්‍යාධිකාරී/
ප්‍රවිනි ලෙස 01.02.2019 සිට සහ සාමාන්‍යාධිකාරී/
ප්‍රවිනි ලෙස 01.11.2019 සිට)

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

1. ජේ ටී එස් පී කාරියවසම් මහතා (කමිටු සභාපති)
2. කේ බී විජයරත්න මහතා (12.07.2019 පත් කරන ලදී)
3. එම් ජේ පී සල්ගාදු මහතා (30.05.2019 පත් කරන ලදී)
4. නීල් ද අල්විස් මහතා
(01.04.2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)
5. වයි එම් ඩී වර්ණසූරිය මිය 30.05.2019 පත් කරන ලදී)
6. ටී කුහන් මහතා (වැඩබලන සාමාන්‍යාධිකාරී/
ප්‍ර.වි.නි. ලෙස 01.02.2019 සිට සහ සාමාන්‍යාධිකාරී/
ප්‍ර.වි.නි. ලෙස 01.11.2019 සිට)
7. කේ එම් ජේ එස් කරුණාතිලක මහතා -
මානව සම්පත් සංවර්ධන හා පරිපාලන ප්‍රධානි

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන කමිටු රැස්වීම්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්, මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම්, නාමයෝජනා කමිටු රැස්වීම්, ණය කමිටු රැස්වීම්, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු රැස්වීම් ඇතුළු රැස්වීම් රැසක් පැවැත්වුනු අතර මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය මෙම වාර්ෂික වාර්තාවේ ආයතනික පාලන වාර්තාව පිටු අංක 88 හි දැක්වේ.

ගිවිසුම් තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

සෘජුව හා වක්‍රව යන දෙයාකාරයෙන්ම බැංකුව සම්බන්ධ ගිවිසුම් කෙරෙහි අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාවන් මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක 39.2.3. හි දැක්වේ. බැංකුව සමග ගිවිසුම් හෝ යෝජිත ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ කිසිදු බැඳියාවක් නොමැත.

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශයක් පිළියෙල කිරීමේදී යොදා ගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 24) සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු හි කොන්දේසි අනුව අධ්‍යක්ෂවරුන් විසින් සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු වශයෙන් වර්ගීකරණය කළ හැකි ගනුදෙනු වී නම් ඒවා හෙළිදරව් කරනු ලැබ ඇත. එසේ අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද ගනුදෙනු මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 39 හි දැක්වේ.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

සාමාන්‍යාධිකාරිවරයා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පැමිණීමේ සහ සහභාගීවීමේ හිමිකම සාමාන්‍යාධිකාරිවරයා සතු වේ.

මානව සම්පත්

ඉහළ ගුණාත්මක සේවාවක් තුළින් තිරසාර වටිනාකම් ගොඩනැංවීම කෙරෙහි කැපවූ ඉහළ උත්ප්‍රේරණයකින් සමන්විත සේවක පිරිසක් වර්ධනය කිරීමට හා පවත්වා ගෙන යාමට බැංකුව නිරන්තරයෙන්ම කටයුතු කලේය.

මෙහෙයුම් විශිෂ්ටත්වය

කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් මෙහෙයුම් පිරිවැය අවම කරගැනීම සඳහා බැංකුව මගින් අඛණ්ඩවම ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීම සඳහා සහ පවතින තාක්ෂණික පදනම් උපරිම විභවයකින් යුතුව යොදාගැනීම සඳහා පියවර ගනු ලැබේ.

පාරිසරික ආරක්ෂාව

බැංකුවේ තිරසාර සංවර්ධනය සඳහා අභිශය වැදගත් වන පරිසරය සුරැකීම සඳහා බැංකුව මගින් ව්‍යාපෘතීන් රැසක් දියත් කරනු ලැබ ඇත බැංකුව පරිසරයට හානිදායක වන කිසිදු ක්‍රියාකාරකමක නිරතව නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පරම දැනුම හා විශ්වාසය අනුව රජය වෙත සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කොට ඇති බවට සෑහීමකට පත් වෙති.

අවදානම් කළමනාකරණය අභ්‍යන්තර පාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ත වගකීම දරනු ලැබේ. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව තුළ ඵලදායී හා පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන් ස්ථාපනය කරනු ලැබ සහ ක්‍රියාත්මකකොට ඇත. බැංකුව නිරාවරනය වන්නා වූ අවදානම් මගහරවා ගැනීම හා සාවද්‍ය ප්‍රකාශයන් හෝ අලාභ වලට එරෙහිව සාධාරණ සහතිකයක් සැපයීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතීන් ප්‍රතිසැකසුම්ගත කොට ඇත. බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම තක්සේරු කිරීම සහ කළමනාකරණය සඳහා නිරන්තර ක්‍රියාවලියක් පවතී. අවදානම් වළකා ගැනීම සඳහා බැංකුව මගින් ගනු ලැබූ විශේෂිත පියවර පිළිබඳව මෙම වාර්ෂික වාර්තාව පිටු අංක 49 සිට 64 දක්වා ඉදිරිපත් කෙරේ.

අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

මූල්‍යමය වාර්තාකරණ පද්ධතිය මූල්‍යමය වාර්තාකරණයෙහි විශ්වාසනීයභාවය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදිය හැකි ලෙස නිර්මාණය කොට ඇති බවටත්, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව සිදුකොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහුවරු කරනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ සාධනීය කොටසක් නිර්මාණය කරන්නා වූ ඉහත වාර්තාව පිටු අංක 106 හි දක්වා ඉදිරිපත් කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සඳහා විගණකාධිපතිවරයාගෙන් සහතිකත්ව වාර්තාවක් ලබාගෙන ඇත. එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 104 හි දක්වේ.

ආයතනික පාලනය

බැංකුව සම්බන්ධ කළමනාකරණ කටයුතු සිදුකිරීමේදී ප්‍රශස්ත ආයතනික පාලන ක්‍රියාකාරකම් සහ ක්‍රියාපටිපාටීන් අනුගමනය කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැඩි අවධානයක් යොමු කරනු ලැබ ඇත. ඒ අනුව අවදානම් කළමනාකරණ පියවර වැඩිදියුණු කිරීම සහ වගවීම හා විනිවිදභාවය වර්ධනය කිරීම උදෙසා වරින් වර ක්‍රමවේදයන් හා ව්‍යුහයන් හඳුන්වාදීම/වැඩිදියුණු කිරීම සිදු කෙරිණි. ආයතනික පාලනය පිළිබඳ වෙනම වාර්තාවක් පිටු අංක 67 සිට 88 දක්වා ඉදිරිපත් කොට ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාධකමය සොයාගැනීම් පිළිබඳව විගණකාධිපතිවරයාගෙන් සහතිකත්ව වාර්තාවක් ලබාගෙන ඇත.

නීතිරීති රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතා කෙරෙහි අනුකූලතාවය

බැංකුව මගින් සෑම කල්හිම ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සහ සෙසු සියළුම අදාළ නීතිරීති රෙගුලාසි සහ විචක්ෂණශීලී අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ බවට තහවුරු කරයි.

විගණකවරුන්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් විගණනයක් සිදුකරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

බැංකුවේ විගණන කමිටුව ශ්‍රී ලංකාවේ බලපතලාභී විශේෂිත බැංකු සඳහා වන ආයතනික පාලනය සම්බන්ධ 2007 අංක 12 දරණ බැංකුකරණ පනතෙහි විධිවිධාන ප්‍රකාර පිහිටුවන ලදී. විගණන කමිටුවේ කාර්යයන් කමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපයෝගී කර ගන්නා ලද ප්‍රඥප්තිය මත පදනම්ව සිදු කෙරිණි.

විගණන කමිටුවේ අධිකාරිත්වය, විෂයපථය සහ වගකීම් බෙදාහැරීමේ අරමුණින් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටු ප්‍රඥප්තිය කාලීන ලෙස සමාලෝචනයට ලක් කොට අනුමත කරනු ලැබේ. එහි විමධ්‍යගත බලතල සමගින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියට අනුකූලව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් වල විෂයපථය සහ කාර්යභාරයන් නිශ්චය කෙරේ.

කමිටුවේ සංයුතිය

කමිටුව පහත දැක්වෙන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර, ඔවුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව කමිටුවෙහි කටයුතු සිදුකරනු ලැබේ.

1. ඒ කේ සෙනෙවිරත්න මහතා (කමිටු සභාපති)
2. කේ බී විජයරත්න මහතා
3. නීල් ද අල්විස් මහතා
   (2019 අප්‍රියෙල් 01 වැනි දින ඉල්ලා අස්විය)
4. වයි එම් ඩී වර්ණසූරිය මිය
   (2019 මැයි 30 වැනි දින පත් කරන ලදී)
5. එස් ජේ සී පෙරේරා මහතා
   (2019 සැප්තැම්බර් 06 වැනි දින පත් කරන ලදී)

විගණන කමිටුව විසින් ආරාධනා කරනු ලැබීමෙන් අනතුරුව සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, විගණන ප්‍රධානී, සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ), ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ ජාතික විගණන කාර්යාලයේ (බැංකුවේ බාහිර විගණක) නියෝජිතයකු විගණන කමිටු රැස්වීම් සඳහා සහභාගී වෙති.

විගණන කමිටුවෙහි කාර්යභාරය ඉටුකිරීමේදී අදාළ වන, ව්‍යාපාරය ආශ්‍රිත ප්‍රධාන පෙලේ ගැටළු හා වර්ධනයන් ආශ්‍රිතව විගණන කමිටුවෙහි දැනුවත්භාවය වර්ධනය කිරීම සම්බන්ධයෙන් අදාළ ඉදිරිපත් සිදුකිරීම සඳහා, ඇතැම් රැස්වීම් සඳහා ව්‍යාපාර ඒකකවල අදාළ නිලධාරීන් වෙතද ඇරයුම් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විගණන කමිටු ලේකම්වරයා වශයෙන් ද කටයුතු කරයි.

කමිටුවෙහි ප්‍රඥප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කමිටුවෙහි ප්‍රඥප්තිය මගින් කමිටුවට අදාළ නීතිරීති හා නිර්දේශයන් පැහැදිලිව නිර්වචනය කරනු ලැබේ. කමිටු ප්‍රඥප්තිය 2019 අප්‍රියෙල් මස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසන් වරට සමාලෝචනය කොට අනුමත කරන ලදී.

විගණන කමිටුවෙහි කාර්යභාරයන් සහ භූමිකාව

විගණන කමිටුව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වගකීමෙන් බැඳේ -

- බැංකුවේ මූල්‍ය තොරතුරු, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය ප්‍රකාශයන්හි සුපිළිපන් බව අධීක්ෂණය කිරීම උදෙසා බැංකුවේ මූල්‍යමය තොරතුරු සමාලෝනය කිරීම.
- බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ ක්‍රියාදාමයන්ගේ ගුණාත්මක බව හා පිළිගත හැකි බව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.
- ගිණුම්කරණ හා මූල්‍යමය වාර්තාකරණය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ නියාමන අනුකූලතාවය සමාලෝචනයට භාජනය කිරීම.
- මූල්‍යමය ප්‍රකාශයන් ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව අඛණ්ඩව යොදා ගනු ලබන ව්‍යවස්ථාපිත විධිවිධාන ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ප්‍රතිපත්තිය කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම උදෙසා අදාළ ප්‍රතිපත්තිය ප්‍රකාශයන් (කාර්තුමය ප්‍රකාශයන්ද ඇතුළුව) සමාලෝචනයට භාජනය කිරීම.
- නීතිරීති උල්ලංගනය කිරීම්, වංචා සහ දෝෂ වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කොට අදාළ පූර්වෝපාය ක්‍රියාවලීන් සිදුකිරීමේදී ආයතනික කළමනාකාරිත්වය සමග අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- විගණන ප්‍රධානියා පත් කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයෙහි කාර්යසාධනය හා ක්‍රියාකාරකම් අධීක්ෂණයේ ස්වාධීනත්වය තක්සේරු කිරීම.
- අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතා කෙරෙහි අනුකූලව බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශයන්හි විශ්වසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධයෙන් බැංකුවෙහි අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ඵලදායීත්වය සමාලෝචනයට ලක් කිරීම.
- අවශ්‍ය බවට හැඟී යන අවස්ථාවන්හිදී විශේෂිත ක්‍රියාකාරකම් සඳහා ස්වාධීන උපදේශකවරුන් සහභාගී කර ගැනීම.

රැස්වීම්

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරනු ලැබ ඇති ආයතනික පාලනය සඳහා වන රෙගුලාසි/මාර්ගෝපදේශයන්ට අනුව රැස්වීම් කාර්තුමය වශයෙන් කැඳවනු ලැබේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර මූල්‍ය වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් හතක් (07) කැඳවන ලදී.

විගණන කමිටු රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයින් තුන් (03) දෙනෙකි.

කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වය පහත දැක්වෙන පරිදි වේ:

කමිටු සාමාජිකයාගේ නම	පැමිණීම
ඒ කේ සෙනෙවිරත්න මහතා	07/07
කේ බී විජයරත්න මහතා	07/07
නීල් ද අල්විස් මහතා	01/01
වයි එම් ඩී වර්ණසූරිය මිය	05/05
එස් ජේ සී පෙරේරා මහතා	01/03

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

අභ්‍යන්තර විගණනය සහ පරීක්ෂා කිරීම

අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම බැංකුවේ ස්වාධීන ක්‍රියාකාරකමක් බවට කමිටුව විසින් තහවුරු කෙරිණි. එමගින් අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් වල ස්වාධීනත්වය, අභ්‍යන්තර විගණන අංශයෙහි විෂයපථය හා සම්පත් වල ප්‍රමාණවත්භාවය සමාලෝචනයට ලක් කරමින් සිය කාර්යයන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අධිකාරීත්වය එම අංශය සතු වන බවට සෑහීමකට පත් විය.

විමර්ශනයට ලක් වන වසර තුළ අභ්‍යන්තර විගණන සැලසුමට අනුව අභ්‍යන්තර විගණන අංශය මගින් විගණන කමිටුවේ අධීක්ෂණය හා උපදේශකත්වය යටතේ බොහොමයක් ශාඛාවන්, තොරතුරු තාක්ෂණ අංශය, මානව සම්පත් අංශය, අනුකූලතා අංශය, මෙහෙයුම් හා බැංකු සහායක සේවා අංශය, නීති අංශය, අවදානම් කළමනාකරණ අංශය සහ දිස්ත්‍රික් කාර්යාල හතරක් විගණනයට ලක් කෙරිණි. ඒ අතරතුර වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සහ අන්තර්මධ්‍ය මූල්‍ය ප්‍රකාශයන් අධීක්ෂණ හා නියාමන අධිකාරීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් පූර්ව නිර්දේශිත පරිදි සකසන ලැබ ප්‍රකාශයට පත් කොට ඇති බව තහවුරු කිරීම උදෙසා විගණන කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවැසි සහාය ලබාදෙන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාව සහ වසර 2018 සඳහා 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි වගන්ති 13 (7) (ඒ) ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද වාර්තාව සහ 2018 - කළමනාකරණ ලිපිය මගින් ඉස්මතු කරන ලද කරුණු සම්බන්ධයෙන්, වසර 2018 තුළදී කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් පසු විපරම් ද විගණන කමිටුව විසින් සිදු කරන ලදී.

තවද අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට හා වංචා, දෝෂ සහ සෙසු අලාභදායක සිදුවීම් වළකාගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සම්බන්ධ පියවරයන් දැනටමත් ගනු ලැබ ඇත. විගණන කමිටුව මගින් බැංකුවේ තිරසාරත්වය, ලාභදායීත්වය සහ සෙසු ආශ්‍රිත තත්ත්වයන් පිළිබඳව තක්සේරුවක් සිදු කෙරේ. විගණන කාර්ය මණ්ඩලයේ දැනුම හා නිපුණත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය විධිවිධානයන්ද සලසන ලදී.

ඒ අනුව මූල්‍ය වාර්තාකරණයේදී අනුකූලතාවය හා අවදානම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාපටිපාටීන්/පද්ධතීන් කෙරෙහි බැංකුව අනුගත වන බවටත් ප්‍රමාණවත් හා යෝග්‍ය වූ අභ්‍යන්තර පාලනයන් පවත්වා ගෙන යනු ලබන බවටත් විගණන කමිටුව මගින් තහවුරු කෙරේ.

බාහිර විගණනය

බැංකුවේ බාහිර විගණන කටයුතු සම්බන්ධයෙන් කමිටුවෙහි කාර්යභාරය පහත දැක්වේ.

මෙරට ව්‍යවස්ථාව අනුව බැංකුවේ බාහිර විගණනය සිදුකරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි. බාහිර විගණනය බලාත්මක අයුරින් සහ ස්වාධීනව සිදුකරන ලද බවට කමිටුව මගින් තහවුරු කරන ලද අතර එමගින් විගණන එළඹුම හා ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමග අඛණ්ඩ වාර්තාවත් පවත්වා ගෙන යන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

කමිටුව මගින් බැංකුවට අදාළ නව හා සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) අනුගත කරගැනීම සම්බන්ධ සංශෝධිත ප්‍රතිපත්තිමය තීරණ සමාලෝචනයට ලක් කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කෙරිණි. කමිටුව මගින් අඛණ්ඩවම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරහි අනුකූලතාවය අධීක්ෂණය කරමින් නිශ්චිත කාල අන්තරයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ඇත.

2019 දී සිදු කරන ලද ක්‍රියාකාරකම්

විමර්ශනයට ලක් කෙරෙන වසර තුළ කමිටුව පහත දක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් වල නිරත විය.

1. වසර 2019 සඳහා බැංකුවේ ක්ෂේත්‍රයන්හි අවදානම් ස්වභාවයන් මත පදනම්ව සකසන ලද වාර්ෂික විගණන සැලසුම අනුමත කිරීම.
2. කළමනාකරණ ලිපිය සහ වසර 2018 සඳහා 1971 අංක 38 දරණ මූල්‍ය පනතෙහි වගන්ති 13 (7) (ඒ) ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කරන ලද වාර්තාව සහ ඒ සඳහා වූ ප්‍රතිචාර සමාලෝචනය හා සාකච්ඡා කිරීම.
3. ශ්‍රී ලංකා මහ බැංකු ව්‍යවස්ථාපිත පරීක්ෂණයේදී මතු කරන ලද කරුණු සමාලෝචනය කොට සාකච්ඡා කරමින් නිවැරදි කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
4. වසර 2019 සඳහා වන බැංකුවේ කාර්තුමය මූල්‍යමය කාර්යසාධනය සමාලෝචනය කරමින් එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදීම සඳහා නිර්දේශ කිරීම.
5. අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය ආවර්තිතව සමාලෝචනය කිරීම.



ඒ. කේ. සෙනෙවිරත්න
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

හැඳින්වීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බලපත්‍රලත් විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද නියෝග 3 (6) හි දක්වනු ලැබ ඇති පරිදි සහ ආයතනික යහපාලන පරිචයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වාර්තා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු පිහිටුවීම අවශ්‍ය වේ. එහි වගන්ති 3 (6) (iii) සහ (iv) ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයිගෙන් සැදුම්ලත් වෙන් වෙන් වූ කමිටු දෙකක් පිහිටුවන ලද අතර ඒවා නම් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC) වේ. ශ්‍රී ලංකා මහ බැංකු නියෝග අනුව නිර්වචනිත විෂයපථය ඇතුළත කමිටු ද්විත්වය වෙත වගකීම් පවරන ලදී. 2017 මාර්තු 27 සිට බලපැවැත්වෙන පරිදි නියමයන් හා කොන්දේසි නිර්වචනයන් (TOR) අනුව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව වෙන් වෙන් වූ කමිටු දෙකක් වශයෙන් ක්‍රියාත්මක විය.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ විෂයපථය

- බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය නිර්ණය කිරීම.
- අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වය සඳහා අරමුණු හා ඉලක්ක සැකසීම හා කාර්යසාධනය ඇගයීම සහ කාලානුරූපව සකසන ලද ඉලක්ක හා අරමුණු වලට සාපේක්ෂව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වයේ කාර්යසාධනය ඇගයීම.
- බැංකුවේ ව්‍යාපාර හා ක්‍රියාකාරී උපායමාර්ග සම්බන්ධයෙන් වූ මානව සම්පත් උපායමාර්ග හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ විෂයපථය

- ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව ව්‍යක්තික තනතුරු වෙත පත්කිරීම හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ගති ලක්ෂණ නිර්වචනය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වය ව්‍යක්තිකයින් වශයෙන් නව සාමාජිකයින් තෝරාගැනීම/පත්කිරීම හෝ ඔවුන්ගේ නැවත පත් කිරීම සළකාබැලීම සඳහා සහ කාර්යසාධනය හා බැංකුවේ සමස්ත අරමුණු කෙරෙහි දක්වන ලද දායකත්වය මත ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරීත්වය ව්‍යක්තිකයින් වෙත සේවා දිගුවක් ලබාදීම සඳහා ක්‍රියාපටිපාටියක් ස්ථාපිත කිරීම.
- ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි නියෝග 3 (3) සඳහන් ක්‍රියාපටිපාටියෙහි විශේෂ කොට දක්වනු ලැබ ඇති පරිදි අධ්‍යක්ෂවරුන් අදාළ ධූරයන් දැරීමට යෝග්‍ය හා නිසි පුද්ගලයින් බවට තහවුරු කිරීම.
- කලින් කලට අමතර/නව විශේෂඥභාවයන් සහ විශ්‍රාම ලබන අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකාරීත්වය ව්‍යක්තිකයින් වෙනුවට අනුප්‍රාප්තික සැලසුමක් පිළිබඳව සළකා බැලීම හා නිර්දේශ කිරීම.

සංයුතිය සහ රැස්වීම්

බැංකුවේ සභාපතිවරයා විසින් කමිටු ද්විත්වයෙහි ප්‍රධානත්වය උසුලනු ලැබේ. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් දහයක් (10) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් හතරක් (4) පවත්වන ලදී.

කමිටු සාමාජිකයින් හට අදාළ තීරණ වලට එළඹීම සඳහා පසුබිම හා ආශ්‍රිත තොරතුරු ඇතුළත් පත්‍රිකා සාමාන්‍යාධිකාරීවරයා ඔස්සේ අංශ ප්‍රධානී මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන විසින් ඉදිරිපත් කෙරේ.

මෙම කමිටු වල ලේකම්වරයා වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වේ.

අවශ්‍ය අවස්ථාවන්හිදී ස්වකීය කාර්යයන් සම්බන්ධ අදහස් ලබාගැනීම සඳහා අංශ ප්‍රධානීන් හට ආරාධනා කෙරේ.

සියළුම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් සඳහා සාමාන්‍යාධිකාරී/ප්‍රවිනි සහභාගී වන අතර අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ආරාධනා මත සහභාගී වේ.

එක් එක් කමිටුවෙහි රැස්වීම් සඳහා ගණපූර්ණය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකි. අවම වශයෙන් කාර්තුවකට වරක් කමිටු රැස්වීම් පැවැත්වේ. වසර තුළදී කමිටු සාමාජිකයින් වෙනස් වූ අතර පැමිණීමේ තොරතුරු පහත දැක්වෙන පරිදි වේ:

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු සාමාජිකයින්

නම	පැමිණීම/ පැවති ගණන
ජේ ටී එස් පී කාරියවසම් මහතා - සභාපති	10/10
කේ බී විජයරත්න - අධ්‍යක්ෂ (2019 ජූලි 12 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	03/03
එම් ජේ පී සල්ගාදු මහතා - අධ්‍යක්ෂ (2019 මැයි 30 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	04/04
නිල් ද අල්විස් මහතා - අධ්‍යක්ෂ (2019 අප්‍රියෙල් 1 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)	06/06
වයි එම් ඩී වර්ණසූරිය මිය - අධ්‍යක්ෂිකා (2019 මැයි 30 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	04/04
කේ අමරසිංහ මහතා - විධායක අධ්‍යක්ෂ (2019 අප්‍රියෙල් 1 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)	06/06
ටී කුහන් මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.	
කේ එම් ජේ එස් කරුණාතිලක - මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන අංශ ප්‍රධානී	
ආර් එම් ටී රාජපක්ෂ මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු සාමාජිකයින්

නම	පැමිණීම/ පැවති ගණන
ජේ ටී එස් පී කාරියවසම් මහතා - සභාපති	04/04
කේ බී විජයරත්න - අධ්‍යක්ෂ (2019 ජූලි 12 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	02/02
එම් ජේ පී සල්ගාදු මහතා - අධ්‍යක්ෂ (2019 මැයි 30 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	03/03
නීල් ද අල්විස් මහතා - අධ්‍යක්ෂ (2019 අප්‍රියෙල් 1 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)	01/01
වයි එම් ඩී වර්ණසූරිය මිය - අධ්‍යක්ෂිකා (2019 මැයි 30 සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)	02/03
ආර් එම් ටී රාජපක්ෂ මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	

ක්‍රියාකාරකම් සාරාංශය

2019 මැයි මාසයේදී, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ විධායක අධ්‍යක්ෂ කේ අමරසිංහ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ හා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සාමාජික නීල් ද අල්විස් යන මහත්වරුන්ගේ ඉල්ලා අස්වීම් හේතුවෙන්, කමිටු ද්විත්වය ප්‍රතිසංවිධානය කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු විය. ඒ අනුව, කේ බී විජයරත්න - අධ්‍යක්ෂ, එම් ජේ පී සල්ගාදු - අධ්‍යක්ෂ සහ වයි එම් ඩී වර්ණසූරිය යන මහත්ම මහත්මීන් අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කිරීමත් සමග ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත් කෙරිණි.

කමිටු ලේකම්වරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ රැස්වීම් වාර්තා සමගින් නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා භාරදෙන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුමත කරන ලදී.

ආචාර්ය නිර්මාල් ද සිල්වා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු වාර්තාව

විෂයපථය

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව පිහිටුවනු ලැබ ඇත්තේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය වැඩි දියුණු කිරීමට සහ තොරතුරු තාක්ෂණ පාලන ක්‍රමවේද සම්බන්ධයෙන් දිනෙන් දින ඉහළ යමින් පවතින් ඉල්ලුම සපුරාලීම සඳහා බැංකුවට සහාය වීමේ අරමුණිනි.

කමිටුව තොරතුරු සන්නිවේදන තාක්ෂණය සඳහා වන සමස්ත ක්‍රමෝපාය පිළිබඳ වගකීමෙන් බැඳෙන අතර එමගින් බැංකුවේ ගනුදෙනුකාර සේවාවන් සහ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් භාවිත කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කෙරේ.

තොරතුරු තාක්ෂණ අනු කමිටුවෙහි සංයුතිය

තොරතුරු තාක්ෂණ අනු කමිටුව බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති අතර පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

කමිටු සාමාජිකයන් :

- කේ. බී. රාජපක්ෂ මහතා - කමිටු සභාපති/අධ්‍යක්ෂ
  (2019 07 01 දින සේවා කාලය අවසන් විය)
- ජේ. ආර්. ෆර්නැන්ඩස් මහතා - කමිටු සභාපති/අධ්‍යක්ෂ
  (2019 07 08 දින සිට බලපැවැත්වෙන පරිදි)
- එම්. ජේ. පී. සල්ගාදු මහතා - සාමාජික / අධ්‍යක්ෂ
- එම්. ඒ. බී. සිල්වා මහතා - සාමාජික/අධ්‍යක්ෂ
  (2019 10 02 දින පත් කරන ලදී)
- නීල් ද අල්විස් මහතා - සාමාජික/අධ්‍යක්ෂ
  (2019 04 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
- එස්. ජේ. සී. පෙරේරා මහතා - සාමාජික/අධ්‍යක්ෂ
  (2019 08 07 දින පත් කරන ලදී)

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ/ප්‍රධාන තොරතුරු නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී ආරාධිතයන් වශයෙන් තොරතුරු තාක්ෂණ කමිටු රැස්වීම් වෙත සහභාගී වන ආයතනික කළමනාකාරීත්වයේ සාමාජිකයන් වේ. බැංකුවේ ඕනෑම නිලධාරියකු හට ආරාධනා මත රැස්වීමට සහභාගී විය හැකි වේ.

තොරතුරු තාක්ෂණ කමිටුවේ ගනපූර්ණය සාමාජිකයින් දෙදෙනෙකි. තොරතුරු තාක්ෂණ කමිටුව මගින් 2019 වසර තුළදී රැස්වීම් තුනක් පවත්වන ලද අතර එම නිසා නියාමන අවශ්‍යතා සම්පූර්ණ වේ.

ආචාර්ය නිර්මාල් ද සිල්වා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ සංයුතිය

විමර්ශනයට ලක් වන වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත දැක්වෙන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් දෙනාගෙන් සමන්විත වූ අතර ඔවුන්ගේ විස්තර පිටු අංක 14 සිට 17 දක්වා ඉදිරිපත් කෙරේ.

එක් එක් නාමය යටතේ අදාළ අධ්‍යක්ෂවරයාගේ ස්වාධීන හෝ ස්වාධීන නොවන බව දක්වේ.

1. කේ බී රාජපක්ෂ මහතා
   (කමිටු සභාපති/විධායක නොවන අධ්‍යක්ෂ - 01/07/2019 දිනය කාලය අවසන් විය)
2. කේ බී විජයරත්න මහතා
   (කමිටු සභාපති/විධායක නොවන අධ්‍යක්ෂ - 08/07/2019 සිට බලපැවැත්වෙන පරිදි)
3. එම් ජේ පී සල්ගාදු මහතා
   සාමාජික/විධායක නොවන අධ්‍යක්ෂ
4. නීල් ද අල්විස් මහතා
   (සාමාජික/විධායක අධ්‍යක්ෂ - 08/07/2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
5. කේ අමරසිංහ මහතා
   (සාමාජික/විධායක නොවන අධ්‍යක්ෂ - 01/04/2019 සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)
6. එස් ජේ සී පෙරේරා මහතා
   (සාමාජික/විධායක නොවන අධ්‍යක්ෂ - 06/09/2019 පත් කරන ලදී)
7. එම් ඒ බී සිල්වා මහතා
   (සාමාජික/විධායක නොවන අධ්‍යක්ෂ - 02/10/2019 පත් කරන ලදී)

නිතිපතා සහභාගිවූවන්

ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී සහ අනුකූලතා නිලධාරී වසර 2019 දී විධිමත් පදනමක් මත රැස්වීම් වලට සහභාගී වූහ.

කමිටු ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරය කමිටුවේ ලේකම්වරයාද වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව කාර්තුමය පදනමකින් යුතුව රැස්වන නමුත් අවශ්‍යතා මත පදනම්ව රැස්වීම් කැඳවනු ලැබේ. වසර 2019 දී කමිටු රැස්වීම් හතරක් කැඳවන ලද අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි ප්‍රඥප්තිය අනුව කමිටුවෙහි අවම ගනපූර්ණය විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ප්‍ර.වි.නි. සහ ප්‍රධාන අවදානම් නිලධාරී වේ.

කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ

රැස්වීම්

සාමාජිකයාගේ නම	සහභාගී වීමට සුදුසු යුතු/සහභාගී වූ
කේ බී රාජපක්ෂ මහතා	03/03
කේ බී විජයරත්න මහතා	04/04
එම් ජේ පී සල්ගාදු මහතා	04/04
නීල් ද අල්විස් මහතා	01/01
කේ අමරසිංහ මහතා	01/01
එස් ජේ සී පෙරේරා මහතා	01/01
එම් ඒ බී සිල්වා මහතා	00/00

කමිටුවෙහි නිර්දේශිත කාර්යභාරය

1988 අංක 30 දරණ බැංකුකරණ පනතෙහි නීතිරීති අනුව මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇති ''ශ්‍රී ලංකාවේ බලපත්‍රලත් විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය'' සම්බන්ධයෙන් 2007 බැංකුකරණ පනතේ නියෝග අංක 12 ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපනය කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශිත කාර්යභාරය පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වේ ;

1. බැංකුව සතුව පරිපූර්ණ අවදානම් කළමනාකරණ ආකෘතියක්, යෝග්‍ය වූ අනුකූලතාවයක් හා ක්‍රමවේදයක් පවතින බවට තහවුරු කිරීම.
2. බැංකුව වෙත ණය, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික කීර්තිනාම අවදානම් ඇතුළුව, නමුත් ඒවාට සීමා නොවී සියළුම අවදානම් කාණ්ඩයන් සහ යෝග්‍ය වූ අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු වෙත පිවිසිය හැකි වීම.
3. ස්ථාපිත විමධ්‍යගත ලද බලාධිකාරීන්ට අනුකූලව අවදානම සම්බන්ධ තීරණ ගනු ලබන බවටත්, බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමනමය හා අධීක්ෂණමය අවශ්‍යතා මත පදනම්ව කමිටුව මගින් සකසන ලද අවදානම් දරා ගැනීමේ සීමාවන්ගෙන් ඔබ්බට යමින් අදාළ අවදානම් සමනය කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බවට තහවුරු කිරීම.
4. බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතියෙහි බලාත්මකභාවය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් වල සවිමත්බව අධීක්ෂණය සහ ඒ වෙත පිවිසුම.
5. අභ්‍යන්තරව නිර්වචනය කරනු ලැබ ඇති අවදානම් දරා ගැනීමේ සූදානමට සාපේක්ෂව ආවර්තිතව කාර්යසාධනය ඇගයුමට ලක් කිරීම.
6. බැංකුවේ අනුකූලතා වාර්තාව සහ වාර්තාව ආශ්‍රිතව ගෙන ඇති පියවර සමාලෝචනයට ලක් කිරීම.
7. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ආකෘතිය ආශ්‍රිත ගැටළු සමාලෝචනය කිරීම.
8. බාසල් 111 පියවර ක්‍රියාවට නැංවීම සහ නියාමන උපදෙස් සම්බන්ධ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

2019 තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම්

අදාළ ක්‍රියාකාරකම් සාරාංශත කොට පහත දැක්වේ ;

1. පහත දැක්වෙන ප්‍රතිපත්තීන් සමෝලෝචනය කොට නිර්දේශ කරන ලදී.

   ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   පොලී අනුපාතික අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   ආතති පරීක්ෂා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

   ණය සමාලෝචන ප්‍රතිපත්තිය

2. සිය අනුමත සීමාවන්ගෙන් ඔබ්බට ගොස් ඇති බැංකුවේ ණය කළඹෙහි ක්ෂේත්‍රමය සීමාවන් අධීක්ෂණය කොට සමාලෝචනය කරන ලද අතර ගැළපුම් සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
3. නියාමන අවශ්‍යතා කෙරෙහි කෙතරම් දුරට අනුකූල වන්නේ දැයි ඇගයුමට ලක් කරනු පිණිස අනුකූලතා නිලධාරීවරයා විසින් භාරදෙන ලද පරිපූර්ණ අනුකූලතා වාර්තාවන් සමාලෝචනය කරන ලදී.
4. බැංකුවේ සමස්ත ප්‍රධාන අවදානම් දර්ශකයන් අධීක්ෂණය කරන ලදී.
5. තොරතුරු සුරක්ෂිතතාව හා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත තත්ත්වයන් නිසි පරිදි පවත්වා ගෙන යාම උදෙසා පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය සහ තොරතුරු සුරක්ෂිතතා ප්‍රතිපත්තිය නිර්දේශ කොට සමාලෝචනයට ලක් කෙරෙමින් පවතී.
6. අවදානම් කළමනාකරණ අංශයෙහි ක්‍රියාකාරී සැලසුම අනුමත කොට අනුගත කරන ලදී.
7. කළමනාකරණ මට්ටමේ රැස්වීම් වල සියළු වාර්තා සමාලෝචනයට ලක් කෙරිණි. (මෙහෙයුම් අවදානම් කළමනාකරණ අනු කමිටුව, කළමනාකරණ කමිටුව, වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් පරිශ්‍ර කමිටුව)

වාර්තාකරණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි රැස්වීම් පිළිබඳ විස්තර රැස්වීම් වාර්තා මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. බැංකුවේ අවදානම් ස්වභාවය සම්බන්ධ වාර්තාව හා සෙසු විශේෂිත කරුණු සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුවෙහි නිර්දේශය මත අනුමත කිරීම සඳහා වෙන් වෙන්ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙන ලදී. විමර්ශනයට ලක් වන වසර තුළදී සමෝධානික අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකරන ලද නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලදී.



සභාපති
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් පහත දක්වෙන නියාමනමය අවශ්‍යතා අනුව පිළියෙල කොට ඉදිරිපත් කරන ලදී:

1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS)
2. 1995 අංක 15 දරණ ගිණුම්කරණ හා විගණන පනත
3. කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගතවීමේ නීතිරීති
4. 1988 අංක 30 දරණ බැංකුකරණ පනත සහ ඒ සම්බන්ධ සංශෝධනයන්
5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික පාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007 අංක 12 දරණ බැංකුකරණ පනත් නියෝගය ඇතුළුව නමුත් එයට සීමා නොවී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද නියෝගයන්, චක්‍රලේඛ හා මාර්ගෝපදේශ: සහ
6. 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත.

මූල්‍ය ප්‍රතිඵල සහ අනාවරනයන් ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා ලද ආකෘතීන්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකු වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී විශේෂිතව දක්වන ලද ආකෘතීන්ට අනුකූල වේ.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රමිතීන්, 2012 ජනවාරි 1 දින සිට බලපැවැත්වුනු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් බැංකුව මගින් සංගතභාවයෙන් යුතුව යොදාගැනිනි. වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමග අනුගත වනු පිණිස අවශ්‍ය අවස්ථාවන්හිදී සන්සන්දනාත්මක තොරතුරු ප්‍රති ප්‍රකාශය කරනු ලැබ ඇත. සියළුම සැළකිය යුතු අයිතමයන් ඉදිරිපත් කොට මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ආකාරයෙන් පැහැදිලි කරනු ලැබ ඇත. අපගේ පරම දැනුම අනුව, මේ සමග ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් මගින් වසර සඳහා බැංකුවේ මූල්‍යමය තත්ත්වය, ආදායම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සම්බන්ධ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කෙරෙන බව තහවුරු කර සිටිමු. පුරෝකථනය කල හැකි අනාගත කාලසීමාවක් සඳහා සිය මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු වන බවට ද අප විශ්වාසය කළ කරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කෙරිණි.

මූල්‍ය ප්‍රකාශයන්හි විශ්වාසවන්තභාවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්ව විසින් වගකීම භාරගැනේ. මූල්‍ය ප්‍රකාශයන් මගින් සත්‍ය වූද සාධාරණ වූද දැක්මක් පිළිබිඹු වන අයුරින්, මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ ඇස්තමේන්තු විනිශ්චයන් සාධාරණ හා විචක්ෂණශීලී පදනම්කින් යුතුව සිදු කොට ඇති අතර, එහිදී ගනුදෙනුවල ස්වභාවය හා හරය මෙන්ම බැංකුවේ කටයුතු වල තත්ත්වය සාධාරණ අයුරින් ඉදිරිපත් කෙරේ.

මේ බව තහවුරු කිරීම උදෙසා, බැංකුව මගින් වත්කම් සුරැකීම සහ වංචා හා අක්‍රමිකතා හඳුනාගැනීම සහ වැළැක්වීම සඳහා ප්‍රධාන බැංකුකරණ පද්ධතිය යොදාගනිමින්, එය අඛණ්ඩවම සමලෝචනයට, ඇගයුමට හා යථාවත්කරණයට ලක් කරමින්, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීමේදී නිසි මෙන්ම ප්‍රමාණවත් වගකීමක් දරනු ලැබ ඇත.

බැංකුවේ ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් නිරන්තරයෙන් අනුගමනය කරනු ලබන බවට තහවුරු කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් ආවර්තිත විගණනයන් සිදු කරන ලදී. කෙසේවුවද, කවර හෝ අභ්‍යන්තර පාලන හෝ ගිණුම්කරණ පද්ධතියක් මගින් සපයනු ලබන සහතිකත්වය මැන බැලීමේදී හඳුනාගනු ලැබිය යුතු ආවේණික සීමාවන් පවතී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන ලදී. විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 108 සිට 112 දක්වා ඉදිරිපත් කෙරේ.

සියළුම ගනුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත් වල වාර්තා වී ඇති බවට සහ අදාළ ක්‍රියාවලිය SLFRS/ LKAS ඇතුළු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ මූල්‍යමය වාර්තාකරණය හා අනාවරනයන් ආශ්‍රිත සෙසු නියාමන විධිවිධානයන්ට අනුකූල වන බවට තහවුරු කරමින් සාධාරණ සහතිකත්වයක් ලබාදීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයන්හි බලාත්මකභාවය ඇතුළුව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණවත්බව සහ බලාත්මකබව සමාලෝචනයට ලක් කෙරේ. විගණන කමිටු වාර්තාව පිටු අංක 95 හි දක්වෙන අතර පූර්ණ ස්වාධීනත්වය තහවුරු කිරීම උදෙසා, බාහිර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන් හට කවර හෝ හරවත් කරුණක් සාකච්ඡාවට භාජනය කිරීම සඳහා විගණන කමිටු රැස්වීමේදී විගණන කමිටු සාමාජිකයින් හමුවීමේ අවස්ථාව සලසන ලදී.

අපගේ පරම දැනුම අනුව අප විසින් පහත දැක්වෙන කරුණු තහවුරු කරනු ලැබේ:

බැංකුව සියළුම අදාළ නීතිරීති, රෙගුලාසි හා මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කොට ඇත:

ප්‍රමාණික අනනුකූල නොවූ අවස්ථා නොමැති බව:

වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ කොටසෙහි සටහන 38.2 හි අනාවරනය කරනු ලැබ ඇති කරුණු හැරුනු විට බැංකුවට එරෙහිව කිසිදු සැළකිය යුතු නඩු කටයුත්තක් නොමැත:

වාර්තාකරණ දින වන විට, බැංකුව විසින් සියළුම බදු, තීරු බදු, ගාස්තු, හා ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් සහ ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු හා බදු ගෙවනු ලැබ ඇති අතර එසේ නොමැති නම් ඒ සඳහා අදාළ ප්‍රතිපාදන සපයනු ලැබ ඇත.



ටී කුහන්
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.



පී එස් එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2020 මැයි 29

මූල්‍යමය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශය මගින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ආකෘතිය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් දක්වනු ලැබේ. මූල්‍ය ප්‍රකාශයන් ආශ්‍රිත විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවේ පිටු අංක 108 හි ඉදිරිපත් කොට ඇති විගණකවරුන්ගේ වාර්තාවෙහි දක්වේ.

බැංකුව මගින් එහි සියලු ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත්ව ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ අදාළ වර්ෂය තුළ බැංකුවෙහි ක්‍රියාකාරකම් වල ස්වභාවය සහ ලාභ/අලාභ පිළිබඳ සත්‍ය වූද සාධාරණ වූද අදහසක් ලබාගත හැකි ආකාරයෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව (SLFRS/ LKAS) මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කෙරෙන බවට තහවුරු කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍ය ප්‍රකාශයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, අවසන් වූ වසර සඳහා ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ආශ්‍රිත සටහන් වලින් සමන්විත වේ.

වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කොට ඇති 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී, වඩාත්ම යෝග්‍ය වූ ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කරන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුවල ස්වභාවය හා හරය පිළිබිඹු වන අයුරින් අවශ්‍ය අවස්ථාවන්හිදී සාධාරණ හා විචක්ෂණශීලී විනිසුම යොදාගත් ගන්නා ලදී.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශයන් 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත, 1988 අංක 30 දරණ බැංකුකරණ පනත හා ඒ සම්බන්ධ සංශෝධන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සෙසු ව්‍යවස්ථාපිත/නියාමනමය අවශ්‍යතාවන්ට අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් මගින් 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු වල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ වූ දැක්මක් පිළිබිඹු වේ.

අඛණ්ඩ පැවැත්ම

පුරෝකථනය හැකි අනාගත කාලසීමාවක් සඳහා සිය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් බැංකුව සතු වන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර ඒ අනුව, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැනුනි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර පුරා බැංකුව මුහුණපාන ලද අවදානම් හඳුනාගැනීම, වාර්තා කිරීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය සම්බන්ධ ඵලදායක වූද පරිපූර්ණ වූද අභ්‍යන්තර මූල්‍ය පාලන ක්‍රම ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තර වගකීමෙන් බැඳේ. මෙහිදී ආවේනික අවදානම් සම්පූර්ණයෙන් තුරන් කල නොහැකි බව අවධාරනය කරමින්, බැංකුව මගින් විවිධ ක්‍රමවේදයන් හා වෙනත් පාලනයන් යෙදා ගනිමින් ඒවා මගහරවා ගැනීම සඳහා ප්‍රායෝගික පියවර ගනු ලැබ ඇත. මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයබව සම්බන්ධයෙන් සාධාරණ සහතිකත්වයක් ලබාදිය හැකි අයුරින් සකසනු ලැබ ඇති බවට තහවුරු කරමින්, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවක් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 106 හි ඉදිරිපත් කෙරේ.

අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරීත්වය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් ක්‍රියාවේ යොදවනු ලැබ ඇත. ප්‍රමාණාත්මක අවදානම් නිරීක්ෂණය හා කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවනු ලැබ ඇති අතර, සාකච්ඡා සඳහා ආවර්තිත පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත අවදානම් සම්බන්ධ වාර්තා ලබාදීමේ ක්‍රමයක් සකසනු ලැබ ඇත.

අදාළ නීතිරීති, රෙගුලාසි, නියෝග සහ මාර්ගෝපදේශයන් සමග අනුකූලතාවය නිරීක්ෂණය අනුකූලතා අංශය මගින් සිදුකෙරෙන අතර ආවර්තිකව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

විගණන කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව මගින්, නිරන්තර පදනමක් මත, අභ්‍යන්තර පාලනයන් හා අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටීන්හි බලාත්මකභාවය පිළිබඳ කැපීපෙනෙන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. විගණන කමිටු සහ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාවන් පිළිවෙලින් වාර්ෂික වාර්තාවේ පිටු අංක 95 සහ 100 හි දක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශයන්ද ඇතුළුව සියළුම වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර ඔවුන් විසින් තීරණය කරනු ලබන ඕනෑම විටකදී අදාළ පරීක්ෂාවන් සඳහා අවස්ථාව ලබාදෙන ලදී.

අනුකූලතාවය

වාර්තාකරණ දින වන විට, බැංකුව විසින් සියළුම බදු, තීරු බදු, ගාස්තු, හා ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සේවකයින් සම්බන්ධයෙන් සහ ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු හා බදු ගෙවනු ලැබ ඇති අතර එසේ නොමැති නම් ඒ සඳහා අදාළ ප්‍රතිපාදන සපයනු ලැබ ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ.

අධ්‍යක්ෂවරුන් විසින් මෙම ප්‍රකාශයෙහි දක්වනු ලැබ ඇති පරිදි ඔවුන්ගේ වගකීම් ඉටු කරන ලද බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2020 මැයි 28

අභ්‍යන්තර පාලන ප්‍රකාශය සම්බන්ධ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/F/RDB/IC/2019 මගේ අංකය உமது இல. Your No. දිනය திகதி Date ١٢ June 2020

සභාපති,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍යමය වාර්තාකරණය ආශ්‍රිත අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයාගේ සහතිකත්ව වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව මගින්, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍යමය වාර්තාකරණය ආශ්‍රිත අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය (''ප්‍රකාශය'') සහතිකත්වය සපයනු ලැබේ.

කළමනාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය මගින්, 2007 අංක 12 දරණ බැංකුකරණ පනත් නියෝගයෙහි වගන්ති 3 (8) (ii) (ආ) වෙත අනුකූලව නිකුත් කරන ලද ''අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධ බැංකු අධ්‍යක්ෂවරුන් වෙත මාර්ගෝපදේශ'' අනුව ප්‍රකාශය පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකාරිත්වය සතු වේ.

මාගේ වගකීම සහ SLSAE 3050 (සංශෝධිත) සමග අනුකූලවීම

මාගේ වගකීම වනුයේ, ප්‍රකාශය අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලියකියවිලි මත පදනම් වන්නේ ද සහ එමගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයෙහි නිර්මිතිය හා බලාත්මකභාවය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගන්නා ලද ක්‍රියාවලිය නිසි පරිදි පිළිබිඹු වන්නේ ද යන්න පරීක්ෂා කිරීමයි.

මවිසින් මෙම කාර්යභාරය ඉටු කරන ලද්දේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද, ''සහතිකත්ව ප්‍රතිඥාත සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE) 3050 (සංශෝධිත), අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධ බැංකු සඳහා වන සහතිකත්ව වාර්තාව අනුවය.

මෙම ප්‍රමිතිය මගින්, කළමනාකාරිත්වය විසින් සියළු ප්‍රමාණාත්මක අංශයන් ආශ්‍රිතව, අභ්‍යන්තර පාලනය සම්බන්ධ ප්‍රකාශය පිළියෙල කරන ලද්දේද, යන්න පිළිබඳ සීමිත සහතිකත්වයක් ලබාගැනීම සඳහා මවිසින් සැලසුම් කිරීම හා ක්‍රියාපටිපාටීන් අනුගමන කිරීම අවශ්‍ය කෙරේ.

මෙම කාර්යභාරයෙහි අරමුණ උදෙසා, කවර හෝ වාර්තාවක් යතාවත් කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මා වගකීමෙන් නොබැඳෙන අතර, මෙම කාර්යභාරය තුළදී, මවිසින් මූල්‍යමය තොරතුරු සම්බන්ධ කිසිදු විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොකරන ලදී.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඉටු කරන ලද කාර්යභාරයෙහි සාරාංශය

මවිසින් මෙම කාර්යභාරය ඉටු කරන ලද්දේ, ප්‍රකාශය අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලියකියවිලි මත පදනම් වන්නේ ද සහ එමගින් බැංකුවේ මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගන්නා ලද ක්‍රියාවලිය නිසි පරිදි පිළිබිඹු වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහාය.

මෙහිදී අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටීන්, මූලිකව බැංකුවේ සේවකයින්ගෙන් සිදු කරන ලද විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලිය වෙත සහාය දක්වන ලද පැවති ලියකියවිලි නියැදි පදනමක් මත පරීක්ෂාවන්ට සීමා විය.

SLSAE 3050 (සංශෝධිත) මගින්, මවිසින් ප්‍රකාශය මගින් සියළුම අවදානම් හා පාලනයන් ආවරනය වන්නේද, හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියාපටිපාටීන්හි බලාත්මකභාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවීය. SLSAE 3050 (සංශෝධිත) මගින්, වාර්ෂික වාර්තාවේ අනාවරනය කරනු ලැබ ඇති කවර හෝ සැළකිය යුතු ගැටළුවක් ආශ්‍රිත ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලැබ ඇති ක්‍රියාවලීන් මගින්, සත්‍ය වශයෙන්ම, අදාළ ගැටළු නිරාකරණය වන්නේද යන්න පිළිබඳව සළකා බැලීමද අවශ්‍ය නොවීය.

ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා යොදාගන්නා ලද සිදුවීම් හෝ ගනුදෙනුව, බැංකුවේ ස්වභාවය පිළිබඳ මාගේ අවබෝධය ආශ්‍රිතව, තෝරාගත ක්‍රියාපටිපාටීන් මාගේ විනිසුම මත රඳාපවතී.

මවිසින් ලබාගත් සාක්ෂි මාගේ නිගමනය සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය වන බව මාගේ විශ්වාසය වේ.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්ව, වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරනු ලැබ ඇති ප්‍රකාශය, බැංකුවේ මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගන්නා ලද ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය සමග නොගැලපෙන බවට විශ්වාස කල හැකි කිසිදු කරුණක් මාගේ අවධානයට යොමු නොවීය.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

අවශ්‍යතාවය

මෙම වාර්තාව 2007 අංක 12 දරණ බැංකු පනත් නියෝගයෙහි වගන්ති 3 (8) (ii) (අ) ප්‍රකාරව නිකුත් කරනු ලැබ ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශයන් මත පදනම්ව සකසනු ලැබ ඇත.

වගකීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ප්‍රමාණවත්බව සහ ඵලදායීතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ. කෙසේවුවද එවැනි ක්‍රමවේදයක් සකසනු ලැබ ඇත්තේ බැංකුවේ ප්‍රතිපත්ති හා ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කරගැනීමට අසමත් වීමේ අවදානම තුරන් කිරීමට වඩා බැංකුවේ ප්‍රමුඛ අවදානම් ක්ෂේත්‍රයන් පිළිගත හැකි අවදානම් ස්වභාවයක් තුළ කළමනාකරණය කරගැනීමේ අරමුණිනි. මෙම තත්ත්වය තුළ, මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය අලාභ හෝ වංචා ආශ්‍රිත ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන්, අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සපයනු ලැබිය හැක්කේ, සාධාරණ සහතිකයක් වන නමුත් පූර්ණ සහතිකයක් නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩල විමර්ශන ක්‍රියාවලිය

අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආවර්තිතව විමර්ශනයට ලක් කරන ලද අතර එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් මාලාවට අනුකූල වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ උපදෙස් මාලාවෙහි එන අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමේ මූලධර්මයන් සැළකිල්ලට ගනිමින් අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයුමට ලක් කරනු ලැබ ඇත. මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම හා පාලනය සම්බන්ධ ස්වකීය ප්‍රතිපත්ති හා ක්‍රියාපාටීන් ක්‍රියාත්මක කිරීමේදී, කළමනාකාරීත්වය මගින් අදාළ අවදානම් හඳනාගැනීම හා මුහුණ පෑ අවදානම් තක්සේරුව, සහ අදාළ අවදානම් අවම කිරීම හා පාලනය කිරීම සඳහා යෝග්‍ය වන අභ්‍යන්තර පාලනයන් සැකසීම, මෙහෙයවීම සහ අධීක්ෂණය යන අංශයන්ගෙන් අධ්‍යක්ෂ මණඩලය වෙත සහාය දෙනු ලබයි.

ක්‍රියාවලියට අදාළ ප්‍රධාන විශේෂාංග

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව සහ සුපිළිපන් බව සමාලෝචනය කිරීමේදී යොදාගත් ප්‍රධාන ක්‍රියාවලීන් වෙත පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ.

- බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතු වල ඵලදායීතාවය සහ සමාගමෙහි මෙහෙයුම්වල සංස්ථාපිත අරමුණු, ක්‍රමෝපායන් සහ වාර්ෂික අයවැය කෙරෙහි මෙන්ම අනුමත ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝගයන් කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන, ණය සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අනු කමිටු ස්ථාපනය කෙරිණි.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සියළුම ගනුදෙනු වලදී මූල්‍යමය හා සෙසු පාලනයන් ආශ්‍රිත මෙහෙයුම් සංග්‍රහය අනුමත කරන ලදී. එම සංග්‍රහයෙහි දැක්වෙන ක්‍රියාපටිපාටීන් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සන්නිවේදනය කෙරිණි.
- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින්, නියැදි හා ආවර්තිත ක්‍රියාපටිපාටීන් භාවිත කරමින් අබණ්ඩවම අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් කෙරෙහි අනුකූලතාව සහ ඵලදායීත්වය පරීක්ෂා කරනු ලබන අතර, අනනුකූලතාවය සම්බන්ධ කවර හෝ සැළකිය යුතු සොයාගැනීමක් විශේෂ කොට දක්වනු ලැබේ. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් ලබාදීමේ අරමුණින් යුතුව, ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින්, සියළුම ඒකකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකෙරේ.
- වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමාලෝචනය සඳහා ඔවුන්ගේ ආවර්තිත රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුව වෙත භාරදෙනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, අභ්‍යන්තර විගතන අංශය, නියාමන අධිකාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කොට, අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය තක්සේරු කරනු ලැබේ. ඔවුන් විසින් විගණනයන්හි විෂයපථය හා තත්ත්වය සම්බන්ධ නිශ්චිත අවධානයකින් යුතුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනයද සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තා ආවර්තිත පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කෙරේ.
- බැංකුව මගින් 2018 දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS – 16-මූල්‍ය උපකරණද 2019 දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS – 16- බදු ද යොදා ගැනිනි. ඉහත සඳහන් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් යොදා ගැනීමට මුලින්ම අදාළ වූ ක්‍රියාවලීන් හා ක්‍රියාපටිපාටීන් බාහිර විගණකවරුන් නියාමනයන් සහ විගණන කමිටුවෙහි ප්‍රතිචාර මත පදනම් තවදුරටත් සවිමත් කෙරෙනු ඇත. බැංකුව විසින් අබණ්ඩවම ණය හා අත්තිකාරම් හානිවීම මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

තහවුරු කිරීමේ ප්‍රකාශය

ඉහත දක්වන ලද ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

ප්‍රකාශය බාහිර විගණකවරුන් විසින් විමර්ශනය කිරීම

බාහිර විගණකවරුන් විසින් 2019 දෙසැම්බර් 31 දින අවසන් වූ වසර සඳහා වන ඉහත දක්වෙන අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශයට විමර්ශනයට ලක් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකසුම සහ බලාත්මකභාවය විමර්ශනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගැනුනු ක්‍රියාවලිය, ඔවුන් විසින් ලද අවබෝධය අනුව නොගැළපීමක් වේය යන්න විශ්වාස කිරීමට හේතුවන ආකාරයේ යමක් ඔවුන්ගේ අවධානයට ලක් වීද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු වේ.

සභාපති - විගණන කමිටුව

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

2020 මැයි 28 වැනි දින

මූලික වාර්තා

108 විගණකාධිපති වාර්තාව
113 ආදායම් ප්‍රකාශය
114 විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය
115 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
116 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
117 ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය
118 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/F/RDB/1/19/18

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date ২৭ May 2020

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මතය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (" බැංකුව") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ ව්‍යක්තියේ නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු යනු වර්තමාන කාලපරිච්ඡේදයෙහි මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනයෙහි, මාගේ ව්‍යක්තීයමය විනිසුම අනුව, වඩාත්ම සැලකිය යුතු කරුණු වේ. සමස්තයක් වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනයේ සන්දර්භය තුළ මෙම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද අතර, ඒ අනුව මාගේ විගණන මතය සකසා ගැනීමේදී, මවිසින් මෙකී කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් සපයනු නොලැබේ. පහත දක්වෙන එක් එක් කරුණ සඳහා, අදාළ කරුණ සම්බන්ධයෙන් විගණනය සිදුකරන ලද ආකාරය පිළිබඳ මාගේ විස්තරය එකී සන්දර්භය තුළ සපයනු ලැබ ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රධාන විගණන කරුණ

වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන මෙහිදී ප්‍රධාන විගණන කරුණ වශයෙන් සැළකුණි. එය ප්‍රධාන විගණන කරුණ වශයෙන් සැළකීම උදෙසා, වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ වල ප්‍රමාණාත්මකභාවය (සහ ඒ සම්බන්ධ හානිකරණ ප්‍රතිපාදන), සංකීර්ණ මානවීය ගණනයන් භාවිතය, කළමනාකාරීත්වය විසින් මූල්‍යමය වාර්තාකරණ ප්‍රමිති 9: මූල්‍ය උපකරණ (SLFRS 9) යොදාගැනීමේදී සහ හානිකරණ ඇස්තමේන්තුවේදී පැවති වාස්තවිකත්වය මගින් පදනම සකසන ලදී.

2019 දෙසැම්බර් 31 දිනට, බැංකුවේ සමස්ත වත්කම් වලින් සියයට 68 ක ප්‍රතිශතයක් වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය හා ලැබිය යුතු දෑ මගින් සමන්විත වූ අතර එය රු.මිලියන 7,667 ක් වූ හානිකරණ ප්‍රතිපාදනයෙන් ශුද්ධව රු.මිලියන 136,206 ක් වශයෙන් දැක්වුනි. (සටහන 20)

එබඳු ගණනයන්හිදී කළමනාකාරීත්වය විසින් යොදාගනු ලැබූ සැළකිය යුතු ඇස්තමේන්තු හා උපකල්පනයන් සහ හානිකරණ ප්‍රතිපාදනය සඳහා පදනම සටහන 3.1.1.7 හි අනාවරණය කෙරේ.

මාගේ විගණනය මගින් ප්‍රධාන විගණන කරුණ සම්බන්ධයෙන් කටයුතු කරන ලද ආකාරය

හානිකරණ ප්‍රතිපාදනයෙහි සාධාරණත්වය ඇගයීම සඳහා, මාගේ විගණන ක්‍රියාවලිය (වෙනත් දෑ අතර) පහත දැක්වෙන කරුණු වලින් සමන්විත විය:

- මවිසින් ණය සහ අත්තිකාරම් සම්බන්ධ පාලනයන්හි නිර්මිති බලාත්මකභාවය තක්සේරු කරන ලද අතර, එයට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සිදුකරන ලද හානිකරණය සම්බන්ධ සැළකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් අධීක්ෂණ, සමාලෝචන හා අනුමැති මට්ටම ඇගයුමට ලක් කිරීම ඇතුළත් විය.
- පාදක වන ගණනයන් හා දත්ත පරීක්ෂාවට භාජනය කෙරිණි.
- ඉහත කරුණු වලට අමතරව, පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාපටිපාටීන් අනුගමනය කෙරිණි:

හානිකරණය වෙනුවෙන් තනි තනිව ඇගයුමට ලක් කරන ලද ණය හා අත්තිකාරම් නියැදියක් සඳහා ;

- මවිසින්, හානිකරණ සිදුවීමක් සිදුවී ඇතිද යන්න නිර්ණය කිරීම සඳහා කළමනාකාරීත්වය මගින් යොදාගනු ලැබූ ප්‍රධාන ක්‍රියාපටිපාටිය ඇගයුමට ලක් කෙරිණි:
- හානිකරණ දර්ශකයන් පැවති අවස්ථාවන්හිදී, මවිසින්, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ, වට්ටම්ගත අනුපාතයන් සහ රඳවාගත් ඇපයන්ද ඇතුළුව කළමනාකාරීත්වයේ ඇස්තමේන්තුගත අනාගත අයකරගැනීම සම්බන්ධ සාධාරණත්වය පිළිබඳව ඇගයුමට ලක් කෙරිණි. මෙහිදී මවිසින්, නියැදි පදනමක් මත, පෙර ඇස්තමේන්තුගත අනාගත අයකරගැනීම් වලට සාපේක්ෂව සැබෑ අයකර ගැනීම්ද සැසඳුමට ලක් කරන ලදී:

හානිකරණය වෙනුවෙන් සාමූහිකව ඇගයුමට ලක් කරන ලද ණය හා අත්තිකාරම් සඳහා :

- අදාළ මූල ලියකියවිලි, තොරතුරු තාක්ෂණ පද්ධතීන්හි විස්තර සහ අදාළ ගණනයන් නැවත සිදු කරමින් මවිසින් පාදක වූ තොරතුරු හා ගණනයන් හි සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී.
- ප්‍රසිද්ධියේ පවතින දත්ත හා තොරතුරු මූලයන් සමග සසඳමින්, මවිසින්, විවිධ ණය කළඹ සම්බන්ධයෙන් ඔවුන්ගේ විනිසුම සඳහා කළමනාකාරීත්වය විසින් යොදාගනු ලැබූ සාර්වආර්ථික හා සෙසු සාධකයන්හි සාධාරණත්වය ද සළකා බලන ලදී.
- මවිසින්, සටහන් 3.1.1.7, 14, 20 සහ 46 හි දක්වා ඇති ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශ අනාවරණයන්හි ප්‍රමාණවත්බව ඇගයුමට ලක් කෙරිණි.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

බැංකුවේ 2019 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

බැංකුවේ 2019 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශයන් සහ ඒ සම්බන්ධ මාගේ විගණන වාර්තාව හැර වෙනත් කරුණු වලින් සමන්විත වේ. වෙනත් තොරතුරු සඳහා කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ. බැංකුවේ 2019 වාර්ෂික වාර්තාව මෙම විගණකගේ වාර්තා දිනයෙන් පසු මා වෙත ලැබීමට අපේක්ෂිතය.

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරනය නොකෙරෙන අතර ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක සහතිකත්ව නිගමනයක් ප්‍රකාශයට පත් කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ මාගේ විගණනය ආශ්‍රිතව, මාගේ වගකීම වනුයේ ඒවා පවතින විට ඉහත හඳුනාගනු ලැබූ වෙනත් තොරතුරු කියවා බැලීම සහ එසේ කිරීමේදී, වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශයන් සමග ප්‍රමාණාත්මකව අසංගත වේද නැතිනම් විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයට පත් වීමක් සහිත වේද යන්න සළකාබැලීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා බැංකුව විසින් සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණශීලීභාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී.

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක සාවද්‍ය අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොගැනීමට වඩා වැඩි ය, මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.
- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගතිමි, නමුත් එසේ සිදුකරන්නේ බැංකුවේ සමූහයේ අභ්‍යන්තර පාලනයෙහි බලත්මකභාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරිත්වය මගින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩව පැවැත්ම අවසන් වීමට හේතු විය හැක.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ වේලාව සහ සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්ය:

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනෙන පරිදි බැංකුව විසින් 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියෙහි අවශ්‍යතාවය අනුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත්තේය.
- ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වර්ෂය හා සංගත වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි මා විසින් පසුගිය වර්ෂය සඳහා සිදුකරන ලද සියළුම නිර්දේශ කිරීම් අන්තර්ගත වේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ක්‍රියාවට නංවන ලද ක්‍රියාපටිපාටීන් සහ ප්‍රමාණාත්මක කරුණු වලට සීමාව රැස් කරගනු ලැබූ සාක්ෂි මත පදනම්ව, පහත දැක්වෙන කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය;

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ නියමයට අනුව බැංකුව විසින් අත්සන් කරන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් පිළිබඳව ව්‍යාපාරයේ සාමාන්‍ය හේතුවට පිටින් ඇති සෘජු හෝ වක්‍ර උනන්දුවක් බැංකුවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට ඇති බව සඳහන් කිරීමට.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ නියමයට අනුව බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ වන ඕනෑම ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට බැංකුව අනුකූල වී නොමැති බව සඳහන් කිරීමට.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ නියමයට අනුව බැංකුව සිය බලතල, කාර්යයන් සහ යුතුකම් අනුව කටයුතු කර නොමැති බව සඳහන් කිරීමට.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ නියමයට අනුව බැංකුවේ සම්පත් කාල රාමුව තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම් සහිත ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොමැති බවට සඳහන් කිරීමට කිසිවක්, සිදු කරන ලද ක්‍රියාපටිපාටි සහ ලබාගත් ප්‍රමාණාත්මක කරුණු වලට පමණක් සීමා වූ සාක්ෂි අනුව මගේ අවධානයට යොමු වී නැත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2019	2018
		රු.	රු.
දළ ආදායම	5	27,507,821,054	26,070,610,605
පොළී ආදායම		26,357,071,298	24,865,108,981
පොළී වියදම්		(13,903,881,276)	(12,959,526,709)
ශුද්ධ පොළී ආදායම	6	12,453,190,022	11,905,582,272
ගාස්තු හා කොමිස් ආදායම		1,134,421,657	1,186,795,173
ගාස්තු හා කොමිස් වියදම		(278,304,299)	(259,105,166)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	7	856,117,358	927,690,007
ශුද්ධ වෙළඳ ලාභය/(අලාභය)	8	4,757,039	1,215,762
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) ආදායම්	9	11,571,062	17,490,689
මුළු මෙහෙයුම් ආදායම		13,325,635,480	12,851,978,730
හානිකරණ වියදම	10	(2,408,748,853)	(1,409,784,095)
ශුද්ධ මෙහෙයුම් ආදායම		10,916,886,627	11,442,194,635
අඩු කලා - මෙහෙයුම් වියදම්			
කාර්ය මණ්ඩල වියදම්	11	(5,931,625,972)	(5,877,946,793)
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම්		(617,322,679)	(319,020,738)
වෙනත් වියදම්	12	(1,407,680,268)	(1,638,896,765)
මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද බදු		-	-
එකතු කල අගය මත බදු වලට පෙර මෙහෙයුම් ලාභය		2,960,257,709	3,606,330,339
මූල්‍ය සේවා මත බදු	13	(1,738,097,299)	(1,503,248,448)
බදු පෙර ලාභය		1,222,160,409	2,103,081,891
බදු වියදම්	14	(723,565,878)	(1,029,495,530)
වසර සඳහා ලාභය		498,594,531	1,073,586,361
කොටසකට ඉපැයීම්			
කොටසකට ඉපැයීම් : මූලික	15	0.91	2.76

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දක්වේ.

මෙම වාර්තාවෙහි පිටු අංක 118 සිට 194 දක්වා ඉදිරිපත් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වේ. විගණකාධිපති වාර්තාව පිටු අංක 108 හි දක්වා ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2019	2018
		රු.	රු.
වසර සඳහා ලාභය		**498,594,531**	1,073,586,361
වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම්)			
ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණන අලාභය	33.3	**(111,761,620)**	(111,149,773)
ඉහත අගයන් මත විලම්බිත බදුකරණයේ බලපෑම	26.2	**31,293,253**	31,121,936
ශුද්ධ බදු මත, වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**(80,468,366)**	(80,027,837)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		**418,126,165**	993,558,524

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

මෙම වාර්තාවෙහි පිටු අංක 118 සිට 194 දක්වා ඉදිරිපත් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වේ. විගණකාධිපති වාර්තාව පිටු අංක 108 හි දක්වා ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	2019	2018
		රු.	රු.
වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	17	**2,750,187,219**	689,184,136
බැංකු තැන්පතු	18	**9,798,242,492**	6,496,628,053
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ උපකරණ	19	**123,000**	115,600
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ	20	**136,205,641,441**	133,432,804,004
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ	21	**45,664,745,400**	27,920,326,465
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	22	**2,289,919**	4,176,342,999
දේපළ, පිරියත හා උපකරණ	24	**1,228,419,894**	1,275,785,603
අස්පෘශ්‍ය වත්කම්	25	**45,356,343**	60,787,719
භාවිත හිමිකම් වත්කම්	25.1	**855,183,154**	-
විලම්බිත බදු වත්කම්	26	**696,316,484**	467,332,859
වෙනත් වත්කම්	27	**2,732,423,840**	2,418,011,987
මුළු වත්කම්		**199,978,929,186**	176,937,319,425
වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	28	**22,050,009,005**	11,098,334,822
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	29	**149,599,829,047**	141,559,973,557
නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් මුදල්	30	**4,707,852,534**	4,707,852,534
ප්‍රවර්තන බදු වගකීම්	31	**448,881,448**	473,833,076
වෙනත් වගකීම්	32	**5,970,920,446**	2,460,286,430
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	33	**2,236,115,128**	1,926,924,377
මුළු වගකීම්		**185,013,607,608**	162,227,204,796
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	34	**8,047,229,930**	8,047,229,930
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	35	**742,261,195**	717,331,468
රඳවාගත් ඉපැයුම්	36	**2,421,534,400**	2,315,905,812
වෙනත් සංචිත	37	**3,754,296,053**	3,629,647,420
මුළු කොටස්හිමිකරුවන්ගේ ස්කන්ධය		**14,965,321,578**	14,710,114,630
මුළු ස්කන්ධය හා වගකීම්		**199,978,929,186**	176,937,319,425
අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්	38	**230,705,990**	212,759,167

මෙම වාර්තාවෙහි පිටු අංක 118 සිට 194 දක්වා ඉදිරිපත් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සමඟින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වේ. විගණකාධිපති වාර්තාව පිටු අංක 108 හි දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශයන් 1988 අංක 30 දරණ බැංකු පනතෙහි සහ 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතෙහි විධි විධාන වලට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇති බවට මම මෙයින් සහතික වෙමි.

පී එස් එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

ටී කුහන්
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර, මෙය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

සභාපති

අධ්‍යක්ෂ

2020 මැයි 29 වන දින
කොළඹ දී ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2019	2018
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
බදු පෙර ලාභය		**2,960,257,709**	3,606,330,339
ගැලපීම්:			
බදු පෙර ලාභයෙහි ඇතුළත් මුදල් - නොවන අයිතම	41	**4,061,421,032**	2,009,117,605
මෙහෙයුම් වත්කම් වල වෙනස්වීම්	42	**(7,274,252,820)**	(7,759,296,804)
මෙහෙයුම් වගකීම් වල වෙනස්වීම්	43	**19,218,607,096**	2,335,364,021
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත ගෙවන ලද දායකත්වය	33.1	**(146,286,891)**	(125,672,259)
මූල්‍ය සේවාවන් මත එකතු කල අගය මත බදු		**(1,659,200,694)**	(1,025,230,834)
බදු ගෙවීම්	31	**(915,600,248)**	(958,313,173)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		**16,244,945,185**	(1,917,701,106)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම්	24	**(217,854,701)**	(363,021,456)
අස්පෘශ්‍ය වත්කම් වල ශුද්ධ මිලදී ගැනීම්	25	**(13,815,989)**	(50,630,424)
ස්ථාවර තැන්පතු වල ආයෝජන (මාස තුනට වැඩි)		**2,287,604,755**	(1,493,138,238)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ආදායම		**4,203,104**	12,009,452
ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ		**2,060,137,169**	(1,894,780,666)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
සාමාන්‍ය කොටස් නිකුතුවෙන් ශුද්ධ ලැබීම්		**-**	-
මෙහෙයුම් කල්බදු පොළී වියදම		**(81,828,219)**	-
මෙහෙයුම් කල්බදු මුල් මුදල ගෙවීම		**(276,245,501)**	-
කාලීන ණය මගින් ශුද්ධ ආදායම		**7,534,500,000**	-
ලාභාංශ මත ගෙවන ලද පොළිය	30.1	**(535,784,685)**	(535,784,685)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		**6,640,641,595**	(535,784,685)
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ඉහළයාම/(පහළයාම)		**24,945,723,949**	(4,348,266,457)
මුදල් හා මුදල් සමාන දෑ - ආරම්භක ශේෂය		**9,639,016,719**	13,987,283,176
මුදල් හා මුදල් සමාන දෑ - අවසාන ශේෂය		**34,584,740,669**	9,639,016,719
මුදල් හා මුදල් සමාන දෑ සැසඳුම			
මුදල් හා මුදල් සමාන දෑ	17	**2,750,187,219**	689,184,136
බැංකු වල වාසිදායක ශේෂයන්			
බැංකු සමග ස්ථාපන	18	**9,798,274,942**	6,496,692,932
මාස තුනට අඩු ස්ථාවර තැන්පතු	21.2	**22,571,266,384**	2,520,602,739
බැංකු වල අවාසිදායක ශේෂයන්		**(534,987,877)**	(67,463,088)
		34,584,740,669	9,639,016,719

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වේ.

මෙම වාර්තාවෙහි පිටු අංක 118 සිට 194 දක්වා ඉදිරිපත් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වේ. විගණකාධිපති වාර්තාව පිටු අංක 108 හි දක්වා ඇත.

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	විශේෂ සංචිත අරමුදල	සාමාන්‍ය සංචිත අරමුදල	රඳවාගත් ඉපැයීම්	එකතුව
	සටහන 34	සටහන 35	සටහන 37	සටහන 37	සටහන 36	
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2018 ජනවාරි 1 දිනට ශේෂය	3,870,936,931	663,652,150	518,042,478	2,843,208,353	1,716,908,747	9,612,748,660
SLFRS 9 ආදේශ කරගැනීම මත බලපෑම	-	-	-	-	(72,485,552)	(72,485,552)
2018 ජනවාරි 1 දිනට SLFRS 9 යටතේ ප්‍රතිප්‍රකාශිත ශේෂය	3,870,936,931	663,652,150	518,042,478	2,843,208,353	1,644,423,195	9,540,263,108
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	-	-	-	-	1,073,586,361	1,073,586,361
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	-	-	(80,027,837)	(80,027,837)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	-	-	993,558,524	993,558,524
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත් කොටස් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු						
නිකුත් කල ප්‍රකාශිත ප්‍රාග්ධනය	4,176,292,999	-	-	-	-	4,176,292,999
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	53,679,318	-	-	(53,679,318)	-
විශේෂ සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	-	53,679,318	-	(53,679,318)	-
සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	-	-	214,717,272	(214,717,272)	-
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත් කොටස් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු	4,176,292,999	53,679,318	53,679,318	214,717,272	(322,075,908)	4,176,292,999
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,047,229,930	717,331,468	571,721,796	3,057,925,624	2,315,905,812	14,710,114,630
2019 ජනවාරි 1 දිනට ශේෂය	8,047,229,930	717,331,468	571,721,796	3,057,925,624	2,315,905,812	14,710,114,630
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	-	-	-	-	498,594,531	498,594,531
වෙනත් විස්තීර්ණ ආදායම්	-	-	-	-	(80,468,366)	(80,468,366)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	-	-	-	-	418,126,165	418,126,165
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත් කොටස් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු						
නිකුත් කල ප්‍රකාශිත ප්‍රාග්ධනය	-	-	-	-	-	-
ගෙවන ලද ලාභාංශ	-	-	-	-	(193,546,847)	(193,546,847)
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	24,929,727	-	-	(24,929,727)	-
විශේෂ සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	-	24,929,727	-	(24,929,727)	-
පොදු සංචිත අරමුදල වෙත මාරුකරන ලද	-	-	-	99,718,906	(99,718,906)	-
ඒකාබද්ධ වීමෙන් අතිරික්තය	-	-	-	-	30,627,630	30,627,630
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත් කොටස් කොටස් හිමිකරුවන් සමග ගනුදෙනු	-	24,929,727	24,929,727	99,718,906	(312,497,577)	(162,919,217)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,047,229,930	742,261,195	596,651,523	3,157,644,530	2,421,534,400	14,965,321,578

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වේ.

මෙම වාර්තාවෙහි පිටු අංක 118 සිට 194 දක්වා ඉදිරිපත් කෙරෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වේ. විගණකාධිපති වාර්තාව පිටු අංක 108 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍යය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, 1985 තෙක් දිවෙන්නා වූ අතීත කාල වකවානුවක සිට ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු කාණ්ඩය යටතේ ස්ථාපිත දිස්ත්‍රික් මට්ටමේ බැංකු වශයෙන් ක්‍රියාත්මක විය. ඉන් අනතුරුව වසර 1997 දී, එබඳු ප්‍රාදේශීය සංවර්ධන බැංකු දාහතක් පළාත් මට්ටමේ බැංකු හයක් බවට ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ කෙරිණි. ඒවා රජරට, රුහුණ, වයඹ, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු වශයෙන් ක්‍රියාත්මක විය. 2010 මැයි මස, මෙකී බැංකු හය ජාතික මට්ටමේ තනි බැංකුවක් බවට පත් කරමින් එය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වශයෙන් නම් කෙරිණි. බැංකුව 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපනය කෙරිණි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය කැළණිය, වෙදමුල්ල, නුවර පාර, අංක 933 දරණ ස්ථානයේ පිහිටා ඇත.

වසර තුළදී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් 2019 අප්‍රියෙල් 1 දිනට ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ වත්කම් හා වගකීම් ඒකාබද්ධකරණයට ලක් කරන ලද අතර ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 23 හි දක්වේ.

2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ස්ථිර, පුහුණු හා කොන්ත්‍රාත් ශ්‍රම බලකාය 3,469 ක් විය. (2018 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 3,381)

1.2 ප්‍රධාන ක්‍රියාකාරම් සහ මෙහෙයුම්වල ස්වභාවය

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ මූලික වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත මූල්‍යමය සහාය ලබාදෙමින්, කෘෂිකාර්මික, කර්මාන්ත, වෙළඳ, වාණිජ, පශු සම්පත්, ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් සවිබල ගැන්වීම තුළින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි පහසුකම් සැලසීමයි. තවද බැංකුව මගින් වසර තුළදී කල්බදු ගනුදෙනු හඳුන්වාදෙන ලදී.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සහ එහි සංශෝධන, 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධන හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳී සිටී.

1.4 මූල්‍ය ප්‍රකාශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශයන් 2020 මැයි 29 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුතුව සඳහා අනුමත කරන ලදී.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 මිනුම්කරණයේ පදනම

පහත දක්වෙන ප්‍රමාණාත්මක අයිතම හැර, මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරන ලදී.

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම ආයුගණන වශයෙන් තක්සේරු කොට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි ප්‍රවර්තන වටිනාකම වශයෙන් හඳුනාගැනේ.
- වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍යමය වත්කම් සාධාරණ අගයට මිනුම් කෙරේ.

2.1.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් වල වෙනස්වීම්

මෙම මූල්‍ය ප්‍රකාශයන්හිදී බැංකුව මගින් ප්‍රථම වරට 2019 ජනවාරි 1 හෝ ඉන් පසු ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන, SLFRS 16 සහ IFRIC 23 ප්‍රමිතීන් ආදේශ කරගැනුනි.

SLFRS 16 - කල්බදු

SLFRS 16 මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 17 - ප්‍රතිස්ථාපනය කෙරේ. එම ප්‍රමිතිය මගින් කල්බදු හඳුනාගැනීම, මිනුම්කරණය, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සම්බන්ධ මූලධර්ම දක්වනු ලබන අතර බදුගැනුම්කරු විසින් බොහොමයක් කල්බදු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගැනීම අවශ්‍ය වේ.

SLFRS 16 යටතේ බදු අලෙවිකාර ගිණුම්කරණය LKAS 17 වෙතින් සැළකිය යුතු අයුරින් නොවෙනස්ව පවතී. බදු අලෙවිකරුවන් විසින් අඛණ්ඩවම LKAS 17 හි පරිදිම සමාන වර්ගීකරණ ප්‍රමිතිය භාවිත කරමින් කල්බදු මෙහෙයුම් කල්බදු සහ මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කරයි. එමනිසා බැංකුව බදු අලෙවිකරු වන කල්බදු සඳහා SLFRS 16 හි බලපෑමක් ඇති නොවේ.

බැංකුව මගින් නවීකරණය කරන ලද ප්‍රත්‍යාවලෝකන එළඹුම භාවිත කරමින් SLFRS 16 ප්‍රමිතිය ආදේශ කරගැනුනු අතර ඒ යටතේ මූලික ආදේශ කිරීමේ සමුච්චිත බලපෑම 2019 ජනවාරි 1 වැනි දින රඳවාගත් ඉපැයුම් තුළ හඳුනාගැනිනි. බැංකුව මගින් පරිවර්තනයේ ප්‍රායෝගිකත්වය උදෙසා 2019 ජනවාරි 1 දිනට කිසියම් ගිවිසුමක කල්බදු ඇතුළත් වේද යන්න තක්සේරු නොකොට සිටීමට අදහස් කරන ලදී. ඒ වෙනුවට, බැංකුව මගින් මෙම ප්‍රමිතිය ඉහතදී මූලික ආදේශන දිනයේදී LKAS 17 සහ IFRIC 4 යොදාගනිමින් කල්බදු වශයෙන් හඳුනාගන්නා ලද ගිවිසුම් වලට පමණක් ආදේශ කරන ලදී.

බැංකුව සතුව විවිධ ශාඛාවන් හා මෝටර් රථ සඳහා කල්බදු ගිවිසුම් පවතී. SLFRS 16 ආදේශ කරගැනීමට පෙරාතුව, බැංකුව විසින් සිය එක් එක් කල්බදු (බදු ගැනුම්කරු වශයෙන්) ආරම්භක දිනයේදී මූල්‍ය කල්බදු හෝ මෙහෙයුම් කල්බදු වශයෙන් වර්ග කෙරිණි. 2019 ජනවාරි 1 දිනට පෙර ගිණුම්කරණ ප්‍රමිතිය සඳහා සටහන 3.1.3 බලන්න.

SLFRS 16 ආදේශ කරගැනීමෙන් අනතුරුව, බැංකුව මගින් කෙටි කාලීන කල්බදු හා පහළ වටිනාකමක් සහිත කල්බදු හැරුනුවිට, සියළුම කල්බදු සඳහා තනි හඳුනාගැනීමේ හා මිනුම්කරණ එළඹුමක් භාවිත කෙරිණි.

පෙර මෙහෙයුම් කල්බදු වශයෙන් ගිණුම්ගත කරන ලද කල්බදු

බැංකුව මගින් කෙටි කාලීන කල්බදු හා පහළ වටිනාකමක් සහිත කල්බදු හැරුනුවිට, මෙහෙයුම් කල්බදු වශයෙන් පෙර වර්ගීකරණය කරන ලද කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හා වගකීම් හඳුනාගැනිනි. මූලික ආදේශන දිනයේදී වෘද්ධි ණය ලබාැනීමේ අනුපාතය භාවිත කිරීමේදී හැර, බොහොමයක් කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හඳුනාගැනුනේ අදාළ ප්‍රමිතිය සැම විටම ආදේශනය කරන ලද ආකාරයෙන් ධාරණ වටිනාකම මත පදනම්වය. ඇතැම් අවස්ථාවන්හිදී, භාවිත හිමිකම් වත්කම් කල්බදු වගකීමට සමාන වටිනාකමක් මත පදනම්ව හඳුනාගෙන, කවර හෝ පෙරදායක වූ හෝ උපචිත කල්බදු ගෙවීම් සඳහා ගැළපීමෙන් අනතුරුව මූලික ආදේශන දිනයේදී වෘද්ධි ණය ලබාැනීමේ අනුපාතය භාවිත කරමින් වට්ටම්ගත කෙරිණි.

බැංකුව මගින් පහත දැක්වෙන අනුමත ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගැනුනි.

- සාධාරණ ලෙස සමාන ගති ලක්ෂණ සහිත කල්බදු කළඹකට ඒකල වට්ටම් අනුපාතයක් යොදා ගැනීම.
- සංක්‍රමණ දිනයට පෙර කල්බදු ගැටළු සහගත තත්ත්වයක පවතින්නේද යන්න පිළිබඳ සිය තක්සේරුව මත විශ්වාසය තැබීම.
- සංක්‍රමණ දිනයේ සිට මාස 12ක් ඇතුළත කල් ඉකුත් වන්නා වූ කල්බදු වෙත නව කල්බදු මිනුම් නීතිරීති අදාළ කර නොගැනුනු අතර ඒවා කෙටි කාලීන කල්බදු වශයෙන් ගිණුම්ගත කෙරිණි.
- සංක්‍රමණ දිනයේදී භාවිත හිමිකම් වත්කම මිනුම්ගත කිරීමේදී කල්බදු සම්බන්ධ මූලික ඍජු පිරිවැය බැහැර කෙරිනි.
- කාලය දිගු කිරීමේ/අවසන් කිරීමේ වරණයන් සහිත ගිවිසුම් වල කල්බදු කාලසීමාව නිර්ණය කිරීමේ පසු දැක්ම ක්‍රමවේදය යොදා ගැනුනි.

ඉහත කරුණු මත පදනම්ව, 2019 ජනවාරි 1 දිනට :

- රු.මිලියන 1,039 ක භාවිත හිමිකම් වත්කම් හඳුනාගනිමින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ''භාවිත හිමිකම් වත්කම්'' ඇතුළත ඉදිරිපත් කෙරිණි.
- රු. මිලියන 998 ක අමතර කල්බදු වගකීම් හඳුනාගැනිනි. (වෙනත් වගකීම් යටතේ ඇතුළත් කෙරිණි)
- SLFRS 16 ආදේශ කරගැනීම මගින් බැංකුවේ රඳවාගත් ඉපැයුම් වෙත කිසිදු බලපෑමක් හෝ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය වෙත කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවේ.

IFRIC නිර්වචනය 23 - ''ආදායම් බදු කර්තව්‍යයන් මත අවිනිශ්චිතතාවය''

මෙම අර්ථදැක්වීම මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 - ''ආදායම් බදු'' යොදාගැනීම කෙරෙහි බලපාන අයුරින් බදු කර්තව්‍යයන් අවිනිශ්චිතතාවයන් සහිත වන විට ආදායම් බදු සඳහා ගිණුම් තැබීම පිළිබඳ තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කෙරේ. එය LKAS 12 හි විෂයපථයෙන් බැහැර බදු හෝ ගාස්තු සඳහා අදාළ නොවන අතර, එහිදී අවිනිශ්චිත බදු කර්තවයයන් හා සම්බන්ධිත පොලී සහ දඩ මුදල් ආශ්‍රිත අවශ්‍යතාවයන්ද විශේෂිතව ඇතුළත් නොවේ. අර්ථදැක්වීම මගින් පහත සඳහන් කරුණු විශේෂිතව අවධානය යොමු කෙරේ.

- කිසියම් ආයතනයක් විසින් අවිනිශ්චිත බදු කර්තව්‍යයන් වෙනම සළකා බැලෙන්නේ ද යන්න
- බදුකරණ අධිකාරීන් විසින් බදු පරීක්ෂාව පිළිබඳ කිසියම් ආයතනයක් විසින් සිදුකරනු ලබන උපකල්පන
- කිසියම් ආයතනයක් මගින් බදු වලට යටත් වන ලාභය (හෝ අලාභය), බදු පදනම්, භාවිත නොකල බදු අලාභයන්, භාවිත නොකළ බදු බැර සහ බදු අනුපාතයන් නිර්ණය කරනු ලබන ආකාරය
- කිසියම් ආයතනයක් සාධක හා තත්ත්වයන් හි වෙනස්වීම් සළකා බලනු ලබන ආකාරය

බැංකුව මගින් ආදායම් බදු කර්තව්‍යයන් සම්බන්ධ අවිනිශ්චිතතා හඳුනාගැනීමේදී සැළකිය යුතු විනිසුමක් යොදා ගැනේ. බැංකුව සංකීර්ණ වටපිටාවක් තුළ මෙහෙයුම් සිදුකරන බැවින්, එම නිර්වචනය මගින් එහි මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑමක් ඇති වේද යන්න සම්බන්ධයෙන් බැංකුව ඇගයුමට ලක් කෙරිණි. අර්ථදැක්වීම ආදේශ කරගනු ලැබීමෙන් අනතුරුව, බැංකුව මගින් එය සතුව කවර හෝ අවිනිශ්චිත බදු ස්ථාවරයන් පවතීද යන්න සැළකිල්ලට ගනු ලැබූ අතර එහිදී පැවරුම් මිළකරණය ආශ්‍රිත කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරිණි. එකිනෙකට වෙනස් අධිකරණ තීන්දු සම්බන්ධ බැංකුවේ බදු ලිපිගොනු ගත කිරීම් වල පැවරුම් මිළකරණයට අදාළ අඩු කිරීම් ඇතුළත් වන අතර බදුකරණ අධිකාරීන් හට එකී බදු කාර්යයන්ට අභියෝග කළ හැකි වේ. එමනිසා, එහි බදු අනුකූලතා මත පදනම්ව ස්වකීය බදු කර්තවයයන් බදු අධිකාරීන් විසින් පිළිගනු ලබනු ඇතැයි සමූහය තීරණය කරයි. බැංකුවෙහි මූල්‍ය ප්‍රකාශ කෙරෙහි අර්ථදැක්වීමෙහි බලපෑමක් නොමැත.

ඉහත දක්වන ලද වෙනස්වීම් හැරුනුකොට, බැංකුව මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කෙරෙන සියළුම කාලපරිච්ඡේදයන් සඳහා විධිමත් ආකාරයෙන් ගිණුම්කරණ ප්‍රමිතීන් යොදාගනු ලැබ ඇත.

2.1.2 පොදු පාලනය යටතේ පවතින ව්‍යාපාර සංයෝජන

පොදු පාලනය යටතේ පවතින සමාගම් අතර ව්‍යාපාර සංයෝජනයන් පොලී සංචයකරණ ක්‍රමවේදය යොදාගනිමින් ගිණුම්ගත කෙරේ. ඒ අනුව, සංයෝජිත සමාගම් වල වත්කම් හා වගකීම් ඒවායේ ධාරණ අගය අනුව නිරූපනය කෙරේ. සංයෝජනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් කිසිදු නව කීර්තිනාමයක් හඳුනානොගැනේ. ගෙවන ලද/මාරු කරන ලද ප්‍රතිශ්ඨාව සහ අත්පත් කරගන්නා ලද ස්කන්ධ අතර කවර හෝ වෙනසක් ස්කන්ධ ඇතුලත පිළිබිඹු කෙරේ.

තාවකාලික/ඇස්තමේන්තුගත සංඛ්‍යා භාවිත කරමින් ව්‍යාපාර සංයෝජනයන් සිදුකරන ලද අතර මිනුම්කරණ කාලපරිච්ඡේදයේදී (එක් වසරක්) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින්, 2019 අප්‍රියෙල් 1 දිනට පැවති ඒකාබද්ධ කරන ලද වත්කම් හා වගකීම් ප්‍රතිතක්සේරුගත කොට ඒ අනුව ඒකාබද්ධකරණ සංචිතය ගැළපීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 අනුකූලතා ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශයන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත හා පසුකාලීනව එය වෙත කෙරුනු සංශෝධනයන්ගේ විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමද 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත හා පසුකාලීනව එය වෙත කෙරුනු සංශෝධනයන්ගේ විධිවිධානයන්ට අනුකූලව සිදු කොට ඇත.

2.3 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකකය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මෙහෙයුම් සිදුකරනු ලබන මූලික ආර්ථික වටපිටාවෙහි ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරනු ලැබ ඇත. වෙනත් අයුරකින් සඳහන් කොට නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍යමය තොරතුරු ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

2.4 මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම

එහිදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් බැංකුවේ අයිතමයන් ස්වභාවය අනුව කාණ්ඩගත කොට ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතා සහ කල්පිරීමේ විලාශය පිළිබිඹු වන පරිදි අනුපිළිවෙලින් ලැයිස්තුගත කෙරිණි. මූල්‍ය ප්‍රකාශයන් සඳහා බලපාන්නා වූ උද්ධමනකාරී සාධක සඳහා ගැලපුම් කිසිවක් සිදු කොට නොමැත. වාර්තාකරණ දිනට මාස 12 ක් ඇතුළත (ප්‍රවර්තන) සහ වාර්තාකරණ දිනෙන් මාස 12 ක් ඉක්මවූ කාලයකට පසුව (ප්‍රවර්තන නොවන) ආපසු අයකරගැනීම හෝ පියවීම පිළිබඳ විශ්ලේෂණයක් සටහන 45 හි ඉදිරිපත් කරනු ලැබ ඇත.

2.5 ප්‍රමාණවත්බව සහ එකතුව

ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 - 'මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම'ට අනුකූලව, සමාන අයිතම වල එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩය මූල්‍ය ප්‍රකාශයන්හි වෙන වෙනම ඉදිරිපත් කෙරේ. ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් සමාන නොවන අයිතම ද, ඒවා ප්‍රමාණවත් වේ නම් වෙනම ඉදිරිපත් කෙරේ.

හඳුනාගත් මුදල් ප්‍රමාණයන් හිලව් කිරීම සම්බන්ධ නීතිමය වශයෙන් බලාත්මක කළ හැකි අයිතියක් පවතින විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට අදහස් කරන අවස්ථාවකදී, හෝ වත්කම් උපලබ්ධි කොට ඒ හා සමගාමීව වගකීම පියවනු ලබන අවස්ථාවකදී පමණක්, මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කිරීමෙන් අනතුරුව ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ. කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ දැක්වීමකින් අවශ්‍යතාවයක් හෝ අනුමැතියක් පවතින අවස්ථාවකදී හැරුනු විට, සහ සමාගමෙහි ගිණුම්කරණ ප්‍රමිතීන්හි විශේෂිතව දක්වනු ලැබ ඇති පරිදි ආදායම් හා වියදම් ආදායම් ප්‍රකාශය තුළ හිලව් කිරීමක් සිදුනොවේ.

2.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත්තේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 7 - ''මුදල් ප්‍රවාහ ප්‍රකාශය'' ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් සැකසීමේ වක්‍ර ක්‍රමවේදය යොදා ගනිමිනි. මුදල් හා මුදල් සමාන දෑ, වටිනාකම වෙනස්වීම පිළිබඳ නොසළකා හළ හැකි අවදානමකට ලක්වන්නා වූ සහ ඕනෑම අවස්ථාවක තථ්‍ය මුදල් ප්‍රමාණයන් බවට පත්කොට ගත හැකි කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වලින් සමන්විත වේ.

මුදල් හා මුදල් සමාන දෑ පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 17, සටහන 18, සටහන 21.2 සහ සටහන 28 හි දැක්වේ.

මුදල් හා මුදල් සමාන දෑ අතරට අත ඇති මුදල්, වෙනත් බැංකු වල පවතින ශේෂයන්, බැංකු සමග ස්ථාපන, ස්ථාවර තැන්පතු වල ආයෝජන (මාස 3 ට අඩු) ඇතුළත් වන අතර අහිතකර බැංකු ශේෂයන්ගෙන් ශුද්ධ වේ.

2.7 සන්සන්දනාත්මක තොරතුරු

වර්තමාන වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම අවශ්‍ය වන ඕනෑම ස්ථානයකදී සන්සන්දනාත්මක තොරතුරු වර්ගීකරණය කෙරේ. කෙසේවුවද, බැංකුව මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 16 (කල්බදු) හි විෂයපථය ඇතුළත කල්බදු සඳහා 2018 වසරට අදාළ සන්සන්දනාත්මක තොරතුරු ප්‍රතිප්‍රකාශ කොට නැත. එමනිසා, 2018 වසරට අදාළ සන්සන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 17 (කල්බදු) යටතේ වාර්තා කෙරෙන අතර ඒවා 2019 සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු සමග සැසඳිය නොහැක. SLFRS 16 වෙත සංක්‍රමණය සටහන 25.1 හි දැක්වේ.

2.8 සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් කෙරෙහි අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය විසින්, වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් ප්‍රමාණයන්, සහ ඒ සඳහා පාදක වන හෙළිදරව් කිරීම්, මෙන්ම අසම්භාව්‍ය වගකීම් අනාවරනය කෙරෙහි බලපාන්නා වූ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සිදුකිරීම අවශ්‍ය වේ. මෙකී උපකල්පනයන් හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් අනාගත කාලපරිච්ඡේදයන්හි බලපෑ හැකි වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් වෙත ප්‍රමාණාත්මක ගැලපුමක් අවශ්‍ය විය හැක.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රමිතීන් ආදේශන ක්‍රියාවලියේදී, කළමනාකාරිත්වය විසින් පහත දැක්වෙන විනිශ්චයන් සිදුකරනු ලැබ ඇත්තේ, අනාගතය සහ ඊළඟ මූල්‍යමය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් වෙත ප්‍රමාණාත්මක ගැලපුමක් සිදුකිරීම කෙරෙහි හේතු විය හැකි සැළකිය යුතු අවදානමක් සහිත, වාර්තාකරණ දිනය වන විට ඇස්තමේන්තු අවිනිශ්චිතතාවන්හි සෙසු ප්‍රධාන මූලයන් කෙරෙහි අවධානය යොමු කරමිනි. අනාගත වර්ධනයන් පිළිබඳ පවතින තත්ත්වයන් හා උපකල්පනයන් බැංකුවේ පාලනයෙන් ඔබ්බෙහි පවතින සාධකයන් මත වෙනස්විය හැකි අතර ඒවා සිදුවුවහොත් සහ සිදුවූ විට උපකල්පනයන් තුළ පිළිබිඹු වේ.

කැපීපෙනෙන කළමනාකාරිත්ව විනිසුම සහ/හෝ ඇස්තමේන්තු සමගින් මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගැනුනු වටිනාකම් මත වඩාත්ම සැළකිය යුතු බලපෑමක් සහිත අයිතම යොදාගන්නා ලද විනිශ්චයන්/ඇස්තමේන්තු වලට අදාළව පහත සැසඳුමට ලක් කොට ඇත.

2.8.1 අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් බැංකු කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර, කල්තබා දැකිය හැකි අනාගතය තුළ අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්ව සිටී. තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් සුරක්ෂිතව පැවැත්ම සඳහා බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත්ව නොසිටී. එමනිසා, අඛණ්ඩවම මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරේ.

2.8.2 ණය සහ අත්තිකාරම් මත හානිකරණ අලාභ

SLFRS 9 ප්‍රමිතිය යටතේ සියළුම මූල්‍යමය වත්කම් කාණ්ඩයන්හි හානිකරණ අලාභයන් මිනුම්කරණයේදී විනිසුම් අවශ්‍ය වන අතර, විශේෂයෙන්ම, හානිකරණ අගයයන් නිර්ණය කිරීමේදී සහ ණය අවදානමෙහි සැළකිය යුතු ඉහළ යාමක් තක්සේරු කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහ හා සමාන්තර අගයයන් හි ප්‍රමාණය කාලගණනය ඇස්තමේන්තුගත කිරීමේදී එය වැදගත් වේ. මෙම ඇස්තමේන්තු විවිධ සාධකයන් මත පදනම් වන අතර, ඒවායේ වෙනස්වීම් විවිධ මට්ටම් වල වෙන්කිරීම් කෙරෙහි හේතු විය හැක.

බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ගණනයන්, විචල්‍ය ආදාන වරණයන් හා ඒවායේ අන්තර් රඳපැවතීම් ආශ්‍රිතව පාදක වන උපකල්පන රැසක් සහිත සංකීර්ණ ආකෘතීන්හි ප්‍රතිදානයන් වේ. ගිණුම්කරණ විනිශ්චයන් හා ඇස්තමේන්තු සළකා බැලෙන්නා වූ අපේක්ෂිත ණය අලාභ ආකෘතීන්හි සංරචකයන් පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වේ:

- ණය අවදානමෙහි කැපී පෙනෙන ඉහළයාමක් පවතීදැයි තක්සේරු කිරීම සඳහා වන බැංකුවෙහි ක්‍රියාපටිපාටිය සහ එසේ වේ නම් මූල්‍ය වත්කම් සඳහා ප්‍රතිපාදන ජීව කාල අපේක්ෂිත ණය අලාභ (LTECL) පදනමක් මත මැනිය යුතු බව සහ ගුණාත්මක තක්සේරුකරණය.
- සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් කාණ්ඩකරණය.
- විවිධ සූත්‍ර සහ අදානයන් යොදා ගනිමින් අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් සැකසීම.
- විරැකියා අනුපාතය සහ ඇප වටිනාකම් වැනි සාර්ව ආර්ථික තත්ත්වයන් හා ආර්ථික ආදානයන් අතර සම්බන්ධතා, සහ පැහැරහැරීමේ සම්භාවිතාව (PD) කෙරෙහි බලපෑම, පැහැරහැරීම කෙරෙහි නිරාවරනයන් (EAD) සහ අලාභ ගෙන දෙන ලද පැහැර හැරීම (LGD) මත බලපෑම නිර්ණය කිරීම.
- අපේක්ෂිත ණය අලාභ ආකෘතීන් වෙත ආර්ථික ආදානයන් උකහා ගැනීම සඳහා ඉදිරිගාමී සාර්ව ආර්ථික තත්ත්වයන් ඒවායේ සම්භාවිතා බරතැබීම් තෝරාගැනීම.

2.8.3 බදුකරණය

බැංකුව ආදායම් බදු ගෙවීමට යටත් වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරනු ලබන අවස්ථාවේදී, බදු නීති අදාළ කරගැනීම සම්බන්ධ අර්ථගැන්වීම් ආශ්‍රිතව පවතින අවිනිශ්චිතතා හේතුවෙන්, ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා වෙන් කල යුතු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීමට සිදු වෙයි.

පුළුල් පරාසයක පැතිරුනු ව්‍යාපාරික සබඳතා සහ පවතින ගිවිසුම්ගත එකඟතාවන්හි දිගු කාලීන ස්වභාවය හා සංකීර්ණත්වය හේතුවෙන්, සිදු කරන ලද උපකල්පනයන් හා සැබෑ ප්‍රතිඵලයන් අතර මතුවන වෙනස්කම් වල ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශයන්හි මුලින් වාර්තාගත බදු ආදායම් හා වියදම් සහ විලම්බිත බදු වටිනාකම් වෙත ගැලපුම් සිදු කළ යුතු වේ. සටහන 14, සටහන 26 සහ සටහන 31.

2.8.4 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල පිරිවැය හා ඒවායේ බැඳීම් වල ප්‍රවර්තන වටිනාකම ආයුගණන තක්සේරුකරණයන් යොදා ගනිමින් නිර්ණය කෙරේ. ආයුගණන තක්සේරුවේදී වට්ටම් අනුපාතයන්, වත්කම් මත ආදායම් වල අපේක්ෂිත අනුපාතයන්, අනාගත වැටුප් වර්ධකයන්, මෘත්‍යුතා අනුපාතයන් හා අනාගත විශ්‍රාම වැටුප් වර්ධකයන් පිළිබඳ උපකල්පනයන් සිදු කෙරේ. මෙම සැලසුම් වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන්, එබඳු ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ. සියළුම උපකල්පනයන් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනයට ලක් කෙරේ.

යෝග්‍ය වූ වට්ටම් අනුපාතය නිර්ණය කිරීමේදී, කළමනාකාරිත්වය මගින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි අපේක්ෂිත කාලසීමාවට අනුරූපී තක්සේරුගත කල්පිරීම් සමගින් ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර වල පොලී අනුපාතික සැළකිල්ලට ගනු ලැබේ. මෘත්‍යුතා අනුපාතය ප්‍රසිද්ධ මෘත්‍යුතා වගු මත පදනම් වේ. අනාගත වැටුප් වර්ධක හා විශ්‍රාම වැටුප් වර්ධක අපේක්ෂිත උද්ධමන අනුපාතයන් හා බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් වර්ධක අනුපාතය මත පදනම් වේ.

2.8.5 දේපළ, පිරියත සහ උපකරණ වල ඵලදායී ජීවකාලය

බැංකුව මගින් එක් එක් වාර්තාකරණ දිනට, වත්කම් වල අවශේෂ වටිනාකම්, ඵලදායී ජීවකාල හා ක්ෂයවීම සමාලෝචනට කෙරේ. මෙකී වටිනාකම්, අනුපාතයන් හා ක්‍රමවේදයන් ඇස්තමේන්තුගත කිරීමේදී කළමනාකාරිත්වයේ විනිසුම භාවිත කෙරෙන අතර එමනිසා ඒවා අවිනිශ්චිතතාවන්ට භාජනය වේ.

2.8.6 බැඳීම් සහ අවිනිශ්චිතතා

සියළු හඳුනාගත් බැරකම් නිශ්චය කිරීම සඳහා සෑම සුසංජානන අවදානමක්ම සැළකිල්ලට ගනු ලැබේ.

අවිනිශ්චිත අනාගත සිදුවීම් මගින් පැවැත්ම සනාථ කෙරෙන ඉදිරියේදී ඇති විය හැකි බැඳීම් හෝ අසම්භාවී ආර්ථික ප්‍රතිලාභ පැවරීමක් ඇති හෝ විශ්වසනීය අයුරින් මැනීමට නොහැකි වර්තමාන බැඳීම් අවිනිශ්චිත බැරකම් වශයෙන් සැළකේ. මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගනු නොලැබ නොමැති නමුත් එවැනි බැරකම් උද්ගතවීම බොහෝ කලකට පසුව සිදුවිය හැකි නම් මිස ඒවා පිළිබඳ අනාවරනය කරනු ලැබ ඇත.

2.8.7 මූල්‍ය උපකරණයන්හි සාධාරණ වටිනාකම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ සටහන් කර ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකම ක්‍රියාකාරී වෙළඳපලෙන් ලබා ගත නොහැකි වූ විට, ඒවා තීරණය කරනු ලබන්නේ ගණිතමය ආකෘති භාවිතය ඇතුළු විවිධ තක්සේරුකරණ ක්‍රමවේදයන් මගිනි. මෙම ආකෘතිවල යෙදවුම් ලබා ගැනීමේදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළවලින් ලබා ගැනීම සිදු කෙරේ. කෙසේ වෙතත් එවැනි දත්ත ලබා ගත නොහැකි නම්, සාධාරණ අගයන් ස්ථාපිත කිරීමේදී යම් තරමක විනිශ්චයක් ක්‍රියාත්මක කරනු ලැබේ. එමඟින් පාලනය කළ නොහැකි යෙදවුම් භාවිතා කිරීමේ බලපෑම අවම වේ.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සම්මත අර්ථ නිරූපණය

3.1 විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන්ට අඛණ්ඩව ඒවා අදාළ වේ.

3.1.1 මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය

3.1.1.1 හඳුනාගැනීමේ දිනය

ගනුදෙනුකරුවන් වෙත ඇති ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන් විසින් ගෙවිය යුතු ශේෂයන් හැරුණු විට මූල්‍ය වත්කම් සහ වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ වෙළඳ දිනයේදීය. එනම්, බැංකුව සාධන පත්‍රයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු වන දිනයයි. නිතිපතා වෙළඳාම් මෙයට ඇතුළත්ය: වෙළඳපොළ තුළ නියාමනය හෝ සම්මුතිය මගින් සාමාන්‍යයෙන් ස්ථාපිත කාල සීමාව තුළ වත්කම් භාරදීමට අවශ්‍ය මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම. ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වෙත අරමුදල් මාරු කළ විට ගනුදෙනුකරුවන්ට ඇති ණය සහ අත්තිකාරම් පිළිගැනීම සිදු කෙරේ. අරමුදල් බැංකුවට මාරු කිරීමේදී ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු ශේෂයන් බැංකුව හඳුනාගැනීම සිදු කරයි.

3.1.1.2 මූල්‍ය උපකරණ මූලිකව අගය කිරීම

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය උපකරණය කළමනාකරණය සඳහා වන ගිවිසුම්ගත නියමයන් සහ ව්‍යාපාර ආදර්ශය මත රඳා පවතී. මූල්‍ය සාධන පත්‍ර මුලින් ම මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම මත වන අතර FVPL හි වාර්තා වී ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හැරුණු විට, ගනුදෙනු පිරිවැය මෙම මුදලට එකතු කිරීම හෝ අඩු කිරීම සිදු වූ විට දී එය සිදු වේ. වෙළඳ කොටසේ ලැබිය යුතු දේ ගනුදෙනු මිලට ගණනය කිරීම සිදු කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම ගනුදෙනු මිලට වඩා වෙනස් වූ විට, පහත විස්තර කර ඇති පරිදි බැංකුව පළමු දින ලාභය හෝ අලාභය ගණනය කරයි.

3.1.1.3 පළමු දින ලාභය හෝ අලාභය

උපකරණයේ ගනුදෙනු මිල ආරම්භයේ දී ඇති සාධාරණ වටිනාකමට වඩා වෙනස් වන විට සහ සාධාරණ වටිනාකම වෙළඳපල ගනුදෙනු වලදී නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් භාවිතා කරමින් තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් මත පදනම් වූ විට, ගනුදෙනු මිල සහ ශුද්ධ වෙළඳ ආදායමේ සාධාරණ වටිනාකම අතර වෙනස බැංකුව මගින් හඳුනාගනු ලැබේ. එවැනි අවස්ථා වලදී, සමහර යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි ආකෘති මත සකස් කළ සාධාරණ වටිනාකම පදනම් වී ඇති විට, ගනුදෙනු මිල සහ සාධාරණ වටිනාකම අතර වෙනස කල්දමා ඇති විට සහ එය හඳුනාගනු ලබන්නේ යෙදවුම් නිරීක්ෂණය කළ විට ආදායම් ප්‍රකාශන අලාභයේදී හෝ උපකරණය පිළිගැනීමට ලක් නොකළ අවස්ථාවක දී ය.

3.1.1.4 මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ තදන්තර මැනීම

3.1.1.4.1 මූල්‍ය වත්කම්

වත්කම් කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපාර ආකෘතිය සහ වත්කම්වල ගිවිසුම් කොන්දේසි මත පදනම්ව බැංකුව සිය සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය කරන අතර මැනීම සිදු කරනු ලබන්නේ

- සටහන 3.1.1.4.1.1 හි විස්තර කර ඇති පරිදි ක්‍රමක්ෂය පිරිවැය අනුව හෝ
- සටහන 3.1.1.4.1.3 පරිදි වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම් අනුව හෝ
- සටහන 3.1.1.4.1.2 හි විස්තර කර ඇති පරිදි ලාභය හෝ අලාභය හරහා මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම (FVPL) අනුවයි

වර්ගීකරණය රඳා පවතින්නේ මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීමේ බැංකුවේ ව්‍යාපාර ආකෘතිය සහ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහයන්ගේ ගිවිසුම් කොන්දේසි මත ය. ලාභය තුළින් සාධාරණ වටිනාකමකින් යුතු වගකීම් නම් කර නොමැති නම් බැංකුව සිය මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කරයි.

3.1.1.4.1.1 ගනුදෙනුකරුවන් වෙත ඇති ණය සහ අත්තිකාරම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වත්කම්

බැංකුව විසින් ගනු ලබන පියවරයන් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම්, බැංකු වෙතින් අය විය යුතු දේ, ණය සහ ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් සහ වෙනත් මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ මැනීම සිදු කරනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබන අවස්ථාවේ දී
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනයන්හි මුදල් ප්‍රවාහයන්ට හේතු වන අතර ඒවා සඳහා ප්‍රධාන වශයෙන් ගෙවිය යුතු ප්‍රධාන මුදල මත මූලික හා පොලී (SPPI) පමණක් ගෙවනු ලබන විට.

මෙම කොන්දේසි පිළිබඳ විස්තර පහත දැක්වේ.

3.1.1.4.1.1 (අ) ව්‍යාපාර ආකෘතිය අගය කිරීම

තම ව්‍යාපාර පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් කණ්ඩායම් කළමනාකරණය කරන්නේ කෙසේද යන්න වඩාත් හොඳින් පිළිබිඹු වන මට්ටමින් බැංකුව සිය ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආකෘතිය තක්සේරු කරනු ලබන්නේ සාධන පත්‍රයක් මත සාධන පත්‍රයක් ආකාරයෙන් නොව, ඉහළ මට්ටමේ සමෝධානිත කළඹක් මඟින් වන අතර එය පහත දැක්වෙන නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ:

- ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරිත්වය සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ ඇති මූල්‍ය වත්කම් ඇගයීමට ලක් කර ආයතනයේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට වාර්තා කෙරෙන ආකාරය
- ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් එම අවදානම් කළමනාකරණය කරන ආකාරය
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට පාරිතෝෂික ලබා දෙන්නේ කෙසේද (නිදසුනක් ලෙස, පාරිතෝෂික මුදල කළමනාකරණය කරන ලද වත්කම්වල සාධාරණ වටිනාකම මත හෝ එකතු කරන ලද ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත රඳා පවතින විට)
- විකිණුම්වල අපේක්ෂිත වාරගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරු කිරීම තුළ වැදගත් අංග වේ.

'දුර්වලම අවස්ථා' හෝ 'පීඩන අවස්ථා' ක්‍රියාදාම සැළකිල්ලට නොගෙන නිමින් සාධාරණය අපේක්ෂිත ක්‍රියාමාර්ග මත ව්‍යාපාර ආකෘති අගය කිරීම පදනම් වේ. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මූලික අපේක්ෂාවන්ගෙන් වෙනස් ආකාරයකින් උපලබ්ධි වේ නම්, බැංකුව එම ව්‍යාපාර ආකෘතිය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් කරනු නොලැබුවත් අළුතින් උත්පාදිත හෝ අළුතින් මිළදී ගත් මූල්‍ය වත්කම් අඛණ්ඩම ඇගයීමේදී එවැනි තොරතුරු ඇතුළත් කරනු ලැබේ.

3.1.1.4.1.1 (ආ) SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවර ලෙස SPPI පරීක්ෂණය සමඟින් ගැළපෙන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා බැංකුව විසින් ගිවිසුම්ගත මූල්‍ය කොන්දේසි තක්සේරු කරනු ලැබේ.

මෙම පරීක්ෂණය සඳහා මූලික පිළිගැනීමේදී මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම ලෙස නියෝජකයා අර්ථ දක්වා ඇති අතර මූල්‍ය වත්කම්වල ආයු කාලය වෙනස් විය හැකිය (නිදසුනක් ලෙස, වාරික / වට්ටම්වල මූලික හෝ ක්‍රමක්ෂය ආපසු ගෙවීම් තිබේ නම්).

සාමාන්‍යයෙන් ණය ලබා දීමේ විධිවිධානයක් තුළ ඇති පොලීවල වඩාත්ම වැදගත් අංග වන්නේ මුදල්වල කාල වටිනාකම සහ ණය අවදානම සලකා බැලීමයි. SPPI තක්සේරුව සිදු කිරීම සඳහා, බැංකුව තීන්දුව අදාළ කරන අතර මූල්‍ය වත්කම් නම් කරන ලද මුදල් සහ පොලී අනුපාතය නියම කර ඇති කාල සීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

ඊට හාත්පසින්ම වෙනස්ව, මූලික ණය ලබා දීමේ විධිවිධානයකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමකට වඩා වැඩි යමක් හඳුන්වා දෙන ගිවිසුම් කොන්දේසි පවතින අවස්ථාවක දී, මූලික වශයෙන් ගෙවිය යුතු මුදල හා පොළිය පමණක් ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ට අදාළ ව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ නිර්මාණය නොවේ. එවැනි අවස්ථාවන්හිදී, මූල්‍ය වත්කම් FVPL ඔස්සේ මැනීම අවශ්‍ය වේ.

3.1.1.4.1.2 ලාභය හෝ අලාභය හරහා මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම

ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම සඳහා පහත අංශ අදාළ වේ:

- මූල්‍ය ආයෝජන - වෙළඳාම සඳහා;
- මූලික හා ලාභ ගෙවීම් පමණක් නියෝජනය නොකරන ගිවිසුම් කොන්දේසි සහිත සාධන පත්‍ර සඳහා

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් යටතේ මූල්‍ය උපකරණ මඟින් මුලින් සාධාරණ වටිනාකම හඳුනා ගනු ලබන අතර ලාභය හෝ අලාභ ප්‍රකාශයේ ගනුදෙනු පිරිවැය හඳුනා ගැනීම අනුව එය සිදු කෙරේ. පසුව, ඒවා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර, යම් ලාභයක් හෝ අලාභයක් පැන නගින විට ලාභ හෝ අලාභ ප්‍රකාශය මඟින් හඳුනා ගැනේ.

මූල්‍ය වත්කමක් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන විට, ණය අවදානම් වෙනස්වීම් හේතුවෙන් ආරෝපිත සාධාරණ වටිනාකමේ වලනය නියෝජනය කරමින්, පාර්ශවකරුගේ ණය සුදුසුකම් පිළිබිඹු කිරීම සඳහා ණය තක්සේරුකරණ ගැලපුමක් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.1.1.4.1.2 (අ) මූල්‍ය ආයෝජන - වෙළඳාම සඳහා

මූල්‍ය ආයෝජනයක් ලාභය හෝ අලාභය මගින් හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති අතර එය මූලික වශයෙන් කාලීනව විකිණීම හෝ නැවත මිල දී ගැනීම සඳහා අත්පත් කර ගෙන තිබේ නම් හෝ ඒකාබද්ධ ව කළමනාකරණය කර ඇති සහ පවතින මූල්‍ය සාධන පත්‍ර කළඹක කොටසක් වේ. කෙටිකාලීන ලාභ ලබා ගැනීමේ සාක්ෂි මේ සඳහා පවතින අතර එසේ නොමැති නම් එය සුදුසුකම් ලත් හෙජ් සම්බන්ධතාවයකට අයත් නොවන ව්‍යුත්පන්නයක් වේ.

කොටස් සුරැකුම්පත්වල ආයෝජනය ලාභය හෝ අලාභය මගින් හඳුනාගෙන ඇති සාධාරණ වටිනාකම් මත හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සටහන 19 බලන්න.

3.1.1.4.1.2 (ආ) ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමින් මැනිය හැකි පරිදි සැලසුම් කර ඇති මූල්‍ය සාධන පත්‍ර

මූලික හඳුනාගැනීමෙන් පසු, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම මගින් මනිනු ලබන්නක් ලෙස මූල්‍ය සාධන පත්‍ර නම් කළ හැකිය. මූල්‍ය වත්කමක් නියම කළ හැක්කේ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම්, එසේ කිරීමෙන් මිනුම් හෝ හඳුනාගැනීමේ නොගැලපීම් ඉවත් කිරීම හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීම (එනම් ගිණුම්කරණ නොගැලපීම ඉවත් කරයි) වෙනත් ආකාරයකින් මූල්‍ය වත්කම් හෝ වගකීම් මැනීමෙන් පැන නගී. මෙම කාණ්ඩය යටතේ බැංකුව කිසිදු මූල්‍ය සාධන පත්‍රයක් නම් නොකරයි.

3.1.1.4.1.3 වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

SLFRS 3 "ව්‍යාපාර සංයෝජනය" අදාළ වන ව්‍යාපාර සංයෝජනයක් තුළ ලාභය හෝ අලාභය මගින් හඳුනාගෙන ඇති වෙළඳ වත්කම් නොවන හෝ බැංකුව මගින් අවිනිශ්චිත තත්ත්වයන් ලෙස හඳුනා නොගත් කොටස් සාධන පත්‍රවල ආයෝජනය කිරීම, දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් කළමනාකාරිත්වය විසින් සාධාරණ වටිනාකමකින් මනිනු ලැබූ ආපසු හැරවිය නොහැකි වරණයකින් වෙනත් පුළුල් ආදායමක සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. වෙනත් පුළුල් ආදායමක් තුළින් සාධාරණ වටිනාකමක් ලබා ගැනීමේ ආපසු හැරවිය නොහැකි වරණයක් කළමනාකරණය විසින් නොසලකන අවස්ථා සඳහා, පෙරනිමියෙන් එම ආයෝජන ලාභ හා අලාභ හරහා ලැබෙන සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.

වෙනත් විස්තීර්ණ ආදායමකින් ඉදිරිපත් කරන ලද මුදල් පසුව ලාභයට හෝ අලාභයට යොමු නොකෙරේ. එවැනි ආයෝජනවල ලාභාංශ ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ.

මෙම කොටස් සාධන පත්‍රවල වාසි සහ අලාභ කිසි විටෙකත් ලාභය කරා ප්‍රතිවර්ගීකරණය නොකෙරේ. ලාභාංශ ආදායම් ප්‍රකාශයේ ශුද්ධ වෙළඳ ලාභය/(අලාභය) ලෙස හඳුනාගෙන ඇත්තේ ගෙවීමේ අයිතිය ස්ථාපිත වූ විට මිස, සාධන පත්‍රයේ පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් ලෙස බැංකුවට ලැබෙන ප්‍රතිලාභ වලින් වන අතර එවැනි අවස්ථාවකදී ලාභ සටහන් වන්නේ වෙනත් විස්තීර්ණ ආදායමෙහිය. වෙනත් විස්තීර්ණ අදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ සාධන පත්‍ර හානිකරණ තක්සේරුවකට යටත් නොවේ.

3.1.1.4.2 මූල්‍ය වගකීම්

පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය වගකීම්වල ආරම්භක හා පසුව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ආරම්භයේදී බැංකුව සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය තීරණය කරයි. ඒ අනුව, මූල්‍ය වගකීම් පහත පරිදි වර්ගීකරණය කර ඇත;

- ලාභ හෝ අලාභ හරහා ලබා ගත් සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම් (FVTPL)
  - වෙළඳාම සඳහා මූල්‍ය වගකීම්
  - ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද මූල්‍ය වගකීම්
  - ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් පසුකාලීනව මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

3.1.1.4.2.1 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම්

FVTPL හි මූල්‍ය වගකීම් අතරට වෙළඳාම සඳහා වන මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වගකීම් ඇතුළත් වේ. මූලික පිළිගැනීමෙන් පසුව, FVTPL හි මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමක් වන අතර, එහි වෙනස්කම් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනෙනු ඇත.

මූල්‍ය වගකීම් වෙළඳාම සඳහා රඳවාගෙන ඇති බවට වර්ගීකරණය කර ඇත්තේ ඒවා මූලික වශයෙන් අත්පත් කර ගනු ලබන්නේ නුදුරු කාලීනව විකිණීම හෝ නැවත මිල දී ගැනීම සඳහා හෝ කෙටිකාලීන ලාභය හෝ ස්ථාන ගැනීම සඳහා එකට කළමනාකරණය කළ කළඹේ කොටසක් ලෙස පවතින විට දී ය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 39 "මූල්‍ය උපකරණ: පිළිගැනීම සහ මිනුම්" අනුව අර්ථ දක්වා ඇති පරිදි හෙජ් සබඳතාවල හෙජිං සාධන පත්‍ර ලෙස නම් කර නොමැති බැංකුව විසින් ඇතුළත් කර ඇති ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර මෙම කාණ්ඩයට ඇතුළත් වේ. වෙන් කළ කාවැද්දූ ව්‍යුත්පන්නයන් ඵලදායී හෙජින් සාධන පත්‍ර ලෙස නම් නොකළහොත් වෙළඳාම සඳහා රඳවා ඇති ඒවා ලෙස වර්ගීකරණය කෙරේ. වෙළඳාම සඳහා ඇති වගකීම්වල ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

මෙම කාණ්ඩය යටතේ බැංකුවට කිසිදු මූල්‍ය වගකීමක් නොමැත.

3.1.1.4.2.2 ක්‍රමක්ෂය පිරිවැය අනුව වගකීම්

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමකින් නම් කර නොමැතිල බැංකුව විසින් නිකුත් කරනු ලබන මූල්‍ය සාධන පත්‍ර සුදුසු පරිදි "ගනුදෙනුකරුවන් සහ වෙනත් ණය ගැනීම් හේතුවෙන්" ක්‍රමක්ෂය පිරිවැය යටතේ වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. එහි දී මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් දරන්නාට ලබා දීමට බැඳී සිටීම හෝ EIR ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයකින් ස්ථාවර කොටස් ප්‍රමාණයක් සඳහා ස්ථාවර මුදල් ප්‍රමාණයක් හෝ වෙනත් මූල්‍ය වත්කම් හුවමාරු කර ගැනීම හැර වෙනත් වගකීමක් සපුරාලීමට බැඳෙනු ඇත.

මූලික හඳුනාගැනීමෙන් පසු, එවැනි මූල්‍ය වගකීම් සැලකිය යුතු ලෙස මනිනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැය යටතේ EIR ක්‍රමයෙනි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ නිකුත් කිරීම පිළිබඳ කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි. ආදායම් ප්‍රකාශයේ "පොලී වියදම්" සඳහා EIR ක්‍රමක්ෂය ඇතුළත් වේ. වගකීම් හඳුනාගෙන ඇති විට මෙන්ම EIR ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ආදායම් ප්‍රකාශයේ වාසි සහ අලාභ හඳුනා ගැනේ.

මෙම කාණ්ඩය සමන්විත වන්නේ බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ඇති ණය සහ නිකුත් කරන ලද ණය මෙන් ම වෙනත් ණය ලබාගත් අරමුදල් මඟිනි.

3.1.1.5 මූල්‍ය වත්කම් සහ වගකීම් නැවත වර්ගීකරණය

බැංකුව ව්‍යාපාරික මාර්ගයක් අත්කරගැනීම, පැහැරකිරීම හෝ අවසන් කිරීම වැනි විශේෂ අවස්ථාවලදී හැර බැංකුව එහි මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය නොකරයි. මූල්‍ය වගකීම් කිසිදු අවස්ථාවක නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2019 දී එහි මූල්‍ය වත්කම් හෝ වගකීම් නැවත වර්ගීකරණය කර නොමැත.

3.1.1.6 මූල්‍ය වත්කම් හා වගකීම් හඳුනානොගැනීම

3.1.1.6.1 නියමයන් සහ කොන්දේසි වල පසුකාලීන වෙනස්වීම හේතුකොට ගෙන නැවත හඳුනා නොගැනීම

හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට හඳුනානොගත් ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගත් වෙනස සමග අළුත් ණය මුදලක් බවට එය පත්වන ප්‍රමාණයට නියමයන් සහ කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවකදී ගනුදෙනුකරුවකු වෙත ණයක් වැනි මූල්‍ය වත්කමක් බැංකුව හඳුනා නොගනී. අළුතින් හඳුනාගත් ණය POCI ලෙස සළකනු ලබන්නේ නම් මිස අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා අදියර 1 ලෙස වර්ගීකරණය කෙරේ.

ගනුදෙනුකරුවකු වෙත ණයක් හඳුනා නොගන්නේද යන්න ඇගයීමේදී අනිකුත් කරුණු අතර බැංකුව පහත සඳහන් සාධක සළකා බලයි.

- ණය මුදලේ ව්‍යවහාර මුදල් වර්ගයේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයේ වෙනස
- වෙනස්කිරීම උපකරණය තවදුරටත් SPPI නිර්ණායකය සපුරාලනු නොලබන බව

සැළකිය යුතු ලෙස වෙනස් වන මුදල් ප්‍රවාහය තුළ වෙනස් කිරීම ඇති නොවේ නම්, හඳුනාගැනීම තුළ වෙනස් කිරීම ඇති නොවේ. මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ වෙනස මත පදනම්ව, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස් කිරීමේ ලාභයක් හෝ අලාභයක් බැංකුව වාර්තා කරයි.

3.1.1.6.2 විශේෂිත වෙනස් කිරීමකදී නොවන අනෙකුත් හඳුනා නොගැනීම

3.1.1.6.2 (අ) මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය කල්පිරී ඇති අවස්ථාවක මූල්‍ය වත්කමක් (හෝ අදාළ ස්ථානයන්හිදී, මූල්‍ය වත්කමක කොටසක්, හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනාගනී. එමෙන්ම මූල්‍ය වත්කම මාරු කර ඇත්නම් සහ මාරු කිරීම හඳුනා නොගැනීම සඳහා සුදුසුකම් ලබයි නම් බැංකුව මූල්‍ය වත්කමක් හඳුනා නොගනී.

බැංකුව පහත දක්වෙන අවස්ථා වලදී මූල්‍ය වත්කම මාරු කර ඇත -

- මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ එහි ගිවිසුම්ගත අයිතිය බැංකුව මාරු කර ඇති අවස්ථාව
  හෝ
- මුදල් ප්‍රවාහ අයිතිය රඳවාගනු ලැබුවද, 'පසුකර යැවීමේ' වැඩපිළිවෙලක් යටතේ යම් තෙවැනි පාර්ශ්වයකට සැළකිය යුතු ප්‍රමාදයක් නොමැතිව සම්පූර්ණයෙන් ලද මුදල් ප්‍රවාහ ගෙවීමට බැඳීමක් භාර ගෙන ඇති අවස්ථාව

පසුකර යැවීමේ වැඩපිළිවෙල යනු මූල්‍ය වත්කමක (''මුල් වත්කම'') මුදල් ප්‍රවාහ ලබාගැනීමේ ගිවිසුම්ගත අයිතිය බැංකුව රඳවාගනු ලැබුවද පහත සඳහන් කොන්දේසි තුන සපුරාලන අවස්ථාවේදී ආයතන එකක් හෝ කිහිපයක් (''ආනුෂංගික ප්‍රදානලාභියා'') වෙත එවැනි මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් බැංකුව භාරගෙන ඇති ගනුදෙනු වේ:

- ණයට දෙන ලද මුදල සහ වෙළඳපොල අනුපාතයන්ට උපචිත පොලිය සම්පූර්ණයෙන් අයකර ගැනීමට අයිතිය සහිත කෙටි කාලීන අත්තිකාරම් හැර මුල් වත්කමෙන් සමාන මුදලක් අයකර ගෙන ඇති නම් මිස ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත මුදල් ගෙවීමට බැංකුවට වගකීමක් නොමැති අවස්ථාව,
- ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත සුරැකුමක් නොවන මුල් වත්කම බැංකුවට විකිණීවට හෝ ඔඩපනය කිරීමට නොහැකි අවස්ථාව,
- සැළකිය යුතු ප්‍රමාදයකින් තොරව ආනුෂංගික ප්‍රදානලාභීන් වෙනුවෙන් බැංකුව අය කරන යම් මුදල් ප්‍රවාහ ප්‍රේෂණය කිරීමට බැංකුවට ඇති අවස්ථාව,

එයට අමතරව, එකතු කළ දිනය සහ ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත ප්‍රේෂණය කළ යුතු දිනය අතර කාලසීමාව තුළ උපයන ලද පොලිය ඇතුළුව මුදල් හෝ මුදල් සමාන දෑ හි ආයෝජනයන් සඳහා හැර එවැනි මුදල් ප්‍රවාහ නැවත ආයෝජනය කිරීමට බැංකුවට හිමිකම නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

හඳුනා නොගැනීම සඳහා මාරුකිරීමක් සුදුසුකම් ලබන්නේ පහත දැක්වෙන අවස්ථාවන්හිදී පමණි:

- බැංකුව සැළකිය යුතු අයුරින් වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රදාන මාරු කර ඇති අවස්ථාව,

හෝ,

- බැංකුව සැළකිය යුතු අයුරින් වත්කමේ සියළුම අවදානම් සහ ප්‍රදාන මාරු කර හෝ රඳවාගෙන නොමැති නමුත්, වත්කමෙහි පාලනය මාරු කර ඇති අවස්ථාව,

පැවරුම්ලාභියාට සම්පූර්ණයෙන් අසම්බන්ධිත තෙවැනි පාර්ශ්වයක් වෙත අලෙවි කිරීමට ප්‍රායෝගික හැකියාව ඇත්නම් සහ ඒකපාර්ශ්විකව සහ මාරුකිරීම මත අමතර සීමාකිරීම් පැනවීමක් නොමැතිව එම හැකියාව ක්‍රියාවට නැංවීමේ අවස්ථාව ඇත්නම් පමණක් පාලනය මාරු කල යුතු බවට බැංකුව විසින් සළකනු ලබයි.

බැංකුව සැළකිය යුතු අයුරින් වත්කමෙහි සියළුම අවදානම් සහ ප්‍රදාන මාරුකර නොමැති සහ පාලනය රඳවාගෙන ඇති අවස්ථාවක, බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පමණක් වත්කම තවදුරටත් හඳනාගනු ලබන අතර මෙම අවස්ථාවේදී බැංකුව ආශ්‍රිත වගකීමක් ද හඳනාගනී. මාරුකල වත්කම් සහ ආශ්‍රිත වගකීම බැංකුව විසින් රඳවාගෙන ඇති අයිතීන් සහ බැඳීම් පිළිබිඹු කෙරෙන පදනමක් මත මනිනු ලැබේ.

මාරුකල වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමෙහි මුල් ධාරණ අගය සහ බැංකුවට ගෙවීමට අවශ්‍ය විය හැකි ප්‍රතිශ්ඨාවේ උපරිම ප්‍රමාණය යන දෙකෙන් පහළ අගයට මනිනු ලබයි.

අඛණ්ඩ මැදිහත්වීම මාරුකල වත්කම මත ලිඛිත හෝ මිලදී ගැනීමේ විකල්පයක (හෝ දෙකම) ස්වරූපයක් ගන්නේ නම්, අඛණ්ඩ මැදිහත්වීම මිලදී ගැනීම මත බැංකුවට ගෙවීමට අවශ්‍ය විය හැකි වටිනාකමට මනිනු ලබයි. සාධාරණ අගයට මනින ලද වත්කමක් මත ලිඛිතව තබන ලද විකල්පයක් වන අවස්ථාවකදී, ආයතනයේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය මාරුකල වත්කමෙහි සාධාරණ අගය සහ විකල්ප ක්‍රියාත්මක මිල යන දෙකෙන් අඩු අගයට සීමා වේ.

3.1.1.6.2 (අා) මූල්‍ය වගකීම්

වගකීම යටතේ වන බැඳීම මුදාහරින, අවලංගු වන හෝ කල්පිරෙන අවස්ථාවක මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. පවත්නා මූල්‍ය වගකීමක් සැළකියයුතු වෙනස් නියමයන් මත හෝ පවත්නා වගකීමක නියමයන් සැළකියයුතු ලෙස වෙනස් වන පරිදි එම ණයකරුගේ වෙනත් ණයකින් ප්‍රතිස්ථාපනය කරන අවස්ථාවක, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස සළකනු ලබයි. මුල් මූල්‍ය වගකීමෙහි ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිස්ථාව අතර වෙනස ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගැනේ.

3.1.1.7 අපේක්ෂිත ණය අලාභ මූලධර්ම පිළිබඳ දළ විශ්ලේෂණය

බැංකුව මගින් ''මූල්‍ය උපකරණ'' වශයෙන් සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමග ලාභ හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියළුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් වෙනුවෙන් අත්තිකාරම වාර්තා කරනු ලැබේ. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 ක් ඇතුළත විය හැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි.

ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම පහත විස්තර කොට ඇති පරිදි පාදක කළඹෙහි ස්වභාවය මත රැඳෙමින් කේවල පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. මූල්‍ය උපකරණයක ඉතිරි ජීවකාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැළකිල්ලට ගනිමින් මූලික හඳුනාගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැළකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදුකිරීමට බැංකුව මගින් ප්‍රතිපත්තියක් ස්ථාපනය කරනු ලැබ ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම්ව, බැංකුව මගින් එහි ණය පහත විස්තර කරනු ලබන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI වශයෙන් කාණ්ඩගත කරනු ලැබ ඇත.

අදියර 1 : ණය පළමුව හඳුනාගනු ලබන අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව අත්තිකාරමක් හඳුනාගනී. අදියර 1 ණය සඳහා ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කොට ඇති ණය ඇතුළත් වේ.

අදියර 2 : ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැළකියයුතු වැඩිවීමක් පෙන්නුම් කොට ඇති අවස්ථාවකදී, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අවදානම සඳහා අත්තිකාරමක් වාර්තා කරයි. අදියර 2 ණය සඳහා ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 3 සිට නැවත වර්ගීකරණය කොට ඇති ණය ඇතුළත් වේ.

අදියර 3 : ණය හානිකරණය වී ඇති බවට සැළකෙන ණය පහසුකම් මෙයට ඇතුළත් වේ. බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.

POCI: මිළදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත හානිකරණය වන මූල්‍ය වත්කම්ය. POCI වත්කම් මූලික හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගළපන ලද සඵල පොලී අනුපාතයක් මත පදනම්ව පොලී ආදායම පසුකාලීනව හඳුනාගැනේ. අපේක්ෂිත ණය අලාභ වල පසුකාලීන වෙනසක් සිදුවන ප්‍රමාණයට හඳුනාගැනීම හෝ මුදාහැරීම සිදුකෙරේ. වාර්තාකරණ දිනට බැංකුවට POCI වත්කම් නොමැත.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමෙහි දළ ධාරණ අගය අඩු කරනු ලැබේ. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳනා නොගැනීමක් ලෙස සළකනු ලබයි.

3.1.1.7.1 අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

සඵල පොලී අනුපාතයට ආසන්න වීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බර තබන ලද ක්‍රියාදාම හතරක් මත පදනම්ව බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවිය යුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය විසින් ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD : පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. පහසුකම මෙයට පෙර හඳුනාගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළනම්, පැහැරහැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ එක්තරා අවස්ථාවකදී පමණක් සිදුවිය හැක.

EAD : පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම සහ මඟහැරුණු ගෙවීම්වල උපචිත පොළිය මත පහළවැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තාකරන දිනයෙන් පසු නිරාවරණ තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි.

LGD : අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අලාභ හානි සහ මුදා හැරීම් මූල්‍ය වත්කම්වල දළ ප්‍රවාහක වටිනාකමේ ගැලපුමක් ලෙස ගණනය කෙරෙන අතර වෙනස් කිරීම් පාඩු හෝ ලාභ වලින් වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලැබේ.

අපේක්ෂිත ණය අලාභ ක්‍රමයේ ශිල්පක්‍රම පහත සාරාංශගත කොට ඇත:

අදියර 1 : මාස 12 අපේක්ෂිත ණය අලාභ වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන ජීවකාල අපේක්ෂිත ණය අලාභවල කොටසක් ලෙස ගණනය කෙරේ. වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි පැහැර හැරීමක් පිළිබඳ අපේක්ෂාව මත පදනම් වී මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව බැංකුව විසින් ගණනය කරයි. මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාවන් පුරෝකථන EAD සඳහා යොදා ගන්නා අතර අපේක්ෂිත LGD වලින් ගුණකර මුල් ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි. ඉහත විස්තර කළ පරිදි මෙම එක් එක් ක්‍රියාදාමය සඳහා මෙම ගණනය කිරීම සිදු කරයි.

අදියර 2 : ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. ශිල්ප ක්‍රම විවිධ ක්‍රියාදාම භාවිතය ඇතුළුව ඉහත විස්තරකල දෙයට සමාන වන නමුත් PDs සහ LGDs උපකරණයේ ජීවකාලය තුළ තක්සේරු කෙරේ. අපේක්ෂිත මුදල් හිඟය ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි.

අදියර 3 : ණය හානිකරණය වී ඇති බවට සලකන ණය සඳහා. එවැනි ණය සඳහා ජීවකාල අපේක්ෂිත ණය අලාභ බැංකුව හඳුනා ගනී. මෙම ක්‍රමය 100%ට PD සැකසුම සහිත අදියර 2 වත්කම්වලට සමානය.

POCI : POCI වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතය මගින් වට්ටම්කළ ක්‍රියාදාම හතර සම්භාවිතා බරතැබීමක් මත පදනම් වී මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී. වාර්තාකරණ දිනයට බැංකුවට POCI වත්කම් නොමැත.

මූල්‍ය ඇප ගිවිසුම් : ණය මුදලක් සහ නොලියූ බැඳීමක් යන දෙකම ඇතුළත් ණය කාඩ්පත් සහ චක්‍රීය පහසුකම් සඳහා, අපේක්ෂිත ණය අලාභ ගණනය කර ණය සමග එකට ඉදිරිපත් කෙරේ. ණය බැඳීම් සහ ණයවර ලිපි සඳහා, වෙන්කිරීම් තුළ අපේක්ෂිත ණය අලාභය හඳුනාගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.1.1.7.2 තනි තනිව වැදගත් ණය සඳහා අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම

බැංකුව පළමුවෙන්ම බැංකුවට තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව අපේක්ෂිත ණය අලාභය තක්සේරු කරයි. එවැනි වත්කම් හානිකරණය නොකරන බවට බැංකුව තීරණය කරන අවස්ථාවක (අදියර 3 නොව), සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක් තුළ වත්කම් ඇතුළත් කරනු ලබන අතර හානිකරණය සඳහා තනි තනිව ඒවා තක්සේරු කරනු ලැබේ. කෙසේවුවද, හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලබන සහ හානිකරණ අලාභයක් හඳුනාගනු ලබන හෝ අඛණ්ඩව හඳුනාගනු ලබන වත්කම් හානිකරණය පිළිබඳ සාමූහික තක්සේරු කිරීමක් තුළ ඇතුළත් නොකෙරේ.

මුල් සළුල පොලී අනුපාතයට මූල්‍ය වත්කමක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කරමින් සහ මූල්‍ය වත්කමෙහි වර්තමාන ධාරණ අගය සමග ඇති වූ වර්තමාන වටිනාකම සසඳමින් මනින ලද අලාභයේ ප්‍රමාණයට වත්කම් හානිකරණය කෙරේ. තනි තනිව වැදගත් ගිණුම් මත හානිකරණය අවශ්‍ය අවස්ථා වලදී වඩාත් විධිමත්ව සමාලෝචනය කෙරේ. මෙයට සාමාන්‍යයෙන් දරන ලද ඇප බලාත්මක කිරීමේ හැකියාව, කාලය හා සත්‍ය සහ අපේක්ෂා කළ හැකි ලැබීම් මුදල පිළිබඳ නැවත තක්සේරු කිරීමක් ඇතුළත් වේ. ස්ථාපිත අලාභ ඇස්තමේන්තුව තුළ අඩුවීමක් පිළිබඳ සාධාරණ සහ විෂයමූලික සාක්ෂියක් ඇති අවස්ථාවකදී තනි තනිව තක්සේරු කළ හැකි හානිකරණය පමණක් මුදාහැරේ. හානිකරණය කරන ලද වත්කම් මත පොලිය වට්ටම දිගහැරුම තුළින් අඛණ්ඩව හඳුනාගැනේ.

තනි තනිව වැදගත් මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ තීරණය කරන අවස්ථාවේදී, පහත සඳහන් සාධක සලකා බලනු ලැබේ:

- නොලියන ලද අනාවරණ ඇතුළුව ගනුදෙනුකරුවාට එකතුකළ අනාවරණය;
- ගනුදෙනුකරුගේ ව්‍යාපාර ආදර්ශයේ ස්වශක්තතාව සහ මූල්‍ය දුෂ්කරතාවලින් පරිබාහිරව සාර්ථකව අලෙවි කිරීම සහ ණය බැඳීම් සේවා කිරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ ඇති කිරීම සඳහා ඒවායේ හැකියාව;
- අපේක්ෂිත ලැබීම් සහ අයකරගැනීම් ප්‍රමාණය සහ කාලය;
- බැංකුවට ඉදිරියෙන් හෝ සමානව ශ්‍රේණිගතකරණ වෙනත් ණයකරුවන්ගේ ප්‍රමාණය සහ වෙනත් ණයකරුවන් බැංකුවට තවදුරටත් සහයවීමේ සම්භාවිතාව;
- එකතුකළ ප්‍රමාණය තීරණය කිරීමේ සංකීර්ණතාව සහ සියලුම ණයකරුවන්ගේ හිමිකම් ශ්‍රේණිගතකරණය සහ නෛතික සහ රක්ෂණ අවිනිශ්චිතා ප්‍රත්‍යක්ෂවන ප්‍රමාණය;
- ඇප (හෝ වෙනත් ණය අඩුකිරීම්) උපලබ්ධි කළහැකි වටිනාකම සහ සාර්ථකව නැවත අයත්කර ගැනීමේ හැකියාව;
- හිඟමුදල් අයකරගැනීම හා සම්බන්ධ යම් පිරිවැය අඩුවිය හැකිවීම;
- දේශීය ව්‍යවහාර මුදලින් නම් කර නොමැතිනම් ණයවල ව්‍යවහාර මුදලින් ලබාගැනීමට සහ ගෙවීම් කිරීමට ණයකරුගේ හැකියාව; සහ
- ඇවරකිරීම හෝ බුන්වත්වීම මත ලබාගතහැකි ලාභාංශය.

3.1.1.7.3 අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තීර්ණ අදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයෙහි පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම් වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ නම් ඇති විය හැකි දීමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමග සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගැනේ. අනෙකුත් විස්තීර්ණ අදායම තුළ හඳුනානොගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභය හෝ අලාභයට ප්‍රතිචක්‍රීය කෙරේ.

3.1.1.7.4 මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කල මූල්‍ය වත්කම්

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කල මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනාගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී.

3.1.1.7.5 ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත දැක්වෙන කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක් මත බැංකුව විශ්වාසය තබයි:

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොලී අනුපාත
- ඇ.එ.ඩො. රුපියල් හුවමාරු අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිත කෙරෙන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශ දිනයට වෙළඳපොලේ සියළුම ගති ලක්ෂණ සෑම විටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැළකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැළපීම් හෝ ආවරන තාවකාලික ගැළපීම් ලෙස අවස්ථානුකූලව සිදුකෙරේ. එමනිසා, බැංකුව මගින් පහත දැක්වෙන ගුණාත්මක සාධකයන්ද සැළකිල්ලට ගනු ලැබේ:

- LTV සාමාන්‍ය
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

3.1.1.7.6 ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිත කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපළ, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණය දීමේ වැඩපිළිවෙල තුළින් පවරාගනු ලබන ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව අනුගමනය කල ප්‍රතිපත්තියයි.

3.1.1.7.7 නැවත අත්කරගත් ඇප

බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිත කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත් යැයි තීරණය කරන ලද වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමෙහි ධාරණ අගය දෙකෙන් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණය වෙත මාරු කෙරේ. විකිණීම වඩාත් ඵලදායී විකල්පයක් බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම් නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කරගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩු කල සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම් වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාව අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපළ හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීම සඳහා අරමුදල් අයකරගැනීමට බාහිර නියෝජිතයන් සේවයේ යොදවයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/බැඳීම් ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කර ගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපළ ශේෂ පත්‍රයේ වාර්තා කෙරේ.

3.1.1.7.8 කපාහැරීම්

බැංකුව මගින් අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේ පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් කපාහරිනු ලබයි. කපාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ අගයක් ගන්නේ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට එකතු කිරීමක් ලෙස වෙනස පළමුව සළකනු ලැබේ. යම් පසුකාලීන අයකරගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

3.1.1.7.9 සහන සහ වෙනස් කරන ලද ණය

බැංකුව සමහර අවස්ථාවන්හිදී නැවත අත්කරගැනීම හෝ වෙනත් ආකාරයකින් බලයෙන් ඇප අයකරගැනීමට වඩා ණයකරුගේ මූල්‍යමය දුෂ්කරතාවන්ට ප්‍රතිචාරයක් ලෙස ණය මුදලේ මුල් නියමයන්ට අනුග්‍රහ ලබාදීම හෝ වෙනස් කිරීම සිදුකරයි. ණයකරුගේ වර්තමාන මූල්‍යමය දුෂ්කරතාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි අනුග්‍රහ හෝ වෙනස්කිරීම් ලබාදෙනු ලබන අවස්ථාවේදී ණය මුදලක සහන වශයෙන් බැංකුව විසින් සළකනු ලබන අතර, ණයකරු මූල්‍යමය වශයෙන් යහපත් තත්ත්වයක පසුවී නම් බැංකුව එයට එකඟ නොවේ. මූල්‍යමය දුෂ්කරතාවන් පිළිබඳ දර්ශක වලට ගිවිසුම් පැහැරහැරීම් හෝ ණය අවදානම් දෙපාර්තමේන්තුව විසින් මතු කරන ලද වැදගත් ගැටළු ඇතුළත් වේ. සහන යටතේ ගෙවීම් වැඩපිළිවෙල දීර්ඝ කිරීම සහ අළුත් ණය කොන්දේසි පිළිබඳ එකඟතා සම්බන්ධ වේ. නියමයන් නැවත සාකච්ඡා කල පසු, යම් හානිකරණ නියමයන් වෙනස් කිරීමට පෙර ගණනය කල මුල් සඵල පොලී අනුපාතය භාවිතයෙන් මනිනු ලබයි. අනාගත ගෙවීම් අබණ්ඩව සිදුවන බවට සහතික කිරීමට සහායවීම සඳහා සහන ණය නියාමනය කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. හඳුනා නොගැනීමේ තීරණ සහ අදියර 2 හා 3 අතර වර්ගීකරණය සිද්ධියෙන් සිද්ධිය පදනමක් මත තීරණය කෙරේ. මෙවැනි ක්‍රියාපටිපාටි ණයක් සම්බන්ධයෙන් අලාභයක් හඳුනාගනී නම්, එය අයකරගන්නා තුරු හෝ කපාහරින තුරු හානිකරණය කල අදියර 3 සහන වත්කමක් වශයෙන් අනාවරනය කර කළමනාකරණය කෙරේ.

ණය මුදල නැවත සාකච්ඡා කර හෝ වෙනස් කර ඇති නමුත් හඳුනා නොගැනීමක් කර නොමැති අවස්ථාවක, බැංකුව මගින් 46.2 සටහනෙහි දක්වනු ලැබ ඇති පරිදි ණය අවදානම සම්බන්ධ සැළකියයුතු වැඩිවීමක් පවතීද යන්න නැවත තක්සේරු කෙරේ. එමෙන්ම, බැංකුව මගින් වත්කම් අදියර 3 ලෙස වර්ගීකරණය කළ යුතුද යන්න සළකා බලනු ලැබේ.

3.1.1.7.10 පූර්වාවරනය කරන වත්කම්

පූර්වාවරනය කරන ලද වත්කම්, ණය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බේරුම් කිරීමෙන් අත්කරගත් දේපළ නියෝජනය කරන අතර, පූර්වාවරනය කරන ලද වත්කම් වල වර්තමාන වෙළඳපොල අගට සහ අදාළ ණය මුදලේ හිඟහිටි මුදල එකී දේපළ අත්කරගත් වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ ණය තෘප්තිමත් කිරීමේදී ඇති වන ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනයක් සේ හඳුනාගනු ලබයි.

3.1.1.7.11 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර හඳුනාගනු ලැබූ ප්‍රමාණ හිලව් කිරීම සඳහා තත් අවස්ථාවේ බලාත්මක යම් නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කොට බැරකම පියවීමට එකවර ක්‍රියාකිරීමට යම් අපේක්ෂාවක් ඇතිනම් පමණක් අදාළ ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ. ගෙවීම් පැහැර හැරීමකදී සියළුම බැරකම් එකවර පියවීම පිළිබඳ ගිවිසුම් සම්බන්ධයෙන් මෙය පොදුවේ අදාළ නොවන බැවින් ආශ්‍රිත වත්කම් හා බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දළ වශයෙන් දක්වනු ලැබ ඇත.

3.1.1.8 සාධාරණ වටිනාකම තීරණය කිරීම

සාධාරණ වටිනාකම යනු වත්කම් විකිණීම සඳහා ලැබිය යුතු හෝ මිනුම් දිනයේදී වෙළඳපල සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ වටිනාකම මැනීම පදනම් වන්නේ වත්කම විකිණීම හෝ වගකීම පැවරීම යන ගනුදෙනු සිදු වන්නේ මතු දැක්වෙන උපකල්පන මත ය යන්න ඔස්සේය:

- වත්කම් හෝ වගකීම් සඳහා වන ප්‍රධාන වෙළඳපොලේ, හෝ
- ප්‍රධාන වෙළඳපොළක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත් වාසිදායක වෙළඳපොලක ගනුදෙනු සිදු වීමේ දී.

ප්‍රධාන හෝ වඩාත්ම වාසිදායික වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව බැංකුවට තිබිය යුතුය.

වත්කම් හෝ වගකීම්වල සාධාරණ වටිනාකම මනිනු ලබන්නේ වෙළඳපල සහභාගිවන්නන් ඔවුන්ගේ ආර්ථික යහපත වෙනුවෙන් ක්‍රියා කරයි යැයි උපකල්පනය භාවිත කරමින් වන අතර ඔවුන් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් විසින් එවැනි ප්‍රතිපත්තියක් භාවිත කරනු ඇති බව උපකල්පන කෙරේ.

මූල්‍යමය නොවන වත්කමක සාධාරණ වටිනාකමක් මැනීම සිදු කරනු ලබන්නේ, වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතයෙන් භාවිතා කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ ලැබීමට ඇති හැකියාව හෝ වත්කම එහි ඉහළම සහ හොඳම භාවිතයට භාවිතා කරන වෙනත් වෙළඳපල සහභාගිවන්නෙකුට විකිණීමෙන් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට වෙළඳපොළ සහභාගිවන්නෙකුට ඇති හැකියාව සැලකිල්ලට ගැනීමෙනි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සාධාරණ වටිනාකම් මැනීමේ දැඩි ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කිරීම කෙරෙහි කටයුතු කෙරෙන අතර පාලනය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා බැංකුව කටයුතු කරන අතර ප්‍රමාණවත් දත්ත ඇති බව කෙරෙහි ද සැලකිමත් වන අතර අදාළ අවස්ථාව අනුව ඇගයීමේ ක්‍රම ශිල්පය නිර්ණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම මනින හෝ අනාවරණය කරන සියලුම වත්කම් සහ වගකීම් සාධාරණ වටිනාකම් ධූරාවලිය තුළ වර්ගීකරණය කර ඇති අතර එය සමස්තයක් ලෙස සාධාරණ අගය මැනීමට වැදගත් වන අවම මට්ටමේ ආදානය මත පදනම්ව පහත පරිදි විස්තර කෙරේ:

1 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා ක්‍රියාකාරී වෙළඳපලවල මිල ගණන් (සකස් නොකළ) වෙළඳපල මිල ගණන්.

2 වන මට්ටම - සාධාරණ අගය මැනීමට සැලකිය යුතු අවම මට්ටමේ ආදානය සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරුකරණ ක්‍රම.

3 වන මට්ටම - සාධාරණ අගය මැනීමට සැලකිය යුතු අවම මට්ටමේ ආදානය සොයාගත නොහැකි තක්සේරුකරණ ක්‍රම.

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති වත්කම් සහ වගකීම් සඳහා, එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් ධූරාවලියේ මට්ටම් අතර මාරුවීම් සිදුවී ඇත්දැයි බැංකුව තීරණය කරයි (සමස්තයක් ලෙස සාධාරණ අගය මැනීමට වැදගත් වන අවම මට්ටමේ ආදානය මත පදනම්ව)

මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෙළිදරව් කිරීම සටහන් අංක 44 හි දක්වා ඇත.

3.1.2 දේපල, පිරියත සහ උපකරණ

වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් දේපළ, පිරියත සහ උපකරණ (PPE) පිළිගැනේ.

දේපළ, පිරියත සහ උපකරණ වල පිරිවැයෙන් ඒවායේ දෛනික සේවා කිරීමේ පිරිවැය අත්හැර උපචිත ක්ෂයකිරීම් හා වටිනාකමේ උපචිත හානිකරණ අඩු කොට දක්වනු ලබයි. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලයේ යෝග්‍ය පරිදි ක්ෂයකිරීම් කාලපරිච්ඡේදය හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් ගණන්දීම සිදුකරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වලදී වෙනස්කම් සේ සළකනු ලබයි. වත්කම් භාවිතය සඳහා පවත්නා අවස්ථාවේ සිට ආරම්භ කර ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලයේ ක්ෂයවීම සරල මාර්ග පදනමින් ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලබයි.

ගොඩනැගිලි	5% වාර්ෂිකව
පරිගණක උපකරණ	20% වාර්ෂිකව
කාර්යාලීය උපකරණ	20% වාර්ෂිකව
මෝටර් රථ	20% වාර්ෂිකව
ගෘහ භාණ්ඩ	15% වාර්ෂිකව
යකඩ සේප්පු	10% වාර්ෂිකව
බෙදුම් හා සවිකිරීම්	20% වාර්ෂිකව

පසු වියදම් වල අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒම සසම්භාවී වන විට එම වියදම් ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

දේපළ, පිරියත සහ උපකරණ වලට අයත් යම් අයිතමයක් බැහැර කිරීමේදී හෝ භාවිතාව තුළින් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලබාගත නොහැකි විට එහි ධාරණ අගය පිළිගැනීම අහෝසි කරනු ලැබේ. කිසියම් වත්කමක් පිළිගැනීම අහෝසි කිරීමකදී ඇති වන (බැහැර කිරීමේ ශුද්ධ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරනු ලබන) ලාභය හෝ අලාභය අදාළ වත්කම පිළිගැනීම අහෝසි කරනු ලැබූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් මෙහෙයුම් - ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.

සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යය ඒවායේ පිරිවැය මත දක්වනු ලබන අතර ඒවා ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සෘජුව දරන ලදුව ප්‍රාග්ධනීකරණයට නියමිත ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

3.1.3 කල්බදු

යම්කිසි සැලසුමක් එම සැලසුමෙහි අන්තර්ගතය මත කල්බද්දක් ද නැතිනම් කල්බදු ඇතුළත් වන්නක් ද යන්න තීරණය කරන අතර එම සැලසුම ඉටුකිරීමට විශේෂිත වත්කමක් හෝ වත්කම් භාවිත කරනවා ද යන්න එම සැලසුම එකී වත්කම් භාවිත කිරීමට අයිතියක් ප්‍රකාශ කරනවා ද යන්න මත කරන තක්සේරුවක් අවශ්‍ය වේ.

3.1.3.1 මූල්‍ය කල්බදු - බැංකුව බදුකරු ලෙස

බද්දට ගත් අයිතමය හිමිකරුට ආනුශංගික වන සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මකව බැංකුවට පැවරෙන මූල්‍ය කල්බදු ආරම්භයේ සිට බද්දට ගත් දේපලෙහි සාධාරණ අගය මත එය පහළ මට්ටමක පවතින්නේ නම් අවම බදු ගෙවීමේ වර්තමාන අගය මත හෝ ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. කල්බදු ගෙවීමේ මූල්‍ය ගාස්තු සහ කල්බදු වගකීම් වල අවකරණය අතර බෙදා වෙන් කරන අතර එවිට පවතින වගකීම් වල ශේෂය මත ස්ථාවර පොලී අනුපාතයක් ලබාගත හැක. මූල්‍ය ගාස්තු ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි අයකර තිබේ.

කල්බදු කාලසීමාව අවසානයේ බැංකුව අයිතිය තහවුරු කරගත හැකි යැයි සාධාරණ නිශ්චිත බවක් නොමැති විට ප්‍රාග්ධනිත කල්බදුකරණය කරන ලද වත්කම් කල්බදු කාලසීමාව සහ ඇස්තමේන්තු කරන ලද වත්කමෙහි ප්‍රයෝජනවත් කාලසීමාව යන දෙකින් වඩාත් කෙටි වන්නේ කුමක්ද එය මත ක්ෂයවීම් කරනු ලැබේ. ක්ෂය කළ හැකි කල්බදුකරණය කරන ලද වත්කම් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය 3.1.2 සටහනෙහි පැහැදිලි කොට ඇති හිමි කර ගෙන ඇති ක්ෂය කළ හැකි වත්කම් සමග අනුකූල වේ.

3.1.3.2 මෙහෙයුම් කල්බදු (2019 ජනවාරි 1 ට පෙර)

බැංකුව බදුදීමනාකරු ලෙස

වත්කමෙහි හිමිකාරිත්වය පිළිබඳ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මකව බැංකු විසින් පවරනු නොලබන කල්බදු මෙහෙයුම් කල්බදු යටතේ වර්ගීකරණය කෙරේ. මෙහෙයුම් කල්බදු සාකච්ඡා කිරීමේදී දරන ලද මූලික පිරිවැය කල්බදු වත්කමෙහි ධාරණ අගයට එකතු කෙරෙන අතර කල්බදු කාලසීමාව පුරා කුලී ආදායම වශයෙන් සමාන පදනමින් හඳුනාගැනේ. අසම්භාව්‍ය කුලී ඒවා උපයන ලද කාලපරිච්ඡේදය තුළදී ආදායම වශයෙන් හඳුනාගැනේ.

3.1.4 අස්පෘශ්‍ය වත්කම්

බැංකුවේ වෙනත් අස්පෘශ්‍ය වත්කම් වලට පරිගනක මෘදුකාංග වල අගය ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලබන්නේ එහි වියදම විශ්වසනීය ලෙස මැනිය හැකිවීමත් එයට ආරෝපණය කළ හැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒමේ හැකියාවත් මතය.

වෙන වෙනම අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් මූලිකව වියදම මත හඳුනාගනු ලැබේ. මූලික හඳුනාගැනීම අනුව යමින් අස්පෘශ්‍ය වත්කම් වියදම් රහිතව ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂයක් සහ ඕනෑම සමුච්චිත හානිකරණ අලාභයක් මත ගෙන යනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් වල ප්‍රයෝජනවත් කාලසීමාව තක්සේරු කරනු ලබන්නේ පරිමිත හෝ අපරිමිත වශයෙනි. පරිමිත ප්‍රයෝජනවත් කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂ කාලය සහ ක්‍රමක්ෂය ගණනය කරනු ලබන ක්‍රමය සමාලෝචනය කිරීම අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේදී සිදුකරනු ලැබේ. වත්කම් වල අන්තර්ගතව ඇති අපේක්ෂිත ප්‍රයෝජනවත් කාලසීමාවන්හි හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවෙහි වෙනස්කම් යෝග්‍ය පරිදි ක්‍රමක්ෂ කාලය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් හෝ වාර්තා කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සළකනු ලබයි. පරිමිත කාලසීමාවක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂ වියදම ආදායම් ප්‍රකාශයෙහි වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වා ඇත.

අස්පෘශ්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලසීමාව තුළ ඒවායේ වියදම ඒවායේ අවශේෂ වටිනාකමට ලියා තැබීම සඳහා සරල මාර්ග පදනම යොදාගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ.

⦿ පරිගණක මෘදුකාංග - වසර 3

3.1.5 මූල්‍ය නොවන වත්කම් හානිවීම

සෑම වාර්තාකරණ දිනකම යම්කිසි වත්කමක් හානි වන්නේද යන්න පිළිබඳ ඇඟවීමක් තිබේද යන්න බැංකුව මගින් තක්සේරු කරනු ලැබේ. එවැනි යම්කිසි ඇඟවීමක් තිබෙන විට හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ විට බැංකුව අදාළ වත්කමෙහි ප්‍රතිලබධිය අගය ඇස්තමේන්තු කරයි.

වත්කමක ධාරණ අගය එහි ප්‍රතිලබධිය අගය අභිබවා යන්නේ නම් හානිකරණ අලාභයක් හඳුනාගත හැක. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත හැක.

3.1.6 මූල්‍ය ඇප

ණය උපකරණයේ කොන්දේසි වලට අනුකූලව ගෙවීමට තිබෙන යම්කිසි ගෙවීමක් සිදුකිරීමට විශේෂිත ණයකරුවකු අපොහොසත් වුවහොත් ඇති වන අලාභය ධාරකයාට ප්‍රතිපූරණය කිරීම සඳහා ගෙවීමට සිදුවන විශේෂිත ගෙවීම් වලට අවශ්‍ය වන කොන්ත්‍රාත් ''මූල්‍ය ඇප'' යනුවෙන් හැඳින්වේ. ''ණය වගකීම්'' යනු පූර්වයෙන් නිශ්චය කරන ලද නියමයන් හා කොන්දේසි ණය ලබාදීමට ඇති ස්ථාවර බැඳීම් වේ.

වෙළඳපොල පොලී අනුපාතයට වඩා පහළ අගයක ණයක් ලබාදීම සඳහා වන මූල්‍ය ඇප හෝ වගකීම් නිසා ඇති වන වගකීම් මූලික වශයෙන් සාධාරණ අගය මත ගණනය කෙරෙන අතර මූලික සාධාරණ අගය ඇපයේ කාලසීමාව හෝ බැඳීම මත ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමක් සිදුවිය හැකි විට මෙම වගකීම නිරවුල් කිරීම සඳහා වන ඕනෑම අපේක්ෂිත ගෙවීමක වර්තමාන අගය සහ මෙම ක්‍රමක්ෂය කරන ලද ප්‍රමාණයේ ඉහළ මට්ටමට පසුව වගකීම ගෙන යනු ලැබේ. වෙළඳපොල පොලී අනුපාතයට වඩා පහළින් ණයක් සැපයීම සඳහා වන මූල්‍ය ඇප හා බැඳීම් අපගේ වෙනත් වගකීම් වල ඇතුළත් කොට ඇත.

3.1.7 විශ්‍රාමික ප්‍රතිලාභ

3.1.7.1 නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලසුම්/පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 - LKAS 19 - ''සේවා නියුක්ති ප්‍රතිලාභ'' හි නිශ්චය කොට ඇති ආකාරයට නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

3.1.7.2 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව ගිණුම් වල ප්‍රතිපාදන සළසනු ලැබ ඇත.

අරමුදල යටතේ පවතින පූර්ණ වගකීම් තහවුරු කරගැනීම සඳහා සෑම වසරකම අවසානයේ ආයුගණක ඇගයීමක් සිදුකරනු ලැබේ. මෙම ඇගයීම 2019 දෙසැම්බර් 31 දිනට සුදුසුකම්ලත් ආයුගණකයින් වන ''Messers Acturial and Management Consultants (Pvt) Ltd.'' ආයතනය විසින් සිදුකරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආයුගණක ලාභ සහ අලාභ හඳුනාගැනීම : සැලසුමට අනුව බැංකුවේ වගකීම් ගණනය කිරීමේදී පැන නගින මුළු ආයුගණක ලාභ සහ අලාභ බැංකුව විසින් හඳුනාගනු ලබන්නේ ඒවා ඇති වන කාලසීමාව තුළ පැන නගින වෙනත් පරිපූර්ණ ආදායම් තුළය.

අරමුදල්කරණය සැලසුම් කිරීම : පාරිතෝෂික වගකීම් බාහිරව අරමුදල්කරණය නොකෙරේ.

3.1.7.3 නිශ්චිත දායකත්ව විශ්‍රාම සැලසුම

"නිශ්චිත දායකත්ව සැලසුමක් යනු යම් කිසි ආයතනයක් වෙනත් ආයතනයකට (අරමුදලක්) නිශ්චිත දායකත්වයක් දක්වන සහ එම අරමුදලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19" LKAS 19 "සේවා නියුක්ති ප්‍රතිලාභ" හි සඳහන් ආකාරයට සේවකයන්ට වර්තමානයේ සහ පූර්ව කාලය තුළ අදාළවන ප්‍රතිලාභ හෝ සියලුම සේවකයන්ට ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් වත්කම් නොමැති නම් වැඩිදුර දායකත්වයක් දැක්වීම සඳහා නීතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නැති පශ්චාත් සේවා නියුක්ති සැලසුමකි.

නිශ්චිත දායකත්ව සැලසුමකට ගෙවිය යුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ලබා දී ඇති සේවයට සමානුපාතික වන අතර ඒවා ගෙවීමට තිබෙන සෑම අවස්ථාවකදීම "පුද්ගලික වියදම්" යටතේ සටහන් කරනු ලැබෙයි. නොගෙවූ දායකත්වයන් වගකීම් ලෙස සටහන් වෙයි.

1. සේවක අර්ථසාධක අරමුදල

   බැංකුවේ සහ සේවකයන්ගේ සේවක අර්ථසාදක අරමුදලට දායකත්වය පිළිවෙළින් 15% සහ 10% ක් වෙයි.

2. සේවක භාරකාර අරමුදල

   බැංකුව සේවක භාරකාර අරමුදලට 3% දායකත්වයක් සපයයි.

3.1.8 ප්‍රතිපාදන

කිසියම් පසුගිය සිද්ධියක් නිසා බැංකුවට යම් වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ඇති විට සහ ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත කෙරෙන සම්පත් පිටතට ගලායාමක් තිබෙන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය විය හැකි විටෙක සහ විශ්වසනීය ඇස්තමේන්තුවක් වගකීමේ ප්‍රමාණයට සකස් කල හැකි විටෙක ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ඕනෑම ප්‍රතිපාදනයකට අදාළ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ආදායම් ප්‍රකාශ ජාලයෙහි ඉදිරිපත් කොට ඇත.

3.1.9 ආදායම් සහ වියදම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලාවිත් ආදායම විශ්වසනීය අයුරින් මැනගත හැකිවීමේ හැකියාව ඇති විට ආදායම හඳුනාගනු ලැබේ. ආදායම හඳුනාගැනීමට පෙර පහත සඳහන් විශේෂිත නිර්ණායක සපුරාලීම අවශ්‍ය වේ.

3.1.9.1 පොළී සහ සමාන ආදායම් හා වියදම්

ක්‍රමක්ෂය කරන ලද වියදම මත ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ, පොළී අනුපාත සහිත මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා තිබෙන දේ ලෙස වර්ගීකරණය කර ඇති අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත නියම කර ඇති මූල්‍ය උපකරණ, පොළී ආදායම හෝ වියදම (EIR) භාවිතා කර වාර්තා කරනු ලැබෙයි. (EIR) යනු මූල්‍ය උපකරණයට අපේක්ෂිත ජීවන කාලය හෝ කෙටි කාලසීමාවක් හරහා සුදුසු පරිදි මූල්‍ය වගකීම් හෝ මූල්‍ය වත්කම්වල ශුද්ධ ධාරණ අගයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නියම වශයෙන් ම වට්ටම් කරන අනුපාතයයි. මෙම ගණනය කිරීමේ දී සියලුම ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගන්නා අතර උපකරණ වලට සෘජුවම අදාළවන ගාස්තු හෝ වෘද්ධිමය වියදම් අතුළත් වන අතර එය සපල පොළී අනුපාතය (EIR) හි අවශ්‍යම අංගයක් වන නමුත් අනාගත ණය අලාභයක් නොවෙයි.

බැංකුව සිය ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ධාරණ අගය ගළපනු ලබයි. ගළපන ලද ධාරණ අගය මූලික සඵල පොළී අනුපාතය පදනම් කරගෙන ගණනය කරනු ලබන අතර ධාරණ අගයෙහි වෙනස මූල්‍ය වත්කම් සඳහා ''පොළී හා සමාන ආදායම්'' සහ ''පොළී හා සමාන වියදම්'' යටතේ සටහන් කරනු ලැබේ. කෙසේවෙතත් මුදල් ලැබීම් ආපසු අයකරගැනීම වර්ධනය වීම නිසා බැංකුව පසුව අනාගත මුදල් ලැබීම් වැඩි කරනු ලැබූ නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් (3.1.1.5 සටහන බලන්න) සඳහා එම වැඩිවීම ඇස්තමේන්තුවේ වෙනස සිදුකල දින සිට සඵල පොළී අනුපාත වලට කරන ලද ගැළපීමක් ලෙස සටහන් කොට ඇත.

හානිකරණ අලාභයක් නිසා මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තාගත අගය අඩු කල විට පොළී ආදායමෙහි හානිකරණ අලාභය මැන බැලීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහය වට්ටම් කිරීමට යෙදාගත් පොළී අනුපාතය යොදා ගෙන හඳනාගැනීම සිදු කෙරේ.

3.1.9.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන විවිධ වූ සේවාවන් මාලාවක් තුළින් බැංකුව ගාස්තු හා කොමිස් ආදායම් උපයා ගනියි. ගාස්තු ආදායම පහත සඳහන් ප්‍රභේදයන්ට බෙදිය හැක.

3.1.9.3 යම්කිසි කාලසීමාවක් පුරා ලබාදෙන සේවාවන්ගෙන් උපයාගනු ලබන ගාස්තු ආදායම

යම්කිසි කාලසීමාවක් පුරා ලබාදෙන සේවාවන් සඳහා උපයාග නු ලබන ගාස්තු එම කාලය තුළ උපචිත වේ. මෙම ගාස්තු වලට කොමිස් ආදායම, ණය සේවා ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු හා ගනුදෙනුකරුවාගෙන් නැවත අයකර ගනු ලබන ලිපිලේඛන ගාස්තු ඇතුළත් වේ.

ලබා ගැනීමට හැකියාව ඇති ණය සඳහා ණය බැඳීම් ගාස්තු සහ වෙනත් ණයට සම්බන්ධ ගාස්තු විලම්බනය කර (යම්කිසි වර්ධනීය පිරිවැයක් ඇත්නම් එය සමග) ණය මත පවතින සඵල පොළී අනුපාතය සඳහා කරන ගැළපීමක් ලෙස හඳුනාගැනේ. යම්කිසි ණයක් ලබාගැනීමට ඇති හැකියාව අඩු නම් ණය බැඳීම් ගාස්තු සරල මාර්ග පදනම යටතේ බැඳියාව ඇති කාලසීමාව තුළ හඳුනාගනු ලැබේ.

3.1.9.4 බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 - LKAS 12 - ''ආදායම් බදු'' අනුව බදු වියදම යනු වර්තමානයේ හා විලම්බනය කරන ලද කාලසීමාව සහ ලාභ හා අලාභ තීරණය කිරීමේදී ඇතුළත් වන මුළු ප්‍රමාණයයි. ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශයේ සෘජුව ''ස්කන්ධ ප්‍රාග්ධනය'' සහ ''වෙනත් විස්තීර්ණ ආදායම්'' යන අයිතමයන්ට අදාළ වන ප්‍රමාණයට ව්‍යතිරේකව ස්කන්ධ ප්‍රාග්ධනය හෝ වෙනත් විස්තීර්ණ අදායම ලෙස හඳුනාගැනේ.

3.1.9.5 පවත්නා බදු

පවතින වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ පවත්නා බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු අධිකාරය වෙත ගෙවීමට තිබෙන හෝ ආපසු අයකර ගැනීමට තිබෙන ප්‍රමාණය මතය. ප්‍රමාණය ගණනය කිරීමට භාවිත කරන බදු අනුපාත සහ නීති වාර්තාකරණ දිනට ක්‍රියාත්මක හෝ ක්‍රියාත්මක යැයි අපේක්ෂිත ඒවා වේ.

ඒ අනුව, බදුකරණය සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ 2006 අංක 10 දරණ දේශීය අදායම් පනත සහ 2017 අංක 24 දරණ පනත එය වෙත සිදුකරන ලද සංශෝධනත් මූල්‍ය ප්‍රකාශයෙහි 14 වැනි සටහනෙහි දක්වා ඇති අනුපාතිකයන්ටත් අනුව බදුකරණය සඳහා ගැළපුම් කරන ලද වසර සඳහා වන ලාභය මතය.

3.1.9.6 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණ සඳහා වන වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනයේදී ඇති තාවකාලික වෙනස මත විලම්බිත බදු හඳුනාගැනේ. පහත සඳහන් කාරණා වලදී හැර සියළුම බදු අය කෙරෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනාගැනේ.

- විලම්බිත බදු වගකීම ඉස්මතු වන්නේ මූලික අවස්ථාවේදීම කීර්තිනාමය හඳුනාගැනීමෙන් හෝ ව්‍යාපාරික සංකලනයක් නොවන වත්කමක් හෝ වගකීමක් කෙරෙන් සිදුවන ගනුදෙනුවක් මගින් ගිණුම්කරණ ලාභයටවත් බදු ගෙවිය යුතු ලාභයටවත් බලපෑමක් නොවන විට,
- පරිපාලිත සමාගම් වල කරන ලද ආයෝජන වලට අදාළ බදු අයකල හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළව එම තාවකාලික වෙනස්කම් වල ප්‍රවර්තනයෙහි කාල නිර්ණය කිරීම පාලනය කළ හැකි අවස්ථාවල සහ තාවකාලික වෙනස පෙනෙන අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවක් නොමැති අවස්ථාවලදී.

සියළුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල ඉදිරියට ගෙන යාම සඳහා සහ පහත සඳහන් අවස්ථාවල හැර අඩු කල හැකි තාවකාලික වෙනස සහ භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල ඉදිරියට ගෙන යාමට එදිරිව බදු අය කල හැකි ලාභය තිබේ යැයි සිතන ප්‍රමාණයට විලම්බිත බදු හඳුනාගනු ලැබේ:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළ විලම්බිත බදු වත්කම් යම්කිසි ගනුදෙනුවකදී ව්‍යාපාර සම්බන්ධයෙන් නොමැති වත්කමක් හෝ වගකීමක් ලෙස මූලිකව හඳුනාගෙන ඇති අවස්ථාවක දී සහ ගනුදෙනු සිදුකරන අවස්ථාවේ ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකල හැකි ලාභයට හෝ අලාභයට බලනොපාන අවස්ථාවකදී,
- පරිපාලිත සමාගම් වල සිදුකරන ලද ආයෝජන වලට සම්බන්ධ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගන්නේ තාවකාලික වෙනස පෙනෙන අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත සහ තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි තත්ත්වයට එදිරිව බදු අයකල හැකි ආදායම පවතින තත්ත්වයක් මත පමණක් වේ.

විලම්බිත බදු වත්කම් වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර එය විලම්බිත බදු වත්කම් වල සියල්ල හෝ කොටසක් උපයෝජනය කිරීමට ඉඩ දෙන පරිදි ප්‍රමාණවත් බදු අය කල හැකි ලාභයක් ඇති වීමට ඇති හැකියාව නොමැති වන තත්ත්වයට අඩු කරනු ලබයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කල හැකි ලාභය විසින් විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට ඇති හැකියාවේ ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක මට්ටමේ පවතින බවට අපේක්ෂිත බදු අනුපාත (සහ බදු නීති) පදනම්ව වත්කම උපලබ්ධි වන විට හෝ වගකීම නිරවුල් කරන විට වසර තුළ අදාළ කරගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් සහ වගකීම් ගණනය කරනු ලැබේ.

සම කොටස් වල සෘජුවම හඳුනාගත් අදාළ පවතින බදු සහ විලම්බිත බදු සම කොටි වල යළි හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශය තුළ හඳුනා නොගනියි.

බදු අය කල හැකි ආයතනයට සහ එම බදුකරණ අධිකාරියට අදාළ පවතින බදු වගකීම් වලට සහ විලම්බිත බදු වලට එදිරිව පවතින බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව බලාත්මක වන අයිතියක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

3.1.9.7 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කරනු ලබන්නේ 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සහ එහි ඊට පසුව කරන ලද සංශෝධන වලට අනුකූලව වේ. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ පදනම වනුයේ එකතු කළ අගය මත බද්දට පෙර ගිණුම්ගත ලාභය සහ නියමිත අනුපාතයන්ට අනුව ගණනය කරන ලද සේවක පාරිශ්‍රමික සහ ආර්ථික ක්ෂයවීම් සඳහා ගළපන ලද අදායම් බදු වේ.

3.1.9.8 මූල්‍ය සේවා මත අයකරන ජාතිය ගොඩනැගීමේ බද්ද

ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරනු ලබන්නේ 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත හා 2014 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක ඊට කරන ලද සංශෝධන වලට අනුකූලවයි. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරනු ලබන්නේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා භාවිත කරන ලද අගය එකතු කිරීමෙන් 2% ක් වශයෙනි.

3.1.9.9 ලාභාංශ මත රැඳවුම් බද්ද

දේශීය පරිපාලිත සමාගම් වල බදු අය කළ හැකි ලාභයෙන් බෙදාහරින ලද ලාභාංශ මූලාශ්‍රයේදීම 10% ක අඩු කිරීමක් සිදුකරගන්නා අතර බැංකුවේ බදු වගකීම් වලට එදිරිව හිලව් කිරීමක් සිදුනොවේ.

බැංකුවේ ලාභාංශ බෙදීම මත ඇති වන රැඳවුම් බද්ද අදාළ ලාභාංශ ගෙවීම සඳහා වන වගකීම් හඳුනාගන්නා අවස්ථාවේදීම හඳුනාගැනේ.

3.1.9.10 ආර්ථික සේවා ගාස්තුව

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත සහ ඉන් අනතුරුව එය වෙත සිදුකරන ලද සංශෝධන වලට අනුව, වගකීමෙන් බැඳෙන පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තුව ගණනය කෙරේ. වර්තමානයේදී, ආර්ථික සේවා ගාස්තුව 0.5% ක් වශයෙන් ගෙවිය යුතු වන අතර එය ගෙවිය යුතු ආදායම් බදු වලින් අඩු කරගත හැකි වේ. හිමිකම් නොකියන ලද ආර්ථික සේවා ගාස්තු, ඇත්නම්, ඒවා ඉදිරියට ගෙන ගොස් එළඹෙන වසර දෙකකදී ගෙවිය යුතු ආදායම් බදු වලට එදිරිව හිලව් කල හැකි වේ. මෙම බද්ද 2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් අහෝසි කරන ලදී.

3.1.9.11 ණය ආපසු ගෙවීමේ බදු (DRL)

2018 ඔක්තෝබර් 1 වැනි දින සිට, 2018 අංක 35 දරණ මුදල් පනත අනුව මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අරමුණු සඳහා මුළු අගය එකතු කිරීම මත පදනම්ව මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු ගණනය කෙරේ. 2019 යොදාගැනුනු ණය ආපසු ගෙවීමේ ගාස්තු අනුපාතය 7% (2018 - 7%) කි. මෙම බද්ද 2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් අහෝසි කරන ලදී.

3.1.9.12 බෝග රක්ෂණ බද්ද (CIL)

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුව, 2013 අප්‍රියෙල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බෝග රක්ෂණ බද්ද හඳුන්වාදෙන ලද අතර එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, බෝග රක්ෂණ බද්ද බදු වලට පසු ලාභයෙන් 1% ක් වශයෙන් ගෙවිය යුතු වේ.

3.1.10 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාගනු ලබන අතර ස්කන්ධ ප්‍රාග්ධනය බැංකුවේ කොටස් හිමියන් විසින් අනුමත කරනු ලබන අවස්ථාවේදී ස්කන්ධ ප්‍රාග්ධනයෙන් අඩු කරනු ලැබේ. අතුරු ලාභාංශ ස්කන්ධ ප්‍රාග්ධනයෙන් අඩු කරනු ලබන්නේ ඒවා ප්‍රකාශයට පත් කිරීම සහ තවදුරටත් බැංකුවේ අභිමතයට යටත් නොවීම යන කරුණු සපුරාලන අවස්ථාවේදීය.

3.1.11 කොටසක් මත ඉපැයීම්

බැංකුව කොටසක් මත මූලික ඉපයීම් දත්ත එහි සාමාන්‍ය කොටස් සඳහා ඉදිරිපත් කරයි. කාලසීමාව තුළ ගෙවීමට ඇති සාමාන්‍ය කොටස් වල හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණය මගින් බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන ලාභය හෝ අලාභය බෙදීමෙන් මූලික කොටස් මත ඉපයීම් ගණනය කෙරේ. සේවකයන්ට ලබාදෙන ලද කොටස් විකල්ප වල අඩංගු වන තනුකික භව්‍ය සාමාන්‍ය කොටස් වල හරිත සාමාන්‍ය අගය සහ සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ වන ලාභය හෝ අලාභය ගැළපීමෙන් තනුකික කොටස් මත ඉපයීම් තීරණය කරනු ලැබේ.

3.1.12 SLFRS 15 - ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් ඔස්සේ ලැබෙන ආදායම

SLFRS 15 2018 ජනවාරි 1 දින හෝ එයට පසු ආරම්භ වන මූල්‍ය කාලසීමා සඳහා බලාත්මක බවට පත් විය. SLFRS 15 හි ප්‍රධාන මූලධර්මය වනුයේ ආයතනයක් ගනුදෙනුකරුවන් වෙත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා මාරුකිරීම විස්තර කරන ආදායම හඳුනාගත යුතු වීමයි. මෙම ප්‍රධාන මූලධර්මය සාකච්ඡා කරන ලද පරිදි පියවර පහක ආදර්ශ රාමුවක් තුළ ලබාදෙනු ලැබේ.

- ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම (ගිවිසුම්) හඳුනාගැනීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම් හඳුනාගැනීම
- ගනුදෙනු මිළ තීරණය කිරීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම් වලට ගනුදෙනු මිල වෙන් කිරීම
- ආයතනය කාර්යසාධන බැඳීමක් තෘප්තිමත් කරන අවස්ථාවේදී (හෝ පරිදි) ආදායම හඳුනාගැනීම

මෙම මාර්ගෝපදේශය යොදා ගැනීම ගනුදෙනුකරුවකු සමඟ ගිවිසුමක් තුළ ඉදිරිපත් කෙරෙන සාධක සහ වාතාවරනය මත රඳා පවතින අතර විනිශ්චය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

4. නිකුත්කරන ලද නමුත් 2019 දෙසැම්බර් 31 දිනට බලාත්මක නොවූ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ අයතනය විසින් නිකුත් කරන ලද පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අර්ථදැක්වීම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් බලාත්මකව නොපැවතිනි. බලාත්මක වීමෙන් අනතුරුව, අදාළ වේ නම්, මෙම නව සහ සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කිරීමට බැංකුව විසින් අදහස් කෙරේ.

SLFRS 17 - රක්ෂණ ගිවිසුම්

SLFRS 17 "රක්ෂණ ගිවිසුම්" යනු හඳුනා ගැනීම සහ මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම් ආවරණය වන පරිදි රක්ෂණ ගිවිසුම් සඳහා පුළුල් නව ගිණුම්කරණ ප්‍රමිතියකි. ක්‍රියාත්මක වූ පසු, SLFRS 17 මඟින් පවත්නා SLFRS 4 "රක්ෂණ ගිවිසුම්" ප්‍රතිස්ථාපනය කෙරෙන අතර SLFRS 17 හි සමස්ත පරමාර්ථය වන්නේ රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණ ආකෘතියක් සැපයීමයි.

2021 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන කාල සීමාවන් වාර්තා කිරීම සඳහා SLFRS 17 බලපැවැත්වේ. ආයතනය විසින් SLFRS 16 සහ SLFRS 15 යටතේ අයදුම් කරන්නේ නම් එය SLFRS 17 පළමු වරට අදාළ වන දිනට හෝ ඊට පෙර අයදුම් කළ යුතු වන අතර කල් තබා සිදු කරන එවැනි අයදුම්පත් සඳහා අවසර දෙනු ලැබේ. මෙම ප්‍රමිතිය බැංකුවට මේ වන විට අදාළ නොවේ.

LKAS 1 සහ LKAS 8 සඳහා වන සංශෝධන: වාස්තවික අර්ථ දැක්වීම

LKAS 1 "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" සහ LKAS 8 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු හා දෝෂයන්" සඳහා වන සංශෝධන සිදු කරනු ලබන්නේ "වාස්තවික" යන්නෙහි අර්ථ දැක්වීම ප්‍රමිතිය හරහා පෙළගැස්වීමට කටයුතු කෙරෙන්නේ අර්ථ දැක්වීමේ ඇතැම් කරුණු පැහැදිලි කිරීමට ය. නව අර්ථකථනයෙහි දැක්වෙන්නේ, "තොරතුරු වාර්තා කිරීම අතහැර දැමීම හෝ අපැහැදිලි කිරීම නම්, පොදු වාර්තාකරණ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාථමික පරිශීලකයින් විසින් ගනු ලබන තීරණ වලට බලපෑම් කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි අතර, එම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන නිශ්චිත වාර්තාකරණයන් පිළිබඳ මූල්‍ය තොරතුරු සපයයි.

පූර්ව අයදුම්පත් සඳහා අවසර ලබා දී ඇති 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා සංශෝධන අපේක්ෂා කෙරේ.

වාස්තවික අර්ථ දැක්වීමේ සංශෝධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

SLFRS 3 සඳහා වන සංශෝධන: ව්‍යාපාරයක් අර්ථ දැක්වීම

SLFRS 3 ව්‍යාපාර සංයෝජනයන්හි නිර්වචනය සඳහා වන සංශෝධනයන් සකසනු ලැබ ඇත්තේ සමාගම් සඳහා අත්පත් කරගන්නා ලද ක්‍රියාකාරකම් හෝ වත්කම් කාණ්ඩයක් ව්‍යාපාරයක්ද නැතහොත් එසේ නොවේද යන්න නිර්ණය කිරීම සඳහා උපකාරී වනු පිණිසය. එමගින් ව්‍යාපාරයක් සඳහා වන අවම අවශ්‍යතා පැහැදිලි කරමින්, කවර හෝ අස්ථානගත සංරකවයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වෙළඳපොල සහභාගිකයින් සතුව හැකියාවක් පවතීද යන තක්සේරුකරණය ඉවත් කරමින්, කිසියම් අත්පත් කරගන්නා ලද ක්‍රියාවලියක් ප්‍රායෝගික වන්නේද යන්න තක්සේරු කිරීම සඳහා සමාගම් වෙත උපදේශන සහාය ලබාදෙමින්, ව්‍යාපාරයක් සහ එහි ප්‍රතිඵල සම්බන්ධ නිර්වචනයන් ලඝු කරමින් වරණීය සංකේන්ද්‍රණතා පරීක්ෂාවක් හඳුන්වාදෙනු ලැබේ.

අත්පත් කර ගැනීමේ දිනය 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ඇරඹෙන පළමු වාර්ෂික වාර්තාකරණ කාල සීමාව තුළ හෝ ඊට පෙර අත්පත් කර ගැනීමේ දිනය පවතින සියලුම ව්‍යාපාරික සංයෝජන සහ වත්කම් අත්පත් කර ගැනීම් සඳහා සංශෝධන අනාගතයට අදාළ වන පරිදි අදාළ වේ.

SLFRS ප්‍රමිතිවල සංකල්පීය රාමුවට යොමු කිරීම සඳහා වන සංශෝධන

සංකල්පීය රාමුවට සංශෝධන සිදු කරනු ලැබුවේ සමහර වැදගත් කරුණු ආවරණය නොවූ නිසා සහ සමහර මග පෙන්වීම් අපැහැදිලි හෝ යල්පැන ඇති බැවිනි. සංශෝධිත සංකල්ප රාමුවට ඇතුළත් වන්නේ:

- මිනුම් පිළිබඳ නව පරිච්ඡේදයක්;
- මූල්‍ය කාර්ය සාධනය වාර්තා කිරීම සඳහා මග පෙන්වීම;
- වත්කමක් සහ වගකීමක් පිළිබඳ වැඩි දියුණු කළ නිර්වචන සහ මෙම නිර්වචන සඳහා සහාය වන මග පෙන්වීම; හා
- මූල්‍ය වාර්තාකරණයේ භාරකාරත්වය, විවක්ෂණභාවය සහ මිනුම් අවිනිශ්චිතතාව වැනි වැදගත් ක්ෂේත්‍රවල පැහැදිලි කිරීම්

මෙම සංශෝධන 2020 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික කාල සීමාවන් සඳහා බලපැවැත්වෙන බැවින්, වාර්තා කරන දිනට මෙම සංශෝධන මගින් බැංකුවට කිසිදු බලපෑමක් සිදු නොවනු ඇත. තවද, SLFRS ප්‍රමිතිවල සංකල්පීය රාමුව වෙත යොමු කිරීම් සංශෝධනය කිරීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

5. දළ අදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
පොළී ආදායම (සටහන 6.1)	26,357,071,298	24,865,108,981
ගාස්තු හා කොමිස් ආදායම (සටහන 7)	1,134,421,656	1,186,795,173
ශුද්ධ වෙළඳ ලාභය/(අලාභය) (සටහන 8)	4,757,039	1,215,762
වෙනත් මෙහෙයුම් ආදායම (සටහන 9)	11,571,062	17,490,689
මුළු දළ ආදායම	27,507,821,054	26,070,610,605

6. ශුද්ධ පොළී ආදායම

6.1 පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
බැංකු සමග ස්ථාපන	735,270,427	494,336,946
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම්		
වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය සහ ලැබිය යුතු දෑ	21,735,964,322	21,016,590,253
ණය සහ අනෙකුත් උපකරණ	3,885,836,549	3,354,181,783
මුළු පොළී ආදායම	26,357,071,298	24,865,108,981

6.2 පොළී වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
බැංකු වලට ගෙවිය යුතු	(1,308,319,793)	(1,000,002,236)
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	(12,493,387,754)	(11,959,524,473)
කල්බදු වගකීම් මත පොළී වියදම	(102,173,728)	-
මුළු පොළී වියදම	(13,903,881,276)	(12,959,526,709)
ශුද්ධ පොළී ආදායම	12,453,190,022	11,905,582,272

7. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
ගාස්තු හා කොමිස් ආදායම	**1,134,421,656**	1,186,795,173
ගාස්තු හා කොමිස් වියදම්	**(278,304,299)**	(259,105,166)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**856,117,357**	927,690,007
සැලුම් ලබන්නේ:		
ණය	**852,512,689**	905,397,905
වෙළඳ හා ප්‍රේෂන	**7,630,593**	6,582,445
තැන්පතු	**(253,121,115)**	(239,902,296)
වෙනත්	**249,095,191**	255,611,952
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	**856,117,357**	927,690,007

8. ශුද්ධ වෙළඳ ලාභය/(අලාභය)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
වෙළඳපොලෙන් ශුද්ධ අලාභය - ස්කන්ධ සුරැකුම්පත්	**(7,400)**	(30,900)
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද මූල්‍යමය වගකීම්	**370,699**	-
ලාභාංශ ආදායම	**4,393,740**	1,246,662
එකතුව	**4,757,039**	1,215,762

9. වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභය/(අලාභය)	**3,811,675**	11,206,047
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් ලද ආදායම	**7,433,448**	4,551,002
අක්‍රීය ණය අයකරගැනීම් (කපා හරින ලද)	**325,939**	1,733,639
වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)	**11,571,062**	17,490,689

10. හානිකරණ ගාස්තු

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
බැංකු සමග ස්ථාපන (සටහන 18.1)	32,429	12,653
වෙනත් ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ ලැබිය යුතු දෑ		
සාමූහික හානිකරණය (සටහන 20.2)	(1,076,946,691)	(1,265,040,780)
කේවල හානිකරණය (සටහන 20.2)	(1,324,690,485)	(144,614,042)
ක්‍රමක්ෂය පිරිවැයට අනුව මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ		
ලාභාංශ (සටහන 21.1.2)	(1,200)	2,840
ස්ථාවර තැන්පතු මත ආයෝජන (සටහන 21.2.2)	(6,668,755)	342,187
ණය ආශ්‍රිත බැඳීම් සහ අසම්භාව්‍යතා	(474,152)	(486,954)
ණය හා වෙනත් අලාභ වෙනුවෙන් ශුද්ධ හානිකරණ (ගාස්තුව)/ප්‍රතිවර්තනය	(2,408,748,853)	(1,409,784,095)

11. කාර්ය මණ්ඩල වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
වැටුප් සහ ප්‍රසාද දීමනා	3,670,368,673	3,612,325,825
EPF/ETF සඳහා දායකත්වයන්	587,605,614	546,973,585
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායක මුදල්	323,313,062	265,384,959
වෙනත්	1,350,338,623	1,453,262,423
එකතුව	5,931,625,972	5,877,946,793

12. වෙනත් වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික	3,683,748	3,200,919
විගණක ගාස්තු	4,693,515	2,455,250
වෘත්තික හා නෛතික වියදම්	14,954,312	24,893,448
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්	1,104,581,162	1,331,786,648
පරිගනකගත කිරීමේ වියදම්	122,361,980	128,432,876
ව්‍යාපාර බදු වියදම්	2,715,109	1,045,833
ගෙවන ලද වෙනත් කොමිස් මුදල්	74,325	185,670
තැන්පතු රක්ෂණ වාරිකය	145,699,228	132,813,463
බෝග රක්ෂණ බද්ද	4,893,954	10,332,117
කාර්ය මණ්ඩල ඇප තැන්පතු පොලිය	4,010,435	3,750,542
උකස් අත්තිකාරම් මත ප්‍රාග්ධන අලාභය	12,501	-
එකතුව	1,407,680,268	1,638,896,765

13. මූල්‍ය සේවා මත අය කරන බදු සහ ණය ආපසු ගෙවීමේ ගාස්තුව

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
ජාතිය ගොඩනැගීමේ බද්ද	**123,625,704**	154,490,412
එකතු කල අගය මත බදු	**1,012,948,950**	1,158,678,090
ණය ආපසු ගෙවීමේ බදු	**601,522,646**	190,079,946
එකතුව	**1,738,097,299**	1,503,248,448

14. බදු වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
ආදායම් බදුකරණය		
වසර වෙනුවෙන් ලාභය මත පදනම්ව බදුකරණය (සටහන 14.1)	**890,648,620**	1,072,147,126
2018/2019 වසර ආශ්‍රිත (අධි)/ඌන ප්‍රතිපාදන	**-**	(5,503,331)
තාවකාලික වෙනස්කම් උත්පාදනය/(ප්‍රතිවර්තනය) (සටහන 26.2)	**(167,082,742)**	(37,148,265)
එකතුව	**723,565,878**	1,029,495,530

14.1 බදු වියදම් සැසඳුම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019 රු.	2018 රු.
බදු පෙර ලාභය/(අලාභය)	**1,222,160,409**	2,103,081,891
(අඩු කලා) : ලාභාංශ	**(4,393,740)**	-
එකතු කිරීම : බදු කාර්යයන් සඳහා අඩු කල නොහැකි වියදම් වල බදු බලපෑම	**5,158,223,496**	3,396,456,057
(අඩු කලා) : බදු කාර්යයන් සඳහා අඩු කල හැකි වියදම් වල බදු බලපෑම	**(3,195,102,236)**	(1,670,441,068)
බදු වලට යටත් වන ලාභය	**3,180,887,929**	3,829,096,880
කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු (අදාළ බදු අනුපාතය අනුව බදු වලට යටත් වන ලාභය)	**28%**	28%
කාලපරිච්ඡේදය සඳහා ප්‍රවර්තන බදු වියදම	**890,648,620**	1,072,147,126
විලම්බිත බදු අයකිරීම/(ප්‍රතිවර්තනය) (සටහන 26.2)	**(167,082,742)**	(37,148,264)
ආදායම බදු වියදම	**723,565,878**	1,034,998,862
2017/2018 වසර ආශ්‍රිත (අධි)/ඌණ වෙන්කිරීම	**-**	(5,503,331)
ආදායම් බදු වියදම	**723,565,878**	1,029,495,531
සඵල බදු අනුපාතිකය	**59%**	49%

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

15. කොටසක් මත ඉපැයීම

15.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 33 - ''කොටසකට මූලික ඉපැයීම'' ට අනුව, බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියෙකුට පැවරිය හැකි ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය තුළ නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් වල බර තැබූ සාමාන්‍යය සංඛ්‍යාවෙන් (හරය) බෙදීමෙන් කොටසකට මූලික ඉපැයීම ගණනය කෙරේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය	**498,594,531**	1,073,586,361
සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය	**498,594,531**	1,073,586,361

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් වල බර තැබූ සාමාන්‍ය කොටස් ගණන	**545,107,049**	389,575,772
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම	**0.91**	2.76

16. මැනීමේ පදනම්න් මූල්‍ය උපකරණ විශ්ලේෂණය

අ. බැංකුව - වර්තමාන වසර (2019)

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැය	වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට	එකතුව
		රු.	රු.	රු.	රු.
වත්කම්					
මුදල් හා මුදල් සමාන දෑ	17	-	**2,750,187,219**	-	**2,750,187,219**
බැංකු සමග ස්ථාපන	18	-	**9,798,242,492**	-	**9,798,242,492**
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	19	**123,000**	-	-	**123,000**
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ	20	-	**136,205,641,441**	-	**136,205,641,441**
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය ආයෝජන - ණය සහ අනෙකුත් උපකරණ	21	-	**45,664,745,400**	-	**45,664,745,400**
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	22	-	-	**2,289,919**	**2,289,919**
වෙනත් මූල්‍ය වත්කම්	27	-	**1,633,841,628**	-	**1,633,841,628**
මුළු මූල්‍ය වත්කම්		**123,000**	**196,052,658,180**	**2,289,919**	**196,055,071,099**

අ. බැංකුව - ප්‍රවර්තන වර්ෂය (2019)

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
		රු.	රු.
වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	28	**22,050,009,005**	**22,050,009,005**
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	29	**149,599,829,047**	**149,599,829,047**
නිකුත් කල ණය හා වෙනත් ණයට ලබාගත් අරමුදල්	30	**4,707,852,534**	**4,707,852,534**
වෙනත් වගකීම්	32	**4,954,270,654**	**4,954,270,654**
මුළු මූල්‍ය වගකීම්		**181,311,961,240**	**181,311,961,240**

ආ. බැංකුව - පෙර වසර (2018)

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	ක්‍රමක්ෂය පිරිවැය	වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට	එකතුව
		රු.	රු.	රු.	රු.
වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ	17	-	689,184,136	-	689,184,136
බැංකු සමග ස්ථාපන	18	-	6,496,628,053	-	6,496,628,053
වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්/ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	19	115,600	-	-	115,600
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ	20	-	133,432,804,004	-	133,432,804,004
ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ	21	-	27,920,326,465	-	27,920,326,465
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	22	-	-	4,176,342,999	4,176,342,999
වෙනත් මූල්‍ය වත්කම්	27		1,285,360,602	-	1,285,360,602
මුළු මූල්‍ය වත්කම්		115,600	168,538,942,658	4,176,342,999	172,715,401,258

ආ. බැංකුව - පෙර වර්ෂය (2018)

දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
		රු.	රු.
වගකීම්			
බැංකු වෙත ගෙවිය යුතු	28	11,098,334,822	11,098,334,822
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	29	141,559,973,557	141,559,973,557
නිකුත් කල ණය හා වෙනත් ණයට ලබාගත් අරමුදල්	30	4,707,852,534	4,707,852,534
වෙනත් වගකීම්	32	1,797,328,111	1,797,328,111
මුළු මූල්‍ය වගකීම්		159,163,489,025	159,163,489,025

17. මුදල් හා මුදල් සමාන දෑ

දෙසැම්බර් 31 වැනි දිනට	2019 රු.	2018 රු.
අතැති මුදල්	627,224,228	539,995,648
වෙනත් බැංකු වල ඇති ශේෂයන්	2,122,962,990	149,188,488
එකතුව	2,750,187,219	689,184,136

18. බැංකු සමග ස්ථාපන

දෙසැම්බර් 31 වැනි දිනට	2019 රු.	2018 රු.
මූල්‍ය වෙළඳපොල ස්ථාපන	9,798,274,942	6,496,692,932
අඩු කලා : අපේක්ෂිත අලාභ සඳහා හානිකරණය (සටහන 18.1)	(32,450)	(64,879)
එකතුව	9,798,242,492	6,496,628,053

18.1 ණය අවදානම වෙත නිරාවරනය මත පදනම්ව බැංකු සමග ස්ථාපන විශ්ලේෂණය

2019 දෙසැම්බර් 31 දිනට	අදියර 1 රු.	අදියර 2 රු.	අදියර 3 රු.	එකතුව රු.
මූල්‍ය වෙළඳපොල ස්ථාපන	9,798,274,942	-	-	9,798,274,942
අපේක්ෂිත අලාභ සඳහා හානිකරණය (සටහන 18.2)	(32,450)	-	-	(32,450)
	9,798,242,492	-	-	9,798,242,492

2018 දෙසැම්බර් 31 දිනට	අදියර 1 රු.	අදියර 2 රු.	අදියර 3 රු.	එකතුව රු.
මූල්‍ය වෙළඳපොල ස්ථාපන	6,496,692,932	-	-	6,496,692,932
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 18.1)	(64,879)	-	-	(64,879)
	6,496,628,053	-	-	6,496,628,053

18.2 අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය - බැංකු සමග ස්ථාපන

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2019	2018
	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය	**64,879**	77,532
වසර සඳහා ශුද්ධ ප්‍රතිවර්තනය (සටහන 10)	**(32,429)**	(12,653)
	32,450	64,879

19. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට සකන්ධ උපකරණ

	2019			2018		
	කොටස් සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	වෙළඳපොල වටිනාකම	කොටස් සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	වෙළඳපොල වටිනාකම
		රු.	රු.		රු.	රු.
පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී	**600**	**6,600**	**6,000**	600	12,000	6,600
සෙලාන් ඩිවෙලොප්මන්ට් පීඑල්සී	**10,000**	**109,000**	**117,000**	10,000	150,000	109,000
	10,600	**115,600**	**123,000**	10,600	162,000	115,600

19.1 වසර තුළදී වෙනස්වීම

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය	**115,600**	146,500
වසර තුළ සාධාරණ අගයෙහි වෙනස	**7,400**	(30,900)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**123,000**	115,600

20. වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය සහ ලැබිය යුතු දෑ

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
දළ ණය සහ ලැබිය යුතු දෑ	**144,693,550,841**	137,769,683,363
(අඩු කලා) : ශූන්‍ය අනුපාත ණය සාධාරණ අගය ගැළපුම	**-**	(8,596,304)
	144,693,550,841	137,761,087,059
(අඩු කලා) : කාර්ය මණ්ඩල ණය සාධාරණ අගය ගැළපුම	**(820,595,233)**	(830,165,393)
	143,872,955,608	136,930,921,667
(අඩු කලා) : සාමූහික හානිකරන ගාස්තු (සටහන 20.2)	**(6,024,186,378)**	(3,179,680,359)
(අඩු කලා) : කේවල හානිකරන ගාස්තු (සටහන 20.2)	**(1,643,127,789)**	(318,437,304)
වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ශුද්ධ ණය සහ ලැබිය යුතු දෑ	**136,205,641,441**	133,432,804,004

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

20.1 විශ්ලේෂණය

දෙසැම්බර් 31 වැනි දිනට	2019 රු.	2018 රු.
නිපැයුම අනුව:		
උකස්	13,746,633,225	11,454,807,949
කාර්යමණ්ඩල ණය	3,560,904,130	3,478,770,159
කෙටි කාලීන	10,200,684,495	9,181,224,723
දිගු කාලීන	117,185,328,990	113,654,880,532
දළ එකතුව	144,693,550,841	137,769,683,363
ව්‍යවහාර මුදල් අනුව:		
ශ්‍රී ලංකා රුපියල්	144,693,550,841	137,769,683,363
දළ එකතුව	144,693,550,841	137,769,683,363
කර්මාන්තය අනුව:		
කෘෂි හා ධීවර කර්මාන්තය	29,289,222,632	36,860,350,948
නිෂ්පාදන	22,724,128,191	22,906,922,131
ප්‍රවාහන	165,435,909	244,473,642
ඉදිකිරීම්/නිවාස	23,617,507,238	28,086,234,943
වෙළඳුන්	24,260,590,030	22,819,454,960
වෙනත් (පරිභෝජන/තැන්පතු එරෙහිව/කාර්ය මණ්ඩල/සංචාරක)	44,636,666,841	26,852,246,739
දළ එකතුව	144,693,550,841	137,769,683,363

20.2 ණය අලාභ සඳහා හානිකරණය - වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ

	කේවල	සාමූහික	එකතුව
2018 ජනවාරි 1 දිනට ශේෂය (SLFRS 9)			
ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම	173,823,262	1,790,452,774	1,964,276,036
2018 ජනවාරි 1 දිනට SLFRS 9 ආදේශ කරගැනීමේ බලපෑම	-	124,902,103	124,902,103
2018 ජනවාරි 1 දිනට ශේෂය (SLFRS 9)	173,823,262	1,915,354,877	2,089,178,139
ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම	144,614,042	1,265,040,780	1,409,654,822
කාලපරිච්ඡේදය තුළ කපාහරින ලද	-	(860,361)	(860,361)
වෙනත් වෙනස්වීම්	-	145,063	145,063
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	318,437,304	3,179,680,360	3,498,117,664
ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම	1,324,690,485	1,076,946,691	2,401,637,175
වෙනත් සංචලනයන්/කපාහරින ලද	-	(33,815,719)	(33,815,719)
2019.04.01 දිනට ඒකාබද්ධ කරන ලද ලසංබැ ශේෂයන්	-	1,801,375,047	1,801,375,047
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,643,127,789	6,024,186,378	7,667,314,167

20.3 ණය අවදානම වෙත නිරාවරනය මත පදනම්ව අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණයෙහි වෙනස්වීම්

පාදක වන ණය වල අදියර මත පදනම්ව, අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය සම්බන්ධ වැඩිදුර විශ්ලේෂණයක් පහත දැක්වේ.

	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
2019 ජනවාරි 1 දිනට ශේෂය	1,016,251,838	928,793,193	1,553,072,633	3,498,117,664
වෙනත් සංචලනයන්/කපාහරින ලද	-	-	(33,815,719)	(33,815,719)
2019.04.01 දිනට ඒකාබද්ධ කරන ලද ලංකාපුත්‍ර සංවර්ධන බැංකු ශේෂයන්	-	-	1,801,375,047	1,801,375,047
ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම	532,168,933	399,311,287	1,470,156,955	2,401,637,175
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,548,420,771	1,328,104,480	4,790,788,916	7,667,314,167

	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
2018 ජනවාරි 1 දිනට ශේෂය	734,045,039	1,029,494,477	843,681,100	2,607,220,617
කාලපරිච්ඡේදය තුළ කපාහරින ලද	-	-	(860,361)	(860,361)
වෙනත් සංචලනයන්	-	-	145,063	145,063
ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම	282,206,799	(100,701,284)	710,106,830	891,612,344
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	1,016,251,838	928,793,193	1,553,072,633	3,498,117,664

20.4 ණය අවදානම වෙත නිරාවරනය මත පදනම්ව වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ පිළිබඳ විශ්ලේෂණය

2019 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
කේවල හානිකරණයට ලක් වූ ණය	-	-	2,167,069,767	2,167,069,767
සාමූහික හානිකරණයට ලක් වූ ණය				
කාලීන ණය වෙනත්	2,244,069,768	163,572,465	150,428,444	2,558,070,676
කාලීන ණය කර්මාන්ත	8,648,858,829	4,781,267,666	2,263,175,309	15,693,301,803
කාලීන ණය වාණිජ	13,170,138,143	5,630,911,781	2,679,471,299	21,480,521,223
කාලීන ණය කෘෂිකර්ම	13,484,326,089	4,260,136,830	1,982,276,556	19,726,739,475
කාලීන ණය නිවාස	29,413,240,500	5,202,725,506	3,081,110,334	37,697,076,341
ප්‍රතිමූල්‍ය	13,449,431,399	5,479,756,564	1,460,699,739	20,389,887,703
ලියඉසුර	176,702	241,926	44,670,618	45,089,246
උකස්	12,994,119,322	613,994,426	36,323,732	13,644,437,480
කල්බදු	614,413,902	125,161,486	149,258,704	888,834,092
කාර්ය මණ්ඩල ණය	3,699,555,923	-	-	3,699,555,923
තැන්පතු එරෙහි ණය	6,564,153,380	-	-	6,564,153,380
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය	-	-	138,813,731	138,813,731
වෙනත් ගනුදෙනුකරුවන් වෙත හා ඔවුන්ගෙන් ලැබිය යුතු දළ ණය	104,282,483,958	26,257,768,650	14,153,298,234	144,693,550,841
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (20.3)	(1,548,420,771)	(1,328,104,480)	(4,790,788,916)	(7,667,314,167)
වෙනත් ගනුදෙනුකරුවන් වෙත හා ඔවුන්ගෙන් ලැබිය යුතු ශුද්ධ ණය (ශූන්‍ය අනුපාත ණය හා කාර්ය මණ්ඩල ණය ගැලපුම් වලට පෙර)	102,734,063,186	24,929,664,170	9,362,509,318	137,026,236,674

2018 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
කේවල හානිකරණයට ලක් වූ ණය	-	-	1,098,887,753	1,098,887,753
සාමූහික හානිකරණයට ලක් වූ ණය				
කාලීන ණය වෙනත්	2,599,981,983	183,427,854	75,641,719	2,859,051,556
කාලීන ණය කර්මාන්ත	10,178,305,534	4,645,631,063	1,017,755,408	15,841,692,004
කාලීන ණය වාණිජ	13,095,235,907	5,305,816,655	1,370,300,662	19,771,353,224
කාලීන ණය කෘෂිකර්ම	14,101,252,990	3,590,833,248	885,285,221	18,577,371,459
කාලීන ණය නිවාස	31,230,665,579	4,699,457,789	1,584,128,691	37,514,252,058
ප්‍රතිමූල්‍ය	13,247,616,246	6,570,833,704	1,483,099,007	21,301,548,956
ලියඉසුර	38,792,404	12,713,935	50,885,732	102,392,072
උකස්	10,640,356,600	701,464,586	39,613,861	11,381,435,047
කල්බදු	3,533,757,648	-	-	3,533,757,648
කාර්ය මණ්ඩල ණය	5,787,941,585	-	-	5,787,941,585
වෙනත් ගනුදෙනුකරුවන් වෙත හා ඔවුන්ගෙන් ලැබිය යුතු දළ ණය	104,453,906,475	25,710,178,835	7,605,598,053	137,769,683,363
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (20.3)	(1,016,251,838)	(928,793,193)	(1,553,072,633)	(3,498,117,664)
වෙනත් ගනුදෙනුකරුවන් වෙත හා ඔවුන්ගෙන් ලැබිය යුතු ශුද්ධ ණය (ශූන්‍ය අනුපාත ණය හා කාර්යමණ්ඩල ණය ගැලපුම් වලට පෙර)	103,437,654,637	24,781,385,642	6,052,525,420	134,271,565,699

21. ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍යමය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ

දෙසැම්බර් 31 වැනි දිනට	2019 රු.	2018 රු.
ණයකර - ලැයිස්තුගත (සටහන 21.1)	**516,934,932**	516,934,932
රජයේ ණය සුරැකුම් - භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර	**2,663,205,000**	2,675,175,000
ස්ථාවර තැන්පතු වල ආයෝජන (සටහන 21.2)	**42,492,391,559**	24,729,332,669
අනු එකතුව	**45,672,531,491**	27,921,442,601
අඩු කිරීම : අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය - ණයකර (සටහන 21.1.1)	**(10,020)**	(8,820)
අඩු කිරීම : අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය - ස්ථාවර තැන්පතු (සටහන 21.2.1)	**(7,776,071)**	(1,107,316)
එකතුව	**45,664,745,400**	27,920,326,465

21.1 ණයකර - ලැයිස්තුගත

	2019			2018		
	ණයකර සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	ක්‍රමක්ෂය පිරිවැය	ණයකර සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	ක්‍රමක්ෂය පිරිවැය
		රු.	රු.		රු.	රු.
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී	**5,000,000**	**500,000,000**	**516,934,932**	5,000,000	500,000,000	516,934,932
එකතුව	**5,000,000**	**500,000,000**	**516,934,932**	5,000,000	500,000,000	516,934,932

21.1.1 අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ණයකර සම්බන්ධ විශ්ලේෂණය

2019 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
ණයකර - ලැයිස්තුගත	516,934,932	-	-	516,934,932
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 21.1.2)	(10,020)	-	-	(10,020)
	516,924,912	-	-	516,924,912

2018 දෙසැම්බර් 31 දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
ණයකර - ලැයිස්තුගත	516,934,932	-	-	516,934,932
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 21.1.2)	(8,820)	-	-	(8,820)
	516,926,112	-	-	516,926,112

21.1.2 අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය - ණයකර ලැයිස්තුගත

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
ජනවාරි 1 දිනට ශේෂය	8,820	11,660
වසර සඳහා ශුද්ධ අයකිරීම්/(ප්‍රතිවර්තනය)	1,200	(2,840)
	10,020	8,820

21.2 ස්ථාවර තැන්පතු වල ආයෝජන

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
මාස තුනට අඩු ස්ථාවර තැන්පතු	22,571,266,384	2,520,602,739
මාස තුනට වැඩි ස්ථාවර තැන්පතු	19,921,125,175	22,208,729,930
එකතුව	42,492,391,559	24,729,332,669

21.2.1 අපේක්ෂිත ණය අලාභ මත පදනම්ව ස්ථාවර තැන්පතු වල ආයෝජන සම්බන්ධ විශ්ලේෂණය

2019 දෙසැම්බර් 31 වැනි දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
ස්ථාවර තැන්පතු වල ආයෝජන	42,492,391,559	-	-	42,492,391,559
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 21.2.2)	(7,776,071)	-	-	(7,776,071)
	42,484,615,488	-	-	42,484,615,488

2018 දෙසැම්බර් 31 වැනි දිනට	අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
ස්ථාවර තැන්පතු වල ආයෝජන	24,729,332,669	-	-	24,729,332,669
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 21.2.2)	(1,107,316)	-	-	(1,107,316)
	24,728,225,353	-	-	24,728,225,353

21.2.2 අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය - ස්ථාවර තැන්පතු වල ආයෝජන

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
ජනවාරි 1 වැනි දිනට ශේෂය	**1,107,316**	1,449,503
වසර සඳහා ශුද්ධ අයකිරීම/(ප්‍රතිවර්තනය)	**6,668,755**	(342,187)
	7,776,071	1,107,316

22. වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ

දෙසැම්බර් 31 වැනි දිනට	2019	2018
	රු.	රු.
ලැයිස්තුගත නොවූ ස්කන්ධ සුරැකුම් (22.1)	**2,289,919**	4,176,342,999
	2,289,919	4,176,342,999

22.1 ලැයිස්තුගත නොවූ ස්කන්ධ සුරැකුම්

	2019			2018		
දෙසැම්බර් 31 වැනි දිනට	කොටස් සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	වෙළඳපොල වටිනාකම	කොටස් සංඛ්‍යාව	ආයෝජන පිරිවැය	වෙළඳපොල වටිනාකම
		රු.	රු.		රු.	රු.
ණය තොරතුරු කාර්යාංශය	**1,821**	**2,289,919**	**2,289,919**	600	60,000	60,000
ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව	-	-	-	158,013,356	4,176,292,999	4,176,292,999
එකතුව	**1,821**	**2,289,919**	**2,289,919**	158,013,956	4,176,352,999	4,176,352,999

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. වසර 2016 සඳහා රජයේ අයවැය යෝජනාවට අනුකූලව, 2018 දෙසැම්බර් 31 වැනි දින බැංකුව මගින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ කොටස් 100% මිළට ගනු ලැබූ අතර එය 2019 අප්‍රියෙල් 1 වැනි දින ප්‍රාදේශීය සංවර්ධනය බැංකුව සමග ඒකාබද්ධ කරන ලදී. එමනිසා, 2019 අප්‍රියෙල් 1 දිනය ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ස්කන්ධ කොටස සමගින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙහි කොටස් වල ආයෝජනයන් ශුද්ධීකරණයට (netted off) ලක් කෙරිණි. (සටහන 23 බලන්න)

23. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අතර ඒකාබද්ධකරණය

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඒකාබද්ධ කිරීම සඳහා 2016 සඳහා රජයේ අයවැයේදී යෝජනා කෙරුනු පරිදි, කැබිනට් මණ්ඩලය සහ එකම කොටස් හිමිකරු වශයෙන් මහා භාණ්ඩාගාරය ද ඇතුළුව අදාළ අධිකාරීන් වෙතින් අවශ්‍ය අනුමැතිය හිමිවීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් 2018.12.31 දින බලපැවැත්වෙන පරිදි රු.මිලියන 4,176 ක වටිනාකමින් යුතු නව කොටස් මහා භාණ්ඩාගාරය වෙනුවෙන් නිකුත් කරන ලද අතර එය මහා භාණ්ඩාගාරය මගින් රඳවාගනු ලැබූ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජන ඉවත් කිරීම සඳහා විය. මෙම ගනුදෙනුවෙහි අරමුණ වූයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අතර ඒකාබද්ධකරණයක් ඇති කිරීම බැවින්, මහා භාණ්ඩාගාරය මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අතර මව්-පරිපාලිත සබඳතාවයක් පවත්වා ගැනීම අපේක්ෂා නොකෙරිනි. ඉහත සඳහන් කරන ලද අරමුණ සමගින්, මහා භාණ්ඩාගාරය මගින් 2019 ජනවාරි 10 වැනි දින, අනාගත තත්ත්වයන් මත රඳාපවතිමින් කවර හෝ ඉහළ දිශාවට සංශෝධන වලට යටත්ව රු.මිලියන 4,176 ක ප්‍රතිශ්ඨාවක් අනුව ප්‍රදේශීය සංවර්ධන බැංකුව සහ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අතර ඒකාබද්ධකරණයක් ඇති කිරීම සඳහා අවසරය පිරිනමන ලදී.

2019 අප්‍රියෙල් 1 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙහි මෙහෙයුම් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් භාර ගැනිනි.

